328 වන කාණ්ඩය - 04 වන කලාපය
தொகுதி 328 - இல. 04
Volume 328 - No. 04

2026 ජූලි 10 වන සිකුරාදා
2026 யூலை 10, வெள்ளிக்கிழமை
Friday, 10th July, 2026

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

# අන්තර්ගත ප්‍රධාන කරුණු


**නිවේදන:**

වාවස්ථාදායක ස්ථාවර කාරක සභාව: අතිරේක සාමාජිකයන් [තීරුව 577]

**රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව** [තීරුව 582]

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු** [තීරු 586-623]

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**

නැඟෙනහිර පළාතේ ධීවරයින් මුහුණ දෙන ගැටලු [තීරුව 623]

කොළඹ වරාය නගරයට ලැබුණු ආයෝජන සහ රැකියා උත්පාදනය [තීරුව 626]

**2026.06.10 දින ගරු මුජිබුර් රහුමාන් මහතා විසින් යොමු කරන ලද ප්‍රශ්නය:**

ගරු අග්‍රාමාත්‍යතුමියගේ පිළිතුර [තීරුව 629]

**NDB බැංකුවේ රුපියල් බිලියන 13.2ක මූල්‍ය වංචාව:**

මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රකාශය [තීරුව 635]

**පෞද්ගලික මන්ත්‍රීන්ගේ යෝජනා:**

රත්නපුර දිස්ත්‍රික්කයේ කොලොන්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මඩුවන්වෙල වලව්ව ප්‍රමුඛ ශ්‍රී ලංකාවේ ඓතිහාසික වටිනාකමින් යුත් ස්ථාන ආරක්ෂා කිරීම [තීරුව 642]

පාසල් සිසුන්ගේ අධ්‍යාපන සංවර්ධනය, වෘත්තීය සංවර්ධනය සහ පුද්ගල සමාජ සංවර්ධනය සඳහා සෑම පාසලකටම පුහුණුව ලත් මනෝ උපදේශකවරයෙකු - Student Counsellor - පත් කිරීම [තීරුව 653]

විදේශගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් වන "රට විරුවන්" වෙනුවෙන් විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් සකස් කිරීම [තීරුව 673]

ශ්‍රී ලංකාවේ පාසල් පද්ධතිය තුළ පිහිටි ආපනශාලාවල ළමුන්ට අහිතකර ආහාර අළෙවි කිරීම නතර කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම [තීරුව 688]

යාපනයේ සංචාරක සේවා ප්‍රවර්ධනය කිරීම සහ ආර්ථිකය සංවර්ධනය කිරීම [තීරුව 698]

**කල් තැබීමේ යෝජනාව:**

ශ්‍රී ලංකාව ලොව ප්‍රමුඛ සංචාරක ගමනාන්තයක් බවට පත් කිරීමේ ජාතික වැඩ පිළිවෙළක් [තීරු715-722]

**ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු** [තීරුව 722]


---

# பிரதான உள்ளடக்கம்


**அறிவிப்புகள்:**

சட்டவாக்க நிலையியற் குழு: மேலதிக உறுப்பினர்கள் [ப: 577]

**அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை** [ப: 582]

**வினாக்களுக்கு வாய்மூல விடைகள்** [ப: 586-623]

**தனி அறிவித்தல் மூல வினா:**

கிழக்கு மாகாண மீனவர்கள் எதிர்கொள்ளும் பிரச்சினைகள் [ப: 623]

கொழும்பு துறைமுக நகரத்தில் பெறப்பட்ட முதலீடும் உருவாக்கப்பட்ட வேலைவாய்ப்புகளும் [ப: 626]

**2026.06.10ஆம் திகதி மாண்புமிகு முஜிபுர் ரஹுமானால் விடுக்கப்பட்ட வினா:**

மாண்புமிகு பிரதம அமைச்சரினது விடை [ப: 629]

**NDB வங்கியில் இடம்பெற்ற 13.2 பில்லியன் ரூபாய் நிதி மோசடி:**

நிதி, திட்டமிடல் பிரதி அமைச்சரினது கூற்று [ப: 635]

**தனி நபர் பிரேரணைகள்:**

இரத்தினபுரி மாவட்டத்தில் கொலொன்ன பிரதேச செயலாளர் பிரிவுக்குரிய மடுவன்வெல பிரபுமனை - வலவ்வ - உட்பட இலங்கையிலுள்ள புராதன பெறுமதிவாய்ந்த தலங்களைப் பாதுகாத்தல் [ப: 642]

பாடசாலை மாணவர்களின் கல்வி அபிவிருத்தி, தொழில் அபிவிருத்தி மற்றும் தனிநபர் சமூக அபிவிருத்தியின் பொருட்டு ஒவ்வொரு பாடசாலைக்கும் பயிற்றப்பட்ட உளவள ஆலோசகர் - Student Counsellor - ஒருவரை நியமித்தல் [ப: 653]

“ரட்டவிருவன்” - புலம்பெயர் வீரர்கள் - என்றழைக்கப்படும் இலங்கையின் புலம்பெயர் தொழிலாளர்களுக்கான ஓய்வூதியத் திட்டமொன்றை வகுத்தல் [ப: 673]

இலங்கையின் பாடசாலைக் கட்டமைப்பிலுள்ள உணவகங்களில் மாணவர்களுக்குப் பாதகமான உணவு வகைகளை விற்பனை செய்வதை நிறுத்துவதற்கான வழிமுறையொன்றை உருவாக்குதல் [ப: 688]

யாழ்ப்பாணத்தில் சுற்றுலாத்துறைச் சேவைகளை மேம்படுத்தல் மற்றும் பொருளாதாரத்தை அபிவிருத்தி செய்தல் [ப: 698]

**ஒத்திவைப்புப் பிரேரணை:**

இலங்கையை உலகின் முன்னணி சுற்றுலாப் பயண முடிவிடமாக ஆக்குவதற்கான தேசிய வேலைத்திட்டம் [ப: 715-722]

**வினாக்களுக்கு எழுத்துமூல விடைகள்** [ப: 722]

# PRINCIPAL CONTENTS


ANNOUNCEMENTS:

Legislative Standing Committee: Additional Members [Col. 577]

PUBLIC FINANCE COMMITTEE REPORT [Col. 582]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 586-623]

QUESTION BY PRIVATE NOTICE:

Issues Faced by Fishermen in Eastern Province [Col. 623]

Investment Received and Employment Generated at Colombo Port City [Col. 626]

QUESTION POSED BY HON. MUJIBUR RAHUMAN ON 10.06.2026:

Reply by Hon. Prime Minister [Col. 629]

RS. 13.2 BILLION FINANCIAL FRAUD AT NDB BANK:

Statement by Deputy Minister of Finance and Planning [Col. 635]

PRIVATE MEMBERS' MOTIONS:

Preservation of Places of Historical Value in Sri Lanka, Including Maduwanwela Walawwa, which Belongs to the Kolonna Divisional Secretary's Division of the Ratnapura District [Col. 642]

Appointment of a Trained Student Counsellor to Every School for the Educational Development, Vocational Development and Personal Social Development of School Children [Col. 653]

Formulation of a Pension Scheme for the Sri Lankans Working Abroad, who are Styled as "*Rata Viruwan*" (Migrant Heroes) [Col. 673]

Formulation of a System to Prevent the Sale of Unhealthy Food to Children in School Canteens Within the School System of Sri Lanka [Col. 688]

Promoting Tourism Services and Economic Development in Jaffna [Col. 698]

ADJOURNMENT MOTION:

National Programme to Transform Sri Lanka into a Leading Global Tourism Destination [Cols. 715-722]

WRITTEN ANSWERS TO QUESTIONS [Col. 722]

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

*2026 ජූලි 10 වන සිකුරාදා*
*2026 யூலை 10, வெள்ளிக்கிழமை*
*Friday, 10th July, 2026*

**පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.**
பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.
The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE]
in the Chair.

## නිවේදන
## அறிவிப்புகள்
## ANNOUNCEMENTS

### ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාව: අතිරේක සාමාජිකයන්
### சட்டவாக்க நிலையியற் குழு: மேலதிக உறுப்பினர்கள்
### LEGISLATIVE STANDING COMMITTEE: ADDITIONAL MEMBERS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

"මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ (අවලංගු කිරීමේ)" පනත් කෙටුම්පත සලකා බැලීම පිණිස පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 113(2) ප්‍රකාරව, ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවට මතු පළ වන මන්ත්‍රීවරයන් අතිරේක සාමාජිකයන් වශයෙන් මවිසින් නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

ගරු නීතිඥ සුනිල් වටගල මහතා
ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය
ගරු අජිත් පී. පෙරේරා මහතා
ගරු හර්ෂණ රාජකරුණා මහතා
ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා
ගරු චතුර ගලප්පත්ති මහතා
ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා
ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය

## II

### පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම
### பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழுக் கூட்டம்
### MEETING OF COMMITTEE ON PARLIAMENTARY BUSINESS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීමක් 2026 ජූලි 10 සිකුරාදා, එනම් අද දින පූර්ව භාග 11.30ට කාරක සභා කාමර අංක 2හි දී පැවැත්වීමට නියමිත බැවින් ඊට පැමිණ සහභාගි වන ලෙස ගරු සාමාජික මන්ත්‍රීවරයන් සියලු දෙනාටම මෙයින් දැනුම් දීමට කැමැත්තෙමි.



## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

Hon. Speaker, I present the Annual Report and Accounts of the University of Kelaniya for the year 2024.

I move that this Report be referred to the Sectoral Oversight Committee on Education, Manpower and Human Capital.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

Sir, I present the Annual Performance Report of the Inland Revenue Department for the year 2025.

I move that this Report be referred to the Sectoral Oversight Committee on Economic Development and International Relations.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

Sir, I present the Performance Report of the Judges of the Superior Courts for the year 2025.

I move that this Report be referred to the Sectoral Oversight Committee on Governance, Justice and Civil Protection.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

Sir, I present the -

(i) Report on the observations and steps taken in terms of the Standing Order No. 119(4) of the Parliament with regard to the matters mentioned on the Election Commission in the Report of the Committee on Public Accounts, which was presented to Parliament;

(ii) Report on the observations and steps taken in terms of the Standing Order No. 119(4) of the Parliament with regard to the matters mentioned

[ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය]

on the Audit Service Commission in the Report of the Committee on Public Accounts, which was presented to Parliament; and

(iii) Report on the observations and steps taken in terms of the Standing Order No. 119(4) of the Parliament with regard to the matters mentioned on the Commission to Investigate Allegations of Bribery or Corruption in the Report of the Committee on Public Accounts, which was presented to Parliament.

I move that these Reports be referred to the Committee on Public Accounts.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
Sir, I present the -

(i) Regulations made by the Minister of Finance, Planning and Economic Development under Section 20 read with Sections 4(1), 6 and 14 of the Imports and Exports (Control) Act, No. 1 of 1969, as amended by Acts, No. 48 of 1985 and No. 28 of 1987 and published in Gazette Extraordinary No. 2493/03 of 15th June, 2026; and

(ii) Regulations made by the Minister of Finance, Planning and Economic Development under Section 20 read with Sections 4(1) and 14 of the Imports and Exports (Control) Act, No. 1 of 1969, as amended by Acts, No. 48 of 1985 and No. 28 of 1987 and published in Gazette Extraordinary No. 2493/39 of 18th June, 2026.

I move that these Regulations be referred to the Committee on Public Finance.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)
ගරු කථානායකතුමනි, සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2025 වර්ෂය සඳහා සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ජනමාධ්‍ය අංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව; සහ

(ii) 2025 වර්ෂය සඳහා රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව.

මෙම වාර්තා සෞඛ්‍ය, ජනමාධ්‍ය සහ කාන්තා සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා (කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.டீ. லால் காந்த - கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சர்)
(The Hon. K.D. Lal Kantha - Minister of Agriculture, Livestock, Land and Irrigation)
ගරු කථානායකතුමනි, 2025 වර්ෂය සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා (වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன - பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சர்)
(The Hon. K.V. Samantha Viddyarathna - Minister of Plantation and Community Infrastructure)
ගරු කථානායකතුමනි, 2020 වර්ෂය සඳහා ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා (ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා)**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர் - கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சர்)
(The Hon. Ramalingam Chandrasekar - Minister of Fisheries, Aquatic and Ocean Resources)
கௌரவ சபாநாயகர் அவர்களே, 2025 ஆம் ஆண்டுக்கான கடற்றொழில் நீரியல் வளத்துறை திணைக்களத்தின் கடற்றொழில் வெகுமதி நிதியத்தின் செயலாற்றுகை அறிக்கையை நான் சமர்ப்பிக்கின்றேன்.

இவ்வறிக்கை சுற்றாடல், கமத்தொழில் மற்றும் வளங்களின் நிலைத்தன்மை பற்றிய துறைசார் மேற்பார்வைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமென நான் பிரேரிக்கின்றேன்.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් මම 2025 වර්ෂය සඳහා බලශක්ති අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව යටිතල පහසුකම් සහ උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා (පරිසර අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி - சுற்றாடல் அமைச்சர்)
(The Hon. (Dr.) Dammika Patabendi - Minister of Environment)

ගරු කථානායකතුමනි, 2025 වර්ෂය සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2025 වර්ෂය සඳහා ශ්‍රී ලංකා පොලිසියේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව; සහ

(ii) 2025 වර්ෂය සඳහා ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව.

මෙම වාර්තා රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා (බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி - புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi - Minister of Buddhasasana, Religious and Cultural Affairs)

ගරු කථානායකතුමනි, 2024 වර්ෂය සඳහා ටවර් හෝල් රඟහල පදනමේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව
## அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை
## PUBLIC FINANCE COMMITTEE REPORT

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

ගරු කථානායකතුමනි, ඕස්ට්‍රේලියාව වෙත එක්සත් ජනපද ඩොලර් මිලියන 2.5ක ණය පියවීමේ ගනුදෙනුවේදී සිදු වූ සයිබර් අපරාධය ආශ්‍රිත වංචාව සම්බන්ධයෙන් රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව සභාවේ විශේෂ අවසරය ඇතිව ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් මම ඉදිරිපත් කරන අතර, සිංහල සහ දෙමළ භාෂා පිටපත් හැකි ඉක්මනින් ඉදිරිපත් කිරීමටද කටයුතු කරමි.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

ගරු කථානායකතුමනි, මේ ගැන පැහැදිලි කරන්න මට විනාඩි කිහිපයක් දෙන්න.

අපි යම්කිසි කාලයක් ගත්තා, මේ වාර්තාව ඉදිරිපත් කරන්න. නොයෙකුත් කට්ටිය අපට චෝදනා කළා, මේ වාර්තාව ඉදිරිපත් කිරීම ප්‍රමාද වෙනවා කියලා. නමුත් අපට පරිපූරක වාර්තාවක් ඉදිරිපත් කරන්න අවශ්‍ය වුණා, සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාගේ එකඟතාව මත. ඒක තමයි පාර්ලිමේන්තු ක්‍රමවේදය. අපි අතිශයින් සන්තෝෂ වෙනවා, කිසිම බෙදීමකින් තොරව සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාව මෙයට ලැබී තිබීම ගැන. ඒක ඇත්තවශයෙන්ම ඉතාම අපහසු කාර්යයක්. කවදා හෝ කාරක සභාවක සභාපතිත්වය දරපු පුද්ගලයෙක් තේරුම් ගනීවි, ඒක ලෙහෙසි වැඩක් නොවෙයි කියන එක. ඒ නිසා මේ සඳහා එකඟත්වය පළ කිරීම සම්බන්ධයෙන් සියලුම මන්ත්‍රීවරුන්ට මම ස්තුතිවන්ත වෙනවා. කාර්ය මණ්ඩලය ඉතාම වෙහෙසෙමින් රෑ තිස්සේ වැඩ කළා. ඔවුන් සියලු දෙනාටත් මගේ ස්තුතිය කාරක සභාව වෙනුවෙන් පිරිනමනවා.

ගරු කථානායකතුමනි, මේකේ ප්‍රධාන නිගමනය මේකයි. මේකෙදි සයිබර් අපරාධයකට සම්බන්ධ වංචාවක් සිදු වෙච්ච බව පැහැදිලිව පෙනෙනවා. ඒ අනුව, මහජන මුදල්වලින් ඇමෙරිකානු ඩොලර් මිලියන 2.5ක් හොරකම් කරපු බව අපට පෙනෙනවා. මෙම සයිබර් අපරාධය හා සබැඳි වංචාව සිදු කිරීම සඳහා අදාළ ආයතන තුළ කිසියම් අභ්‍යන්තර හවුල්කාරිත්වයක් හෝ කුමන්ත්‍රණයක් පැවතියේද යන්න අපරාධ විමර්ශන ඇතුළු නීතිය බලාත්මක කිරීමේ ක්‍රියාවලිය මඟින් තීරණය කළ යුතුයි. අපට පාර්ලිමේන්තුවේ ඒ දෙය කරන්න බැහැ. අපේ remit එක එතැනට යන්නේ නැහැ. අදාළ නිලධාරීන් තම ක්‍රියාවන්හිදී හුදෙක්ම නොදැනුවත්කම, නොහැකියාව හෝ නොසැලකිලිමත්කම මත පමණක් කටයුතු කරලා තිබෙනවාද කියලා තහවුරු කර ගන්න වෙන්නේ එතැනින්.

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

දැන් මම කියවන්නම්, විධායක සාරාංශය. මේක ඉංග්‍රීසි භාෂාවෙන් තිබෙන්නේ. මම මේ කරන්නේ unofficial translation එකක්. 2025 නොවැම්බර් සිට 2026 ජනවාරි දක්වා කාලය තුළ ඕස්ට්‍රේලියානු අපනයන මූල්‍ය ආයතනය - Export Finance Australia - වෙත සිදු කළ යුතු යම් ණය ආපසු ගෙවීමේදී සයිබර් අපරාධයකට සම්බන්ධ වංචාවක් හේතුවෙන් මහා භාණ්ඩාගාරයට ඇමෙරිකානු ඩොලර් මිලියන 2.5ක අලාභයක් සිදු විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස විදේශ ණයහිමියා වෙත හිඟ මුදල් ද ඇති විය. රජයේ මුදල් පිළිබඳ කාරක සභාව 121වන ස්ථාවර නියෝගය යටතේ රාජ්‍ය ණය සේවාකරණය පිළිබඳ සිය අධීක්ෂණ කාර්යයන්ට අනුකූලව මෙම කරුණ පිළිබඳව විමර්ශනය කළේය. කාරක සභාව අවස්ථා 4කදී රැස්වී නිලධාරීන් රැසක් සමඟ මෙම සිදුවීම් මාලාව පිළිබඳව සාකච්ඡා කළ අතර අදාළ ආයතනවලින් සවිස්තරාත්මක වාර්තා ලබා ගත්තේය. මෙම අන්තර් ක්‍රියා සහ ලේඛන හරහා කාරක සභාවට ලබා දී ඇති තොරතුරු මත පදනම්ව කාරක සභාව විසින් හඳුනා ගත් සයිබර් අපරාධ ආශ්‍රිත වංචාවට දායක වුණු සිදුවීම් සහ සාධක මෙම වාර්තාව මඟින් ඉදිරිපත් කරයි.

මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු සියලු නිලධාරින්, මහ බැංකුවේ අධිපතිතුමා ඇතුළු සියලු නිලධාරින්, SLCERT ආයතනයේ සභාපතිතුමා ඇතුළු සියලු නිලධාරින් වාගේම නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරින් අපට සම්පූර්ණ සහයෝගය ලබා දීපු බව මම මේ අවස්ථාවේදී කියන්න ඕනෑ. ණය ආපසු ගෙවීමේ ක්‍රියාවලියේ අභ්‍යන්තර පාලන පද්ධතියේ පවතින ක්‍රමානුකූල පිරිහීම සහ යල්පැන ගිය විද්‍යුත් තැපැල් - emails, යටිතල පහසුකම් හේතුවෙන් සයිබර් අපරාධයකට සම්බන්ධ වංචාවක අවදානම ඉහළ ගොස් ඇති බව කාරක සභාව නිගමනය කරයි. මෙය හුදෙකලා අතපසුවීමක් නොව ආයතන කිහිපයක පාලන ක්‍රියා පටිපාටි සහ මෙහෙයුම් අසාර්ථක වීමෙහි ප්‍රතිඵලයකි. අලුතින් පිහිටුවන ලද රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය, ඒ කියන්නේ Public Debt Management Office - PDMO - වෙත ණය ආපසු ගෙවීමේ කාර්යයන් සංක්‍රමණය කිරීමේ ක්‍රියාවලිය මෙහෙයවීම සඳහා පූර්ව, නිශ්චිත විමර්ශන කොන්දේසි සහිත ලේඛනයක් නොමැති වීම පවතින ක්‍රියා පටිපාටි සහ මෙහෙයුම් හිඩැස් තවදුරටත් උග්‍ර කළ ප්‍රධාන පාලන අතපසුවීමකි. මෙයට ඵලදායී අභ්‍යන්තර පාලනයන් සහ ශක්තිමත් තොරතුරු තාක්ෂණ පද්ධති නොමැතිකම මෙන්ම ජ්‍යෙෂ්ඨ නිලධාරින් වෙත ගැටලු යොමු කිරීමේ ප්‍රමාණවත් ක්‍රියාපටිපාටි නොමැතිකම ඇතුළත් වන නමුත් ඒවාට පමණක් සීමා නොවේ. විදේශ ණය ආපසු ගෙවීමේ ක්‍රියාවලිය තුළ මෙම අඩුපාඩු ඓතිහාසිකව පැවති බව කාරක සභාව නිරීක්ෂණය කරයි.

මෙම නිගමන මත පදනම්ව රාජ්‍ය මූල්‍ය කළමනාකරණයේ එවැනි බරපතළ අසාර්ථකත්වයන් නැවත ඇතිවීම වැළැක්වීම සඳහා තීරණාත්මක පියවර ලෙස ප්‍රධාන නිර්දේශ කිහිපයක් කාරක සභාව ඉදිරිපත් කරයි.

- සමස්ත විදේශ ණය ආපසු ගෙවීමේ ක්‍රියාවලිය පිළිබඳව ජාතික විගණන කාර්යාලය විසින් වහාම විශේෂ විගණනයන් සිදු කිරීම අත්‍යවශ්‍යය.
- ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය විසින් රාජ්‍ය අංශයේ තොරතුරු තාක්ෂණ පද්ධති පිළිබඳ ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රචාරක ඒකකය - SLCERT - නිර්දේශ ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා හදිසි පියවර ගැනීම; සහ
- මුදල් අමාත්‍යාංශය විසින් රාජ්‍ය මූල්‍ය ක්‍රියාවලීන් මෙහෙයවන මූල්‍ය රෙගුලාසි වහාම ප්‍රතිසංස්කරණය කිරීම මෙයට ඇතුළත් වේ.

මෙම වාර්තාවේ අන්තර්ගතය රාජ්‍ය මුදල් අධීක්ෂණය සම්බන්ධයෙන් කාරක සභාව වෙත ඇති විෂය පථයට පමණක් සීමා වේ. කාරක සභාවේ විෂය පථයට සාපරාධී විමර්ශන හෝ නෛතික වගකීම් පිළිබඳ තීන්දු ගැනීම, තීන්දු ප්‍රකාශ කිරීම ඇතුළත් නොවේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
මම ඉක්මනින් අවසන් කරන්නම්.

ගරු කථානායකතුමනි, මේ චෝදනාවලට අවශ්‍ය නම් අපරාධ නීතිය යටතේ චෝදනා ගොනු කිරීම අපේ වැඩක් නොවෙයි, ඒක නීතිපතිවරයාගේ කාර්යභාරයක්.

ගරු කථානායකතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලන්නේ, මේ වාර්තාවේ නිගමන මත පදනම්ව, ඔබතුමා විශ්වාස කරන පරිදි සුදුසු, ඒ සියලු විමර්ශන ක්‍රියාමාර්ග ගැනීම සඳහා අවශ්‍ය සහ ප්‍රමාණවත් පියවර ගන්නා ලෙසයි. රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙනුවෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, මට මේ අවස්ථාව ලබා දුන්නාට.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, මහජන පෙත්සම් පිළිගැන්වීම.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු කථානායකතුමනි, මට පොඩි වේලාවක් දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු කථානායකතුමනි, භාණ්ඩාගාරයේ ඩොලර් මිලියන 2.5ක් අස්ථානගත වීම සම්බන්ධයෙන් රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපතිතුමා විසින් එම කමිටුවේ වාර්තාව දැන් ඉදිරිපත් කළා. ඒක රටටම බොහොම වැදගත් දෙයක් නිසා, එළඹෙන පාර්ලිමේන්තු සතියේ ඒ පිළිබඳව දින දෙකක විවාදයක් ලබා දෙන්න කියලා අපි ඉල්ලීමක් කරනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, Parliamentary Business Committee Meeting එකේදී ඒ ගැන සාකච්ඡා කරමු.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමනි, Parliamentary Business Committee Meeting එකේදී ඒ ගැන කථා කර ගන්න පුළුවන්.

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු කථානායකතුමනි, ඇල්පිටිය, කුරුඳුගහ, තානායම් කන්ද, අංක 351/1 යන ලිපිනයෙහි පදිංචි එල්.ඒ. සුසන්ත මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) පොල්ගස්ඕවිට, රිලාවල, ශ්‍රී සරණංකර පාර, අංක 25/එච්/7 යන ලිපිනයෙහි පදිංචි එච්.පී.අයි.යූ.කේ. කරුණාධීර මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) බණ්ඩාරගම, බමුණුමුල්ල, තොටුපොල පාර, අංක 38 ජී යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්.ජී.ජී.බී. රාජපක්ෂ මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) නාකුළුගමුව, සීනිමෝදර, කොටඅඹගහවත්ත යන ලිපිනයෙහි පදිංචි ටී.එච්. රෝහිණී දීපිකා මහත්මියගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) පොල්ගහවෙල, මැටිකුඹුර, පොල්පිටිය, පාසල් පාර යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්.එන්.යූ.එල්. කරුණාරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු (මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) எல்.எம். அபேவிக்ரம)
(The Hon. (Prof.) L.M. Abeywickrama)
ගරු කථානායකතුමනි, කඹුරුපිටිය, ලේනබටුව, "සමන්ති" යන ලිපිනයෙහි පදිංචි ආර්. සුමනදාස මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු සුනිල් බියන්විල මහතා**
(மாண்புமிகு சுனில் பியன்வில)
(The Hon. Sunil Biyanwila)
ගරු කථානායකතුමනි, ගලේවෙල, පට්ටිවෙල, රත්මලගාල, අංක 194/1 යන ලිපිනයෙහි පදිංචි එච්.ජී.ජී. නයනානන්ද මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 1 -28/2024- (1), ගරු හේෂා විතානගේ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 2 -136/2024- (1), ගරු චමින්ද විජේසිරි මහතා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)
ගරු කථානායකතුමනි, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 3 -657/2025- (1), ගරු රෝහණ බණ්ඩාර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

## අනාරක්ෂිත දුම්රිය හරස් මාර්ගවල සේවය කරන තාවකාලික සේවකයින්: ස්ථිර පත්වීම්
### பாதுகாப்பற்ற புகையிரதக் கடவைகளில் சேவையில் ஈடுபட்டுள்ள தற்காலிக ஊழியர்கள்: நிரந்த நியமனம்
### TEMPORARY EMPLOYEES SERVING AT UNGUARDED LEVEL CROSSINGS: PERMANENT APPOINTMENTS

1410/2025

**4. ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති අනාරක්ෂිත දුම්රිය හරස් මාර්ග සංඛ්‍යාව කොපමණද;

(ii) මඩකලපුව දිස්ත්‍රික්කයේ ඇති අනාරක්ෂිත දුම්රිය හරස් මාර්ග සංඛ්‍යාව කොපමණද;

(iii) එම අනාරක්ෂිත දුම්රිය හරස් මාර්ගවල සේවයේ නියුතු ස්ථිර සහ තාවකාලික සේවකයින් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

[ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා]

(iv) තාවකාලික සේවකයින්ට ස්ථිර පත්වීම් ලබා දෙනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையிலுள்ள பாதுகாப்பற்ற புகையிரதக் கடவைகளின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) மட்டக்களப்பு மாவட்டத்திலுள்ள பாதுகாப்பற்ற புகையிரதக் கடவைகளின் எண்ணிக்கை யாது என்பதையும்;

(iii) மேற்படி பாதுகாப்பற்ற புகையிரதக் கடவை களில் சேவையில் ஈடுபட்டுள்ள நிரந்தர மற்றும் தற்காலிக ஊழியர்களின் எண்ணிக்கை வெவ் வேறாக யாது என்பதையும்;

(iv) தற்காலிக ஊழியர்களுக்கு நிரந்தர நியமனங்கள் வழங்கப்படும் திகதி யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Transport, Highways and Urban Development:

(a) Will he inform this House -

(i) the number of unguarded level crossings found in Sri Lanka;

(ii) the number of unguarded level crossings found in the Batticaloa District;

(iii) separately, the number of permanent employees and temporary employees serving at the said unguarded level crossings; and

(iv) the date on which the said temporary employees will be given permanent appointments?

(b) If not, why?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 414කි.

(ii) 37කි.

(iii) ස්ථිර සේවකයන් යොදවා නොමැත.

තාවකාලික සේවකයන් ගණන 51කි.

(iv) මෙම දෙපාර්තමේන්තුවේ අවසරයෙන් තොරව මහජනයා විසින් අනවසරයෙන් භාවිත කරන අනාරක්ෂිත දුම්රිය හරස් මාර්ග සඳහා යොදවා ඇති සේවකයින් දුම්රිය දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලයට අයත් නොවන අතර, එම සේවකයන් ස්ථිර කිරීමේ හැකියාවක් නොමැති බව කාරුණිකව දන්වමි.

(ආ) මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ නියෝජ්‍ය භාණ්ඩාගාර ලේකම්ගේ අංක BD/GPS/13/01/01/2026 හා 2026.01.14 දිනැති ලිපියෙහි සඳහන් උපදෙස් පරිදි 2026 අයවැය යෝජනා අනුව 2026 ජනවාරි මස සිට එම සේවකයින් සඳහා ගෙවීම් කිරීම පමණක් ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව මඟින් සිදු කරන බව කාරුණිකව දන්වමි.

අතීතයේදී මෙම දෙපාර්තමේන්තුවේ පැවැති උග්‍ර සේවක පුරප්පාඩු හේතුවෙන් දෙපාර්තමේන්තු මට්ටමෙන් පාලනය වුවද, ගේට්ටුකරුවන් යොදා නොමැති හරස් මාර්ග සහ මෙම දෙපාර්තමේන්තුවේ අවසරයෙන් තොරව මහ ජනයා විසින් අනවසරයෙන් භාවිත කරන හරස් මාර්ගවලදී සිදු වන අනතුරු ඉහළ යෑම හේතුවෙන් ප්‍රජා පොලිස් සේවාව යටතේ අනාරක්ෂිත දුම්රිය හරස් මාර්ග ආරක්ෂිත කිරීමේ කාර්යය රජය විසින් පොලිස් දෙපාර්තමේන්තුව වෙත පවරා ඇත.

ඒක 2013දී පමණ ගත්තු තීන්දුවක්.

එහිදී අනාරක්ෂිත දුම්රිය හරස් මාර්ග සඳහා තාවකාලික ගේට්ටු ස්ථාපිත කිරීම හා ගේට්ටු ක්‍රියාකරවන්නන් යෙදවීම පොලිස් දෙපාර්තමේන්තුව විසින් සිදු කර ඇති අතර, එම ගේට්ටුකරුවන් බඳවා ගැනීම ස්ථිර රැකියාවක් නොවන ස්වේච්ඡා සේවාවක් යටතේ සිදු කළ යුතු බව පොලිස්පතිවරයාගේ 2013.07.02 දිනැති ලිපිය අනුව තහවුරු වේ.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
බොහොම ස්තුතියි, ගරු අමාත්‍යතුමනි. ඔබතුමා කියපු කාරණය මම පිළිගන්නවා. ඒ ප්‍රදේශයේ විශාල කණ්ඩායමක්,-

வாழைச்சேனையிலிருந்து மட்டக்களப்பு நகரம் வரையான பிரதேசங்களில் ரயில் பாதையைக் கடந்துசெல்லும் பெருமளவான பாதைகளில் பாதுகாப்பற்ற புகையிரதக் கடவைகளே காணப்படுகின்றன. அதை நானும் ஏற்றுக்கொள்கின்றேன். அந்தப் பிரதேசங்களில் கிட்டத்தட்ட 5 கிலோமீற்றர் தூர இடைவெளியில்தான் ரயில் பாதையைக் கடப்பதற்கான பாதுகாப்பான புகையிரதக் கடவைகள் இருக்கின்றன. சாதாரணமாக புகையிரத குறுக்குப் பாதையைப் பயன்படுத்தாமல் ஒரு three-wheelerஇல் கிராமத்துக்குச் செல்வதென்றால், 15 கிலோமீற்றர் சுற்றிவர வேண்டும். இதற்குச் சிறந்ததோர் உதாரணம், கோரளைப்பற்றில் இருக்கின்ற பறங்கியாமடு என்ற இடம். அந்த இடத்திலுள்ள புகையிரத குறுக்குப் பாதை நீண்ட காலமாகப் பயன்படுத்தப்பட்டு வந்தது. அண்மையில் Sri Lanka Railwaysஆல் அந்த இடத்தின் நடுப்பகுதியில் இரும்புத் தூணொன்று போடப்பட்டு போக்குவரத்து செய்வது தடைசெய்யப்பட்டு இருக்கின்றது. இதனால் ரயில் பாதைக்கு மறுபக்கத்தில் இருக்கின்ற மக்களுக்கு அதாவது, கடற்கரையோரமாக இருக்கின்ற மக்களுக்கு அந்த இடத்தை போக்குவரத்துக்காகப் பயன்படுத்த இயலாது. பாதுகாப்பற்ற புகையிரதக் கடவையைப் பயன்படுத்துவதால் accidents நடக்கின்றது என்பதை நானும் ஏற்றுக் கொள்கின்றேன்.

கௌரவ அமைச்சர் அவர்களே, நாங்கள் இதற்கானதொரு தீர்வை எட்ட வேண்டும். ஏனெனில், இது மக்களின் போக்குவரத்துக்குத் தடையாக இருக்கிறது. நீங்கள் குறிப்பிட்டதுபோல, பாதுகாப்பில்லாத ரயில் கடவைகளைப் பராமரிப்பதற்கு கடந்த காலத்தில் பிரஜா பொலிஸ் சேவையிலுள்ளவர்கள் நியமிக்கப்பட்டு இருந்தார்கள். அவர்களில் சிலர் இப்பொழுதும் வேலை செய்கிறார்கள். நான்

நினைக்கின்றேன், அவர்களுக்கு மாதாந்தம் 7,500 ரூபாய் அளவில்தான் சம்பளம் வழங்கப்படுகின்றது என்று. கௌரவ அமைச்சர் அவர்களே, இப்பொழுது 7,500 ரூபாய் மாதந்தச் சம்பளத்தில் வாழ முடியாது என்பது உங்களுக்குத் தெரியும். இதனால் அவர்களில் பலர் இப்போது அந்த வேலையில் இல்லை.

என்னுடைய முதலாவது மேலதிக வினாவைக் கேட்கின்றேன்.

கௌரவ அமைச்சர் அவர்களே, கரையோரப் பிரதேசத்தில் இருக்கின்ற மக்கள், ரயில் பாதையைக் கடக்காமல் தங்களுடைய இடங்களுக்குப் போக முடியாது. ஏனெனில், அவர்களுக்குச் செல்வதற்கு வேறு வழியே இல்லை. அந்த மக்கள் சட்டவிரோதமாக அந்த இடத்தைப் போக்குவரத்துக் காகப் பயன்படுத்துகிறார்கள் என்று சொல்லி, அந்த இடத்தில் தடையை ஏற்படுத்தி இருக்கிறார்கள். அதற்குப் பதிலாக மாற்றுவழிகளை உருவாக்கி அவர்கள் பயணித்தால், இன்னும் அதிகமாக accidents நடக்கலாம். இதற்கு ஏதாவது தீர்வு இருக்கிறதா? எனக் கேட்கின்றேன்.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමාගේ අතුරු ප්‍රශ්නයට පිළිතුර මෙසේයි. අනාරක්ෂිත දුම්රිය හරස් මාර්ගවල සේවයේ නිරත දුම්රිය ගේට්ටුකරුවන්ට ගෙවන දීමනාව පසුගිය අය වැයෙන් රුපියල් 15,000ක් දක්වා වැඩි කරලා දැනට එය ලබා දෙනවා. කලින් රුපියල් 7,500ක දීමනාවක් තමයි ඒ සඳහා තිබුණේ.

මෙහි තිබෙන සමස්ත පින්තූරය කියන්නම්. සමස්ත දුම්රිය මාර්ග පද්ධතියේ දිග කිලෝමීටර 1,700ක් වාගේ ප්‍රමාණයක් වනවා. ඒවා හරහා යන නිල වශයෙන් පිළිගත්තු දුම්රිය හරස් පාරවල් 1,362ක් තිබෙනවා. මේවායෙන් මහජන භාවිතය සඳහා විවෘතව පවතින දුම්රිය හරස් මාර්ග ප්‍රමාණය 1,177යි. 185ක් පෞද්ගලික දුම්රිය හරස් මාර්ග.

ආරක්ෂිත දුම්රිය හරස් මාර්ග ප්‍රමාණය 763යි. ඒ දුම්රිය හරස් මාර්ග 763න් 309කට system එකකින් ආරක්ෂාව දී තිබෙනවා. දුම්රිය හරස් මාර්ග 454කට විදුලි සීනු සහිතව ආරක්ෂාව දී තිබෙනවා. දුම්රිය දෙපාර්තමේන්තුවත් පිළිගන්නා, පොලිස් ආරක්ෂාව සහිත අනතුරු ඇඟවීම් පුවරුවක් මඟින් ආරක්ෂාව සපයා ඇති දුම්රිය හරස් මාර්ග ප්‍රමාණය 414යි. ඒ 414ත් system එකකින් control කරන්න අවශ්‍ය වැඩ කටයුතු කරගෙන යනවා. අපි මේ වසරේ මහව සිට අනුරාධපුරය දක්වා 46ක් හදාගෙන යනවා. තවත් 368ක් ඉතිරි වෙනවා. ගරු කථානායකතුමනි, අපි බලාපොරොත්තු වෙනවා, ඒ දුම්රිය හරස් මාර්ග 368න් 134ක් අත්‍යවශ්‍යයි කියලා හඳුනාගෙන 2027අවුරුද්දේදී ඉතා ඉක්මනින් ඒවායේ කටයුතු අවසන් කරන්න. ඒවායෙන් 100ක කටයුතු ටෙන්ඩර් මඟිනුත්, 34ක කටයුතු දුම්රිය දෙපාර්තමේන්තුව මඟිනුත් අවසන් කරන්න කටයුතු කරනවා, ඒ අවශ්‍ය කරන capacity එක දුම්රිය දෙපාර්තමේන්තුවට නැති නිසා.

ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නය ගත්තොත්, විශේෂයෙන්ම උතුරු පළාතේ දුම්රිය හරහා හරස් මාර්ග වැඩියි. නැඟෙනහිර පළාතේත් යම් ප්‍රමාණයක් තිබෙනවා. විශේෂයෙන්ම යුද්ධය පැවති වකවානුවේ කෝච්චි ගියේ නැති නිසා ජනතාව අවුරුදු 10ක්, 15ක්, 20ක් තිස්සේ කෝච්චි පාර හරහා යන්න පුරුදු වුණා. කෝච්චි එන්නේ නැති නිසා ඒකේ ප්‍රශ්නයක් නැහැ. නමුත්, දැන් කෝච්චි මේ හැම තැනටම යනවා. එතකොට තිබෙන ප්‍රශ්නය මේකයි. කෝච්චි පාර කියන්නේ dedicated track එකක්. ඒක හරහා විශාල වශයෙන් හරස් මාර්ග ආවොත් වෙන්නේ මේකයි. තේරුම් ගන්න උදාහරණයක් කිව්වොත්, expressway එක මැද්දෙන් හැම තැනම හරස් මාර්ග දැම්මාම වෙන දේම තමයි. ගරු මන්ත්‍රීතුමා මට ඊයේ මෙතැනදී කිව්වා, කොළඹ ඉඳලා මඩකලපුවට යන්න කෝච්චිය පැය එකොළහමාරක් ගන්නවා කියලා. ඇත්තටම එහෙම කෝච්චි වැඩක් නැහැ. ඒකට එකම හේතුව මේ ප්‍රශ්නය නොවෙයි. ඒකට හේතුව enginesවල ප්‍රශ්නය සහ අලි මැරෙන නිසා අපි යම් සීමා දාලා තිබීම. නමුත්, ඇත්ත ප්‍රශ්නය තමයි මේ දාන හරස් මාර්ග ප්‍රමාණය වැඩි වුණොත් වෙන්නේ ශීඝ්‍රගාමී දුම්රිය ධාවනය කරන්න බැරි වෙන එක. ඒ නිසා මේ ප්‍රශ්නයේ දෙපැත්තක් තිබෙනවා. ජනතාවට අපහසුතාවකුත් තිබෙනවා. නමුත්, දුම්රිය කියන්නේ විශේෂ සේවයක්.

ගරු කථානායකතුමනි, අපි හැම තැනින්ම දුම්රිය හරස් මාර්ග දැම්මොත් ලංකාවේ slow trains විතරයි යන්න පුළුවන්. එම නිසා ඔබතුමා ඒක අනුමත කරන්නේ නැති වෙයි, ගරු මන්ත්‍රීතුමනි. නමුත්, අපට මෙහෙම දෙයක් කරන්න පුළුවන්. අපි යාපනය දිස්ත්‍රික්කයේත්, වවුනියාවේත් කරපු දෙයක් තිබෙනවා. ඔබතුමන්ලාට අත්‍යවශ්‍යයි කියලා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව තීන්දු කරන ස්ථානවල විස්තර ලබා දුන්නොත් මම දුම්රිය දෙපාර්තමේන්තුවේ ඉහළ නිලධාරීන් එවන්නම්, ඔබතුමන්ලාත් එක්ක field visits යන්න. Field visits ගියාම පාර හරහා කොහොම වෙතත් parallel ඉඩක් තිබෙනවා නම්, ඒ කියන්නේ පාර හරහා යන්න දෙන්න බැරි වුණත් පාරේ සමාන්තරව ඉඩ තිබෙනවා නම්, ඒවා ජනතාවට පාවිච්චි කරන්න අපට ලබා දෙන්න පුළුවන්. එම නිසා මේ කටයුත්ත ස්ථානීය පරීක්ෂණයක් එක්ක කරන්න එකඟ වෙන්න පුළුවන්.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

நன்றி, கௌரவ அமைச்சர் அவர்களே! இந்த விடயத்தில் புகையிரதப் பாதைக்குச் சமாந்தரமாகப் பாதைகளை அமைப்பதென்பது மட்டக்களப்பு மாவட்டத்தைப் பொறுத் தளவில் சாத்தியமாகாது. ஏனென்றால், கடற்கரைப் பிரதேசத்துக்கு இந்த ரயில்பாதையைக் கடந்துதான் போக வேண்டும். நீங்கள் சொன்னதைப்போல, கள விஜயமொன்றை மேற்கொண்டு இது தொடர்பில் ஆராய்ந்து இறுதித் தீர்மானத்தை எடுக்கலாம். ஆனால், இந்தப் புகையிரப் பாதையில் இருக்கின்ற அனைத்துக் கடவைகளும் முக்கியமானவை. இதற்கு மாற்று வழியொன்றை நான் முன்மொழிகின்றேன். Sri Lanka Railways பிரதேச சபையுடன் இணங்கினால், பிரதேச சபை ஊடாக அச்சபை ஊழியர்களை வைத்து ஏதாவது ஓர் ஒழுங்கைச் செய்யலாம். உங்களுடைய ஆலோசனைக்கு நன்றி. மட்டக்களப்புக்கு power set ஒன்றைத் தந்தால் நாங்கள் சந்தோஷப்படுவோம். இதன்மூலம் எங்களுடைய பிரதேசத்தில் புகையிரத சேவையை இன்னும் மேம்படுத்தலாம்.

கௌரவ அமைச்சர் அவர்களே, என்னுடைய இரண்டாவது மேலதிக வினாவைக் கேட்கின்றேன்.

இந்த வினா பிரதான வினாவுடன் நேரடியாகத் தொடர்புபடுவதில்லை. நீங்கள் விரும்பினால் பதிலளிக் கலாம். யாழ். மாவட்டத்துக்குச் செல்லும் ரயில் சேவை தொடர்பில் நேற்றும் உங்களுடன் பேசினேன். இப்பொழுது, வாரத்துக்கு 4 ரயில் சேவைதான் இருக்கின்றது. கடந்த காலத்தில் யாழ்ப்பாணத்துக்கு நாளாந்தம் ஒரு ரயில்சேவை இருந்ததென

[ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා]

நான் நினைக்கின்றேன். கௌரவ அமைச்சர் அவர்களே, வட மாகாணத்தில் இருக்கும் இராணுவம், கடற்படை மற்றும் விமானப் படையைச் சேர்ந்தவர்கள் railway warrantஐப் பயன்படுத்தி - அவர்களுக்கு வருடத்துக்கு 3 railway warrants இருக்கிறது - seats book பண்ணுகிறார்கள். அவர்களில் காங்கேசன்துறை -KKS- இலிருந்து அநுராதபுரம் வருபவர்களும் railway warrantஐப் பயன்படுத்தி seats book பண்ணுகிறார்கள். அவர்கள் அநுராதபுரத்தில் இறங்கி விடுவார்கள். விசேடமாக, நல்லூர் திருவிழா நடைபெறுகின்ற காலப்பகுதியிலும் சரி, ஏனைய காலப்பகுதியிலும் சரி, யாழ்ப்பாணத்துக்கான ரயில் சேவையில் அதிகளவான seats முன்பதிவு செய்யப்பட்டு fullஆகி இருக்கும். இதற்குத் தீர்வாக யாழ்ப்பாணத்துக்கு நாளாந்த சேவை - daily service - ஒன்றை உருவாக்க முடியுமா? warrant ஊடாக seats bookஆகுவதைக் குறைத்து, ஏதாவதொரு percentageஇன் அடிப்படையில் பொதுமக்களும் பயன்படுத்தக்கூடிய வகையில் ஒரு புகையிரத சேவையை வழங்க முடியுமா? எனக் கேட்கின்றேன்.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, නල්ලූර් කෝවිල කියන්නේත්, මඩු පල්ලිය කියන්නේත්, දළදා මාළිගාව කියන්නේත් මේ රටේ පොදු ජනතාවගේ උරුමය. ඒවා බෞද්ධ, හින්දු, කතෝලික, ඉස්ලාම් කියන සියලුදෙනාම බලන්න යා යුතු, වැදගත් ස්ථාන. ඒ නිසා අපිට කියන්න බැහැ ඒවා එක පිරිසකට විතරක් වෙන් විය යුතුයි කියලා.

"දිට්වා" ආපදාවෙන් පස්සේ අපි දුම්රිය මාර්ග සියල්ල ප්‍රතිසංස්කරණය කරද්දී, උතුරු ප්‍රදේශය වෙනුවෙන් උපරිම මහන්සි වුණා. අපි අප්‍රේල් 09වන දා මංගල්‍යය පටන් ගන්න කලින්, විශේෂයෙන්ම අලුත් අවුරුද්දට කලින් උතුරේ මාර්ග සියල්ලම ප්‍රතිසංස්කරණය කළා. දැනට පැයට කිලෝමීටර 100-110 අතර වේගයකින් උතුරේ කෝච්චි ධාවනය කරනවා. සෑම ආගමික උත්සවයක් වෙනුවෙන්ම කරනවා වාගේම අපි උපදෙස් දීලා තිබෙනවා, නල්ලූර් උත්සවය වෙනුවෙනුත් විශේෂ දුම්රිය සේවාවක් ලබා දෙන්න කියලා. නමුත් දුම්රියවල ප්‍රමාණයේ අඩුකම, engines ප්‍රමාණයේ අඩුකම වාගේ ප්‍රශ්න නිසා ජනතාවට එන පීඩනයක් තිබෙනවා. ඒවා විසඳන්න කල් යයි, ගරු මන්ත්‍රීතුමා. නමුත් අපි තිබෙන පහසුකම්වලින් උපරිම සේවාව ලබා දෙන්න උත්සාහ කරනවා.

## ආබාධ සහිත පුද්ගලයන්ගේ නිවාස ගැටලු: විසඳුම්
## மாற்றுத்திறனாளிகள் எதிர்கொள்ளும் வீட்டுப் பிரச்சினை: தீர்வுகள்
## HOUSING PROBLEM OF PERSONS WITH DISABILITIES: SOLUTIONS

1978/2026

**5. ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා**
(மாண்புமிகு சுகத் வசந்த த சில்வா)
(The Hon. Sugath Wasantha de Silva)

නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ආබාධිත තත්ත්වය හේතුවෙන් නිවසක් ඉදිකර ගැනීමට නොහැකි තැනැත්තන් සඳහා ලබාදෙන විසඳුම් කවරේද;

(ii) ඉඩමක් හිමි නමුත් නිවසක් නොමැති ආබාධිත තැනැත්තන් සඳහා නිවාස ගැටලුව නිරාකරණය කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) `එක්ව අත් නොහැර' ප්‍රතිපත්තිය අනුව නිවසක් ලබාදීම සඳහා සලකනු ලබන නිර්ණායක කවරේද;

(ii) එම නිර්ණායක සියලු ආබාධ සහිත ප්‍රජාව අන්තර්ගත වන පරිදි සකස් කර තිබේද;

(iii) රජය විසින් ඉදිකරන නිවාස යෝජනා ක්‍රමවල නිවාසවලින් යම් ප්‍රතිශතයක් ආබාධ සහිත තැනැත්තන්ට වෙන් කිරීමේ ක්‍රමයක් තිබේද;

(iv) නොඑසේ නම්, ඉදිරියේදී එවැනි නිවාස වෙන් කිරීමේ ක්‍රමයක් හඳුන්වා දෙන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

வீடமைப்பு, நிர்மாணிப்பு மற்றும் நீர் வழங்கல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மாற்றுத்திறனாளிகள் வீடொன்றை நிர்மாணித்துக்கொள்வதில் எதிர்கொள்ளும் பிரச்சினைகளுக்கு வழங்கப்படும் தீர்வுகள் யாவை;

(ii) காணியொன்று உள்ளபோதிலும் வீடில்லாத மாற்றுத்திறனாளிகளின் வீட்டுப் பிரச்சினையைத் தீர்ப்பதற்காக மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) 'கைவிடாது ஒன்றுபட்டு' என்ற கொள்கைக்கு அமைவாக வீடொன்றை வழங்குவதற்கு கவனத்திற்கொள்ளப்படும் அளவுகோல்கள் யாவை;

(ii) சகல மாற்றுத்திறனாளிகள் சமுதாயத்தையும் உள்ளடக்கும் வகையில் மேற்படி அளவுகோல் தயாரிக்கப்பட்டுள்ளதா;

(iii) அரசாங்கத்தால் நிர்மாணிக்கப்படும் வீடமைப்புத் திட்ட வீடுகளில் குறிப்பிடத்தக்க சதவீதத்தை மாற்றுத்திறனாளிகளுக்கு ஒதுக்குவதற்கான முறைமையொன்று காணப்படுகின்றதா;

(iv) இன்றேல், அவ்வாறான வீடுகளை ஒதுக்குவதற்கான முறைமையொன்று எதிர்காலத்தில் அறிமுகப்படுத்தப்படுமா;

என்பதையும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Housing, Construction and Water Supply:

(a) Will he inform this House the -

(i) solutions that are provided to persons who are unable to construct a house due to disability; and

(ii) measures that will be taken to resolve the housing problem of persons with disabilities who own a land, but do not have a house?

(b) Will he also inform this House -

(i) the criteria that are considered in providing a house under the policy "Leaving No One Behind";

(ii) whether the said criteria have been formulated to include the entire community with disabilities;

(iii) whether there is a system for allocating a certain percentage of houses to persons with disabilities in the housing schemes constructed by the Government; and

(iv) if not, whether such a system for allocating houses will be introduced in the future?

(c) If not, why?

**ගරු ටී.බී. සරත් මහතා (නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரீ.பி. சரத் - வீடமைப்பு, நிர்மாணிப்பு மற்றும் நீர் வழங்கல் பிரதி அமைச்சர்)
(The Hon. T.B. Sarath - Deputy Minister of Housing, Construction and Water Supply)

ගරු කථානායකතුමනි, නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මඟින් දිළිඳු සහ අඩු ආදායම්ලාභී ප්‍රජාවගේ නිවාස අවශ්‍යතාව වෙනුවෙන් "තමන්ගේ තැනක් - ලස්සන ජීවිතයක්" නිවාස ආධාර වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබයි.

ඊට අමතරව ක්‍රියාත්මක කරන "සෙවණ ආධාර" වැඩසටහන මඟින් ද ආබාධිත තැනැත්තන්ගේ නිවාස ගැටලුවට විසඳුමක් ලබාදීමට ක්‍රියා කරනු ලැබේ. "සෙවණ ආධාර" වැඩසටහන යටතේ ප්‍රතිලාභීන් තෝරා ගැනීමේදී ඉඩමක් හිමි නමුත් නිවාස ණය මුදලක් ලබාගෙන ආපසු ගෙවීමේ හැකියාව නොමැති අදාළ ග්‍රාම නිලධාරි වෙතින් ලබා ගත් අඩු ආදායම් සහතිකය සහිත, විශේෂ අවශ්‍යතා ඇති, සුව නොවන මාරාන්තික ලෙඩ රෝගවලින් හා ශාරීරික දුබලතාවලින් පෙළෙන, පවුලේ ආදායම උපදවන්නා අහිමි, ස්ථිර ආදායම් මාර්ග නොමැති අපේක්ෂා භංගත්වයට පත් වූ සහ සුවිශේෂී දක්ෂතා ඇති නිවසක් ඉදිකර ගැනීමේ සැබෑ අවශ්‍යතාවක් ඇති දිළිඳු පවුල් මෙහිදී දායක කර ගැනීමට අපේක්ෂා කරනු ලැබේ. මේ සඳහා සෙවණ අරමුදලින් ප්‍රතිපාදන වෙන් කරනු ලැබේ. තෝරා ගන්නා ප්‍රතිලාභීන්ට නව නිවසක් ඉදිකිරීමේදී රුපියල් 1,000,000ක් ද, නිවසක් වැඩිදියුණු කිරීම සඳහා රුපියල් 750,000ක ආධාර මුදලක් ද වශයෙන් වෙන් කරනු ලැබේ.

ඉහත වැඩසටහන් සඳහා ප්‍රතිලාභීන් තෝරා ගැනීමේදී ආබාධ සහිත පුද්ගලයින් සිටීම හෝ දිගු කාලීන නිදන්ගත රෝගවලින් පෙළෙන පුද්ගලයින්ගෙන් සමන්විත වීම වැනි, නිවසක් තනා ගැනීමේ අභියෝගයට මුහුණ පා සිටින පවුල්හට ප්‍රමුඛතාවක් හිමි වේ. මෙම වැඩසටහන යටතේ තෝරා ගන්නා ප්‍රතිලාභී පවුලකට උපරිම වශයෙන් රුපියල් 1,000,000ක ආධාරයක් ලබා දෙනු ලබයි. මීට අමතරව, ආබාධිත තැනැත්තකු ජීවත් වන නිවසේ වැසිකිළිය හා නාන කාමරය ඔහුගේ / ඇයගේ දෛනික ජීවිතය පහසු කරන ආකාරයට යෝග්‍ය ප්‍රමිතියෙන් යුත් අංගෝපාංග සහිතව වැසිකිළි 500ක් ඉදිකිරීමේ වැඩසටහනක් බස්නාහිර පළාත තුළ ක්‍රියාත්මක වේ. එක් වැසිකිළියක් සඳහා රුපියල් 1,000,000ක ආධාර මුදලක් ලබාදීමට නියමිතය.

(ii) ඉහත "තමන්ගේ තැනක් - ලස්සන ජීවිතයක්" වැඩසටහන යටතේ එක් පවුලකට රුපියල් 1,000,000 බැගින් නිවාස ඒකක 9,700ක් අලුතින් ඉදිකිරීම සඳහා රුපියල් මිලියන 9,700ක් වෙන් කර ඇත. සෙවණ ආධාර නිවාස වැඩසටහන යටතේ ආධාර නිවාස 295ක් ඉදිකිරීම සඳහා රුපියල් මිලියන 715ක් 2026 වර්ෂය සඳහා වෙන් කර ඇත.

(ආ) (i) "එක්ව අත් නොහැර" ප්‍රතිපත්තිය ජාතික නිවාස සංවර්ධන අධිකාරිය යටතේ ක්‍රියාත්මක වැඩසටහනක් නොවේ.

(ii) අදාළ නොවේ.

(iii) 2006.10.17 වන දින අංක 1467/15 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් නිකුත් කර ඇති නිවේදනය පරිදි 1996 අංක 28 දරන ආබාධ සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ 23 වන වගන්තිය සමඟ කියවිය යුතු 25 වන වගන්තිය යටතේ සමාජ සේවා හා සමාජ සුබසාධන අමාත්‍යවරයා විසින් ඇතුළත් කර ඇති රෙගුලාසි වන 2006 අංක 01 දරන ආබාධිත පුද්ගලයින් (ප්‍රවේශ වීමේ) රෙගුලාසිය අනුව කාර්ය මණ්ඩල නිවාස, බහු නිවාස සහ උස් නේවාසික ඒකක හා කුලී නිවාස ඉදිකිරීමේදී බාධක රහිත විශේෂාංග සහිතව ඉදිකිරීම සඳහා සෑම නිවාස ඒකක 25කටම අවම වශයෙන් ඒකක 01ක් සහ ඉන්පසුව ඉදිවන සෑම නිවාස ඒකක 100කටම අමතර ඒකක 01ක් වෙන් කළ යුතුවේ.

(iv) අදාළ නොවේ.

(ඇ) අදාළ නොවේ.

**ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා**
(மாண்புமிகு சுகத் வசந்த த சில்வா)
(The Hon. Sugath Wasantha de Silva)

ලබා දුන් පිළිතුර වෙනුවෙන් ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාට ස්තුතිවන්ත වෙනවා. ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

බස්නාහිර පළාතේ සිටින ආබාධ සහිත ප්‍රජාවගේ නිවාසවල සනීපාරක්ෂක කටයුතු සඳහා රුපියල් ලක්ෂ 10ක ආධාරයක් දෙන බව ගරු නියෝජ්‍ය ඇමතිතුමා සඳහන් කළා. ඒ අනුව මෙම වැඩසටහනේ වර්තමාන තත්ත්වය පිළිබඳව දැනගන්න කැමැතියි. ඒ වාගේම ඉදිරි වර්ෂයේදී සෙසු පළාත්වලටත් මේ වැඩසටහන දියත් කරන්න පුළුවන්ද කියන එකත් දැනගන්න කැමැතියි. මොකද, ආබාධ සහිත පුද්ගලයෙකුට සනීපාරක්ෂක කටයුතු සඳහා විශේෂ ප්‍රවේශයක් තිබෙන්න ඕනෑ. ඒ ප්‍රවේශය නොමැති වුණොත් තම ආබාධිත තත්ත්වයත් එක්ක එම පුද්ගලයාට තමන්ගේ කෘත්‍යයන් කර ගැනීමේදී විශාල ගැටලුවකට මුහුණ දෙන්න සිදුවෙනවා. විශේෂයෙන්ම රෝද පුටු භාවිත කරන චලන ආබාධිත කණ්ඩායම්වලට සාමාන්‍ය වැසිකිළි-කැසිකිළි පාවිච්චි කරන්න බැහැ. මොකද, ඔවුන් රෝද පුටුවලින් ඒ තුළට යා යුතුයි. ඒ වාගේම ඒ තුළ රෝද පුටුව හසුරුවා ගත යුතුයි. ඒ නිසා වෙනත් අභ්‍යන්තරික ඉදිකිරීම් කෙරෙන්න ඕනෑ. මේ අවුරුද්දේ බස්නාහිර

[ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා]

පළාතට පමණක් දියත්වෙන මේ වැඩසටහන ඉදිරි අවුරුද්දේදී අය වැය ප්‍රතිපාදන යොදා ගනිමින් සෙසු පළාත්වල සිටින ආබාධ සහිත ප්‍රජාවටත් මේ ප්‍රදානය, මේ අනුග්‍රහය ලබා දෙන්න නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යාංශය විධියට ඔබතුමන්ලා කටයුතු කරනවාද කියලා මම දැනගන්න කැමැතියි.

**ගරු ටී.බී. සරත් මහතා**
(மாண்புமிகு ரீ.பி. சரத்)
(The Hon. T.B. Sarath)

ගරු කථානායකතුමනි, නියමු ව්‍යාපෘතියක් විධියට තමයි අපි බස්නාහිර පළාත තෝරාගෙන මෙම ව්‍යාපෘතිය කළේ. බස්නාහිර පළාතට වැසිකිළි 500ක් හදන්න මේ ව්‍යාපෘතිය යටතේ ආධාර වෙන් කරලා තිබෙනවා. මේ වෙනකොට ඉල්ලුම් කර තිබෙන ඉල්ලුම්කරුවන් පිළිබඳව අපි පරීක්ෂණ කරලා, 382ක් තෝරාගෙන තිබෙනවා. මේ නියමු ව්‍යාපෘතිය සාර්ථක වුණොත් ඉදිරියේදී රට පුරාම මේ ව්‍යාපෘතිය ආරම්භ කරන්න රජය බලාපොරොත්තු වෙනවා.

**ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා**
(மாண்புமிகு சுகத் வசந்த த சில்வா)
(The Hon. Sugath Wasantha de Silva)

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමාගේ මේ ප්‍රකාශයත් එක්ක සෙසු පළාත්වල සිටින ආබාධ සහිත ප්‍රජාව තුළත් යම්කිසි උත්තේජනයක්, යම්කිසි හැඟීමක් ඇති වනවා. මොකද ඔවුන් දන්නවා, මේ අවශ්‍යතාවේ බරපතළකම. ඔවුන් දන්නවා, මේ අවශ්‍යතාව ඉෂ්ට කරගන්න යෑමේදී සිදු වන දුෂ්කරතා නිසා ඔවුන් පත්වන අපහසුතාව පිළිබඳව. අපි බලාපොරොත්තු සහගතව ඉන්නවා, සෙසු පළාත්වල සිටින ආබාධ සහිත ප්‍රජාව වෙනුවෙනුත් මේ වැඩ පිළිවෙළ ඉස්සරහට ගෙන යයි කියලා.

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, ඒත් එක්කම මම දැනගන්න කැමැතියි, නිවාස අවශ්‍යතාව තිබෙන ආබාධ සහිත ප්‍රජාව පිළිබඳවත් තොරතුරු රැස් කිරීමේ හැකියාව තිබෙනවාද කියලා. ඒ අනුව අපට පුළුවන්, නිවාස, ඉදිකිරීම් අමාත්‍යාංශයෙන් සපයන මේ ආධාර වැඩ පිළිවෙළ වඩාත් සක්‍රියව සහ ඵලදායීව අනිවාර්යයෙන්ම ආබාධ සහිත ප්‍රජාව අතරට යවන්න. මොකද, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ 2024 වාර්තාවල සඳහන් වනවා, ලංකාවේ ජනගහනයෙන් ලක්ෂ 32කට අධික ප්‍රමාණයකට කායික හෝ මානසික අපහසුතා තිබෙනවා කියලා. ප්‍රතිශතයක් වශයෙන් ගත්තොත්, එය සියයට 16ක පමණ ප්‍රමාණයක්. ඒ අතරින් උග්‍ර ආබාධ තත්ත්වයන් තිබෙන අය ලක්ෂ 7කට අධිකයි. මේ ප්‍රජාව ආමන්ත්‍රණය කරන්න නම්, විද්‍යාත්මකව ප්‍රවේශ වෙන්න නම් මේ පිළිබඳව දත්ත රැස්කිරීමේ අවශ්‍යතාව තිබෙනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඒ සම්බන්ධයෙන් ඔබ අමාත්‍යාංශයේ අවධානය යොමු කරන්න සූදානම්ද කියන කාරණාව මම දැනගන්න කැමැතියි.

**ගරු ටී.බී. සරත් මහතා**
(மாண்புமிகு ரீ.பி. சரத்)
(The Hon. T.B. Sarath)

ගරු කථානායකතුමනි, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් පත් කරන ලද නියෝජිතයෙක් ඉන්නවා. ඒ නියෝජිතයා මඟින් මේ වනකොටත් අපි දිස්ත්‍රික්ක මට්ටමින් එවැනි තොරතුරු එකතු කරනවා. ඒවා දත්ත විධියට ගබඩා කරනවා. ඒ අනුව තමයි අපි ඉදිරියේදී නිවාස ලබා දීමේදී කටයුතු කරන්නේ. ඒ නිසා දැනටමත් අපි ඒ තොරතුරු, දත්ත එකතු කරනවා.

## විශ්‍රාම වැටුප් විෂමතා අවම කිරීම: ක්‍රියාමාර්ග
### ஓய்வூதிய முரண்பாடுகளைக் குறைத்தல்: நடவடிக்கை
### MINIMIZATION OF PENSION ANOMALIES: STEPS TAKEN

1994/2026

**6. ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මේ වන විට ශ්‍රී ලංකාවේ විශ්‍රාම වැටුප් ලබන විශ්‍රාමිකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) රාජ්‍ය සේවයේ වැටුප් සංශෝධන සිදු කරන සෑම අවස්ථාවකදීම විශ්‍රාම වැටුප් විෂමතාව ඉහළ යන බව විශ්‍රාමික සංවිධාන විසින් පෙන්වා දෙන බව දන්නේද;

(iii) එම විෂමතාව අවම කිරීමට වර්තමාන රජය මෙතෙක් ගෙන ඇති සහ ඉදිරියේදී ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இன்றளவில் இலங்கையில் ஓய்வூதியம்பெறும் ஓய்வூதியதாரர்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) அரசாங்க சேவையில் சம்பளத் திருத்தங்களை மேற்கொள்ளும் ஒவ்வொரு சந்தர்ப்பத்திலும் ஓய்வூதிய முரண்பாடுகள் அதிகரிப்பதாக ஓய்வூதிய அமைப்புகள் சுட்டிக்காட்டுவதை அறிவாரா என்பதையும்;

(iii) மேற்படி குறைபாடுகளை குறைத்துக் கொள்வதற்காக தற்போதைய அரசாங்கத்தினால் இதுவரையில் மேற்கொள்ளப்பட்டுள்ள மற்றும் எதிர்காலத்தில் மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Public Administration, Provincial Councils and Local Government:

(a) Will he inform this House -

(i) the number of pensioners in Sri Lanka who are currently receiving pensions;

(ii) whether he is aware that the organizations of pensioners point out that pension anomalies increase whenever the salaries in the Public Service are revised; and

(iii) the measures that have been taken so far and the measures that will be taken by the present Government to minimize the said pension anomalies?

(b) If not, why?

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා (රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன - பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna - Minister of Public Administration, Provincial Councils and Local Government)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 748,215ක් වේ. වැඩිදුර විස්තර ඇමුණුම 01හි සඳහන්ව ඇත.

ඇමුණුම 01 **සභාගත***කරමි.

(ii)
- රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගන්වනු ලබන නිලධරයකු වෙත හිමිගන්වන විශ්‍රාම වැටුප ගණනය කරනු ලබන්නේ ඔහු අවසන් වරට සේවයේ යෙදී සිටි දිනට ලැබූ වැටුප සහ ඒ වන විට ඔහු විසින් සම්පූර්ණ කරන ලද සේවා කාලය මත පදනම්වය.
- නිලධරයා අවසන් වරට සේවයේ යෙදී සිටි දිනය වන විට ලබමින් සිටි වැටුප තීරණය වන්නේ රාජ්‍ය සේවය තුළ එම අවස්ථාව වන විට ක්‍රියාත්මක වන වැටුප් ව්‍යුහය අනුවය. එබැවින් නිලධරයා විශ්‍රාම යෑමෙන් පසුව රාජ්‍ය සේවයට අදාළව සිදු කරනු ලබන වැටුප් සංශෝධන අනුව රාජ්‍ය සේවයේ වැටුප් ව්‍යුහයේ සිදු වන වෙනස්වීම් නිලධරයා ලබමින් සිටින මූලික විශ්‍රාම වැටුප සඳහා බලපෑමක් ඇති නොකරයි.
- කෙසේ වෙතත්, අතීතයේ සිට මේ දක්වා රාජ්‍ය සේවයේ වැටුප් සංශෝධන සිදු කරනු ලබන අවස්ථාවලදී ඊට අනුරූපීව විශ්‍රාමිකයින්ගේ විශ්‍රාම වැටුපද ප්‍රතිශෝධනය කිරීමට එවකට පැවති රජයන් විසින් පහත දක්වා ඇති පරිදි කටයුතු කර ඇත.
  - 1996.12.31 දින හෝ ඊට පෙර විශ්‍රාම ගොස් 2004.01.01 දින වන විට විශ්‍රාම වැටුප් ලබමින් සිටින සියලු විශ්‍රාමිකයින්ගේ විශ්‍රාම වැටුප 1996.12.31 දිනට අදාළ වැටුප මත ප්‍රතිශෝධනය කිරීම හා 2004.01.01 දින සිට ප්‍රතිශෝධිත විශ්‍රාම වැටුප ගෙවීම. (අවුරුදු අටකට පසු)
  - 1997.01.01 දින හෝ ඊට පෙර විශ්‍රාම ගොස් 2006.01.01 දින වන විට විශ්‍රාම වැටුප් ලබමින් සිටින සියලු විශ්‍රාමිකයින්ගේ විශ්‍රාම වැටුප 1997.01.01 දිනට හිමි වැටුප මත ප්‍රතිශෝධනය කිරීම. (අවුරුදු නවයකට පසු)
  - 2006.01.01 දිනට පෙර විශ්‍රාම ගොස් 2015.07.01 දින වන විට විශ්‍රාම වැටුප් ලබමින් සිටින සියලු විශ්‍රාමිකයින්ගේ විශ්‍රාම වැටුප රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 හා 06/2006(iv)හි සඳහන් අදාළ වැටුප් ක්‍රමය අනුව ප්‍රතිශෝධනය කිරීම. (අවුරුදු නවයකට පසු)
  - 2017.01.01 දින හෝ ඊට පෙර විශ්‍රාම ලද සියලු විශ්‍රාමිකයින්ගේ විශ්‍රාම වැටුප රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016හි උපලේඛන IIහි 2017.01.01 දිනට හිමි විය යුතු වැටුප මත ප්‍රතිශෝධනය කිරීම හා 2019.07.01 දින සිට එම ප්‍රතිශෝධිත විශ්‍රාම වැටුප ගෙවීම. (වසර එකහමාරකට පසු)

  මේ විධියට මේ ප්‍රතිශෝධන කරලා තිබෙනවා.
- රාජ්‍ය සේවය සඳහා නව වැටුප් ව්‍යුහයක් හඳුන්වා දෙනු ලබන අවස්ථාවන්හිදී ඒ වන විට විශ්‍රාම ගොස් සිටින සමස්ත විශ්‍රාමිකයින්ගේ විශ්‍රාම වැටුපද එම නව වැටුප් ව්‍යුහයට අනුරූපව ප්‍රතිශෝධනය කිරීමට ඉහත පරිදි අවස්ථා සලසා දී ඇති බැවින් රාජ්‍ය සේවය සඳහා නව වැටුප් ව්‍යුහයක් හඳුන්වා දෙනු ලබන සෑම අවස්ථාවකදීම විශ්‍රාම වැටුප් ලබන සමස්ත විශ්‍රාමිකයින්ගේ විශ්‍රාම වැටුපද එම නව වැටුප් ව්‍යුහය අනුව ප්‍රතිශෝධනය කර දෙන ලෙස ඉල්ලීමට පෙලඹීමක් ඇති වී තිබෙන බව නිරීක්ෂණය කරමි.
- ඒ අනුව, 2025 අය වැය යෝජනා මඟින් රාජ්‍ය සේවය සඳහා නව වැටුප් ව්‍යුහයක් හඳුන්වා දීමෙන් පසුව මේ වන විට විශ්‍රාම වැටුප් ලබමින් සිටින විශ්‍රාමිකයින්ගේ විශ්‍රාම වැටුප ඊට අනුරූපව ප්‍රතිශෝධනයට අවශ්‍ය ප්‍රතිපාදන සලසා දෙන ලෙස ඉල්ලීම් ඉදිරිපත් වීම සිදු වේ.
- එසේ වුවත්, රාජ්‍ය නිලධරයකු විශ්‍රාම යෑමෙන් පසුව රාජ්‍ය සේවයේ සිදු කරනු ලබන වැටුප් ව්‍යුහයේ සංශෝධන, මූලික විශ්‍රාම වැටුප සංශෝධනය සඳහා බලනොපාන බව සඳහන් කරමි.

(iii)
- රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 මඟින් රාජ්‍ය සේවයේ වැටුප් සංශෝධනයට අදාළව විශ්‍රාම වැටුප ප්‍රතිශෝධනය කිරීමට යෝජනා කරන ලද අදියර 5න් අදියර 3ක් මෙම රජය බලයට පත් වන අවස්ථාව වන විට ක්‍රියාත්මක කිරීමට ඉතිරිව තිබිණි.
- ඒ අනුව මේ වන විට විශ්‍රාම වැටුප් ලබන විශ්‍රාමිකයින් අතරින් 2020.01.01 දින හෝ ඊට පෙර විශ්‍රාම ගොස් ඇති සියලු විශ්‍රාමිකයින්ගේ විශ්‍රාම වැටුප රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016හි උපලේඛන IIහි 2020.01.01 දිනට අදාළ වැටුප අනුව ප්‍රතිශෝධනය කිරීමට 2025 අය වැය වැඩසටහන යටතේ රජය විසින් තීරණය කර ඇත.
- මෙය අදියර 03ක් ඔස්සේ ක්‍රියාත්මක වන අතර ඉන් පළමු අදියර එනම්, 2018.01.01 දින හෝ ඊට පෙර විශ්‍රාම ලද සියලු විශ්‍රාමිකයින්ගේ විශ්‍රාම වැටුප රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016හි උපලේඛන IIහි 2018.01.01 දිනට අදාළ වැටුප මත ප්‍රතිශෝධනය කිරීම 2025.07.01 දින සිට ආරම්භ කරන ලද අතර මේ වන විට එම කටයුතු සියයට 95කින් පමණ අවසන් කර ඇත. ලිපිගොනුවල ගැටලුවක් තිබුණා නම් පමණයි යම් ප්‍රමාදයක් තිබෙන්නේ.

---

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා]

- දෙවන අදියර 2026.07.01 දින සිට ක්‍රියාත්මක වන අතර, එහිදී 2019.01.01 දින හෝ ඊට පෙර විශ්‍රාම ලද සියලු විශ්‍රාමිකයින්ගේ විශ්‍රාම වැටුප රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016හි උපලේඛන IIහි 2019.01.01 දිනට හිමිවිය යුතු වැටුප මත ප්‍රතිශෝධනය කිරීමට නියමිතව ඇත. මේ ජූලි 01වැනි දා සිට එය ක්‍රියාත්මකයි.
- තුන්වන අදියර 2027.07.01 දින සිට ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත අතර, එහිදී 2020.01.01 දින හෝ ඊට පෙර විශ්‍රාම ලද සියලු විශ්‍රාමිකයින්ගේ විශ්‍රාම වැටුප රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016හි උපලේඛන IIහි 2020.01.01 දිනට හිමිවිය යුතු වැටුප මත ප්‍රතිශෝධනය කිරීමට නියමිතව ඇත.
- ඒ අනුව 2027.07.01 දින වන විට 2020.01.01 දින හෝ ඊට පෙර විශ්‍රාම ලද සියලු විශ්‍රාමිකයින්ට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016හි උපලේඛන IIහි 2020.01.01 දිනට හිමිවිය යුතු වැටුප මත විශ්‍රාම වැටුප හිමි වනු ඇත.
- 2020.01.01 දිනෙන් පසු 2025.01.01 දින තෙක් විශ්‍රාම ගොස් ඇති සියලු විශ්‍රාමිකයින් - මේ ප්‍රශ්නගත කණ්ඩායම- විශ්‍රාම ගොස් ඇත්තේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 යටතේ රජයේ නිලධාරින් සඳහා ලබා දුන් අදියර 5ක වැටුප් වැඩිවීම් ලබා ගැනීමෙන් පසුවය. ඒ අනුව 2020.01.01 දින සිට 2025.01.01 දින තෙක් විශ්‍රාම ගොස් ඇති සියලු විශ්‍රාමිකයින් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016හි 2020.01.01 දිනට රාජ්‍ය නිලධාරින් සඳහා ලබා දුන් වැටුප් වැඩිවීම් ලබාගෙන ඇති අතර, එතැන් සිට ඔවුන් විශ්‍රාම ලබා ගත් දින දක්වා වන වැටුප් වර්ධකයන්ද, ඊට අනුරූපී වන පරිදි විශ්‍රාම වැටුපද ලබා ගනිමින් සිටී.
- එබැවින් 2025.01.01 දින හෝ ඊට පෙර විශ්‍රාම ලබා ඇති සියලුම විශ්‍රාමිකයින් 2027.07.01 දින වන විට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016හි 2020.01.01 දිනට හිමි වැටුප මත විශ්‍රාම වැටුප් ලබන විශ්‍රාමිකයින් බවට පත් වේ. එබැවින් එම විශ්‍රාමිකයින් අතර විශ්‍රාම වැටුප් විෂමතාවක් නොපවතින බව සඳහන් කරමි.
- ජීවන වියදම ඉහළ යෑම මත විශ්‍රාමිකයින්ට මුහුණ දීමට සිදු වන ආර්ථික ගැටලු සඳහා සහන සැලසීමේදී මූලික විශ්‍රාම වැටුප ප්‍රතිශෝධනය කිරීම වෙනුවට විශ්‍රාමිකයින් වෙත හිමිගන්වනු ලබන ජීවන වියදම් දීමනාව ඉහළ දැමීම හෝ රාජ්‍ය සේවයේ වැටුප් සංශෝධනයට සමගාමීව තීරණය කරනු ලබන ප්‍රතිශතයකින් යුත් වෙනත් විශේෂ දීමනාවක් සමස්ත විශ්‍රාමිකයින් වෙත හිමිගැන්වීම වඩාත් සුදුසු බව නිරීක්ෂණය කරන අතර, ඉදිරියේදී ඒ පිළිබඳව සලකා බැලීමට තීරණය කර ඇත.
- එසේම මේ වනවිට පිහිටුවා ඇති වැටුප් හා විශ්‍රාම වැටුප් කොමිෂන් සභාව මඟින් ඉදිරියේදී තවදුරටත් විෂමතා පවතී නම් එය නිවැරදි කිරීමට කටයුතු කළ හැකි වේ.
- සියලුම විශ්‍රාමිකයන් සඳහා මූලික විශ්‍රාම වැටුපට අමතරව ඇමුණුම 02හි සඳහන් පරිදි දීමනා ගෙවනු ලබන බවද දන්වමි.

  ඇමුණුම 02ට අනුව රුපියල් 14,000කට වැඩි මුදලක් ගෙවනවා.
- එසේම 2020.01.01 දිනට පෙර විශ්‍රාම ලබා ගෙන ඇති විශ්‍රාමිකයන් සඳහා විශ්‍රාම වැටුපට අමතරව දීමනා මුදල් වශයෙන් රුපියල් 14,025ක් ගෙවනු ලබයි. විස්තර ඇමුණුම 02හි දක්වා ඇත.

**ඇමුණුම 02**

2025.01.01 දින හෝ ඊට පෙර සේවයෙන් විශ්‍රාම ගොස් ඇති විශ්‍රාමිකයන් වෙත විශ්‍රාම වැටුපට අමතරව පහත සඳහන් දීමනා හිමිගැන්වීම සිදු කෙරේ.

- ➢ 2022.01.13 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2022 අනුව මාසිකව ගෙවනු ලබන රුපියල් 5,000ක දීමනාව.
- ➢ 2024.01.10 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2024 අනුව මාසිකව ගෙවනු ලබන රුපියල් 6,025ක ජීවන වියදම් දීමනාව.
- ➢ 2024.08.07 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2024 අනුව මාසිකව ගෙවනු ලබන රුපියල් 3,000ක විශේෂ අන්තර්කාලීන දීමනාව.

2025.01.01 දිනෙන් පසු සේවයෙන් විශ්‍රාම ගොස් ඇති විශ්‍රාමිකයන් වෙත විශ්‍රාම වැටුපට අමතරව පහත පරිදි දීමනා හිමිගැන්වීම සිදු කෙරේ.

i. 2025.01.01 දිනෙන් පසුව 2025.03.31 දින තෙක් වූ කාල සීමාව තුළ සේවයෙන් විශ්‍රාම ගොස් ඇති විශ්‍රාමිකයන් වෙත රුපියල් 6,025ක ජීවන වියදම් දීමනාව සමඟ රුපියල් 5,000ක මාසික දීමනාව හා රුපියල් 3,000ක විශේෂ අන්තර්කාලීන දීමනාව 2025.06.30 දින තෙක් පමණක් හිමිගැන්වීම සිදු කරන අතර ඉන්පසුව විශ්‍රාම වැටුප සමඟ මාසික ජීවන වියදම් දීමනාව පමණක් හිමිගන්වනු ලැබේ.

ii. 2025.04.01 දිනෙන් පසුව සේවයෙන් විශ්‍රාම ගනු ලබන විශ්‍රාමිකයන්ට විශ්‍රාම වැටුප් සමඟ රුපියල් 6,025ක මාසික ජීවන වියදම් දීමනාව හිමිගැන්වීම සිදු කෙරේ.

(ආ) අදාළ නොවේ.

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා, සවිස්තරාත්මක පිළිතුරක් ලබා දීම පිළිබඳව. හැබැයි, ගරු ඇමතිතුමනි, ඔබතුමා දීර්ඝ පිළිතුරක් ලබා දුන්නාට එම පිළිතුරේ හරය ගත්තාම එහි පැහැදිලිව කියනවා, 2016 - 2020 දක්වා තිබුණු විෂමතා සඳහා අපි පිළිතුරු ලබා දුන්නත්, 2020 අවුරුද්දේ ඉඳලා මේ දක්වා වැටුප් වැඩිවීම් සිදු වුණාට, ඒ වෙලාවේදී ඇති වෙලා

තිබුණු තත්ත්වය තුළ විශ්‍රාම වැටුප් සම්බන්ධයෙන් විශාල විෂමතාවක් ඇති වෙලා තිබෙනවාය කියන එක. නමුත්, මම අහපු ප්‍රශ්නයට ඔබතුමා පිළිතුරක් ලබා දීලා නැහැ. එම නිසා ඒ ප්‍රශ්නයට මම පිළිතුරක් බලාපොරොත්තු වෙනවා.

විශ්‍රාමිකයා මේ වනකොට ඉතාම අසරණභාවයට පත් වෙලා තිබෙනවා. මොකද, මේ ජ්‍යෙෂ්ඨ පුරවැසියන් ගොඩක් දෙනෙක් වයස අවුරුදු 60න් තමයි විශ්‍රාම ගිහිල්ලා තිබෙන්නේ. මේ අයට තමන්ගේ එදිනෙදා ජීවිතය ගත කිරීමේදී අවශ්‍ය කරන බෙහෙත් ලබා ගැනීම සම්බන්ධයෙන් විශාල වශයෙන් ගැටලු ඇති වෙලා තිබෙනවා. මොකද, එදා තමන් ගත්ත වැටුපත් එක්ක බලනකොට දැන් බෙහෙත් වෙනුවෙන් විශාල මුදලක් ගෙවන්න සිදු වෙලා තිබෙනවා, උද්ධමනය වැඩි වීමත් එක්ක. 2019 අවුරුද්දට සාපේක්ෂව ගත්තොත්, අද වනවිට සෑම භාණ්ඩයකම මිල තුන් හතර ගුණයකින් වැඩි වෙලා තිබෙනවා. බෙහෙත්වල මිලත් ඒ විධියටම වැඩි වෙලා තිබෙනවා. හැම දෙයක්ම එහෙමයි. විශ්‍රාමිකයා අද ජීවත් වෙන්න බැරි තැනකට පත් වෙලා තිබෙනවා. ඒ නිසා ඔබතුමා ඔය කියපු යෝජනාවලදී විශේෂයෙන්ම 2020-2026 කාලයට අදාළ වැටුප් වැඩිවීම තුළ ඇතිවන විශ්‍රාම වැටුප් විෂමතාව සම්බන්ධව ඔබතුමාගෙන් නිසි පිළිතුරක් ලැබුණේ නැහැ. එම නිසා ඒකට පිළිතුරක් මම බලාපොරොත්තු වෙනවා.

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා සඳහන් කරපු කාරණාවල කොටසක් නිවැරදියි, කොටසක් නිවැරදි නැහැ. විශ්‍රාමිකයන්ගේ පමණක් නොවෙයි, සියලුම රාජ්‍ය සේවකයන්ගේ හා සමස්ත පුරවැසියන්ගේ ජීවන වියදම වැඩි වෙලා තිබෙනවාය කියන එක අපි පක්ෂ, විපක්ෂ භේදයකින් තොරව පිළිගන්නා කාරණයක්. මම කලින් සඳහන් කළා වාගේම, පෙර වර්ෂවලදී විශ්‍රාම ගිය විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප සංශෝධනය කිරීම් සිදු වීමේදී අවසාන අවස්ථාවේ හැර ඊට පෙර හැම අවස්ථාවකදීම අවුරුදු 8කට වැඩි කාලයක් ගත වෙලා තමයි සංශෝධනයක් සිද්ධ වෙලා තිබෙන්නේ.

අපි දන්නවා, මෑත කාලීනව අවස්ථා දෙකකදී වැටුප් වැඩිවීම් සිද්ධ වුණු බව. 2025 අවුරුද්දේ වැටුප් වැඩිවීමක් සිද්ධ වුණා. ඊට පෙර 2020 අවුරුද්දේ වැටුප් වැඩිවීමක් සිද්ධ වුණා. එතකොට, 2020 අවුරුද්දේ වැටුප් වැඩිවීමට අනුකූලව තමයි 2020 සිට 2025 දක්වා විශ්‍රාම ගිය රාජ්‍ය සේවකයන්ගේ විශ්‍රාම වැටුප ගළපා හදන්නේ. 2025 ජනවාරි 01වැනි දායින් පසු විශ්‍රාම යන රාජ්‍ය සේවකයන්ට 2025 අවුරුද්දේ සිට වැඩි වුණු වැටුපට අනුව තමයි විශ්‍රාම වැටුප සකස් වෙන්නේ. ඒ නිසා පැහැදිලිවම 2016 අවුරුද්දෙන් පසු විශ්‍රාම ගිහින් හිටපු විශ්‍රාමික කණ්ඩායම් දෙකකට අවස්ථා දෙකකදී විශ්‍රාම වැටුප වැඩි කරලා තිබුණා. ඉතුරු කණ්ඩායම් තුනට විශ්‍රාම වැටුප් වැඩි කිරීම සඳහා අපි මේ වනවිටත් කටයුතු කර තිබෙනවා. මේ 2020-2024 කණ්ඩායම සම්බන්ධයෙන් තිබෙන ප්‍රශ්නය පිළිබඳව අපට පැහැදිලි අවබෝධයක් තිබෙනවා. ඉදිරියේදී ඒ කණ්ඩායම්වලට අදාළ ගැටලු නිරාකරණය කිරීම සඳහා අපි කටයුතු කරනවා.

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)

ගරු කථානායකතුමනි, මම දෙවැනි අතුරු ප්‍රශ්නය හැටියට ගරු ඇමතිතුමාට කාරණා දෙකක් ඉදිරිපත් කරනවා. පළමුවන කාරණය මෙයයි. විශ්‍රාමිකයන් වෙනුවෙන් අග්‍රහාර රක්ෂණය ලබා දෙනවා කියන එක ඔබතුමන්ලාගේ මැතිවරණ පොරොන්දුවල දිගින් දිගටම කියපු කාරණාවක්. හැබැයි, 2016 අවුරුද්දට පසු විශ්‍රාම ගිය අයට තමයි දැනට ඒ අග්‍රහාර රක්ෂණය ලබා දීම සඳහා අවශ්‍ය පියවර ගනිමින් යන්නේ. නමුත්, 2016ට පෙර විශ්‍රාම ගිය අයට මේ රක්ෂණය ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ලබා දෙන්න පුළුවන් පිළිතුර මොකක්ද?

දෙවැනි කාරණය මේකයි. ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ තැන්පතු සඳහා ලබා දුන් පොලී අනුපාතය ජනවාරි මාසයේ ඉඳලා ඉවත් කර තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, එක ප්‍රශ්නයක් අහන්න.

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)

එකම කාරණයක් ගැන තමයි මම අහන්නේ, මේ විශ්‍රාමිකයන් සම්බන්ධව. මට ඒ ගැන කියන්න තත්පර කීපයක් දෙන්න, ගරු කථානායකතුමනි. ගොඩක් අය විශ්‍රාම ගියාට පසු තමන්ගේ මුදල් බැංකුවේ දාලා තමයි එදිනෙදා කටයුතු කරගෙන ගියේ. ජනවාරි මාසයේ ඉඳලා මේ පොලී අනුපාතය ඉවත් කිරීම නිසා ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට විශාල හානියක් සිද්ධ වෙලා තිබෙනවා. දැන් මේ ගෙවෙන්නේ මේ අවුරුද්දේ 7වන මාසය. මේ දක්වා ඒ වෙනුවෙන් කිසිම පියවරක් රජයෙන් අරගෙන නැහැ. බැංකුවලින් ලැබුණු පොලියෙන් ජීවත් වුණු අයට දැන් එම මුදල ලැබෙන්නේ නැති තත්ත්වයක් තිබෙනවා. එම නිසා ඒ අය විශාල අසරණභාවයකට පත් වෙලා ඉන්නවා. එක පැත්තකින් උද්ධමනය වැඩි වෙලා තිබෙනවා. ඒ වාගේම බෙහෙත් මිල වැඩි වෙලා තිබෙනවා. ජීවත් වෙන්න බැරි තැනකට ඔවුන් පත් වෙලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් ඔබතුමා ලබා දෙන පිළිතුර මොකක්ද?

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ මූලික ප්‍රශ්නයෙන් පරිබාහිර කාරණා දෙකක් තමයි දෙවැනි අතුරු ප්‍රශ්නය හැටියට එතුමා ඉදිරිපත් කළේ. එම නිසා ඒ පිළිබඳව මම දැනට තොරතුරු ලබාගෙන නැහැ. එතුමා ඒ කරුණු වෙනම ප්‍රශ්නයක් හැටියට ඉදිරිපත් කළොත් මට ඒ සම්බන්ධයෙන් තොරතුරු ලබා දෙන්න පුළුවන්.

## කොළඹ දිස්ත්‍රික්කයේ ජල සැපයුම: පාරිභෝගිකයින් මුහුණ දෙන දුෂ්කරතා

கொழும்பு மாவட்டத்தில் குடிநீர் விநியோகம்: பாவனையாளர்கள் எதிர்கொள்ளும் சிரமங்கள்

SUPPLY OF WATER TO COLOMBO DISTRICT: DIFFICULTIES FACED BY CONSUMERS

2012/2026

7. **ගරු දේවානන්ද සුරවීර මහතා**
(மாண்புமிகு தேவானந்த சுரவீர)
(The Hon. Dewananda Suraweera)

නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කොළඹ දිස්ත්‍රික්කය තුළ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මඟින් ජලය පරිභෝජනයට ගන්නා ලියාපදිංචි පාරිභෝගිකයන් සංඛ්‍යාව කොපමණද;

[ගරු දේවානන්ද සුරවීර මහතා]

(ii) එම ජනතාව සඳහා අවශ්‍ය වන සමස්ත ජල ධාරිතාව කොපමණද;

(iii) දිස්ත්‍රික්කය තුළ නව ජල සම්බන්ධතා සඳහා දෛනිකව ඉදිරිපත් වන අයදුම්පත් සංඛ්‍යාවේ සාමාන්‍යය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ආ) (i) දිස්ත්‍රික්කයේ ඇතැම් ප්‍රදේශවල ජල පීඩනය අවම වීම හේතුවෙන් දෛනිකව ප්‍රමාණවත් ජලය නොලැබීමෙන් අපහසුතාවට පත් වන ප්‍රජාවක් සිටින බව දන්නේද;

(ii) එසේ නම්, එම ප්‍රදේශවලට නිසි පීඩන යටතේ ජලය සැපයීමට පියවර ගන්නේද;

(iii) රුක්මල්ගම පිහිටි ජල ටැංකිය 1985 වර්ෂයේ ඉදිකරන ලද විශාල ජල ධාරිතාවක් ගබඩා කළ හැකි ටැංකියක් වුවද, මේ වනවිට එය අක්‍රිය තත්ත්වයේ පවතින බව දන්නේද;

(iv) රුක්මල්ගම නිවාස ඒකක 501කින් සමන්විත නිවාස ව්‍යාපෘතියේ ජල පාරිභෝගිකයන්ගේ බහුතරයක් සහ විජයපුර ප්‍රදේශයේ පවුල් රාශියක් මේ හේතුවෙන් පීඩා විඳින බව දන්නේද;

(v) එම ජල ටැංකිය යථා තත්ත්වයට පත් කිරීමට නොහැකි වීමට හේතු කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

வீடமைப்பு, நிர்மாணிப்பு மற்றும் நீர் வழங்கல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கொழும்பு மாவட்டத்தில் தேசிய நீர் வழங்கல் மற்றும் வடிகாலமைப்பு சபைமூலம் பாவனைக்கு நீரைப் பெறுகின்ற பதிவுசெய்யப்பட்ட பாவனையாளர்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) அம்மக்களுக்குத் தேவையான மொத்த நீரின் கொள்ளளவு யாது என்பதையும்;

(iii) மாவட்டத்தில் நாளாந்தம் புதிய நீர் இணைப்புகளைப் பெற்றுக்கொள்வதற்காகச் சமர்ப்பிக்கப்படும் விண்ணப்பப்படிவங்களின் எண்ணிக்கையின் சராசரி யாது என்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) மாவட்டத்தின் சில பிரதேசங்களில், நீரின் அழுத்தம் குறைவாகக் காணப்படுவதால் நாளாந்தம் போதியளவு நீர் கிடைக்கப்பெறாமல் அவதியுறும் மக்களும் உள்ளனர் என்பதை அவர் அறிவாரா என்பதையும்;

(ii) ஆமெனில், அப்பிரதேசங்களுக்கு உரிய அழுத்தத்துடன் நீரை விநியோகிப்பதற்கான நடவடிக்கைகள் மேற்கொள்ளப்படுமா என்பதையும்;

(iii) 1 9 8 5ஆம் ஆண்டு நிர்மாணிக்கப்பட்ட ருக்மல்கமவில் அமைந்துள்ள நீர்த்தாங்கி, அதிகளவான நீரைச் சேமிக்கக்கூடிய தாங்கி என்றபோதிலும், தற்போது அத்தாங்கி பயன்படுத்தப்படாத நிலையில் காணப்படுவதை அவர் அறிவாரா என்பதையும்;

(iv) ருக்மல்கம, 501 வீட்டலகுகளைக் கொண்ட வீடமைப்புத் திட்டத்தில் வாழும் நீர் பாவனையாளர்களில் பெரும்பாலானோரும், விஜயபுர பிரதேசத்தில் வாழும் பல குடும்பங்களும் இதன் காரணமாகப் பாதிக்கப்பட்டுள்ளதை அவர் அறிவாரா என்பதையும்;

(v) இந்நீர்த்தாங்கியைப் பயன்படுத்தக்கூடிய நிலைக்குக் கொண்டுவர முடியாமல் போனமைக்கான காரணங்கள் யாவை என்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Housing, Construction and Water Supply:

(a) Will he state the -

(i) number of registered consumers who obtain water supplied by the National Water Supply and Drainage Board in the Colombo District;

(ii) total volume of water that is required for the said consumers; and

(iii) average number of applications that are received daily for new water connections in the district?

(b) Will he also state -

(i) whether he is aware that there are consumers in certain areas of the district who are experiencing inconveniences due to insufficient supply of water caused by low water pressure every day;

(ii) if so, whether steps will be taken to supply water at adequate pressure to the said areas;

(iii) whether he is aware that the water tank at Rukmalgama, although constructed in 1985 with a large storage capacity, is currently in a non-functional condition;

(iv) whether he is aware that the majority of the water consumers in the Rukmalgama Housing Project, which consists of 501 housing units, and many families in the Vijayapura area are suffering hardships due to the said reason; and

(v) the reasons for the inability to restore the said water tank?

(c) If not, why?

**ගරු ටී.බී. සරත් මහතා**
(மாண்புமிகு ரீ.பி. சரத்)
(The Hon. T.B. Sarath)

ගරු කථානායකතුමනි, නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) 722,937කි.

(ii) 790,000m³ක් එක දිනයකට නිෂ්පාදනය කර බෙදා හරිනවා.

(iii) 55ක් පමණ.

(ආ) (i) ඔව්.

(ii) ඔව්. ඒ සඳහා දීර්ඝ කාලීන හා කෙටි කාලීන විසඳුම් හඳුනා ගෙන ඇත.

(iii) ඔව්.

(iv) ජල පාරිභෝගිකයන්ගේ බහුතරයක් සහ විජයපුර ප්‍රදේශයේ පවුල් රාශියක් මේ සම්බන්ධයෙන් පීඩා විඳින බව දන්නා අතර, එම පීඩාවට හේතුව මෙම අත්හැර දමන ලද ජල ටැංකිය නොවන බව දන්වා සිටිමි.

(v) දැනට මෙම ප්‍රදේශවලට සපයනු ලබන ජලය, පන්නිපිටිය ජල ටැංකිය මඟින් සපයන අතර එමඟින් වැඩි පීඩන තත්ත්වයක් යටතේ වැඩි ජල පාරිභෝගික වපසරියක් වෙත ජලය සපයනු ලැබේ.

අතුරුගිරිය ප්‍රදේශය වෙත 4,500m$^3$ක ධාරිතාවකින් ජලය සපයනු ලබන Chico Plant ජල සැපයුම් පද්ධතිය 12,000m$^3$ක් දක්වා වැඩිදියුණු කිරීමේ ප්‍රසම්පාදන කටයුතු ඉදිරියේදී ආරම්භ කිරීමට නියමිතව ඇති අතර, ඒ අනුව පද්ධතියේ වැඩිදියුණු කිරීමේ කටයුතු ඉදිරි අවුරුදු එකහමාරක කාලයක් තුළ නිම කිරීමට හැකියාව ලැබේ.

එම නිසා ඉන් ලැබෙන අමතර ජල ධාරිතාව පන්නිපිටිය දක්වා සම්ප්‍රේෂණය කිරීමේ හැකියාව ලැබේ.

එමෙන්ම අඹතලේ ජල පවිත්‍රාගාරය මඟින් දෛනිකව සිදු කරනු ලබන නිෂ්පාදන ධාරිතාව 50,000m$^3$කින් ඉහළ නැංවීමේ ADB ආධාර මත ක්‍රියාත්මක වන ව්‍යාපෘතියේ ප්‍රසම්පාදන කටයුතු මේ වනවිට ආරම්භ කර ඇති අතර, එම ව්‍යාපෘතිය මඟින් කෝට්ටේ හා මහරගම ප්‍රදේශය වෙත වැඩි ජල ධාරිතාවකින් ජලය සැපයීම සිදු වේ.

ඒ අනුව, ලබුගම-කලටුවාව මඟින් මහරගම ප්‍රදේශය වෙත N 33 සම්ප්‍රේෂණ නළ මාර්ගය ඔස්සේ ලැබෙන වැඩි ජල ප්‍රමාණය, පන්නිපිටිය වෙත ලබා දීමේ හැකියාව ලැබේ.

මීට අමතරව ලබුගම-කලටුවාව පිරිපහදුව මඟින් ජලය සපයන මිලි මීටර් 1,000ක විෂ්කම්භයකින් යුත් බෙදා හැරීමේ සම්ප්‍රේෂණ නළ මාර්ගය මේ වන විට මීගොඩ හන්දිය දක්වා පමණක් ක්‍රියාත්මක වන අතර, එම බෙදා හැරීමේ නළ පද්ධතිය පන්නිපිටිය දක්වා දීර්ඝ කිරීමට අවශ්‍ය කටයුතු සැලසුම් කර ඇත.

එබැවින්, ඉහත සඳහන් කර ඇති වැඩිදියුණු කිරීම්වලින් අනතුරුව දෛනික ජල සැපයුම් ධාරිතාව වැඩි කර ගැනීමට හැකියාව ලැබෙන අතර, දැනට අත්හැර දමා ඇති ජල ටැංකිය පිළිසකර කර භාවිතයට ගැනීමට හැකියාව ලැබේ.

(ඇ) අදාළ නැත.

**ගරු දේවානන්ද සුරවීර මහතා**
(மாண்புமிகு தேவானந்த சுரவீர)
(The Hon. Dewananda Suraweera)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට උත්තර ලබා දීම පිළිබඳව ගරු නියෝජ්‍ය ඇමතිතුමාට මා ස්තුතිවන්ත වනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට ඉදිරිපත් කරන මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

කොළඹ දිස්ත්‍රික්කයේ ජනතාව පසුගිය කාලය පුරා පොදුවේ මුහුණ දුන් බරපතළ ප්‍රශ්නයක් තමයි ඔබතුමා වෙත මා යොමු කරන්නේ. අද වනකොට ඔබතුමන්ලාගේ විශේෂ මැදිහත් වීම මත සම්පූර්ණ වශයෙන් නොවුණත්, යම් යම් ආකාරයෙන් මේ ප්‍රශ්නයට උත්තරයක් හම්බ වෙලා තිබෙනවා. හැබැයි, මා විශ්වාස කරනවා ඒක සැබෑ උත්තරය නොවෙයි කියලා. මොකද, කෝට්ටේ ජල කරාමය වුවටක් අඩු කරලා මහරගම ප්‍රදේශයට දෙනවා. මහරගම ජල කරාමය වුවටක් අඩු කරලා කඩුවෙලට දෙනවා. කඩුවෙල ජල කරාමය වුවටක් අඩු කරලා තව තැනකට දෙනවා. ඒ විධියට මේක චක්‍රයක් විධියට යනවා. මේ අනුව කොළඹ ජීවත් වන ජනතාවට අවශ්‍ය කරන ජල පරිභෝජනය පිළිබඳව බරපතළ ප්‍රශ්නයක් තිබෙන බව පෙනෙනවා. මම විශ්වාස කරනවා, ඔබතුමන්ලා මේ වනකොට එම ප්‍රශ්නයට දීර්ඝ කාලීන උත්තරයක් හොයමින් ඉන්නවා කියලා. දැනට ඇත්තටම පුරෝකථනය වුණු ජනගහනයට වඩා වැඩි ප්‍රමාණයක් කොළඹ දිස්ත්‍රික්කය තුළ ජීවත් වනවා. ස්ථිර පදිංචිකරුවන් නොවන අයත් එක්ක ලක්ෂ 55ක්, 60ක් විතර ජීවත් වනවා.

ජලය කියන්නේ, මූලික අවශ්‍යතාවක්. මේ දැවෙන ප්‍රශ්නයට ඔබතුමන්ලා ක්ෂණිකව මැදිහත් වෙයි කියලා මා විශ්වාස කරනවා. මේ සම්බන්ධව ඉදිරි ක්‍රියාමාර්ග විධියට ක්‍රියාත්මක කිරීමට තිබෙන යෝජනා මොනවාද කියලා මා දැන ගන්න කැමැතියි.

**ගරු ටී.බී. සරත් මහතා**
(மாண்புமிகு ரீ.பி. சரத்)
(The Hon. T.B. Sarath)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා ඇහුවේ සාධාරණ ප්‍රශ්නයක්. නිෂ්පාදනය කරන ජල ප්‍රමාණයට වඩා වැඩි ප්‍රමාණයක් පසුගිය කාලයේ කොළඹ දිස්ත්‍රික්කය පුරාම සිටින පාරිභෝගිකයන්ගේ ඉල්ලීම මත ලබා දීලා තිබෙනවා. ඒ ප්‍රමාණයට ජලය සම්ප්‍රේෂණාගාරවල නිෂ්පාදනය වෙන්නේ නැහැ. ඒ ප්‍රශ්නය කොළඹ දිස්ත්‍රික්කය පුරාවටම තිබෙනවා. ඒ නිසා කොළඹ දිස්ත්‍රික්කයේ වියළි කාලගුණය වැඩි වන මාසවල ජලය ලබා දීමේ සහ ජල ධාරිතා වේගය පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා, කොළඹ දිස්ත්‍රික්කය පුරාම. ඒ සඳහා අපි කැලණි ගඟ, කලටුවාව සහ අඹතලේ ජල පවිත්‍රාගාරවලට අමතරව ජල පවිත්‍රාගාර ඉදිරියේදී ආරම්භ කරන්න කටයුතු කරමින් තිබෙනවා. ඒක සම්පූර්ණ වුණු ගමන් ඉදිරි අවුරුදු එකහමාර වාගේ කාලසීමාව තුළ අපට කොළඹ දිස්ත්‍රික්කය පුරාවට පැන නැඟිලා තිබෙන ප්‍රශ්නයට උත්තරයක් සපයන්න පුළුවන්. ඒ සඳහා අපි මැදිහත් වෙලා තිබෙනවා, ඒ සඳහා මුදල් වෙන් කර තිබෙනවා. දැනටමත් අදාළ ටෙන්ඩර් කටයුතු පවා අවසන් වෙලා තිබෙන්නේ. ඒ නිසා අපට හිතෙනවා, ඉදිරි අවුරුදු එකහමාර වාගේ කාලසීමාව තුළ මේ ප්‍රශ්නයට අදාළව සාර්ථක විසඳුමක් ලබා දෙන්න පුළුවන් කියලා.

**ගරු දේවානන්ද සුරවීර මහතා**
(மாண்புமிகு தேவானந்த சுரவீர)
(The Hon. Dewananda Suraweera)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මගේ දෙවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි. එය ඔබතුමාගේ උත්තරය එක්ක සම්බන්ධ වනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, උදාහරණයක් විධියට රුක්මලේ ජල ටැංකිය 1985දී විතර ගොඩ නඟන්නේ විශාල කලාපයක් ආවරණය වන ක්‍රියාවලියක් විධියටයි. හැබැයි, මේ වනකොට ඒ ජල ටැංකිය අවට භූමිය පවා එක එක දේශපාලන හිතවතුන් බෙදා ගෙන අනෙක් පැත්තෙන් ඒ ජල ටැංකියට අදාළ කරන යන්ත්‍ර උපකරණ පවා ගලවාගෙන ගිය වටපිටාවක් තිබෙන්නේ. නමුත්, ඔබතුමා දුන් උත්තරය තුළ තිබෙන්නේ එහෙම එකක් නොවෙයි. ඒ නිසා මේක පිළිබඳ විශේෂ අවධානයක් යොමු කළ යුතුම වනවා. මොකද, විශාල මුදල් ප්‍රමාණයක් වැය කරලා ගොඩ නඟපු, ඇත්තටම ඒ ප්‍රදේශවල ජීවත් වන මිනිසුන්ට සැබෑ උත්තරයක්

[ගරු දේවානන්ද සුරවීර මහතා]

ලැබුණු වැඩ පිළිවෙළක් විධියට තමයි ඔය ජල ටැංකිය දකින්නේ. එතකොට ඒක වහලා දමනවා නම්, ඒක ක්‍රියාත්මක නොකරන්නේ මන්ද කියන කාරණාව මට ප්‍රශ්නයක් විධියට තිබෙනවා.

ඊළඟට දෙවෙනි කාරණාවත් ඒකටම අදාළයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, විශාල apartments ප්‍රමාණයක් ගොඩ නැඟෙමින් තිබෙනවා, කොළඹ දිස්ත්‍රික්කය පුරා. ඒක විසින් ජල අර්බුදයක් හදනවා. ඒ apartments ගොඩ නඟන අදාළ අයිතිකරුවන්ට, ඔබතුමන්ලාගේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙන් අනුමැතිය දෙන්න කලින්, මේ තිබෙන තත්ත්වයන් පිළිබඳ පූරෝකථනයක් කරලා ඒ අවසරය ලබා දෙන්න බැරිද?

**ගරු ටී.බී. සරත් මහතා**
(மாண்புமிகு ரீ.பி. சரத்)
(The Hon. T.B. Sarath)
ඒක කරන්න පුළුවන්, ගරු මන්ත්‍රීතුමා. ඒ වාගේම, ඔබතුමා සඳහන් කළ ජල ටැංකිය ගැන කිව්වොත්, දැනට අපි සපයන ජල ප්‍රමාණයත් එක්ක පවතින නළ පද්ධතිය මඟින් එම ජල ටැංකියට ප්‍රමාණවත් ජල ප්‍රමාණයක් ගෙනෙන්නට බැහැ. ඒ නිසා තමයි ඒක නතර කරලා තිබෙන්නේ. නමුත්, ජලය ඝන මීටර් 1,000ක සැපයුමක් කළ හැකි පරිදි නළයේ විෂ්කම්භය පුළුල් කිරීමට ඉදිරියේදී අපේ සූදානමක් තිබෙනවා. ඒ සඳහා අපි සැලසුම් කරමින් ඉන්නවා. ඒ සැලැස්ම සාර්ථක වෙනකොට මෙම ජල ටැංකිය නැවත පරිහරණය කරන්න පුළුවන්. එතකොට නැවත ජලය පුරවන්න පටන් ගන්න පුළුවන්කම ලැබෙනවා. ඒ වාගේම එතැන තිබෙන දූෂණ සහ වංචා පිළිබඳව ඔබතුමා කරපු පැහැදිලි කිරීම් සම්බන්ධයෙන් පරීක්ෂණයක් කරන්නත් කටයුතු කරනවා.

## ජනතා වතු සංවර්ධන මණ්ඩලය සතු ඉඩම්: විස්තර
## மக்கள் தோட்ட அபிவிருத்திச் சபைக்குச் சொந்தமான காணிகள்: விபரம்
## LANDS BELONGING TO JANATHA ESTATE DEVELOPMENT BOARD: DETAILS

2038/2026

**8. ගරු සුජීව දිසානායක මහතා**
(மாண்புமிகு சுஜீவ திசாநாயக்க)
(The Hon. Sujeewa Dissanayake)
වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ජනතා වතු සංවර්ධන මණ්ඩලය ආරම්භ කළ වර්ෂය කවරේද;

(ii) මේ වනවිට එම මණ්ඩලයට අයත් මුළු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) මණ්ඩලයට අයත් ඉඩම් මහනුවර දිස්ත්‍රික්කය තුළ පිහිටා තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) හන්තාන රක්ෂිතය තුළ ඇති මණ්ඩලය සතු මුළු ඉඩම් ප්‍රමාණය අක්කරවලින් කොපමණද;

(ii) එම රක්ෂිතය තුළ උකුවෙල වත්ත නමින් ඉඩමක් පිහිටා තිබේද;

(iii) බලංගොඩ ප්‍රදේශයේ ඉඩමක් වෙනුවෙන් හන්තාන රක්ෂිතයේ පිහිටි එම ඉඩම පවරාදීමක් සිදුකර තිබේද;

(iv) එසේ නම්, එම ඉඩමේ වර්තමාන හිමිකරු කවුරුන්ද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மக்கள் தோட்ட அபிவிருத்திச் சபை ஆரம்பிக்கப் பட்ட வருடம் யாது என்பதையும்;

(ii) தற்பொழுது மேற்படி சபைக்குச் சொந்தமாக வுள்ள மொத்தக் காணியின் அளவு எவ்வளவு என்பதையும்;

(iii) மேற்படி சபைக்குச் சொந்தமான காணிகள் கண்டி மாவட்டத்தில் அமைந்துள்ளனவா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) ஹந்தானை ஒதுக்கத்தில் காணப்படும் மேற்படி சபைக்குரிய மொத்தக் காணியின் அளவு ஏக்கரில் எவ்வளவு என்பதையும்;

(ii) மேற்படி ஒதுக்கத்தில் 'உக்குவெல வத்த' என்ற பெயரில் காணியொன்று உள்ளதா என்பதையும்;

(iii) பலாங்கொடை பிரதேசத்திலுள்ள காணி ஒன்றுக் காக ஹந்தானை ஒதுக்கத்தில் அமைந்துள்ள மேற்படி காணியின் உரிமை மாற்றம் செய்யப்பட்டுள்ளதா என்பதையும்;

(iv) ஆமெனில், மேற்படி காணியின் தற்போதைய உரிமையாளர் யார் என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Plantation and Community Infrastructure:

(a) Will he inform this House -

(i) the year in which the Janatha Estate Development Board was established;

(ii) the total extent of lands owned by the Board at present; and

(iii) whether lands owned by the Board are located in the Kandy District?

(b) Will he also inform this House -

(i) the total extent of lands owned by the Board in the Hanthana Forest Reserve in acres;

(ii) whether there is a land called Ukuwela Watta located in the said forest reserve;

(iii) whether the said land located in the Hanthana Forest Reserve has been transferred in exchange for a land in the Balangoda area; and

(iv) if so, the current owner of that land?

(c) If not, why?

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ජනතා වතු සංවර්ධන මණ්ඩලය 1972 අංක 11 දරන රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා පනත යටතේ 1976 පෙබරවාරි මස 06වන දින නිකුත් කරන ලද 199/1 M දරන ගැසට් පත්‍රය මඟින් 1976 වර්ෂයේ පිහිටුවා ඇත.

(ii) ජනතා වතු සංවර්ධන මණ්ඩලය සතුව ඉඩම් හෙක්ටෙයාර 142,572.67ක් පවතී. එම ඉඩම් ප්‍රමාණයෙන් හෙක්ටෙයාර 122,367.86ක් ප්‍රාදේශීය වැවිලි සමාගම් වෙත පවරා දී ඇති අතර, හෙක්ටෙයාර 12,756.52ක් ජනතා වතු සංවර්ධන මණ්ඩලය විසින් සෘජුව පාලනය කරනු ලබයි. තවද, හෙක්ටෙයාර 1,867.36ක ඉඩම් ප්‍රමාණයක් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් නැවත පවරාගෙන ඇත. ඉතිරි ඉඩම් ප්‍රමාණය වෙනත් පාර්ශ්ව වෙත බදු පදනම මත ලබා දීම, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ පාලනය යටතට පවරා දීම, රජය විසින් අත් පත් කර ගැනීම ඇතුළු විවිධ කාර්යයන් සඳහා යොදාගෙන ඇත.

(iii) ඔව්.

හෙක්ටෙයාර 22,664.38ක් මහනුවර දිස්ත්‍රික්කයේ මණ්ඩලය සතු වතු ඉඩම් පවතී.

(ආ) (i) 2010 පෙබරවාරි 17 දින නිකුත් කරන ලද අංක 1641/28 දරන ගැසට් පත්‍රය මඟින් හන්තාන පාරිසරික ආරක්ෂක ප්‍රදේශය පිහිටුවා ඇති අතර, හන්තාන වතුයායෙන් මෙම කලාපයට අයත් වන ඉඩම් ප්‍රමාණය මැනුම් කර නොමැත.

(ii) උකුවෙල වත්ත සම්බන්ධයෙන් දැනුවත් නොමැත. උඩුවෙල වතුයායේ, එනම් මහනුවර - ගලහ පාරෙන් දකුණුපස කොටසක් මෙම හන්තාන පාරිසරික ආරක්ෂක ප්‍රදේශයට අයත්ය. උඩුවෙල වතු යායේ හෙක්ටෙයාර 735ක් පවතී.

(iii) බලංගොඩ ප්‍රදේශයේ රාස්සගල වත්තේ ඉඩම් කොටසක් වෙනුවෙන් හන්තාන රක්ෂිත වතු යායෙන් අක්කර 43යි, රූඩ් 1යි, පර්චස් 16කින් යුත් ඉඩම් කොටසක් පවරා දීමක් 2004 වසරේදී සිදු කර ඇත.

එම පවරා දුන් ඉඩම් කොටස 2010.02.17 දින නිකුත් කරන ලද 1641/28 දරන ගැසට් පත්‍රය මඟින් හන්තාන වතු යායේ අධිසංවේදී කලාපයට ප්‍රකාශ කර ඇති හන්තාන වතු යායේ උඩුවෙල වතු යායේ ඉඩම් ප්‍රමාණයක් බවට නිශ්චිතව නැතත් ඒ සම්බන්ධයෙන් මතයක් පවතී.

(iv) චාමිනී කිරිඇල්ල සහ පිලිප් ශාන්තිකුමාර මහවලතැන්න ජයවර්ධන යන අය වෙත මෙම ඉඩම් පවරා දීම සිදු වී ඇති අතර, වර්තමාන හිමිකරුවන් සම්බන්ධයෙන් දැනුවත් වීමක් නැත.

(ඇ) අදාළ නොවේ.

**ගරු සුජීව දිසානායක මහතා**
(மாண்புமிகு சுஜீவ திசாநாயக்க)
(The Hon. Sujeewa Dissanayake)
ගරු කථානායකතුමනි, ජනතා වතු සංවර්ධන මණ්ඩලය සහ ඒ ආශ්‍රිත අනෙක් ආයතන සතුව හෙක්ටෙයාර 142,000කට ආසන්න ඉඩම් ප්‍රමාණයක් තිබෙනවා කියලා අපේ ගරු අමාත්‍යතුමා පාර්ලිමේන්තුවට ප්‍රකාශ කළා. පසුගිය කාල වකවානුව තුළ විවිධ පුද්ගලයන් ඒ ආයතනය සතුව තිබුණු ඉඩකඩම් අත්පත් කර ගත්තා. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවලදී ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයිති ඉඩම් විවිධ සංවර්ධන කටයුතු වෙනුවෙන් ඉල්ලා සිටිනවා. රට සතුව තිබෙන ප්‍රධාන සම්පතක් තමයි ජනතා වතු සංවර්ධන මණ්ඩලය. එය, 1976දී ආරම්භ වෙච්ච එකක්. වර්තමාන අමාත්‍යවරයා හැටියට ජනතා වතු සංවර්ධන මණ්ඩලය සතුව තිබෙන ඉඩම් ආරක්ෂා කර ගන්න ඔබතුමාගේ පැත්තෙන් ගන්නා වූ පියවර කුමක්ද කියන එකයි මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය.

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)
ගරු කථානායකතුමනි, මේ ගරු මන්ත්‍රීතුමා අහපු ප්‍රශ්නයටම අදාළව ගත්තොත්, මේ ඉඩම් ලබා දීම සම්බන්ධයෙන් විවිධ ගැටලු තිබෙනවා. පෙර කියපු හන්තාන වත්තේ ඉඩම් පිළිබඳව ඒ කාලයේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ හිටපු සභාපති නීතිඥ නිලන්ත විජේසිංහ මහත්මයා 2023.06.24වන දා කරුණු දක්වා තිබෙනවා, "ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ ලේඛන අනුව සී. කිරිඇල්ලේ මහත්මිය උපරිමයට වැඩි කෘෂි කාර්මික ඉඩම් හිමි තැනැත්තියක් නොවන බවත්, ඇයට හිමිකම් පැවැති රාස්සගලවත්තේ භුක්තිය කොමිෂන් සභාව සතු වී නොමැති බවත්, එබැවින් ඇයට විකල්ප ඉඩම් ලබා දීමට කොමිෂන් සභාවට බැඳීමක් නොමැති බවත් කාරක සභාව වෙත පැහැදිලි කරන ලදී. ඇයට මේ කොමිෂන් සභාවෙන් එකී බිම් කොටස නීත්‍යනුකූල කර දී නොමැති බවත් මෙයින් කාරුණිකව දැනුම් දෙමි" කියලා. මෙහිදී "කාරක සභාව" කියලා කිව්වේ, COPE එකට. නීත්‍යනුකූල ලෙස නොදුන්නත් ඒවා භුක්තියට අරගෙන තිබෙනවා. පසුව, කැබැලි කර තිබෙන බවට වාර්තා වෙනවා. මෙතුමා ප්‍රශ්න කරනවා වාගේ රාජ්‍ය වැවිලි සංස්ථාවේත්, ජනතා වතු සංවර්ධන මණ්ඩලයේත් ඉඩම් සැලකිය යුතු ලෙස අවභාවිත වී තිබෙන බවට අප දැන් කරන මූලික පරීක්ෂණවලදී හෙළිදරව් වෙමින් තිබෙනවා. ඒවා සම්බන්ධයෙන් අපි ඉදිරියේදී ක්‍රියාමාර්ග ගන්නවා.

ඒ වාගේම එතුමා ඇහුවා, ඒවායේ ඉඩම් ඉල්ලීම් සම්බන්ධයෙන් ඉදිරියේදී මොකක්ද කරන්නේ කියලා. රජයේ අත්‍යවශ්‍ය කාර්යයන් සඳහා ඉඩම් ලබා දිය යුතුව තිබෙනවා. හැබැයි, කරන ඉල්ලීම් සම්බන්ධයෙන් හොඳින් සොයා බලා තමයි ඒවා ලබා දීම සිදු කරන්නේ. බොහෝ ඉල්ලීම් එනවා, පාසල්, පන්සල්, පල්ලි, කෝවිල් ඇතුළු දේවලට; කුණු ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානවලට. ලබා දිය හැකි සීමිත ඉඩම් ප්‍රමාණයක් රටේ තිබෙන්නේ. අත්‍යවශ්‍යතාව බලලා, හොඳ විමර්ශනයක් මධ්‍යයේ තමයි අපි ඉඩම් ලබා දීම ඉදිරියේදී සිදු කරන්නේ.

**ගරු සුජීව දිසානායක මහතා**
(மாண்புமிகு சுஜீவ திசாநாயக்க)
(The Hon. Sujeewa Dissanayake)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයිති ඉඩම්වල, ඒ ඒ දිස්ත්‍රික්කවලට අවේණික වෙච්ච විවිධ භෝග වර්ග වගා වෙනවා. බදුල්ල සහ නුවරඑළිය දිස්ත්‍රික්ක තුළ තේ වගාව මුල් කරගෙන ඒ ආයතනය සතුව තිබෙන ඉඩම්වල වගා කටයුතු සිදු කරනවා කියලා හිතනවා. මේ වන කොට අපට ආරංචියක් ලැබෙනවා, ආදර්ශ තේ ගම්මාන 500ක් ආරම්භ කිරීමක් සම්බන්ධව. මම අපේ වර්තමාන ගරු අමාත්‍යතුමාගෙන් අහනවා, රජය සතුව තිබෙන දැවැන්ත සම්පතක් යොදාගෙන ඒ ආදර්ශ තේ ගම්මාන පිහිටුවා ඒ අයගේ ජන ජීවිතයේ දේශපාලන, සමාජ, ආර්ථික, සංස්කෘතික පැති සංවර්ධනය කරන්න ඔබතුමන්ලා විසින් අමාත්‍යාංශය හැටියට ගන්නා වූ ඉදිරි ක්‍රියාමාර්ග මොනවාද කියලා.

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)

ගරු කථානායකතුමනි, එතුමා මේ ප්‍රශ්නය විමසීම පිළිබඳව මම බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය හැටියට අපි මේ ජූලි 15වන දා රට පුරා "Ceylon Tea Village" නමින් නව ව්‍යාපෘතියක් ආරම්භ කරනවා. ඒ කියන්නේ, තේ ගම්මාන 500 ව්‍යාපෘතිය. දැනට පවතින කුඩා තේ වතු ගම්මාන මූලික කරගෙන තමයි ඒ ගම්මාන 500 තෝරාගෙන තිබෙන්නේ. ලංකාවේ තේ වගා කරන දිස්ත්‍රික්ක 14ක් තිබෙනවා. මෙම වැඩසටහන යටතේ ඒ දිස්ත්‍රික්ක 14න් පළමුවැනි අදියරේදී දිස්ත්‍රික්ක 11ක එකී ගම්මාන ආරම්භ වෙනවා. එම වැඩසටහන ජාතික වශයෙන් ආරම්භ කරන උත්සවය කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පවත්වන්න අපි දැනට සැලසුම් කර තිබෙනවා. ඊට අමතරව, දිස්ත්‍රික්ක 11හිම ප්‍රධාන උත්සවය බැගින් පවත්වන්න අපි සූදානම් කර තිබෙනවා.

ගරු කථානායකතුමනි, දැනට ගණනය කර තිබෙන ආකාරයට මේ රටේ කුඩා තේ වතු ගොවීන් 418,000ක් ඉන්නවා. තේ කර්මාන්තයත් සමඟ මීට වඩා පවුල් ප්‍රමාණයක් පෝෂණය වෙනවා වාගේම ආර්ථිකයත් ශක්තිමත් කරගෙන තිබෙනවා. තේ කර්මාන්තයෙන් ජාතික ආර්ථිකයට විශාල දායකත්වයක් ලබා දෙනවා. ඒ හින්දා අපි ඉලක්ක කර තිබෙනවා, 2030 වර්ෂය වන විට අපේ රටේ නිමි තේ නිෂ්පාදනය කිලෝ මිලියන 400 දක්වා ගෙන යන්න. දැනට එය තිබෙන්නේ නිමි තේ කිලෝ මිලියන 264ක් වශයෙන්. ගිය අවුරුද්දේ තේවලින් ලැබුණු අපනයන ආදායම ඩොලර් බිලියන 1.51යි. අපි ඉලක්ක කර තිබෙනවා, 2030දී එය ඩොලර් බිලියන 2.5 දක්වා ගෙන යන්න. අන්න ඒ ඉලක්කය සම්පූර්ණ කර ගන්න කුඩා තේ වතු ගොවියා අපට වැදගත්. මොකද, අපේ රටේ සමස්ත තේ නිෂ්පාදනයෙන් සියයට 75ක් නිෂ්පාදනය කරලා දෙන්නේ කුඩා තේ වතු ගොවීන්. අන්න ඒ කුඩා තේ වතු ගොවීන්ගේ ආර්ථිකය ශක්තිමත් කිරීම, ඔවුන්ගේ ආදායම් මට්ටම වැඩි කිරීම, ඒ වෙනුවෙන් දලු නිෂ්පාදනය වැඩි කිරීම සහ ඔවුන්ගේ දලුවලට වැඩි මිලක් ලබා දීම අරමුණු කර ගනිමින් ඔවුන්ට රක්ෂණාවරණයක්, ඒ වාගේම විශ්‍රාම වැටුප් ක්‍රමයක් ද සහිතව එන මේ නව තේ ගම්මාන ව්‍යාපෘතිය අපි ජූලි 15වන දා උදෑසන 9.00ට රට පුරා දියත් කරන බව දැනුම් දෙන්න කැමැතියි.

## අසාධාරණ මිල ගණන් යටතේ භාණ්ඩ විකිණීම: පාලනය
## நியாயமற்ற விலைகளில் பொருட்கள் விற்பனை: கட்டுப்படுத்தல்
## SALE OF GOODS AT UNREASONABLE PRICES: CONTROL

2056/2026

**9. ගරු රුවන්තිලක ජයකොඩි මහතා**
(மாண்புமிகு ருவன்திலக்க ஜயக்கொடி)
(The Hon. Ruwanthilaka Jayakody)

වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ බොහෝ වෙළෙඳසැල්වල සාධාරණ පදනමකින් තොරව වෙළෙඳුන් විසින් තම අභිමතය පරිදි මිල තීරණය කරමින් භාණ්ඩ අළෙවි කරනු ලබන බවත්;

(ii) මේ හේතුවෙන් පාරිභෝගික ජනතාව අසාධාරණයට ලක් වන බවත්; එතුමා පිළිගන්නේද?

(ආ) (i) මෙවැනි වෙළෙඳසැල් වැටලීම සඳහා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් යොදවා ඇති නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) මෙලෙස අසාධාරණ මිල ගණන් යටතේ භාණ්ඩ අළෙවි කිරීම පාලනය කිරීම සඳහා අධිකාරිය සතුව වැඩ පිළිවෙළක් තිබේද;

(iii) නො එසේ නම්, එවැනි වැඩ පිළිවෙළක් සකස් කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையில் பெரும்பாலான வர்த்தக நிலையங் களில், நியாயமான அடிப்படைகள் எதுவுமின்றி வியாபாரிகள் தங்களின் விருப்பத்துக்கேற்ற வாறு விலைகளை நிர்ணயித்துப் பொருட்களை விற்பனை செய்கின்றனர் என்பதையும்;

(ii) அதன் விளைவாக பாவனையாளர்கள் அநீதிக் குள்ளாகின்றனர் என்பதையும்;

அவர் ஏற்றுக்கொள்கின்றாரா;

(ஆ) (i) இதுபோன்ற வர்த்தக நிலையங்களைச் சுற்றி வளைப்பதற்குப் பாவனையாளர் அலுவல்கள் அதிகாரசபை கடமையில் ஈடுபடுத்தியுள்ள அலுவலர்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) இவ்வகையில் நியாயமற்ற விலைகளில் பொருட்கள் விற்பனை செய்யப்படுவதைக் கட்டுப்படுத்த அதிகாரசபையிடம் ஏதேனும் வேலைத்திட்டம் உள்ளதா என்பதையும்;

(iii) இன்றேல், அவ்வாறானதொரு வேலைத் திட்டத்தை தயாரிப்பதற்கு மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Trade, Commerce, Food Security and Co-operative Development:

(a) Will he admit that -

(i) in many shops in Sri Lanka, traders sell goods by determining prices at their own discretion without any reasonable basis; and

(ii) consumers are subjected to unfair treatment as a result of the reason referred to above?

(b) Will he inform this House -

(i) the number of officers deployed by the Consumer Affairs Authority to conduct raids on such establishments;

(ii) whether the Authority has in place a mechanism to control the sale of goods at unreasonable prices in this manner; and

(iii) if not, the measures that will be taken to formulate such a mechanism?

(c) If not, why?

**ගරු ආර්.එම්. ජයවර්ධන මහතා (වෙළෙඳ, වාණිජ සහ ආහාර සුරක්ෂිතතා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஆர்.எம். ஜயவர்தன - வர்த்தக, வாணிப மற்றும் உணவுப் பாதுகாப்புப் பிரதி அமைச்சர்)
(The Hon. R.M. Jayawardhana - Deputy Minister of Trade, Commerce and Food Security)

ගරු කථානායකතුමනි, වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා ඒ ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ඔව්.

(ii) ඔව්.

ඇතැම් වෙළෙඳසැල් සම්බන්ධයෙන් එවැනි තත්ත්වයන් වාර්තා වී ඇති අතර ඒ සම්බන්ධයෙන් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය නිරන්තරයෙන් නීතිමය පියවර ගනිමින් සිටී.

(ආ) (i) 2026.07.02වන විට විමර්ශන නිලධාරින් 272ක් දිවයින පුරා යොදවා ඇත.

මේ නිලධාරින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට සම්බන්ධ කරලා දිස්ත්‍රික් ලේකම්ගේ නායකත්වය යටතේ ක්‍රියාත්මක වන කණ්ඩායමක් බවට පත් කර තිබෙනවා.

(ii) ඔව්. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් දෛනිකව සහ විශේෂ උත්සව සමයන්හිදී දිවයින පුරා අඛණ්ඩව වෙළෙඳ පොළ වැටලීම් සහ පරීක්ෂාවන් සිදු කරනු ලබයි. ඊට අමතරව, පාලන මිලක් නියම කර ඇති භාණ්ඩ සඳහා එම මිල ගණන් ක්‍රියාත්මක වීම අධීක්ෂණය කිරීම පිණිස විශේෂ වැඩ පිළිවෙළක් දැනට ක්‍රියාත්මක වෙනවා.

(iii) අදාළ නොවේ.

(ඇ) අදාළ නොවේ.

**ගරු රුවන්තිලක ජයකොඩි මහතා**
(மாண்புமிகு ருவன்திலக்க ஜயக்கொடி)
(The Hon. Ruwanthilaka Jayakody)

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, පිළිතුර ලබා දුන්නාට ස්තුතියි. මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මේ කාරණයේම දිගුවක් විධියට මා අහන්න කැමැතියි.

අපි දන්නවා, අපේ රටේ තිබෙන ලොකු කුඩා වෙළෙඳ සැල් බොහොමයක් අයුතු ලෙස ලාභ ලබා ගැනීමට උත්සාහ දරන බව. වෙළෙඳාම නිවැරැදිව කරන සියලු දෙනාට නිසි ගෞරවය ඇතිව මම මේ කාරණය කියන්න කැමැතියි. ඇතැම් වෙළෙඳ ව්‍යාපාරිකයන් ඉතාම කනගාටුදායක ලෙස පාරිභෝගිකයන් ගසා කෑමේ අර්බුදය ගම්වල සහ සමහර පැතිවල තිබෙනවා. මේ තත්ත්වය වෙනස් කිරීම සඳහා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය යම් මට්ටමක මැදිහත් වීමක් කළත් එය ප්‍රමාණවත්ද කියන ප්‍රශ්නය තිබෙනවා. මේ සඳහා කළ හැකි වෙනස් ආකාරයේ මැදිහත් වීමක් තිබේද?

**ගරු ආර්.එම්. ජයවර්ධන මහතා**
(மாண்புமிகு ஆர்.எம். ஜயவர்தன)
(The Hon. R.M. Jayawardhana)

ගරු කථානායකතුමනි අපි දන්නවා, ශ්‍රී ලංකාවේ භාණ්ඩ අලෙවි කරන වෙළෙඳ සැල් මිලියන ගණනාවක් තිබෙන බව. ඒ වෙළෙඳ සැල්වල විකුණන භාණ්ඩ පිළිබඳව සොයා බැලීම පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් දිගින් දිගටම කරනු ලබනවා. ලංකාවේ පාලන මිලට අනුව භාණ්ඩ වර්ග ඉතා සුළු ප්‍රමාණයක් තමයි තිබෙන්නේ. පාලන මිලට අදාළ භාණ්ඩ පිළිබඳව පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය දිස්ත්‍රික් ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් දිස්ත්‍රික් මට්ටමේ නිලධාරින් කණ්ඩායමක් යොදවා සෑම දිස්ත්‍රික්කයකම විටින් විට පරීක්ෂා කරනවා; ඒ පිළිබඳව සොයා බලනවා. ඒ භාණ්ඩ වැඩි මිලකට විකුණුවොත් ඒකට දඩයක් නියම කරනවා. මේ දක්වා විශාල දඩ මුදල් අය කිරීමක් සිදු කර තිබෙනවා. අපි ඒ පිළිබඳව පරීක්ෂා කර බලනවා.

ගරු කථානායකතුමනි, ලංකාව පුරා තිබෙන වෙළෙඳ සැල්වල අලෙවි කරන භාණ්ඩ හා සේවා දෙස බැලුවොත්, වැඩිම ප්‍රමාණයක් තිබෙන්නේ සහතික මිලක් නැති ඒවා. ඒ වාගේම ගරු කථානායකතුමනි, අපි මේ භාණ්ඩ හා සේවාවන්හි මිල ගණන් දිහා බැලුවොත්, එක ළඟ කඩවල් දෙකේ පවා මිල ගණන් දෙකක් තිබෙන අවස්ථා තිබෙනවා. ඒ කියන්නේ, භාණ්ඩ මිල වැඩි කරමින් විකුණන ක්‍රියාවලියක් තිබෙනවා. අමාත්‍යාංශය හැටියට අපි කල්පනා කර තිබෙනවා, ලංකාව පුරා වෙළෙඳාම් කරන වෙළෙඳ සැල් සියල්ල පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය යටතේ ලියාපදිංචි කරන්න පුළුවන්ද කියලා බලන්න. දැන් ඒ පිළිබඳව යම් අදහසක්, යෝජනාවක් ඇවිල්ලා අපි ඒ පිළිබඳව කටයුතු කරනවා. ඒ වාගේම සමහර දේවල මිල තීරණය කිරීම සම්බන්ධයෙන් ගැටලුවක් ඇවිල්ලා තිබෙනවා. උදාහරණයක් විධියට ගත්තොත්, කෑම බීම වාගේ දේවල මිල තීරණය කරන්න අමාරුයි. විශේෂයෙන්ම මහී ප්‍රවාහන බස් රථ තේ පානය ආදිය සඳහා නවත්වන කඩවලින් බිත්තර රොටියක් ගත්තොත්, එහි මිල රුපියල් 150යි කියනවා.

බිත්තරයක් රුපියල් 30යි, රොටිය රුපියල් 40යි. හැබැයි, බිත්තර රොටිය රුපියල් 150යි. සමහර ඒවායේ බිත්තරත් නැහැ. ඒවාගේ තැන් තිබෙනවා. ඒ නිසා අපි මේ පිළිබඳව සොයා බලමින් කටයුතු කරන්න බලාපොරොත්තු වෙනවා. වෙළෙඳ සැල් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය යටතේ ලියාපදිංචි කරලා නියාමනයක් කරමින් තමයි ඒක කරන්න වෙන්නේ. නැත්නම් නිශ්චිත මිල පාලනයක් නැති භාණ්ඩවල මිලට අදාළව දඬුවම් කිරීමේ ක්‍රියාවලියක් තීන්දු කරන්න අමාරුයි.

**ගරු රුවන්තිලක ජයකොඩි මහතා**
(மாண்புமிகு ருவன்திலக்க ஜயக்கொடி)
(The Hon. Ruwanthilaka Jayakody)

ස්තුතියි ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, ඉතා හොඳ පිළිතුරක් ලබා දුන්නාට.

මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ජනතාවගේ ජීවිතය නඟා සිටුවීම සඳහා වර්තමාන රජය මේ වනවිට විවිධ ක්‍රියාමාර්ග ගනිමින් ඉන්නවා. ආහාර ද්‍රව්‍ය ඇතුළු අත්‍යවශ්‍ය පාරිභෝගික භාණ්ඩවල මිල අඩු කිරීම සඳහා මැදිහත් වීම ඉන් එකක්. විශේෂයෙන් ඉන්ධන මිල අඩු කිරීම හමුවේ භාණ්ඩවල මිල සෘජු ලෙසම අඩු විය යුතු බව මම විශ්වාස කරනවා. නමුත් බොහෝ වෙළෙඳුන් මෙම සහනය ජනතාවට ලබා දෙන්නේ නැහැ. රජය විසින් පාරිභෝගික ජනතාවට ලබා දෙන සහනය බොහෝ වෙළෙඳුන් විසින් ඔවුන් සතු කරගන්නවා. මෙය ජනතාවට සිදුවන විශාල අසාධාරණයක්. මේ අසාධාරණය වැළැක්වීම සඳහා ක්‍රියාමාර්ගයක් ගැනීමට හැකිද?

**ගරු ආර්.එම්. ජයවර්ධන මහතා**
(மாண்புமிகு ஆர்.எம். ஜயவர்தன)
(The Hon. R.M. Jayawardhana)

ගරු කථානායකතුමනි, අපි පසුගිය දවස්වල මේ පිළිබඳව ඇමතිතුමා සහ අදාළ නිලධාරින් සමඟ දීර්ඝ වශයෙන් සාකච්ඡා කළා. ගරු කථානායකතුමනි, ඉන්ධන මිල වැඩි වුණාම ඒ වැඩි වෙච්ච ගමන්ම ඉක්මනින්ම භාණ්ඩ මිල වැඩි කරනවා. හැබැයි, ඉන්ධන මිල විශාල වශයෙන් අඩු වුණත්, භාණ්ඩ මිල අඩු කිරීම

[ගරු ආර්.එම්. ජයවර්ධන මහතා]

සිද්ධ වෙන්නේ නැති එක පිළිබඳව අපි අධ්‍යයනය කරලා තිබෙනවා. අපි පසුගිය දවස්වල මේ පිළිබඳ සාකච්ඡා කළාම අදහසක් ආවා. ඉන්ධන මත පදනම් වෙලා භාණ්ඩ මිල වැඩි වුණත්, ඉන්ධන මිල අඩු කරන්න තීරණයක් ගත්තාම වෙළෙන්දන්ගේ පැත්තෙන් වෙනත් කාරණා ගණනාවක් කියනවා. ඉන්ධන මිල පමණක් නොවෙයි භාණ්ඩ මිලට බලපාන්නේ කියලා කියනවා. අපි පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියත් එක්ක සම්බන්ධ වෙලා එ වෙළඳ සැල් ලියාපදිංචි කිරීමෙන් පසු අපි මේ පිළිබඳ වැඩ පිළිවෙළක් සකස් කරලා ඉන්ධන මිල වැඩි වෙන වෙලාවට සහ අනෙක් සේවා වැඩි වෙන වෙලාවට භාණ්ඩ මිල වැඩි කිරීමට සහ අවශ්‍ය තැන්වලදී භාණ්ඩ මිල අඩු කිරීමට වැඩ පිළිවෙළක් සාකච්ඡා කරන්න තමයි බලාපොරොත්තුව තිබෙන්නේ. මේ සඳහා විධිමත් වැඩ පිළිවෙළක් සකස් කිරීම පිළිබඳව අමාත්‍යාංශයේ සාකච්ඡාවක් තිබෙනවා. ඒ සාකච්ඡාවෙන් පස්සේ තමයි අපට ඇත්තටම විධිමත් විධියේ තීන්දුවක් ගන්න පුළුවන්කම තිබෙන්නේ.

## පොළොන්නරුව, චීන-ශ්‍රී ලංකා මිත්‍රත්ව වෘක්කවේද විශේෂිත රෝහල: විස්තර

### பொலன்னறுவை, சீன-இலங்கை நட்புறவு சிறுநீரகவியல் விசேட வைத்தியசாலை: விபரம்

### CHINA-SRI LANKA FRIENDSHIP NEPHROLOGY SPECIALIZED HOSPITAL, POLLONNARUWA: DETAILS

2086/2026

**10.ගරු පද්මසිරි බණ්ඩාර මහතා**
(மாண்புமிகு பத்மசிறி பண்டார)
(The Hon. Padmasiri Bandara)
සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1);

(අ) (i) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, චීන-ශ්‍රී ලංකා මිත්‍රත්ව වෘක්කවේද විශේෂිත රෝහල ආරම්භ කළ වර්ෂය සහ දිනය කවරේද;

(ii) එම රෝහල සහ එහි සේවා අංශ ස්ථානගත කිරීම ශක්‍යතා අධ්‍යයනයකින් පසුව සිදුකර තිබේද;

(iii) රෝගී සත්කාර සේවා සඳහා ස්ථානගත කර ඇති අංශ කවරේද;

(iv) එක් එක් සත්කාර අංශය මඟින් ලබාදී ඇති සේවා වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) එම රෝහලේ ස්ථාපිත කර ඇති රසායනාගාර වර්ග;

(ii) රෝහල ආරම්භ කළ දිනයේ සිට මේ දක්වා පරීක්ෂණ රසායනාගාර මඟින් සිදුකර ඇති පරීක්ෂණ සංඛ්‍යාව සහ පර්යේෂණ කටයුතු සඳහා ස්ථාපිත කර ඇති රසායනාගාර මඟින් සිදුකර ඇති පර්යේෂණ සංඛ්‍යාව;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) பொலன்னறுவை மாவட்டத்தில், சீன - இலங்கை நட்புறவு சிறுநீரகவியல் விசேட வைத்தியசாலை ஆரம்பிக்கப்பட்ட ஆண்டு மற்றும் திகதி யாது என்பதையும்;

(ii) மேற்படி வைத்தியசாலை மற்றும் அதன் சேவைப் பிரிவுகள் தாபிக்கப்படுவதற்கு முன்னர் சாத்தியவள ஆய்வு மேற்கொள்ளப்பட்டதா என்பதையும்;

(iii) நோயாளர் சிகிச்சையளிப்பு சேவைகளுக்காகத் தாபிக்கப்பட்டுள்ள பிரிவுகள் யாவை என்பதையும்;

(iv) ஒவ்வொரு சிகிச்சையளிப்புப் பிரிவுமூலமாக வழங்கப்பட்டுள்ள சேவைகள் வெவ்வேறாக யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மேற்படி வைத்தியசாலையில் தாபிக்கப்பட்டுள்ள ஆய்வுகூட வகைகள்;

(ii) வைத்தியசாலை ஆரம்பிக்கப்பட்ட திகதி முதல் இதுவரையில் பரிசோதனை ஆய்வுகூடங்கள் மூலமாக மேற்கொள்ளப்பட்டுள்ள பரிசோதனைகளின் எண்ணிக்கை மற்றும் ஆராய்ச்சி நடவடிக்கைகளுக்காகத் தாபிக்கப்பட்டுள்ள ஆய்வுகூடங்கள் மூலமாக மேற்கொள்ளப்பட்டுள்ள ஆராய்ச்சிகளின் எண்ணிக்கை;

வெவ்வேறாக யாதென்பதையும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Health and Mass Media:

(a) Will he inform this House -

(i) the year and date on which the China-Sri Lanka Friendship Nephrology Specialized Hospital in the Polonnaruwa District was established;

(ii) whether the said hospital and its service units were established after conducting a feasibility study;

(iii) the names of the units that have been established for patient care services; and

(iv) the services provided by each patient care unit separately?

(b) Will he also inform this House separately the -

(i) types of laboratories established in the said hospital; and

(ii) number of tests conducted by the diagnostic laboratories and the number of research studies conducted by the laboratories established for research purposes since the date of establishment of the said hospital up to now?

(c) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) චීන රජය විසින් 2021.02.31 දින රෝහල භාර දුන් අතර 2021.06.11 දින සමාරම්භක උත්සවයෙන් පසු 2021.07.26 දින සායනික සේවා ආරම්භ කර ඇත.

(ii) පොළොන්නරුව ජාතික වෘක්කවේද විශේෂිත රෝහල චීන රජය වෙතින් අප රට වෙත ලැබූ ප්‍රදානයක් වන අතර, චීන රජය විසින් පත් කර එවන ලද දූත මණ්ඩලයක් විසින් සිදුකරන ලද ශක්‍යතා අධ්‍යයනයකින් අනතුරුව රෝහල ඉදිකිරීම සැලසුම් කොට ඇත. එම ශක්‍යතා අධ්‍යයන වාර්තාව ඇමුණුම A වශයෙන් **සභාගත*** කරමි.

(iii) පරිපාලන කටයුතු හා රෝහල් සේවා සඳහා අංශ 32ක් ස්ථානගත කර ඇත. එය ඇමුණුම B මඟින් දක්වා ඇත. ඇමුණුම B **සභාගත*** කරමි.

(iv) ඇමුණුම B මඟින් දක්වා ඇත.

(ආ) (i) එම රෝහලේ ස්ථාපිත කර ඇති රසායනාගාර වර්ග:

Biochemistry

Histopathology

Hematology

(ii)

| Years Components | 2021 (2021.07.06) දින සිට | 2022 | 2023 | 2024 | 2025 | 2026 (2026.05.31) දක්වා |
|---|---|---|---|---|---|---|
| Laboratory tests (Total) | 17,594 | 142,769 | 234,265 | 311,945 | 354,648 | 160,786 |
| Mobile Laboratory tests (Total) | - | - | 12,572 | 19,155 | 25,716 | 12,835 |

(ඇ) පැන නොනඟී.

**ගරු පද්මසිරි බණ්ඩාර මහතා**
(மாண்புமிகு பத்மசிறி பண்டார)
(The Hon. Padmasiri Bandara)

ගරු කථානායකතුමනි, මම හිතන විධියට ලංකාවේ තිබෙන විශාලම වකුගඩු රෝහල තමයි පොළොන්නරුවේ තිබෙන චීන-ශ්‍රී ලංකා මිත්‍රත්ව වකුගඩු රෝහල. දැනට තිබෙන දියුණුම උපකරණ විශාල ප්‍රමාණයක් එම රෝහල සතුව තිබෙනවා. ඒ වාගේම දවසකට රෝගීන් විශාල ප්‍රමාණයක් එම රෝහලට පැමිණෙනවා. පසුගිය දවස්වල අපේ ඇමතිතුමාත්, අපිත් එම රෝහලේ නිරීක්ෂණ චාරිකාවක යෙදුණා. එම අවස්ථාවේදී අපි දැක්කා, උපකරණ විශාල තොගයක් ප්‍රයෝජනයට නොගෙන තිබෙන බවක්. ඒ වාගේම මෙහි එක කොටසක් research lab එකක් හැටියට නම් කර තිබෙනවා. මම දන්නා තරමින් සහ දැනට ලැබී තිබෙන වාර්තා අනුව මෙම පර්යේෂණ ආයතනය මඟින් මේ දක්වා කිසිදු පර්යේෂණයක් සිදුකර නැහැ. අපි නිරීක්ෂණය කළ වේලාවේදීත් දැක්කා, පොලිතින්වලින් අසුරා ගෙනාපු විධියටම එම උපකරණ ටික තිබෙන බව.

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, මෙම චීන-ශ්‍රී ලංකා මිත්‍රත්ව රෝහලට අදාළ ගිවිසුම අත්සන් කරපු නිලධාරින් කවුද, රෝහලේ පවතින තත්ත්වය පිළිබඳව දැනට ඔබතුමාට කිව හැකි තොරතුරු මොනවාද, ඒ වෙනුවෙන් ගනු ලබන ක්‍රියාමාර්ගය මොකක්ද?

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, ලංකාවේ දැනට වසර ගණනාවක් තිස්සේ පවතින මූලය හඳුනා නොගත් වකුගඩු රෝගයක් යැයි කියනු ලබන CKDu කියන රෝගී තත්ත්වයට අවධානය යොමු කරලා මහජන චීන සමූහාණ්ඩුව විසින් මෙම රෝහල ප්‍රදානයක් හැටියට අපට ලබා දුන්නා. ඇත්තටම ඒකට අපි මහජන චීන සමූහාණ්ඩුවට සහ චීන ජනතාවට විශේෂ ස්තුතිය පුද කරන්නට ඕනෑ.

ඇත්තටම එම රෝහල විශේෂ රෝහලක් හැටියට සායනික කටයුතුවලින් ඔබ්බට ගිහිල්ලා වකුගඩු රෝග සම්බන්ධයෙන් පර්යේෂණ කිරීම සඳහාත් අවශ්‍ය පහසුකම් තිබෙන තැනක්. නමුත් මම කියන්නට කැමැතියි, එම රෝහලේ තිබෙන ධාරිතාව සහ ඒ තිබෙන පර්යේෂණ උපකරණ ප්‍රමාණය සමස්තයක් හැටියට ගත්තාම, සියයට 100ක්ම භාවිත වෙන්නේ නැති බව. මොකද, අපි දැනටමත් පොළොන්නරුව දිස්ත්‍රික් මහ රෝහලත් සම්බන්ධ කරගෙන අවශ්‍ය කාර්ය මණ්ඩලය සහ උපකරණ යම් ප්‍රමාණයකට හුවමාරු කර ගනිමින් තමයි මේ කටයුතු කරගෙන යන්නේ. ඒ නිසා ගරු මන්ත්‍රීතුමා කියන කාරණයේ යම් කොටසක නිවැරදිභාවයක් තිබෙනවා. අපි දැනට මහජන චීන සමූහාණ්ඩුව හා ලංකාවේ චීන තානාපති කාර්යාලය එක්කත් සාකච්ඡා කරමින් යනවා, මෙම රෝහලේ ඉදිරි නඩත්තු කටයුතු සහ ඒවා වර්ධනය කර ගැනීමේදී අවශ්‍ය සම්පත් ලබා ගැනීම සම්බන්ධයෙන්. දැනට ඒ තත්ත්වය තමයි තිබෙන්නේ. මේ ගැන අපි අවධානයෙන් කටයුතු කරනවා.

**ගරු පද්මසිරි බණ්ඩාර මහතා**
(மாண்புமிகு பத்மசிறி பண்டார)
(The Hon. Padmasiri Bandara)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, සාමාන්‍යයෙන් වකුගඩු රෝහලේ දවසකට 100කට, 150කට ආසන්න ප්‍රමාණයකගේ රුධිර කාන්දුකරණය - dialysis - කරනවා. ඒ සඳහා භාවිත කරන ජල බුබුලි වගයක් තිබෙනවා. මට මතක විධියට අපි ඒක හඳුන්වන්නේ "A" can and "B" can කියලා. ගරු කථානායකතුමනි, නියෝජ්‍ය අධ්‍යක්ෂ හැටියට හිටපු කාලයේදී ඔබතුමාත් විශේෂ අවධානයක් මේ කෙරෙහි යොමු කර තිබුණා අපි ගිහිල්ලා හමුවුණ වෙලාවේදීත් ඔබතුමාත් අපි එක්ක මේ ගැන සාකච්ඡා කළා. මම හිතන විධියට මේකෙන් විශාල මුදලක් මේ ආයතනයේ නඩත්තුව සඳහා එකතු කරගන්න පුළුවන්. නමුත්, දැනට තිබෙන තත්ත්වය අනුව මම හිතන විධියට මිලියන ගණනාවක වංචාවක් සිදු වෙමින් පවතිනවා. ගරු ඇමතිතුමනි, මේ පිළිබඳ විමර්ශනයක් කරනවා ද, ඒ සඳහා අමාත්‍යාංශය පැත්තෙන් ගනු ලබන ක්‍රියාමාර්ගය මොකක්ද?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා කියන කාරණයට අපි අවධානය යොමු කරලා අමාත්‍යාංශය මට්ටමින් විමර්ශනයක් කරන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

දෙවන වටය.

## වීථි ලාම්පු සවිකිරීම: අනුගමනය කරන නිර්ණායක
## தெரு விளக்குகள் பொருத்துதல்: பின்பற்றப்படும் அளவுகோல்கள்
## INSTALLATION OF STREET LIGHTS: CRITERIA FOLLLOWED

28/2024

**1. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු නීතිඥ හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க-மாண்புமிகு சட்டத்தரணி ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. Hesha Withanage Ankumbura Arachchi, Attorney-at-Law)

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ඇතැම් ස්ථානවල වීථි ලාම්පු නොමැති වීම හේතුවෙන් රාත්‍රී කාලයේදී ජනතාව දුෂ්කරතාවට පත්වන බවත්;

(ii) අවශ්‍ය ස්ථානවලට වීථි ලාම්පු සවි නොකර පෞද්ගලික අවශ්‍යතා මත වීථි ලාම්පු සවි කරන බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) වීථි ලාම්පු සවි කිරීමේ වගකීම පැවරෙන ආයතනය කවරේද;

(ii) වීථි ලාම්පු සවි කිරීමේදී සපුරාලිය යුතු මූලික අවශ්‍යතා කවරේද;

(iii) අවශ්‍යතා සපුරාලන ස්ථාන සඳහා වීථි ලාම්පු ලබා ගැනීමට ජනතාවට හැකියාවක් තිබේද;

(iv) එසේ නම්, ඒ සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ගය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) சில இடங்களில் தெரு விளக்குகள் பொருத்தப்படாததன் காரணமாக பொதுமக்கள் இரவு நேரங்களில் பெரும் சிரமங்களுக்கு ஆளாகின்றனர் என்பதையும்;

(ii) தேவையான இடங்களில் தெரு விளக்குகள் பொருத்தப்படாமல், தனிப்பட்ட தேவைகளின் அடிப்படையில் தெரு விளக்குகள் பொருத்தப்படுகின்றன என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) தெரு விளக்குகளைப் பொருத்தும் பொறுப்பு ஒப்படைக்கப்பட்டுள்ள நிறுவனம் யாது என்பதையும்;

(ii) தெரு விளக்குகளைப் பொருத்தும்போது பூர்த்தி செய்யவேண்டிய அடிப்படைத் தேவைப்பாடுகள் யாவை என்பதையும்;

(iii) தேவைப்பாடுகளைப் பூர்த்திசெய்யும் இடங்களுக்குத் தேவையான தெரு விளக்குகளைப் பெற்றுக்கொள்வதற்குப் பொதுமக்களுக்கு வாய்ப்பு உள்ளதா என்பதையும்;

(iv) ஆமெனில், அதற்காகப் பின்பற்றவேண்டிய வழிமுறை யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Public Administration, Provincial Councils and Local Government:

(a) Is he aware that -

(i) the public faces significant hardships at night due to the absence of street lights at certain places; and

(ii) street lights are installed based on personal needs instead of installing them at the required places?

(b) Will he inform this House -

(i) the name of the institution responsible for the installation of street lights;

(ii) the basic requirements that must be met for the installation of street lights;

(iii) whether it is possible for the public to obtain street lamps for the places that meet the requirements; and

(iv) if so, the procedure to be followed in that regard?

(c) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை:*
** Answer tabled:*

(අ) (i) ඔව්.

(ii) වීථි ලාම්පු සවි කිරීම බලශක්ති අමාත්‍යාංශය පනවා ඇති සීමා තුළ අත්‍යවශ්‍ය ස්ථාන ආවරණය කරමින් සිදු කරනු ලබන අතර, පෞද්ගලික අවශ්‍යතා මත පළාත් පාලන ආයතන වීථි ලාම්පු සවි කරනු නොලැබේ.

(ආ) (i) මහ නගර සභා, නගර සභා, ප්‍රාදේශීය සභා සහ සීමාසහිත ලංකා විදුලි (පෞද්ගලික) සමාගම යටතේ ඇති ඉලෙක්ට්‍රිසිටි ඩිස්ට්‍රිබියුෂන් ලංකා ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය - EDL.

(ii) බලශක්ති අමාත්‍යාංශ ලේකම්ගේ අංක පීඊ/01/01 සහ 2010.08.17 දිනැති ලිපිය ප්‍රකාරව, මහ නගර සභා සහ නගර සභා ඇතුළු නාගරික ප්‍රදේශවල සවි කළ යුතු වීථි ලාම්පු සංඛ්‍යාවේ ඇස්තමේන්තුගත විදුලි පරිභෝජනය එම බල ප්‍රදේශයේ වාර්ෂික ගෘහස්ථ හා පොදු කාර්ය සිල්ලර විදුලි පරිභෝජනයෙන් සියයට 2ක ප්‍රමාණය නොඉක්මවිය යුතු අතර, ග්‍රාමීය ප්‍රදේශවල (ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ) සවි කළ යුතු වීථි ලාම්පු සංඛ්‍යාවේ ඇස්තමේන්තුගත විදුලි පරිභෝජනය එම බල ප්‍රදේශයේ වාර්ෂික ගෘහස්ථ හා පොදු කාර්ය සිල්ලර විදුලි පරිභෝජනයෙන් සියයට 3ක ප්‍රමාණය නොඉක්මවිය යුතුය.

(iii) ඔව්.

(iv) අදාළ ප්‍රදේශයේ හෝ ස්ථානයේ අවශ්‍යතාව පැහැදිලි කරමින් පළාත් පාලන ආයතනය වෙත ඉල්ලීම ඉදිරිපත් කළ යුතු අතර, පළාත් පාලන ආයතනය විසින් එම ස්ථානයේ යෝග්‍යතාව පිළිබඳව පරීක්ෂා කර බලා සභාවේ මූල්‍ය ශක්තිය සහ මහා සභා අනුමැතිය මත සීමාසහිත ලංකා විදුලි (පෞද්ගලික) සමාගම යටතේ ඇති ඉලෙක්ට්‍රිසිටි ඩිස්ට්‍රිබියුෂන් ලංකා ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය - EDL - වෙත ඉල්ලීම ඉදිරිපත් කරනු ලැබේ. සීමාසහිත ලංකා විදුලි (පෞද්ගලික සමාගම විසින් වැය වන පිරිවැය ඇස්තමේන්තුගත කර පළාත් පාලන ආයතනය වෙත වාර්තා කරනු ලබන අතර, එම පිරිවැය පළාත් පාලන ආයතනයෙන් අය කර ගැනීමෙන් අනතුරුව සීමාසහිත ලංකා විදුලි (පෞද්ගලික) සමාගම යටතේ ඇති ඉලෙක්ට්‍රිසිටි ඩිස්ට්‍රිබියුෂන් ලංකා ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය විසින් වීථි ලාම්පු ස්ථාපනය කරනු ලැබේ.

(ඇ) අදාළ නොවේ.

## සමුපකාර අරමුදල: විස්තර
### கூட்டுறவு நிதியம்: விபரம்
### CO-OPERATIVE FUND: DETAILS

657/2025

**3. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු රෝහණ බණ්ඩාර මහතා වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க- மாண்புமிகு ரோஹண பண்டார சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. Rohana Bandara)

වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) සමුපකාර අරමුදල නමින් අරමුදලක් ඇති බව දන්නේද;

(ii) එම අරමුදල ස්ථාපිත කිරීමේ අරමුණු කවරේද;

(iii) මේ වන විට එම අරමුදලේ මුළු වටිනාකම කොපමණද;

(iv) එම අරමුදලට මුදල් ලැබෙන මූලාශ්‍ර කවරේද;

(v) එම අරමුදලේ මුදල් භාවිත කළ හැකි කටයුතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) මේ වන විට දෙහිවල-ගල්කිස්ස සහ මහරගම විවිධ සේවා සමුපකාර සමිති සතුව පවතින ග්‍රාමීය බැංකු කඩා වැටී ඇති බව දන්නේද;

(ii) එම ග්‍රාමීය බැංකුවල තැන්පත්කරුවන්ට යම් සහනයක් ලබාදීමට සමුපකාර අරමුදල යටතේ කටයුතු කළ හැකිද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 'கூட்டுறவு நிதியம்' என்ற பெயரில் ஒரு நிதியம் உள்ளதென்பதை அறிவாரா;

(ii) மேற்படி நிதியம் தாபிக்கப்பட்ட நோக்கங்கள் யாவை;

(iii) இன்றளவில் மேற்படி நிதியத்தின் மொத்தப் பெறுமதி எவ்வளவு;

(iv) மேற்படி நிதியத்துக்கு நிதி கிடைக்கும் மூலங்கள் யாவை;

(v) மேற்படி நிதியத்தின் நிதியைப் பயன்படுத்தக்கூடிய நடவடிக்கைகள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) தற்போது தெஹிவளை-கல்கிசை மற்றும் மஹரகம பல்நோக்குக் கூட்டுறவுச் சங்கத்துக்குச் சொந்தமான கிராமிய வங்கிகள் வீழ்ச்சி நிலையை அடைந்துள்ளன என்பதை அவர் அறிவாரா;

(ii) மேற்படி கிராமிய வங்கிகளில் வைப்பீடு செய்துள்ளவர்களுக்கு ஏதேனும் நிவாரணம் வழங்க கூட்டுறவு நிதியத்தின்கீழ் நடவடிக்கை மேற்கொள்ள இயலுமா;

என்பதையும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Trade, Commerce, Food Security and Co-operative Development:

(a) Will he inform this House -

(i) whether he is aware of the existence of a fund designated as the "Co-operative Fund";

(ii) the objectives of establishing the said fund;

(iii) the aggregate value of the aforesaid fund at present;

(iv) the sources of income of the said fund; and

(v) the activities for which monies from the aforesaid fund can be used?

(b) Will he also inform this House whether -

(i) he is aware that rural banks owned by the Multipurpose Co-operative Societies of Dehiwala-Mount Lavinia and Maharagama have currently collapsed; and

(ii) steps can be taken to provide some relief to the depositors of those rural banks under the "Co-operative Fund"?

(c) If not, why?

**ගරු ආර්.එම්. ජයවර්ධන මහතා**
(மாண்புமிகு ஆர்.எம். ஜயவர்தன)
(The Hon. R.M. Jayawardhana)

ගරු කථානායකතුමනි, වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඔව්. පළාත් මට්ටමින් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ පළාත් අරමුදල් 9ක් පවතින අතර, රේඛීය සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ ද අරමුදලක් පවතී.

(ii) 1972 අංක 05 දරන සමුපකාර සමිති පනතට අදාළව සමුපකාර විෂය භාර අමාත්‍යවරයා විසින් 1973 නොවැම්බර් 20 දින අනුමත කරන ලද සමුපකාර රීති මාලාවේ 43 වගන්තිය අනුව සමුපකාර ඇමතිතුමාගේ යම්කිසි සාමාන්‍ය හෝ විශේෂ විධිවිධානවලට යටත්ව රෙජිස්ට්‍රාර්තුමා විසින් පරිපාලනය කළ යුතු බව දැක්වෙන මෙම අරමුදල පහත සඳහන් කාර්යයන් සඳහා යෙදවිය හැකි බව දක්වා ඇත.

[ගරු ආර්.එම්. ජයවර්ධන මහතා]

- සමුපකාර අධ්‍යාපනය, ව්‍යාප්තිය හා ප්‍රචාරක වැඩ
- සමුපකාර සමිතිවල කළමනාකරණ කාර්යක්ෂමතා දියුණු කිරීම
- සමුපකාර සමිතිවලට උපකාර කිරීම

(iii) රුපියල් මිලියන 1,122කි. (බස්නාහිර පළාත)

(iv) සමුපකාර සමිතියක වාර්ෂික විගණනයෙන් පසු වර්ෂයට අදාළ ලාභයෙන් සියයට 10ක ප්‍රමාණයක් සමුපකාර අරමුදලට දායක ලෙස ගෙවිය යුතුය. සමුපකාර සමිතිය අලාභදායී වන්නේ නම් රුපියල් 5ක මුදලක් දායකය වශයෙන් ගෙවිය යුතුය. ඒ අනුව බස්නාහිර පළාත තුළ ලියා පදිංචි සමුපකාර සමිති 1,384ක දායක මුදල්වලින් මෙම අරමුදල ගොඩනැඟී ඇත.

(v) 1972 අංක 05 දරන සමුපකාර සමිති පනතට අදාළව සමුපකාර විෂය භාර අමාත්‍යවරයා විසින් 1973 නොවැම්බර් 20 දින අනුමත කරන ලද සමුපකාර රීති මාලාවේ 43 වගන්තිය අනුව,

- සමුපකාර අධ්‍යාපනය, ව්‍යාප්තිය හා ප්‍රචාරක වැඩ
- සමුපකාර සමිතිවල කළමනාකරණ කාර්යක්ෂමතා දියුණු කිරීම
- සමුපකාර සමිතිවලට උපකාර කිරීම

(ආ) (i) ඔව්. එය බස්නාහිර පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ අධීක්ෂණය වේ.

(ii) නොහැක.

(ඇ) බස්නාහිර පළාතේ දැනට විවිධ හේතු මත අර්බුදයකට ලක්ව කඩා වැටී ඇති සමුපකාර සමිති ප්‍රමාණය සාපේක්ෂව ඉහළ අගයක් බැවින්, එකී සමිතිවල තැන්පතු ආපසු ගෙවීම සඳහා එම අරමුදල භාවිත කිරීම සඳහා ප්‍රමාණවත් මුදල් ශේෂයක් නොමැත.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්න, ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### නැඟෙනහිර පළාතේ ධීවරයින් මුහුණ දෙන ගැටලු
### கிழக்கு மாகாண மீனவர்கள் எதிர்கொள்ளும் பிரச்சினைகள்
### ISSUES FACED BY FISHERMEN IN EASTERN PROVINCE

**ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා**
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ சபாநாயகர் அவர்களே, பாராளுமன்ற நிலையியற் கட்டளை 27(2)இன்கீழ், கௌரவ கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சர் அவர்களிடம் எனது கேள்வியைக் கேட்க விரும்புகின்றேன்.

இலங்கையிலிருக்கின்ற ஏனைய கரையோர மாவட்டங்களைவிட, எமது மட்டக்களப்பு, திருகோணமலை மற்றும் அம்பாறை மாவட்டங்களில் மிக அதிகமான மக்கள் தங்களின் பிரதான வாழ்வாதாரமாகக் கடற்றொழிலையே நம்பியிருக்கின்றனர். இங்கு சுமார் 1,000க்கும் மேற்பட்ட படகுகள் சுழற்சி முறையில் தொடர்ச்சியாகக் கடற்றொழிலில் ஈடுபட்டு வருவதுடன், இதன்மூலமே பல்லாயிரக்கணக்கான மீனவக் குடும்பங்கள் தங்களது அன்றாடத் தேவைகளைப் பூர்த்திசெய்து வருகின்றனர்.

இன்று எமது மீனவர்கள் எதிர்கொள்ளும் மிகப் பெரிய பிரச்சினை, கடலில் இடம்பெறுகின்ற மீன் திருட்டும் கடற்கொள்ளையும் ஆகும். ஒரு முழுமையான வலைத் தொகுதிக்கு சுமார் 100,000 ரூபாய் வரை செலவாகும் நிலையில், அவற்றைப் பழுதுபார்ப்பதற்கே நாளொன்றுக்கு 4,000 - 5,000 ரூபாய்வரை மேலதிகச் செலவு ஏற்படுகிறது. திருகோணமலை முதல் பொத்துவில் வரையான பகுதிகளில் பலமுறை போராட்டங்கள் நடத்தப்பட்டபோதிலும், எமது மீனவர்களின் இந்தத் துயரத்திற்குத் தீர்வுகாண கௌரவ அமைச்சர் அவர்கள் பல தடவை முயற்சி எடுத்திருக்கின்றபோதிலும், இதுவரை உரிய தீர்வு கிடைக்கவில்லை. நேற்றிரவுகூட வாகரை கடற்பரப்பில் மீன்பிடியில் ஈடுபட்டவர்களின் வலைகளை வெட்டி, கடற்கொள்ளை நடைபெற்றிருக்கிறது.

கௌரவ சபாநாயகர் அவர்களே, VMS - Vessel Monitoring System - கருவி மீனவர்களின் பாதுகாப்புக்காக அறிமுகப்படுத்தப்பட்டதாகக் கூறப்பட்டபோதிலும், நடைமுறையில் அது அவர்களின் வாழ்வாதாரத்திற்குப் பெரும் சுமையாக மாறியிருக்கிறது. ஆரம்பத்தில் அது முற்றிலும் இலவசமாக வழங்கப்படும் என்று கூறப்பட்டாலும், பின்னர் சுமார் 35,000 - 70,000 ரூபாய்வரை வெவ்வேறு கட்டண முறைகளில் மீனவர்களிடமிருந்து அதற்கெனப் பணம் அறவிடப்பட்டுள்ளது. மேலும், இதற்காக மாதாந்தக் கட்டணமாக 6,000 ரூபாய் வசூலிக்கப்படுவது சாதாரண மீனவர்களுக்குப் பாரிய பொருளாதாரச் சுமையாக இருக்கிறது.

"மின்னல் தாக்காது" என்று அதிகாரிகளால் உறுதியளிக்கப்பட்ட VMS கருவியைப் பொருத்தியிருந்த பல படகுகள், மின்னல் தாக்கத்துக்குள்ளாகியிருக்கின்றன. இதனால், alternators, batteries - மின்கலங்கள் மற்றும் ஒட்டுமொத்த மின்சார அமைப்புகளும் சேதமடைந்து, ஒவ்வொரு boatக்கும் பல இலட்சம் ரூபாய் நஷ்டம் ஏற்பட்டிருக்கிறது.

கடலில் 'சிக்னல்' துண்டிக்கப்பட்டால், அதற்கான காரணங்களை முறையாக ஆராயாமல், கடலுக்குச் செல்லும் மீனவர்களின் pass - அனுமதிப்பத்திரங்கள் - அதிகாரிகளால் முடக்கப்படுகின்றது. பழுதுபார்ப்பு என்ற பெயரில் "சிந்து மெரைன்" நிறுவனம் சுமார் 250,000 - 600,000 ரூபாய் வரையான கட்டணங்களைக் கோருவதாகவும் நான் அறிகின்றேன்.

கௌரவ சபாநாயகர் அவர்களே, அதேபோன்று கடந்த காலத்தில் 'கனான்' - Canan - படகுகளுக்கு வழங்கப்பட்ட 14 நாள் pass நடைமுறை தற்பொழுது நிறுத்தப்பட்டுள்ளது. வரவிருக்கும் கச்சான் காற்றுக் காலத்தில் மீனவர்கள் தினசரி கடலுக்குச் செல்ல வேண்டிய நிலை உள்ளது. இரவு முழுவதும் தூக்கமின்றித் தொழிலில் ஈடுபட்டுவிட்டு, அதிகாலையில் கரை திரும்பும் மீனவர்கள், இந்த pass நடைமுறைகளின் காரணமாக இரண்டு மணித்தியாலங்களுக்கும் மேலாக அலுவலகங்களில் காத்திருக்க வேண்டிய சூழல்

ஏற்பட்டுள்ளது. இதனால் அவர்கள் போதிய ஓய்வின்றி மீண்டும் கடலுக்குச் செல்ல வேண்டிய நிலை உருவாகியுள்ளது.

கௌரவ சபாநாயகர் அவர்களே, தொழில் ரீதியான சுமை, கடற்கொள்ளையர்களின் தொல்லை மற்றும் VMS கட்டணச் சுரண்டல்கள் என அனைத்தும் மீனவர்களைக் கடுமையாகப் பாதித்துள்ளது. இந்த விடயங்கள் கௌரவ அமைச்சர் அவர்களுக்கும் நன்றாகத் தெரியும். கௌரவ கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சர் அவர்களே, இது அவர்களின் வாழ்வுரிமையுடன் நேரடியாகத் தொடர்புடைய பிரச்சினை என்பதால், அவற்றுக்கு உரிய தீர்வுகளைப் பெற்றுக்கொள்வதற்குத் தேவையான நடவடிக்கைகளைத் தங்களது அமைச்சுமூலம் மேற்கொள்வதற்கு ஆவன செய்யுமாறு இவ்வுயரிய சபையிலே தங்களிடம் விநயமாகக் கேட்டுக்கொள்ளவதுடன், பின்வரும் வினாக்களுக்குத் தங்களிடமிருந்து உரிய பதில்களையும் எதிர்பார்க்கின்றேன்:

- கடற்கொள்கைளயர்களைக் கட்டுப்படுத்த எடுக்கப்பட்டுள்ள நடவடிக்கைகள் என்ன? அது தொடர்பாக மேற்கொண்டுள்ள முயற்சிகள் என்ன?
- VMS கருவிகளுக்கான மாதாந்தக் கட்டணங்களையும், அதிகப்படியான பழுதுபார்ப்புக் கட்டணங்களையும் மறுபரிசீலனை செய்து குறைப்பதற்கும், மின்கலம் - batteries - பாதுகாப்பிற்கான வசதிகளை ஏற்படுத்துவதற்கும் நடவடிக்கை எடுப்பீர்களா?
- கௌரவ அமைச்சர் அவர்களே, கச்சான் காற்றுக் காலத்தைக் கருத்திற்கொண்டு, மீனவர்களின் ஓய்வுநேரப் பாதிப்பைத் தவிர்க்கும் பொருட்டு, pass நடைமுறைகளை எளிமைப்படுத்தி, Canan படகுகளுக்குப் பழையபடி 14 நாள் pass நடைமுறையை மீண்டும் அறிமுகப்படுத்துவீர்களா?

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා (ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා)**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர் - கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சர்)
(The Hon. Ramalingam Chandrasekar - Minister of Fisheries, Aquatic and Ocean Resources)

கௌரவ சபாநாயகர் அவர்களே, இந்தக் கேள்விக்கான பதிலை அளிப்பதற்கு 2 வார காலக்கெடுவை நான் கேட்கின்றேன். காரணம், நேற்று 2 மணிக்குத்தான் இந்தப் பிரச்சினை தொடர்பான கேள்வி எங்களுக்குக் கிடைத்தது. கௌரவ பாராளுமன்ற உறுப்பினர் ஹிஸ்புல்லாஹ் அவர்கள் கேட்கின்ற இந்தக் கேள்வி என்பது மிகவும் முக்கியமானது. இது பல நிறுவனங்களோடு தொடர்புபட்ட ஒரு விடயம். விசேடமாக, கடற்படையும்கூட இதில் சம்பந்தப்பட்டு இருக்கின்றது; அவர்களுடைய தகவலையும் நாங்கள் பெற்றுக்கொள்ள வேண்டிய தேவை இருக்கின்றது. அந்தத் தேவையின் நிமித்தமாக, அடுத்த பாராளுமன்ற அமர்விலே இதற்கான பதிலைப் பெற்றுத் தர நான் உறுதியளிக்கின்றேன். நன்றி!

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 27(2) යටතේ මීළඟ ප්‍රශ්නය, ගරු ශාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා.

## II

## කොළඹ වරාය නගරයට ලැබුණු ආයෝජන සහ රැකියා උත්පාදනය
## கொழும்பு துறைமுக நகரத்தில் பெறப்பட்ட முதலீடும் உருவாக்கப்பட்ட வேலைவாய்ப்புகளும்
## INVESTMENT RECEIVED AND EMPLOYMENT GENERATED AT COLOMBO PORT CITY

**ගරු ශාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

Hon. Speaker, I would like to pose this Question to the Hon. Minister of Finance, Planning and Economic Development.

The Colombo Port City was promised to bring UD Dollars 15 billion in investments and generate over 80,000 jobs. Yet young Sri Lankans are leaving the country in record numbers for lack of opportunity. Of the Zone's 178 hectares of marketable land, 116 hectares are held on a 99-year lease by CHEC Port City Colombo (Pvt.) Limited, a subsidiary of the Chinese State-owned China Harbour Engineering Company (Pvt.) Limited, which markets that land and keeps the proceeds. The Zone is promoted abroad with "No cap on foreign employment." In April, 2026, the Cabinet approved 77 "Businesses of Strategic Importance" for the Zone. As a matter of urgent public importance, I ask the Hon. Minister the following:

1. Of the 116 hectares leased to the China Harbour Engineering Company (Pvt.) Limited, what extent has been sub-leased or otherwise transferred to date? Will the Government table a list of the investors, the country of ownership of each and the duration of each lease? Further, overall, what proportion of the land is utilized by Sri Lanka-based companies?
2. What has the Government earned from the Port City to date compared to what the China Harbour Engineering Company (Pvt.) Limited has earned from marketing land in the Zone?
3. For each of the past five years, how much foreign investment was actually received (a) within the Port City and (b) through the Board of Investment and other channels in US dollars?

   This question is about how much of investment the Port City has brought in and how much of investment the Board of Investment has brought in.
4. How many people work in the Port City today - how many Sri Lankan citizens, how many under 35 years of age and how many foreign nationals?

   Hon. Minister Anil Jayantha, I would also like to share with you an article that appeared on 13th April, 2021. ගරු අමාත්‍යතුමනි, ඉදිරිපත් කර තිබෙන ප්‍රශ්නයට අදාළවයි මම මේ ප්‍රශ්නයත් අහන්නේ. When the Port City Economic Commission was gazetted, Colombo Port City Economic Commission එක ගැසට් කරලා ස්ථාපනය කරනකොට අපි වාගේම ගරු

[ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා]

ජනාධිපතිතුමාත් එදා ඒකට විරුද්ධ වුණා. ඔබතුමාගේ අවධානය යොමු කිරීම සඳහා මම මේ තොරතුරු කියන්නම්. එදා, එතුමා raise කරපු concerns ටික තමයි මම අද raise කරන්නේ. එහිදී පැහැදිලිව කියා තිබෙනවා that only foreigners can invest in the Port City and that it will end up becoming a Chinese colony කියලා. ගරු වසන්ත සමරසිංහ ඇමතිතුමා Colombo Port City Economic Commission එකට විරුද්ධව උසාවියේ නඩුවකුත් දැම්මා, ඒක unconstitutional, Colombo Port City Economic Commission එක වැරදියි, ඒ හරහා එන ආයෝජන ලංකා රජයට ප්‍රයෝජනවත් වන ආයෝජන නොවෙයි, ඒක චීන කොලනියක් බවට පත්වනවා කියලා. මේ වාගේ ප්‍රශ්න තිබියදී තමයි එවකට තිබුණු ආණ්ඩුව මේ Colombo Port City Economic Commission එක පත් කළේ.

ගරු අමාත්‍යතුමනි, මම අහන ඊළඟ ප්‍රශ්නය මේකයි.

5. For the past five years, state separately the total expenditure of the Board of Investment and the Colombo Port City Economic Commission - including but not limited to salaries and wages and capital expenditure - their self-generated revenue and Treasury funding and the amount to generate per US dollar of investment actually received.

ගරු අමාත්‍යතුමනි, මේ ප්‍රශ්නය අහන එකේ වැදගත්කමක් තිබෙනවා. Colombo Port City එක හරහා රට තුළට ඇවිල්ලා තිබෙන ආයෝජන පිළිබඳව සහ Colombo Port City Economic Commission එකට යන වියදම පිළිබඳව මේකෙන් අපට දැනගන්න පුළුවන්. Colombo Port City Economic Commission එකේ දැන් ඉන්න DG මහත්මයාව පසුගිය ආණ්ඩුවෙන් තමයි පත් කළේ. ගරු අමාත්‍යතුමනි, අපට තිබෙන තොරතුරු අනුව Colombo Port City Economic Commission එකේ ඉන්න සමහර නිලධාරින්ට රුපියල් ලක්ෂ 10ත්, 12ත් අතර පඩියක් ගෙවනවා. මම ඊයේ හෝ පෙරේදා ප්‍රධාන ඇමතිවරයෙකුගෙන් - මම අමාත්‍යාංශය කියන්නේ නැහැ - ඇහුවා, ඒ අමාත්‍යාංශයේ තිබෙන වැදගත් තනතුරකට තවම කවුරුවත් පත් කරලා නැත්තේ ඇයි කියලා. එතකොට එතුමා කිව්වා, රුපියල් 60,000ක වාගේ පඩියකට එම තනතුරට අවශ්‍ය qualifications තිබෙන අය ගන්න බැහැ කියලා. ඒක අමාත්‍යාංශයක තිබෙන වැදගත් තනතුරක්; රට ගෙනයන්න අවශ්‍ය වැදගත් තනතුරක්. එතැන පඩිය රුපියල් 60,000යි. නමුත් මේ Colombo Port City Economic Commission එකේ වැඩ කරන සමහර නිලධාරින්ට රුපියල් ලක්ෂ 10ක, 12ක වාගේ පඩියක් ගෙවනවා. ඒ වියදමට හරියන්න Colombo Port City Economic Commission එකෙන් අපට ලාභයක් එනවාද? BoI එකේ ඉන්න DGටත් වඩා සමහර අයගේ පඩි වැඩියි. ඒ නිසායි මම wages ගැන ඇහුවේ. අමාත්‍යාංශවල ඉන්න ඔබතුමන්ලාගේ අවධානයත් ඒ සඳහා යොමු කරන්න ඕනෑ. ගරු අමාත්‍යතුමනි, මේ Colombo Port City Economic Commission එක සහ Colombo Port City ව්‍යාපෘතිය පිළිබඳ අපේ ස්ථාවරය මොකක්ද කියලා අපි පෙර සිටම කියා තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, please finish up now.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Okay, මම අවසන් කරනවා.

සාමාන්‍යයෙන් කවුරු හරි ඉඩමක් අරගෙන, ඒ ඉඩම ගත්ත purpose එකට භාවිත කරන්නේ නැත්නම් රජයෙන් ඒ ඉඩම ආපහු ගන්නවා. මේ Colombo Port City එක ගෙනැල්ලා, Colombo Port City Economic Commission එක ස්ථාපනය කළාට පස්සේ, නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා උදේට එතැනට ගිහිල්ලා exercise කරන එකයි - එතැන තැනක් තිබෙනවා, exercise කරන්න - dunesවල buggies පදින එකයි කළා හැරෙන්න ලංකාවේ ජනතාවට මේ Colombo Port City Commission එක හරහා පැමිණ තිබෙන ආයෝජන මොනවාද කියලා බැලුවාම මට නම් කියන්න තරම් දෙයක් පේන්න නැහැ. නමුත් ඒකට යන වියදම කොච්චරද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, please finish up.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ඒ නිසා තමයි මම මේ ප්‍රශ්නය ඉදිරිපත් කළේ, ගරු අමාත්‍යතුමනි.

අනෙක් කාරණය මෙයයි. Colombo Port City Economic Commission එකේ සාමාජිකයින් පාර්ලිමේන්තුවට කැඳවන්න. රජයේ මුදල් පිළිබඳ කමිටුවට - COPF එකට, COPE එකට කැඳවා ඒගොල්ලන්ගෙන් ප්‍රශ්න කරන්න ඕනෑ. මොකද, ඒගොල්ලන් රටේ ජනතාවගේ සල්ලිවලින් ජීවත්වනවා. හැබැයි, රටේ ජනතාවට කිසිදු benefit එකක් ලැබෙන්නේ නැහැ.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා. මොකද, පිළිතුර සූදානම් නැහැ. ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වනවා, කාලීන සහ වැදගත් ප්‍රශ්නයක් ඉදිරිපත් කිරීම පිළිබඳව. ඊළඟ සභා වාරයේදී අනිවාර්යයෙන්ම මේ ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අමාත්‍යාංශ නිවේදන. අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය, ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය.

2026.06.10වන දින ගරු මුජිබුර් රහුමාන් මහතා විසින් අග්‍රාමාත්‍යතුමියගෙන් ප්‍රශ්න ඇසීමේ අවස්ථාව යටතේ අසනු ලැබූ ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම.

## 2026.06.10 දින ගරු මුජිබුර් රහුමාන් මහතා විසින් යොමු කරන ලද ප්‍රශ්නය: ගරු අග්‍රාමාත්‍යතුමියගේ පිළිතුර
## 2026.06.10ஆம் திகதி மாண்புமிகு முஜிபுர் ரஹுமானால் விடுக்கப்பட்ட வினா: மாண்புமிகு பிரதம அமைச்சரினது விடை
## QUESTION POSED BY HON. MUJIBUR RAHUMAN ON 10.06.2026: REPLY BY HON. PRIME MINISTER

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

ගරු කථානායකතුමනි, ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා විසින් 2026.06.10වන දින අසන ලද ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

01. සහන ලබා දී ඇත.

පසුගිය නොවැම්බර් මාසයේදී දිවයින පුරා බලපෑ මෑත කාලයේ විශාලතම ස්වාභාවික ආපදාව වූ "දිට්වා" සුළි කුණාටුව හේතුවෙන් පවුල් 492,302කට අයත් පුද්ගලයින් 1,696,231දෙනෙකු පීඩාවට පත් වූහ. විපතට පත් ජනතාවගේ ජීවනෝපාය සහ සුබසාධනය යථා තත්ත්වයට පත් කිරීම සඳහා රජය ප්‍රමුඛතාවක් දී ක්‍රියාත්මක කරන සහන හා වන්දි වැඩසටහන් බොහොමයක් 2026 ජූනි වන විට ඉහළ ප්‍රගතියක් අත්කරගෙන ඇත. ඒ අනුව, ක්ෂණික සහන සහ යළි පදිංචි කිරීමේ දීමනා යටතේ නිවාස පිරිසිදු කිරීම, මුළුතැන්ගෙයි බඩුමුට්ටු ප්‍රතිස්ථාපනය, තාවකාලික කුලී දීමනා සහ පාසල් සිසුන් සඳහා ලබා දෙන ආධාර ඇතුළු ප්‍රධාන ගෙවීම් බහුතරයක් සියයට 90ක් ඉක්ම වූ ප්‍රගතියක් අත්කරගෙන තිබේ.

ජීවනෝපාය හා කෘෂිකාර්මික ක්ෂේත්‍ර සඳහා ලබා දෙන වන්දි අතර මිරිදිය ධීවර බෝට්ටු හානි සඳහා වන වන්දි සම්පූර්ණයෙන්ම ගෙවා අවසන් කර ඇති අතර, එළවලු, මිරිස්, ලූනු සහ වී වගා හානි සඳහා වන වන්දි ගෙවීම් ද ඉහළ ප්‍රගතියකින් යුතුව ක්‍රියාත්මක වෙමින් පවතී. ජීවිත හානි සහ පූර්ණ ආබාධිතයින් සඳහා වන දීමනා මෙන්ම, සත්ව ගොවිපොළ හිමියන් සඳහා වන දීමනා, සුළු හා ක්ෂුද්‍ර ව්‍යාපාර නැවත ආරම්භ කිරීම සඳහා වන ආධාර ද සැලකිය යුතු මට්ටමකින් ප්‍රගතියක් අත්කරගෙන තිබේ.

විපතට පත් විශාල ජනකායකට දිවයින පුරා එකවර සහන හා වන්දි ලබා දීම සංකීර්ණ ක්‍රියාවලියක් වන බැවින්, තාක්ෂණික හා පරිපාලනමය හේතු මත ඇතැම් ප්‍රමාදයන් ඇති විය හැකි නමුත්, එම බාධක අවම කරමින් ඉතිරි ගෙවීම් කඩිනමින් ජනතාව වෙත ලබා දීමට රජය සහ අදාළ ආයතන අඛණ්ඩව කටයුතු කරමින් සිටී. සියලු මූල්‍ය ප්‍රතිපාදන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් විනිවිදභාවයෙන් වෙන් කර ඇති අතර, ප්‍රමාද වී ඇති අවස්ථා සම්බන්ධයෙන් සොයා බලා කඩිනම් පියවර ගැනීමට අවශ්‍ය උපදෙස් ද ලබා දී ඇත. ඒ අනුව, ඉතිරි සහන හා වන්දි මුදල් ද ඉතා කෙටි කාලයක් තුළ පීඩාවට පත් ජනතාව වෙත ලබා දීමට අපේක්ෂා කෙරේ.

ආපදාවට ලක්වූවන් සවිබලගැන්වීමේ වැඩසටහන යටතේ ආරක්ෂක අමාත්‍යාංශය විසින් 2026.06.05 දිනට ලබා දුන් සහනවලට අදාළ ප්‍රගතිය ඇතුළත් ලේඛනයක් ඇමුණුම 01 ලෙස දක්වා ඇත.

02. ව්‍යසන කළමනාකරණ පනතේ 11(1) වගන්තිය අනුව ගරු ජනාධිපතිතුමා හෝ ආරක්ෂක ලේකම් විසින් කිසිදු ගැසට් නිවේදනයක් නිකුත් කර නොමැත.

රාජ්‍ය නිලධාරින්ගෙන් උපරිම සේවයක් ලබා ගැනීමටත්, එමඟින් ආපදා තත්ත්වයට වඩාත් සාර්ථකව මුහුණදීමටත්, විශේෂයෙන් කඩිනම් සහන වඩාත් ඉක්මනින් පැය 24 පුරා ලබා දීමටත්, අංක 03/2025 දරන ආපදා සහන සේවා චක්‍රලේඛය මඟින් 2025.11.21වන දින සිට නැවත දැනුම් දෙන තෙක් විස්තීර්ණ ආපදා තත්ත්වයක් ආරක්ෂක ලේකම්වරයා විසින් ප්‍රකාශයට පත් කරන ලදී. මෙය ගැසට් පත්‍රයක් නොවන අතර, ආපදා සහන සේවා චක්‍රලේඛයක් පමණි. එය ඇමුණුම 02 ලෙස දක්වා ඇත.

03. "දිට්වා" ආපදාව සිදුවන විට 2005 අංක 13 දරන ව්‍යසන කළමනාකරණ පනත සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක වී නොතිබුණි. එම පනතේ දක්වා ඇති ආයතනික රටාව හා සැලසුම් සඳහා වන ක්‍රමවේද පූර්ණ වශයෙන් ස්ථාපිත කර නොතිබුණි.

එබැවින්, පැන නැඟුණු හදිසි තත්ත්වයට මුහුණ දීම පිණිස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ මහජන ආරක්ෂක ආඥාපනතේ ප්‍රතිපාදන යටතේ ගරු ජනාධිපතිතුමාගේ තීරණය පරිදි හදිසි අවස්ථාවක් ප්‍රකාශයට පත් කරන ලදී.

එසේම, පැන නැඟුණු ආපදාවට ක්ෂණිකව මුහුණ දීම පිණිස;

- රට යළි ගොඩනැඟීම සඳහා දේශීය හා විදේශීය මූලාශ්‍රවලින් ලැබෙන ආධාර භාර ගැනීමටත්, එවැනි ආධාර ලබා ගැනීම උදෙසා දේශීය හා ජාත්‍යන්තර තලවල සහාය හා අනුග්‍රහය ලබා ගැනීමේ - lobbying - කටයුතු සිදු කිරීම පිණිසත් රාජ්‍ය අංශ හා පෞද්ගලික අංශ ඒකාබද්ධ වන පරිදි "Rebuilding Sri Lanka" අරමුදලේ පාලක කමිටුව පත් කිරීමත්,
- ඉන් අනතුරුව, රාජ්‍ය අංශයේ හා පෞද්ගලික අංශයේ සහයෝගය සාක්ෂාත් කර ගැනීම පිණිස ඊට අදාළ ජනාධිපති කාර්ය සාධක බලකායක් පිහිටුවීමටත් කටයුතු කරන ලදී.

තවද, ලැබෙන ආධාර සියල්ල භාණ්ඩාගාරයේ පාලනය යටතේ ඇති භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් යටතේ පවතින ගිණුම්වල සුරක්ෂිතව පවතී. ඒ අනුව, මෙකී කිසිදු කටයුත්තක් මඟින් ව්‍යවස්ථාපිත නොවන අරමුදලක් පිහිටුවීම සිදු කර නොමැත.

04. **පාලක කමිටුවේ සාමාජිකයින්:**

මෙම පාලක කමිටුව සාමාජිකයින් එකොළොස් දෙනෙකුගෙන් සමන්විත වේ.

| # | නම | තනතුර |
|---|---|---|
| i. | ගරු (ආචාර්ය) අනිල් ජයන්ත ප්‍රනාන්දු මහතා | කම්කරු අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍ය |
| ii. | ගරු හනීෆ් යූසුෆ් මහතා | බස්නාහිර පළාත් ආණ්ඩුකාරවර |
| iii. | ආචාර්ය හර්ෂණ සූරියප්පෙරුම මහතා | ලේකම්, මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය |
| iv. | දුමින්ද හුලංගමුව මහතා | ජනාධිපති ජ්‍යෙෂ්ඨ උපදේශක |
| v. | ජී.එම්.ආර්.ඩී. අපෝන්සු මහතා | ජනාධිපති ජ්‍යෙෂ්ඨ අතිරේක ලේකම් |

[ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය]

| # | නම | තනතුර |
|---|---|---|
| vi. | සුගීෂ්වර ගුණරත්න මහතා | අධ්‍යක්ෂ ජනරාල් (යුරෝපා හා උතුරු ඇමෙරිකා කටයුතු), විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය |
| vii. | මොහාන් පණ්ඩිතගේ මහතා | - |
| viii. | ක්‍රිෂාන් බාලේන්ද්‍ර මහතා | - |
| ix. | ආචාර්ය පරාක්‍රම දිසානායක මහතා | - |
| x. | අෂ්රොෆ් ඕමාර් මහතා | - |
| xi. | ඉෂාර නානායක්කාර මහතා | - |

පාලක කමිටුවේ කාර්යභාරය සහ මෙතෙක් ප්‍රගතිය:

අරමුදල් සාර්ථකව එක්රැස් කිරීම, එම මුදල් භාණ්ඩාගාරය යටතේ විනිවිදභාවයෙන් සහ ආරක්ෂිතව පවත්වා ගෙන යාම සහ අරමුදල නිල වශයෙන් ස්ථාපිත වීමෙන් අනතුරුව කාර්යක්ෂමව ක්‍රියාත්මක වීමට අවශ්‍ය නීතිමය හා ආයතනික රාමුව සකස් කර ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට කටයුතු කිරීම.

05. ස්වාධීන ව්‍යවස්ථාපිත අරමුදලක් පාර්ලිමේන්තු පනතක් මඟින් සම්මත කර බලාත්මක කිරීමට අදාළ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමට යම්කිසි සැලකිය යුතු කාලයක් ගත වේ. නමුත් පරිත්‍යාගශීලීන්ගෙන් ලැබෙන ආධාර ප්‍රමාදයකින් තොරව භාර ගැනීම සඳහා මහා භාණ්ඩාගාරය යටතේ විශේෂ තැන්පතු ගිණුමක් විගණකාධිපතිවරයාගේ අධීක්ෂණයට යටත් වන පරිදි විවෘත කිරීමට කටයුතු කරන ලදී. මහජනතාවගේ සහ පරිත්‍යාගශීලීන්ගේ මුදල් කිසිදු පෞද්ගලික ගිණුමකට හෝ නීති විරෝධී ගිණුමකට බැර කර නොමැති අතර, ඒවා භාණ්ඩාගාරයේ පාලනය යටතේ ඇති භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් යටතේ පවතින ගිණුම්වල සුරක්ෂිතව පවතී. එම නිසා නීත්‍යානුකූලභාවය පිළිබඳ ගැටලුවක් පැන නොනඟී.

06. මේ දක්වා "Rebuilding Sri Lanka" විශේෂ භාණ්ඩාගාර ගිණුමට දේශීය හා විදේශීය පරිත්‍යාගශීලීන්ගෙන් ලැබී ඇති සමස්ත මුදල 2026.05.29 දිනට රුපියල් 7,599,589,000ක් හා ඇමෙරිකානු ඩොලර් 11,584,562.18කි. ඒ අනුව සමස්ත එකතුව රුපියල් 11,341,628,483.10කි.

ආපදා තත්ත්වයෙන් පීඩාවට පත් ජනතාවට සහන සැලසීම සහ හානියට පත් යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා පරිත්‍යාගශීලීන් විසින් ලබා දී ඇති සියලුම මූල්‍ය ආධාර, මේ වනවිට භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයාගේ අධීක්ෂණය යටතේ පවත්වා ගෙන යනු ලබන විශේෂ ගිණුමක සුරක්ෂිතව තැන්පත් කර ඇත. ජාතික ප්‍රමුඛතා සහ අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් හඳුනා ගනු ලබන ව්‍යාපෘති සඳහා මෙම අරමුදල් විනිවිදභාවයෙන්, වගවීමෙන් සහ කාර්යක්ෂමතාවෙන් යුතුව යොදා ගැනීමට නියමිතය. එම ව්‍යාපෘති ප්‍රධාන වශයෙන් ආපදාවෙන් පීඩාවට පත් ජනතාවට සහන සැලසීම, ජීවනෝපාය ප්‍රතිෂ්ඨාපනය කිරීම සහ හානියට පත් පොදු යටිතල පහසුකම් හා අත්‍යවශ්‍ය සේවා නැවත නඟාසිටුවීම කෙරෙහි අවධානය යොමු කරනු ඇත. එසේම, මෙම අරමුදල්වල කළමනාකරණය සහ භාවිතය සම්බන්ධ සියලු කටයුතු ඉහළම විනිවිදභාවය, වගවීම සහ යහපාලන මූලධර්මයන්ට අනුකූලව සිදු කෙරෙනු ලැබේ.

07. පළාත් සභා මැතිවරණයට වෙන් කළ මුදල් ආපදා සහන සඳහා යොදා ගෙන නැත. එබැවින් වියදම් කළ මුදල් ප්‍රමාණය කොපමණද යන ප්‍රශ්නය අදාළ නොවේ.

ඇමුණුම් 01 සහ 02 **සභාගත*** කරමි.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. විශේෂයෙන්ම දැන් මේ "Rebuilding Sri Lanka" කියලා අරමුදලක් නැහැ කියන එක තහවුරු වෙනවා. එතකොට ඒ එකතු කරපු මුදල භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයා යටතේ තිබෙන ගිණුමක තමයි තිබෙන්නේ. ගරු අගමැතිතුමියනි, ආණ්ඩුව පැත්තෙන් සියලුදෙනාගෙන් ඉල්ලා සිටියේත්, ප්‍රචාරය කළේත්, මේ "Rebuilding Sri Lanka" කියන ගිණුමට මුදල් බැර කරන්න කියලා නේ. නමුත්, එහෙම ගිණුමක් නැහැ. රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේදීත් එහෙම ගිණුමක් නැහැ කියන එක පිළිගත්තා. එතකොට ඒ මුදල් භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්වරයා යටතේ තිබෙන ගිණුමකට තමයි යන්නේ. එලෙස එකතු කර තිබෙන මුදල් මේ වනවිට මොන මොන ව්‍යාපෘති සඳහා වියදම් කරලා තිබෙනවාද, කොයි තරම් මුදල් ප්‍රමාණයක් වියදම් කර තිබෙනවාද, ඒ මුදල් වියදම් කළාට පස්සේ කොයි තරම් මුදල් ප්‍රමාණයක් ඉතුරු වෙලා තිබෙනවාද කියන එක දැනගන්න පුළුවන්ද?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා ඒ පිළිබඳව සවිස්තර පිළිතුරක් සපයනවා.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

ගරු මන්ත්‍රීතුමනි, මේ කාරණය පැහැදිලි කර ගන්න ඕනෑ මෙහෙමයි. මෙතැන "අරමුදල" කියලා කියන්නේ අරමුදල් රැස් කිරීම. වෙනම අරමුදලක් නීත්‍යානුකූලව හදන එකත්, අරමුදල් රැස් කිරීම කියන එකත් කාරණා දෙකක්. මෙහි අදාළ කමිටු පත් කිරීම ඇතුළු ඒ සියල්ල කළේ මේ අදාළ කාරණය සඳහා අරමුදල් රැස් කරන්නයි. ඒ සඳහා වඩාත්ම නීත්‍යානුකූල ක්‍රමවේදය මේකයි. අපි කවුරුත් දන්නේ නැති, එළියේ තිබෙන ගිණුමකට වඩා, මහා භාණ්ඩාගාරය සතුව ඒකාබද්ධ අරමුදල තිබෙනවා. ඒ ගිණුමට මුදල් දමන්න කියලා අපි ආරාධනා කළා, මෙය ගොඩනැඟීම සඳහා. ඒ කියන්නේ, "Rebuilding Sri Lanka" කියන කාර්යයට. ඒ සඳහා රුපියල් බිලියන 500ක් වියදම් කිරීම වෙනුවෙන් අවශ්‍ය මුදල් වෙන් කිරීමට අපි පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගත්තා. අන්න ඒ මුදල් වියදම් කරන්න ගන්න financing source එක තමයි, මේ රැස් කරන අරමුදල. ඒ රුපියල් බිලියන 500ම එතැනින් ආවා නම් ඒත් ප්‍රශ්නයක් නැහැ. දැනටමත් ඒ මුදල් එම ගිණුම්වල තිබෙනවා. ඒ කියන්නේ, භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් සතුව ගිණුම් ගණනාවක් තිබෙනවා. ඒ ගිණුම්වලට ආපු මුදල් එහෙමම

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

තැන්පත් වෙලා තිබෙනවා. හැබැයි, අපි මේ වියදම් කරන රුපියල් බිලියන 500 ගත්තොත්, දැනටමත් රුපියල් බිලියන 248කට අදාළව allocations දීලා එළියට ගිහිල්ලා තිබෙනවා. එතකොට ඒ සම්බන්ධයෙන් ගිණුම්කරණ කාරණයක් තමයි ඉදිරියේදී සිදු වෙන්නේ.

ගරු මන්ත්‍රීතුමනි, මේකේ කොච්චර මුදල් ප්‍රමාණයක් තිබෙනවාද කියලා ඔබතුමා ඇහුවා. රුපියල්වලින් ගත්තොත්, එම මුදල රුපියල් බිලියන 11කට ආසන්නයි. ඒ අනුව සමස්ත රුපියල් බිලියන 500න් එතැනින් ලැබිලා තිබෙන්නේ රුපියල් බිලියන 11යි. ඒ නිසා කිසිදු ආකාරයක,-

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මම ඇහුවේ ඒක නොවෙයි.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
ඉන්න, මම ඒ ගැන පැහැදිලි කරන්නම්.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මම ඇහුවේ රුපියල් බිලියන 11න් කොයි තරම් ප්‍රමාණයක්,-

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
මුදල් ගිණුම්ගත කළොත්, රුපියල් බිලියන 500ක් වෙන් කරලා තිබෙනවා. ඒකෙන් රුපියල් බිලියන 248ක් දැන් වියදම් කරලා තිබෙනවා. රුපියල් බිලියන 500ක්ම මේ අරමුදල සඳහා ලැබුණා නම්, ඒ රුපියල් බිලියන 500ම තමයි වියදම් වෙන්නේ. දැන් මේ රුපියල් බිලියන 500න් අපි කියන පරිත්‍යාග, අපි මේ කරන ඉල්ලීම් නිසා පිටින් අපට ලැබිලා තිබෙන්නේ රුපියල් බිලියන 11යි. ඒ කියන්නේ, තවත් රුපියල් බිලියන 489ක්ම භාණ්ඩාගාරය ඇතුළෙන් තමයි වියදම් වෙන්නේ. ඒ නිසා කිසිදු ආකාරයකට නීති විරෝධී දෙයක් සිදු වෙලා හෝ වෙන තැනකට මුදල් ගිහිල්ලා නැහැ. එම නිසා වඩාත් උචිතව වර්ෂය අවසානයේදී මේ ගිණුම්ගත කිරීම ගත්තොත්, මේ රුපියල් බිලියන 500න් කොච්චර වියදම් කළාද, ඒ සඳහා මූල්‍යනය කළේ මොන ආකාරයටද, ඒකාබද්ධ අරමුදලෙන් කොච්චර ගත්තාද, මේ ගත්ත ප්‍රමාණයෙන් අපි කොච්චර වියදම් කළාද කියන එක ඉදිරිපත් කරනවා. ඒ වාගේම යම් ඉතුරුවක් තිබෙනවා නම් ඒකත් කොහොමද ගිණුම්ගත කරන්නේ කියන කාරණය පැහැදිලි කරනවා. ඒ අනුව ඉතාම පැහැදිලියි ගරු මන්ත්‍රීතුමනි, රුපියල් බිලියන 11ක් ලැබිලා තිබෙන්නේ, රුපියල් බිලියන 500ක වියදම් ඇස්තමේන්තුවකට කියන එක. ඒ නිසා කිසිදු ආකාරයකට මේකෙන් මුදල් වියදම් නොවී තිබෙනවා කියන එක නොවෙයි කියන්නේ. ඒ කියන්නේ, ගිණුම්ගත කිරීම සඳහා ඉදිරියේදී අපට අවශ්‍ය වෙන්නේ අර රුපියල් බිලියන 500න්, ඒකාබද්ධ අරමුදලෙන් කොච්චර ගියාද කියන එකයි. මේකත් ඒකාබද්ධ අරමුදලම තමයි. ප්‍රශ්නයක් මතු වුණේ ගරු මන්ත්‍රීතුමනි, අරමුදල කිව්වාම. අතීතයේදී ඒකාබද්ධ අරමුදලෙන් පිට අරමුදල් හදලා තිබුණා නේ, සුනාමි අරමුදල් වාගේ. ඒ නිසා කාට හරි අදහසක් ආවා, මේකත් එළියේ කොහේ හෝ හදපු එකක්ද කියලා. නමුත්, අපි එහෙම හැදුවේ නැහැ. අපි භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ ගිණුමට ඒ සියල්ල ගත්තේම ඒකයි. එතකොට ඒ මුදල් වියදම් කරන්නේ වෙනත් ගිණුමක් හරහාද, එහෙම නැත්නම් ඒකාබද්ධ අරමුදල් හරහාද කියන කාරණය ඉදිරියේදී අපි ඉදිරිපත් කරනවා.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු කථානායකතුමනි, මේ ගැන පැහැදිලි කරගන්න මම ඔබතුමාගෙන් පොඩි වෙලාවක් ඉල්ලා සිටිනවා. මොකද, අනිල් ජයන්ත ඇමතිතුමා මම අහපු ප්‍රශ්නයට නොවෙයි උත්තරය දුන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මම දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්නම්, එතුමා කියපු දේ ගැනත් සඳහන් කරන ගමන්ම. මම පැහැදිලිවම ඇහුවේ මේ අරමුදලෙන් එකතු කර ගත්ත මුදලෙන් කොයි තරම් ප්‍රමාණයක් වියදම් කළාද කියලායි. එතුමා කිව්වා, එකතු කර ගත්ත මුදල මහා භාණ්ඩාගාරයට එකතු කරලා තිබෙනවා, මහා භාණ්ඩාගාරයේ මුදල් එක්ක වියදම් වෙනවාය කියලා. ඒක නොවෙයි නේ ප්‍රශ්නය.

ආණ්ඩුව පැහැදිලිව කිව්වා, "Rebuilding Sri Lanka" කියලා අරමුදලක් හදනවාය කියලා. නමුත්, එහෙම අරමුදලක් නැහැ. එහෙම අරමුදලක් හදන්න ඕනෑ ව්‍යවස්ථාපිත අරමුදලක් හැටියට, පාර්ලිමේන්තුවට යෝජනාවක් ඉදිරිපත් කරලා ඒක සම්මත කරගෙනයි. ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනතේ ඒක පැහැදිලිව තිබෙනවා. නමුත් ඒ කටයුත්ත සිදු වෙලා නැහැ. මෙතුමා කියනවා, ඒ සල්ලි ටික මහා භාණ්ඩාගාරයේ එකතු කර තිබෙනවා, මහා භාණ්ඩාගාරයේ තිබෙන සල්ලිත් එක්ක ඒවා වියදම් කරනවා කියලා. ඒක හරියන්නේ නැහැ. මිනිසුන්ට කියලා, දානපතියන්ගෙන්, ව්‍යාපාරිකයන්ගෙන් අරමුදලක් එකතු කරන්නේ ආපදා වෙනුවෙන් වියදම් කරන්න. ඒ අරමුදලෙන් වියදම් කරපු ප්‍රමාණය පිළිබඳව තමයි මම ඇහුවේ.

කොහොම වුණත්, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය දැන් මම අහන්නම්, ගරු කථානායකතුමනි. මේ ආපදාවෙන් පීඩාවට පත් වෙච්ච අය අතරින්, ස්ථිර නිවාසවල පදිංචි වෙලා හිටපු විශාල පිරිසක් ඉන්නවා. ස්ථිර නිවාසවල පදිංචි වෙලා හිටපු අයත් මේ "දිට්වා" සුළි කුණාටුවෙන් පීඩාවට පත් වෙලා තිබෙනවා. ඒ වාගේම ඔවුන්ගේ නිවාස හා ඉඩකඩම් විශාල වශයෙන් මේ ආපදාව නිසා හානියට පත් වෙලා තිබෙනවා. අවුරුදු ගණනාවක් ඒ ස්ථිර නිවාසවල පදිංචි වෙලා හිටපු අයට යම් යම් ලියකියවිලි ඉදිරිපත් කිරීම හා ඒවා ඔප්පු කිරීම සම්බන්ධයෙන් ගැටලු රාශියක් මතු වෙලා තිබෙනවා. අයට සහන සලසා දීලා නැහැ. ඒ අය වෙනුවෙන් ලබා දෙන සහන මොනවාද කියලා මම දැනගන්න කැමැතියි.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු කථානායකතුමනි, අපි මේ පිළිබඳව නිරන්තර සෝදිසියෙන් කටයුතු කරනවා. මොකද, ඒ එක් එක් අවස්ථාව වෙනස්. එලෙස නැති වූ සමහර නිවාස පිහිටා තිබුණු ඉඩම් අනවසර ඉඩම්. ඒ වාගේම සමහර ඒවා රජය සතු ඉඩම්. ඒ වාගේ ප්‍රශ්න ගණනාවක් තිබෙනවා. සමහර ඒවා NBRI එකෙන් ඉවත් වෙන්න කියලා තිබුණු ඉඩම්. ඒ නිසා ඒ, ඒ දිස්ත්‍රික්කවල ඒ, ඒ ආවේණික තත්ත්වයන් අනුව අපි ඒ එකින් එකට විසඳුම් හොයමිනුයි ඉන්නේ. සම්පූර්ණයෙන්ම අලුත් නිවාස හදා ගැනීම අවුරුද්දක් විතර කාලයක් ගත වන ක්‍රියාවලියක්. ඒක මේ

[ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය]

මොහොතේදීත් සිද්ධ වෙමින් පවතිනවා. ඒවායේ ප්‍රගතිය පිළිබඳ විස්තර ඇතුළත් ලේඛන මම සභාගත කළා. ඊට අමතරව, ඔවුන්ට කුලියට ඉන්න හෝ නෑදෑයෙකුගේ ගෙදරක ඉන්නත් යම් දීමනාවක් අපි ලබා දීලා තිබෙනවා. එහෙමත් කරන්න බැරි වුණාම අපි ඒ අය වෙනුවෙන් transitional housing project එකකුත් පටන් අරගෙන තිබෙනවා. දැන් සෑහෙන දුරට ඒ කටයුතු සම්පූර්ණ වෙලා තිබෙනවා. ඒ අනුව ඒ අයට transitional housing ලබා දෙන්නත් අපි කටයුතු කර තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මීළඟ අමාත්‍යාංශ නිවේදනය, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන්, ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා.

## NDB බැංකුවේ රුපියල් බිලියන 13.2ක මූල්‍ය වංචාව: මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රකාශය
## NDB வங்கியில் இடம்பெற்ற 13.2 பில்லியன் ரூபாய் நிதி மோசடி: நிதி, திட்டமிடல் பிரதி அமைச்சரினது கூற்று
## RS. 13.2 BILLION FINANCIAL FRAUD AT NDB BANK: STATEMENT BY DEPUTY MINISTER OF FINANCE AND PLANNING

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)

ගරු කථානායකතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි. 2026.05.05වැනි දින ගරු රවී කරුණානායක මහතා විසින් ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නයට මා පිළිතුරු ලබා දෙනවා. මා එය ඉංග්‍රීසි භාෂාවෙන් කියවන්නම්.

1.
- In terms of the Banking Act, the Bank Supervision Department - BSD - is entrusted with the regulation and supervision of licensed banks.
- This responsibility is discharged primarily through prudential regulations, continuous supervision and statutory examinations.
- The Bank Supervision Department - BSD - adopts a risk-based supervisory framework that prioritizes significant risks including credit, liquidity, market operational et cetera and availability of resources such as capital, earnings, management and governance to mitigate such risks and to meet potential shocks.
- Accordingly, the supervisory framework adopted by the BSD is focused on prudential supervision and should not be construed as a financial audit, investigative exercise or forensic audit.
- This process supported to ensure the continuing stability of the banking sector including the last three years in the aftermath of the severe macroeconomic stress.

2. As per the AML/CFT legal mandate provided in the Financial Transactions Reporting Act, No. 6 of 2006 - FIRA, the FIU is responsible for receiving Suspicious Transaction Reports - STRs, analysing them for potential money laundering or terrorist financing activities and disseminating relevant financial intelligence to competent authorities for appropriate action. Accordingly, all such Suspicious Transaction Reports - STRs - received had been duly acknowledged and all STRs received in this instance, too, had been acted upon in terms of the law. That is, the Financial Transactions Reporting Act. Once the STRs were received, the necessary law enforcement agency, in this particular case, the CID, referral would be carried out after FIU concludes its analysis and the further information collection prior to dissemination. All actions have been taken in line with the “follow the money approach” in focus. It is important to note that no STRs, which were reported to the FIU, were reported with direct reference to any NDB fraudulent transactions prior to the disclosure made by the NDB. However, the recipient entity in the NDB fraud, where majority of funds had been transferred, was identified by the Financial Intelligence Unit - FIU - as one major party in a network, who seems to be engaged in various suspicious financial activities. Financial intelligence with an extensive analysis done by the FIU relating to the said network, including recipient entity as well, has been provided to the law enforcement authorities in three instances, prior to the official disclosure made by the NDB.

3.
- The investigations by the law enforcement authorities and other relevant parties are ongoing.
- Bank Supervision Department examination up to this point reveals that the total value involved in this incident of NDB is Rs. 13.2 billion.
- No losses have come to light in any other financial institution.

4. The payment infrastructure provider, that is LankaPay (Pvt.) Ltd., normally called “LankaPay”, facilitates the switching of transaction between the originating institution and the receiving institution and operates as a "pass-through." Currently, LankaPay neither has the authority nor the mandate to verify the authenticity of the transactions processed through its systems nor to validate or check the legitimacy of transactions.

5.
- The proposed dividends amounting to Rs. 2.76 billion scheduled to be paid on 06th April, 2026 were suspended by an order of BSD, in terms Section 45(1) of the Banking Act, No. 30 of 1988, as amended.

- The total value of cash dividends withheld for all institutional shareholders is Rs. 2.19 billion, of which EPF was entitled to receive approximately Rs. 260 million.

6. Financial Institutions in Sri Lanka such as the National Development Bank are liable for the following taxes:

   - Corporate Income Tax - CIT - of 30 per cent;
   - Value Added Tax -VAT- of 18 per cent and Social Security Contribution Levy - SSCL - of 2.5 per cent on financial services;
   - A final Withholding Tax - WHT - on Advance Income Tax - AIT - of 15 per cent on dividend. That is, as a final tax.

   Hence, the tax implications of the financial fraud of Rs. 13.2 billion will depend upon the accounting treatment of the resultant loss due to the fraud. That is yet to be done.

   The implications of the reported financial fraud amounting to Rs. 13.2 billion will depend on how the resultant loss is ultimately recognized and treated in the Bank's financial statements and tax returns.

   Accordingly, the related fiscal impact cannot be reliably estimated until the forensic review is completed and the final accounting treatment is determined.

   As per the information gathered from authorized representative of the Bank, the forensic review started by the Central Bank of Sri Lanka has not yet been finalized and the final quantified impact of the fraud remains subject to confirmation.

   In view of the above circumstances, particularly:

   - the absence of finalized forensic findings by the Central Bank of Sri Lanka,
   - the non- submission of amended tax return, reflecting the reported fraud losses along with restated financial statements by the Bank, the Inland Revenue Department is presently not in a position to reliably estimate the total fiscal impact, including direct tax losses, indirect tax losses and any potential non-collectability arising from the reported fraud incident.

7. As mentioned in answer to Question No. 3 above, the relevant investigations in this regard are currently ongoing.

8. - NDB's share price followed a downward trend since the first market disclosure of information on 02nd April, 2026, starting at Rs. 130.50 and declined to Rs. 116.00 by 04th May, 2026.
   - NDB's market capitalization was approximately Rs. 56 billion at the time of disclosure of information and since then, the share price has been between Rs. 111 and Rs. 116 and hence, market capitalization has come down to Rs. 48 to Rs. 50 billion.

9. The Board of Directors of the National Development Bank PLC has appointed the Deloitte Touche Tohmatsu India LLP, an international independent firm, to conduct a forensic audit. The Central Bank of Sri Lanka was consulted in the formulation of the ToR of the forensic audit and will directly report to the Central Bank of Sri Lanka. The scope includes investigation of governance issues which will assist decisions to be made on any further regulatory actions that may be required.

Thank you.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Hon. Ravi Karunanayake, you can get a short clarification.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Hon. Speaker, I think the quality of the answers that come from the Central Bank of Sri Lanka is deteriorating by the day. With regard to this information that comes in, Hon. Minister, you have now become only a post box and nothing more than that. I am sorry to say that, but we are playing around with the financial system of this country. Sir, firstly, the information that has been given is wrong. While this Question is being answered today, Deloitte has given an internal report saying that the loss is Rs. 13.5 billion, whereas the Central Bank is reporting through the Minister that it is Rs. 13. 2 billion.

Sir, by asking these questions in Parliament, if we do not get the truth coming out from them, from what institution could we get information on the reality? This is not the first time this is happening, Hon. Minister. So, what you reported was wrong.

If a person who has only Rs. 1 billion does not pay Rs. 25,000, the Inland Revenue Department would run after him and he would be taken to the Magistrate's Court. Here, they have had a loss of Rs. 6 billion and it is seen. The loss is Rs. 13.2 billion and 40 per cent of it is roughly Rs. 6 billion. So, with regard to that Rs. 6 billion that is not coming in, what does the Central Bank say? Their job is to act as a regulator, Hon. Minister. So, the regulator is, basically, not performing its duty and pointing fingers all over. I am speaking on behalf of the general public who are investing in the financial system. The regulator is supposed to regulate it on behalf of us. And, Hon. Minister, first of all, please do not read out the answer that had been sent to you unless it satisfies you because this is concealment of the truth. People are looking out for an answer. If Rs. 13 billion goes off from your reserves and the share prices only vary by Rs. 11, there is something radically wrong.

The most important thing I want to highlight is this. In answer to question number 2, the Hon. Minister was saying that suspicious transactions must be reported to the FIU. That is the accepted norm. My question was

[ගරු රවි කරුණානායක මහතා]

regarding that. He was telling me the same thing that I asked from him. We brought the officials responsible before the Committee on Public Finance and we did not get an answer. I am sorry, but there is a deterioration, a degeneration. If this type of thing goes on, it will create a huge problem.

Not only that, Hon. Minister, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, you have to shorten your explanation and ask the question.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
I am making an explanation because it is very important, Sir, and let me ask the question.

Hon. Minister, there is another thing. A suspicious transaction has two ends. If one bank has a problem, it is remitted to another bank. There are six banks and 10 non-banking institutions. Two banks have reported it regarding the NDB. So, on this score, if there are any suspicious transactions, the other bank has a right to inform about it to the FIU. So, are you telling me that 3,000 transactions could take place without the Bank Supervision Department finding the trend in the movement of those funds? If so, I think we are in serious jeopardy. So, Sir, I would greatly appreciate if you would, through the Hon. Minister, get this verified. If you want, you could retract this Question and get them to answer it properly because I am appalled at the level of reporting by such an independent institution to Parliament.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Dr.) Anil Jayantha, you may respond.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
Hon Deputy Speaker, Rs. 13.2 billion is the loss reported as to the records and the calculations available to the Central Bank. Hon. Member, as you said, if there is a difference in the report provided by Deloitte, we will take it into account. But, I did not get Deloitte's report.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
You were answering Parliament today.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
Maybe, there is a timeline difference. But, regarding that particular amount, what is reported is that it is Rs. 13.2 billion. So, we will also look at that other amount you referred to.

And coming back to the IRD issue, in fact, the estimation or any other action will have to be decided upon based on how this particular loss is going to be accounted for, whether it is going to be accounted for as an entire loss or whether the loss is going to be recovered. So, likewise, there may be some implications and that would be the reason why it cannot be reliably estimated. However, I am sure that the IRD, as you highlighted, would take all these actions in line with this and do the calculations. So, there is nothing to worry about.

The other point that you highlighted was about the STRs received by other banks. With reference to this particular NDB matter, even after making this particular disclosure, the Central Bank has not received any STRs. But, other STRs may have been received by other bank. However, if you could specifically mention the names of those banks and reports, we could request the Central Bank to get all those reports.

And the final point is, you highlighted about the share price implications. When we take share prices, there is no theory or deterministic situation which says that when the value goes down, the share price would react on *pro rata* basis. The price really depends on market dynamics and other factors as well. Anyhow, we accept the fact that there is an impact on the market price. As a result, it has come down. So, it really depends. As of now, if we just look at the banks, the statistics on capital adequacy, equity adequacy and all those are above the minimum requirements. Based on the available information, prudential action is being taken and regulated accordingly by the Central Bank.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Hon. Minister, I am sorry to disagree with you.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Ravi Karunanayake, shall we now move on to the main Business of the Day?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

How this transaction comes about is when one bank - the NDB - remits to the other banks. Because of its sensitivity, I would not mention the name of the other bank.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Ravi Karunanayake, we will not go into a debate on this. We have the Meeting of the Committee on Parliamentary Business also and I think you are also needed there.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

I know, I also have got to go for that Meeting.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Yes. And the Hon. Chief Government Whip also has to go.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

So, on that basis, if the other bank does not report the issue that they have received such a -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Okay, Hon. Member. Now, we will get on with the Business of the Day. - *[Interruption.]*

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

Hon. Member, -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. (Dr.) Anil Jayantha, shall we move on?

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

Hon. Member, if there is any other additional information, we will refer it back to the bank and report.

Thank you.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Notice of Motions at the commencement of the Public Business, the Leader of the House of Parliament.

## පාර්ලිමේන්තුවේ කටයුතු
### பாராளுமன்ற அலுவல்
### BUSINESS OF THE PARLIAMENT

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු සභානායකතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයේ විෂය අංක 1, 2, 3, 4, 5, 6 සහ 7 පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී අංක 24(2) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගයෙහි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය."

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, Private Members' Motions.

Private Members' Motions listed for today are, P. 55/2025, P. 58/2025, P. 57/2025, P. 59/2025, P. 61/2025 and P. 70/2025.

## පෞද්ගලික මන්ත්‍රීන්ගේ යෝජනා
### தனி நபர் பிரேரணைகள்
### PRIVATE MEMBERS' MOTIONS

### රත්නපුර දිස්ත්‍රික්කයේ කොලොන්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මඩුවන්වෙල වලව්ව ප්‍රමුඛ ශ්‍රී ලංකාවේ ඓතිහාසික වටිනාකමින් යුත් ස්ථාන ආරක්ෂා කිරීම
### இரத்தினபுரி மாவட்டத்தில் கொலொன்ன பிரதேச செயலாளர் பிரிவுக்குரிய மடுவன்வெல பிரபுமனை - வலவ்வ - உட்பட இலங்கையிலுள்ள புராதன பெறுமதிவாய்ந்த தலங்களைப் பாதுகாத்தல்
### PRESERVATION OF PLACES OF HISTORICAL VALUE IN SRI LANKA, INCLUDING MADUWANWELA WALAWWA, WHICH BELONGS TO THE KOLONNA DIVISIONAL SECRETARY'S DIVISION OF THE RATNAPURA DISTRICT

[පූ.භා. 11.42]

**ගරු උපුල් කිත්සිරි මහතා**
(மாண்புமிகு உபுல் கித்சிறி)
(The Hon. Upul Kithsiri)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "රත්නපුර දිස්ත්‍රික්කයේ කොලොන්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ඓතිහාසික ස්ථානයක් වන මඩුවන්වෙල වලව්ව ප්‍රමුඛ ශ්‍රී ලංකාවේ ඓතිහාසික වටිනාකමින් යුත් ස්ථාන බොහෝ ප්‍රමාණයක් පවතින හෙයින් ද, එම ස්ථාන සංචාරක ආකර්ෂණයට ලක් වී ඇති හෙයින් ද, වර්තමානය වන විට එවැනි ස්ථාන දැඩි අනාරක්ෂිත

[ගරු උපුල් කිත්සිරි මහතා]

තත්ත්වයට පත් වී ඇති හෙයින් ද, එම ස්ථානවල මුල් පෞරාණිකභාවයට හානියක් නොවන ලෙස සංරක්ෂණය කොට එම ස්ථාන සතු ඉඩම් කඩිනමින් මැන නිරවුල් කොට අනාගත පරපුර සඳහා ආරක්ෂා කර දෙමින් සංචාරක කර්මාන්තයට යොදා ගැනීම සඳහා ඒවා ආරක්ෂා කිරීමට වැඩ පිළිවෙළක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රටට අවුරුදු 125,000කට වැඩි ඈතකට දිව යන ඉතිහාසයක් තිබෙන බව අපි දන්නවා. අපේ රටට සංස්කෘතිකමය වටිනාකමක් එන්නේ බෞද්ධාගම පැමිණීමත් සමඟයි. ඒ සංස්කෘතිය නව ආරකින් සහ සංවිධිතව ආරම්භ වෙනවා. ශ්‍රී ලංකාව පුරා ඇති වර්ග කිලෝමීටර 65,610 ඇතුළේ පුරාවිද්‍යාත්මක ස්මාරක, ස්ථාන දහස් ගණනින්, ලක්ෂ ගණනින් අපට දැක ගන්න පුළුවන්කම තිබුණා. අද වන කොටත් අපේ රට තුළ එවැනි ස්ථාන රාශියක් දැක ගන්න පුළුවන්. වර්තමානය වනකොට ඒවා ජාත්‍යන්තර මට්ටමින් පවා ප්‍රසිද්ධියට පත් වෙලා සංචාරකයන්ගේ ආකර්ෂණය දිනා ගත් ස්ථාන බවට පත් වෙලා තිබෙනවා. ලංකාව පුරා, එනම් කොළඹ සිට සංගමන්කන්ද තුඩුව දක්වා සහ පේදුරු තුඩුවේ සිට දෙවුන්දර තුඩුව දක්වා වූ භූමිය පුරා විහිදුණු සංස්කෘතික වටිනාකම්වලින් යුත් ස්ථාන ගණනාවක්ම අපට දකින්න ලැබෙනවා. ඒ සෑම පුරාවිද්‍යා ස්ථානයක්ම අපේ රටේ අනාගත දේපළක් හැටියට තමයි අප දකින්න ඕනෑ. ඒ කියන්නේ, ඒවා වර්තමානයේ ජීවත් වන අපට විතරක් අයිති දේවල් හැටියට නොව, මේ රටේ අනාගතයේ ජීවත් වන සැමට අයිති ස්ථාන හැටියටයි අප දකින්න ඕනෑ.

විශේෂයෙන් සංස්කෘතික වශයෙන් වැදගත් ස්ථානවලට ජාති, ආගම්, කුලමල භේද නැහැ. අපි පොළොන්නරුවට ගියොත් පොළොන්නරුවේ තිවංක පිළිමගෙය, වටදාගෙය, පරාක්‍රම සමුද්‍රය, පරාක්‍රමබාහු ප්‍රතිමාව වාගේම ශිව දේවාලත් නරඹනවා. අප සියලුදෙනා ජාති, කුල, ආගම් භේදයකින් තොරව ඒ ස්ථාන නරඹන්නේ ඒවායේ තිබෙන සංස්කෘතික වටිනාකම නිසායි. දකුණ, උතුර, නැඟෙනහිර ආදි කුමන ප්‍රදේශයක සංචාරය කළත් අප ඒ ස්ථාන නරඹන්නේ ඒ ස්ථානවල තිබෙන්නේ පල්ලි ද, පන්සල් ද, කෝවිල් ද කියන පදනමින් නොව, ඒවායේ ඓතිහාසික වටිනාකම ගැන හිතලායි. ඒ නිසාම තමයි ඒවායේ සංස්කෘතික වටිනාකම් මෙන්ම ඉපැරැණි බව, එනම් කොයි කාලයේ, කුමන වකවානුවේ ගොඩනැඟුණු ඒවාද යන්න සොයා බලා ඒවා ආරක්ෂා කර ගනිමින් අනාගත පරපුරට දායාද කිරීමට අප කටයුතු කරන්නේ. ඒ දායාද කරන එක හරහා අපේ අනාගත පරපුරට ඒ වරප්‍රසාද භුක්ති විඳින්න දෙන ගමන් මෙය සංචාරක කර්මාන්තයේ තෝතැන්නක් බවට පත් කරලා අපේ රට සංචාරක කේන්ද්‍රස්ථානයක් බවට පත් කරන්න පුළුවන් කියන අදහස අපට තිබෙනවා.

විශේෂයෙන්ම මේ යෝජනාවත් එක්කම ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මඩුවන්වෙල වලව්ව සම්බන්ධයෙන් අදහස් ප්‍රකාශ කරනවා. රත්නපුර දිස්ත්‍රික්කයේ කොලොන්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයිති වලව්වක් තමයි මඩුවන්වෙල වලව්ව. මේ මඩුවන්වෙල වලව්වේ පුරාවෘතය ආරම්භ වෙන්නේ ක්‍රිස්තු වර්ෂ 1700දී පමණ. ඒ පරම්පරාවේ විවිධ පරම්පරා විසින් මේ ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කරලා 1905 වාගේ කාලය වෙනකොට වර්තමානයේ අපට දකින්න තිබෙන මේ තත්ත්වයට පත් කරනවා. විශේෂයෙන්ම ගත්තොත්, කාමර 121ක් මේ මඩුවන්වෙල වලව්ව භූමියේ දකින්න පුළුවන්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Upul Kithsiri, you have exhausted your allotted time. Please wind up.

**ගරු උපුල් කිත්සිරි මහතා**
(மாண்புமிகு உபுல் கித்சிறி)
(The Hon. Upul Kithsiri)

හොඳයි. මැද මිදුල් 21ක් තිබෙනවා. රැස්වීම් ශාලා, අධිකරණ ශාලා ආදී වශයෙන් ගත්තොත් විශාල ප්‍රමාණයක් තිබෙනවා. ඒ වාගේම තමයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 1964දී මෙය රජයට පවරා ගන්න කටයුතු කරලා 1978දී මේ වලව්ව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට අයිති වෙනවා. 1983.07.08 දින අංක 252/18 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් මේ වලව්වට රුපියල් 85,500ක වන්දියක් ගෙවලා අරගෙන තිබෙනවා. අක්කර 13යි, රූඩ් 3යි, පර්චස් 13ක ප්‍රමාණයක් මේ වලව්ව සතු වෙනවා. නමුත් මේකේ ඛේදනීය තත්ත්වය මේකයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ වලව්වට අයිති භූමිය 2006.07.21 දින 1455 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් අක්කර 7කුත්, පර්චස් 23ක් ලෙස දක්වමින් අක්කර 6යි, රූඩ් 2යි, පර්චස් 30ක් මෙයින් ඉවත් කරනවා. ඒක තමයි කනගාටුදායක තත්ත්වය. ඒ නිසා මේ සභාවෙන් මා ඉල්ලා සිටින්නේ මේ වලව්ව නැවත ඒ පැරණි තිබූ තත්ත්වයට ගෙනෙන්න කියන කාරණයයි. ඒ වාගේම අපේ රටේ තිබෙන ඓතිහාසික ස්ථාන මැනලා වෙන් කරලා අනාගත පරපුර වෙනුවෙන් දායාද කරන්න කියන ඒ ඉල්ලීමත් කරමින් තමයි මම මේ යෝජනාව ගේන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The Hon. Chandana Thennakoon to second the Motion.

[පූ.භා. 11.48]

**ගරු චන්දන තෙන්නකෝන් මහතා**
(மாண்புமிகு சந்தன தென்னக்கோன்)
(The Hon. Chandana Thennakoon)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු උපුල් කිත්සිරි මන්ත්‍රීතුමා විසින් ගෙන එන ලද මෙම කාලෝචිත පෞද්ගලික මන්ත්‍රී යෝජනාව මම ස්ථිර කරනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Ajith P. Perera. You have six minutes to speak on that Motion.

[පූ.භා. 11.49]

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු උපුල් කිත්සිරි මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉතාම කලෝචිත යෝජනාව මමත් ස්ථිර කරනවා. රත්නපුර දිස්ත්‍රික්කයේ කොලොන්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි ඓතිහාසික වටිනාකමින්

යුතු මේ ස්ථානය ඇත්තටම ආරක්ෂාකොට පවත්වාගෙන යෑම ඉතා වැදගත්. ඒ සඳහා ප්‍රමුඛතාව ලබාදීමට සහ රටේ අවධානයට ලක් කිරීමට ගරු මන්ත්‍රීතුමා කරන ලද මේ ඉල්ලීම ඉතාම වැදගත් කලෝචිත කරුණක් බවත් සඳහන් කරන්න අවශ්‍යයි. අපේ තරුණ කාලයේ අපි මේ ස්ථානයට කිහිප වතාවක්ම ගිහිල්ලා තිබෙනවා. අපේ රටේ ඉතිහාසය සම්බන්ධයෙන් වන ඉතා වැදගත් ස්මාරකයක් ලෙස මෙය සලකන්නට පුළුවන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රටේ ඉතිහාසයේ ඉතාම වැදගත් කාලයක් තමයි කෝට්ටේ රාජධානිය පැවැති කාලය. 16වන සියවසේ, 1521දී "විජයබා කොල්ලය" කියලා අපි හඳුන්වපු ඒ ඓතිහාසික සංසිද්ධියේදී VII වන විජයබාහු රජතුමා මරා දැමීමෙන් පසු මේ කෝට්ටේ රාජධානිය කොටස් තුනකට බෙදුණා; කෝට්ටේ, සීතාවක සහ රයිගම වශයෙන් බෙදුණා. රයිගම රජ කළේ විජයබාහු රජතුමාගේ දරුවකු වන පරරාජසිංහ, නැත්නම් අපි රයිගම් බණ්ඩාර කියා හඳුන්වන රජතුමා. එතුමා 1521 සිට 1538 දක්වා කාලයේ රයිගම මූලික කරගෙන රයිගම් රාජධානිය පාලනය කළා.

රයිගම් කෝරළය කියන ප්‍රදේශයට අද අපි බණ්ඩාරගම කියා හඳුන්වන ප්‍රදේශය, හොරණ කියා හඳුන්වන ප්‍රදේශය, රයිගම කියා හඳුන්වන ප්‍රදේශය, මිල්ලනිය සහ ඒ අවට ප්‍රදේශ සියල්ලම අයිති වුණා, මුහුදුබඩ ප්‍රදේශ ඇතුළත්ව. රයිගම් බණ්ඩාර රජතුමාගේ මාළිගාව තිබුණේ රයිගම, කොතලාවල. ඒ මාළිගාව තිබුණු ස්ථානය, රජ මාළිගාවේ ප්‍රාකාරය, පැරණි නාන පොකුණ ඇතුළු ඓතිහාසික ස්ථාන සැහෙන පමණ ආරක්ෂා වෙලා තිබෙනවා. කාලයක් තිස්සේ මේ රටේ කෞතුකාගාර දෙපාර්තමේන්තුව මේ ස්ථාන සැලකිය යුතු පමණකට සංරක්ෂණය කර තිබෙනවා. අද කොතලාවල රජ මහා විහාරය පිහිටා තිබෙන්නේ රයිගම් බණ්ඩාර රජතුමාගේ රජ මාළිගාව පිහිටි භූමියේ.

විශේෂයෙන්ම මේ රයිගම් රාජධානියට සමාන්තරව තිබුණු ඓතිහාසික ස්ථාන සංරක්ෂණය කිරීම සහ ඒ ඉතිහාසය සංරක්ෂණය කිරීම ඉතාම වැදගත් වෙනවා. විශේෂයෙන්ම වීදාගම සණානන්ද පිරිවෙන කියන මහා විශ්වවිද්‍යාලය තිබුණේ මේ ආසන්නයේ. පෘතුගීසි පාලනය තුළ, ලන්දේසි පාලනය තුළ භෞතික වශයෙන් මේ දේපළ විනාශ වුණා. හැබැයි, ඉතිරි වී තිබෙන ඓතිහාසික වටිනාකමකින් යුතු ස්ථාන ආරක්ෂා කර, ඒ කෞතුක වස්තු ආරක්ෂා කර, රටේ අනාගතය වෙනුවෙන් සුරක්ෂා කිරීමේ වගකීමක් අපි හැමෝටම තිබෙනවා. මීට වසර 10කට පමණ කලින් රයිගම් රාජධානිය සහ ඊට සමාන්තර කෝට්ටේ රාජධානියට අයිති පුරාවස්තු සුරක්ෂාකොට, ඒ ඉතිහාසය අනාගත පරපුරට දැක බලා ගැනීමට හැකිවීම පිණිස කෞතුකාගාරයක් ඉදිකිරීම සඳහා සැලසුමක් සකස් කර තිබුණා.

ගරු සංස්කෘතික කටයුතු ඇමතිතුමනි, රයිගම් රාජධානියට ආවේණික මේ පුරාවස්තු පමණක් නොවෙයි, විශේෂිත සංස්කෘතික අංග තිබෙනවා. ඒ වාගේම, අපේ නැටුම් කලාවක් තිබෙනවා. රයිගම් කෝරළයට ආවේණික පහතරට නැටුම් කලාවේ විශේෂ ප්‍රභේදයක් තිබෙනවා. ඒ වාගේම, කාලයක් තිස්සේ එකතු කරගත්ත කෞතුක වස්තු විශාල ප්‍රමාණයක් තිබෙනවා. 2018-2019 කාලයේ මේ රයිගම් රාජධානියේ කෞතුකාගාරය සඳහා මූලික සැලැස්මක් සකස් කළා. ඒ සඳහා මූලික කටයුතුත් කෙරුණා. පසුව එය නතර වුණා. එය ඉදිකිරීම ඉතාම වැදගත්. මොකද, පහතරට ප්‍රදේශවල අපි බොහෝ දෙනෙක් රටේ ඉතිහාසය ගැන කථා කරද්දී කථා කරන්නේ අනුරාධපුර යුගය, පොළොන්නරු යුගය, මහනුවර යුගය යනාදී වශයෙන් යම් සුවිශේෂ, ප්‍රධාන රාජධානි ගැන පමණයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. නමුත්, අපේ රටේ ඉතිහාසයේ ඉතා වැදගත් දේශපාලනික සහ සංස්කෘතික වටිනාකම් පිළිබඳ සාක්ෂි සහිත මේ ප්‍රාදේශීය රාජධානි හා සම්බන්ධ සංස්කෘතික සහ කෞතුක වටිනාකම් ආරක්ෂා කිරීමත් ඉතා වැදගත්. ඒක අපේ සංස්කෘතියේ වැදගත් කොටසක්. විශේෂයෙන්ම පහතරට ප්‍රදේශවල ජීවත් වන ජනතාව හැටියට, අපේ ඒ උරුමයන් පිළිබඳව වර්තමාන පරපුර වාගේම මතු පරපුරත් දැන සිටීම ඉතා වැදගත් වෙනවා. ඒ නිසා සංස්කෘතික උරුමයන්, ඒ වාගේම කෞතුක උරුමයන් සියල්ලම ඒකරාශිකොට දැක්විය හැකි කෞතුකාගාරයක්, රයිගම, කොතලාවල මේ රයිගම් බණ්ඩාර රජතුමාගේ මාළිගාව පිහිටි භූමියේ ස්ථාපනය කිරීම සඳහා මම යෝජනාවක් කරන්න කැමැතියි. ඒ වාගේම, මේ පහතරට සංස්කෘතික උරුමයන් ආරක්ෂා කිරීම පිණිස විශේෂ වැදගත්කමක් ලබාදෙන ලෙසත් මම ඉල්ලා සිටිනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Gamagedara Dissanayake. You have eight minutes.

[පූ.භා. 11.54]

**ගරු ගමගෙදර දිසානායක මහතා (බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு கமகெதர திசாநாயக்க - புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Gamagedara Dissanayake - Deputy Minister of Buddhasasana, Religious and Cultural Affairs)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු උපුල් කිත්සිරි මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත්කොට තිබෙන යෝජනාව ඉතාම සුවිශේෂී, වැදගත්කමක් සහිත යෝජනාවක් හැටියටයි සලකන්නේ. මේ අවස්ථාවේ මෙම යෝජනාව සාකච්ඡාවට ගැනීමත් ඉතාම කාලෝචිතයි. මොකද, මේ වර්ෂයට අදාළ පුරාවිද්‍යා දෙසතිය පසුගිය 07වැනි දා අපි ආරම්භ කරනු ලැබුවා. පුරාවිද්‍යා දෙසතිය ක්‍රියාත්මක වෙමින් තිබෙන මේ කාලය තුළ මෙවැනි වටිනාකමක් සහිත කාරණයක් පාර්ලිමේන්තුවේ අවධානයට යොමු කිරීම ඉතාම වැදගත් කාර්යයක් හැටියටයි අපි සලකන්නේ. එතුමා යෝජනා කරන පරිදි මඩුවන්වෙල වලව්ව අපේ ඓතිහාසික වටිනාකම් සහිත ඉපැරණි ස්ථානයක්. එම ස්ථානයේ තිබෙන සුවිශේෂීතා පිළිබඳව, එය අපට පෞරාණිකව කෙතරම් වැදගත් වනවාද කියන කාරණා පිළිබඳව අපේ ගරු මන්ත්‍රීතුමා සඳහන් කළා. ඒ වාගේම එතුමා යෝජනාවක් කළා, මෙවැනි වටිනාකම් සහිත පෞරාණික ස්ථාන සංරක්ෂණය කර ගන්න වැඩ පිළිවෙළක් සකස් කිරීමත් අත්‍යවශ්‍යයි කියලා.

නිශ්චිත ලෙස එතුමා සඳහන් කරන මඩුවන්වෙල වලව්ව යම් කාල වකවානුවක විශාල වපසරියක් සහිත භූමියක් හැටියට තිබිලා, මේ වන විට එම භූමි ප්‍රමාණය ක්‍රමානුකූලව අඩු වන තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. නිශ්චිත කාරණය ලෙස ගරු මන්ත්‍රීතුමා මේ වෙලාවේදී මඩුවන්වෙල වලව්ව ගෙන හැර දැක්වූවත්, පොදුවේ බොහෝ ඓතිහාසික පුරාවිද්‍යාත්මක වටිනාකම් සහිත ස්ථානවල අපි දකින ඉරණම තමයි එතුමා මඩුවන්වෙල වලව්ව මූලික කරගෙනත් ඉදිරිපත් කර තිබෙන්නේ. බොහෝ ඓතිහාසික වටිනාකම් සහිත ස්ථාන මේ වන විට විවිධ පාර්ශ්වයන්ගේ ග්‍රහණයට ලක් වෙලා තිබෙනවා. ඒ නිසා, එවැනි ස්ථාන පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරලා, එම ස්ථාන ආරක්ෂා කරගෙන මතු පරම්පරාවට දායාද කරන්නට අපට වගකීමක් තිබෙනවා.

[ගරු ගමගෙදර දිසානායක මහතා]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රජයක් හැටියට අපේ මූලික අරමුණක් තමයි පුරාවිද්‍යා ක්ෂේත්‍රයට අදාළ ස්මාරක කේන්ද්‍ර කර ගත්, පුරා විද්‍යාවේ සිට මිනිසුන් කේන්ද්‍ර කර ගත් පුරා විද්‍යාවක් දක්වා මෙය ප්‍රවර්ධනය කිරීම. අපි හුඟක් වෙලාවට දකින දෙයක් තමයි පුරා විද්‍යාව ආයතනගතව, දෙපාර්තමේන්තුගතව, ක්‍රියාත්මක වන විෂයක් බවට පත් වෙලා තිබෙන බව. එතැනින් එහාට ගිය, ජනතාව එක්ක බද්ධ වුණු ක්‍රියාවලියක් බවට මෙය පත් කළ යුතුව තිබෙනවා. එම පරමාර්ථය මූලික කර ගෙන තමයි අපි පසුගිය 07වැනි දා පුරාවිද්‍යා ක්ෂේත්‍රයට අදාළව සුවිශේෂී මැදිහත් වීමක් කරන්න විශේෂ වැඩ පිළිවෙළක් පටන් ගත්තේ.

"උරුමයට ජීවයක්" කියන තේමාව යටතේ, ඉදිරි කාලය තුළ අපේ රටේ ඓතිහාසිකව වැදගත් වන ස්ථාන, මෙතුමා සඳහන් කරන මඩුවන්වෙල වලව්ව ඇතුළු පුරාවිද්‍යාත්මක වටිනාකම් සහිත ස්ථාන දහසක් සංරක්ෂණය කරන්න අපි බලාපොරොත්තු වනවා. ඒ පුරාවිද්‍යා ස්මාරක දහසක් සංරක්ෂණය කිරීමේ වැඩසටහනේ විශේෂම කාර්යභාරයක් බවට පත් වෙන්නේ, එයට ප්‍රජාව දායක කර ගැනීමයි. ස්මාරක හැටියට හඳුනා ගන්නා ස්ථානවල ප්‍රජාවත් සම්බන්ධ කරගෙන ප්‍රජා සංරක්ෂණ කමිටු ගොඩනගලා, ඒ හරහා අර ජනතාවගෙන් වියෝ වෙලා තිබුණු, ජනතාවගෙන් විතැන් වෙලා තිබුණු පුරා විද්‍යාව ජනතාවත් එක්ක බද්ධ වුණු ක්ෂේත්‍රයක් බවට පත් කරන්න අපි බලාපොරොත්තු වනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බොහෝ රටවල පුරාවිද්‍යාත්මක වටිනාකම් සහිත ස්ථාන සංචාරක ව්‍යාපාරයේදී පාවිච්චි වනවා. අපේ රටෙත් සංචාරක ව්‍යාපාරයට පුරාවිද්‍යාත්මක වටිනාකම් සහිත ස්ථාන පාවිච්චියට ගැනෙනවා. නමුත්, එය ප්‍රමාණාත්මකව සිදු නොවන බවට අදහසක් තමයි අප තුළ තිබෙන්නේ. ඒ නිසා, පුරාවිද්‍යාත්මක ඓතිහාසික වටිනාකම් සහිත ස්ථාන අපේ සංචාරක ව්‍යාපාරයත් එක්ක බද්ධ කිරීමේ වගකීමක් අපට තිබෙනවා. ඒ ස්ථාන ආශ්‍රිතව රැකියා උත්පාදනය කරන්නත් අපට පුළුවන්කමක් තිබෙනවා. ඒ පිළිබඳව දැන් අපේ අවධානය යොමු කර තිබෙනවා. ඒ වාගේම අපේ රටේ සංස්කෘතික ප්‍රවර්ධනයට, කලාපීය සංවර්ධනයට එම ස්ථාන දායක කර ගන්න පුළුවන්කමක් තිබෙනවා. අපි විශේෂයෙන්ම අමාත්‍යාංශය හැටියටත් ඒ පිළිබඳව මේ වෙලාවේ විශේෂ අවධානයක් යොමු කරලා තිබෙනවා.

ඒ වාගේම තමයි, පුරා විද්‍යාව කැණීම් හා සංරක්ෂණයෙන් ඔබ්බට ගිහිල්ලා ජාතික සංවර්ධනයත් එක්ක බද්ධ කිරීම අත්‍යවශ්‍ය වෙලා තිබෙනවා. ඒ අරමුණු ඉලක්ක කරගෙන තමයි අපේ අමාත්‍යාංශයේ වැඩ කටයුතු ටික අපි සැලසුම් කරලා තිබෙන්නේ. සංඛ්‍යාත්මකව ගත්තොත්, මඩුවන්වෙල වලව්ව වාගේම මෙවැනි ව්‍යාකූලත්වයට පත් වෙච්ච ස්ථාන බොහෝ ප්‍රමාණයක් - දහස් ගණනක් - අපේ රටේ හඳුනා ගන්න පුළුවන්. මේ ස්ථාන සංරක්ෂණය කිරීම අත්‍යවශ්‍ය වනවා. ඒ අර්ථයෙන් තමයි අපි "උරුමයට ජීවයක්" කියන වැඩසටහන ආරම්භ කරලා ක්‍රියාත්මක කරගෙන යන්නේ. ඉදිරි කාලය තුළ අපේ රටේ උතුරු, නැඟෙනහිර ඇතුළු සෑම දිස්ත්‍රික්කයක්ම ආවරණය වන පරිදි මේ ස්ථාන සංරක්ෂණය කිරීමේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න අපි බලාපොරොත්තු වනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමහර දෙනෙකු තුළ ආකල්පයක් තිබෙනවා, පුරා විද්‍යාව කිව්වාම ඒක බෞද්ධ පදනමක් සහිත ක්ෂේත්‍රයක් කියලා. අපි පැහැදිලිව මේ වෙලාවේ කියන්න ඕනෑ, පුරා විද්‍යාව කියන්නේ බෞද්ධ උරුමයට විතරක් සීමා වෙච්ච එකක් නොවෙයි කියන එක. අපි දැනට හඳුනාගෙන තිබෙන ස්ථානවලින් වැඩිපුර ස්ථාන ප්‍රමාණයක් බෞද්ධ පසුබිමක් සහිත ස්ථාන තමයි. නමුත්, පුරා විද්‍යාව තුළින් අපි ආවරණය කරන්නේ එක් ආගමකට, එක් ජාතියකට විතරක් සීමා වෙච්ච දෙයක් නොවෙයි. සමහර වෙලාවට අපට උතුරෙදී, නැඟෙනහිරදී, සමහර වෙලාවට දකුණේ අනෙක් ප්‍රදේශවලදී කැණීම් කරනකොට මතු වන සමහර ස්ථාන වෙනත් සංස්කෘතික වටිනාකම් සහිත, වෙනත් ආගමික පසුබිමක් සහිත ස්ථාන වෙන්න පුළුවන්. එවැනි ස්ථාන ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් අපේ මැදිහත්වීම අත්‍යවශ්‍ය වනවා. ඒ නිසා මේ වනවිට මේ කෙරෙහි බලපෑ විවිධාකාර තර්ජන අපි හඳුනාගෙන තිබෙනවා. ඒ තර්ජන ඉවත් කර ගැනීම සඳහාත් ඉදිරි කාලය තුළදී අනිවාර්ය ලෙසම කටයුතු කරන්න සිද්ධ වනවා. අපේ ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ යෝජනාව අතිශය වැදගත් යෝජනාවක් බව සඳහන් කරමින්, ඉදිරි කාලය තුළ පුරාවිද්‍යා ක්ෂේත්‍රය තුළ මීට වඩා ප්‍රබෝධයක්, මීට වඩා වර්ධනයක්, ඒ වාගේම ජනතාවත් එක්ක සම්බන්ධ වෙච්ච ක්‍රියාවලියක් සිද්ධ වනවා කියන කාරණය සනාථ කරමින්, ඒ කාරණයට හැම දෙනාගේම සහයෝගය ලබා දෙන්න කියන ඉල්ලීම කරමින්, මම නතර වනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. (Dr.) Hiniduma Sunil Senevi. You have ten minutes to provide the Reply.

[අ.භා. 12.02]

**ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා (බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி - புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi - Minister of Buddhasasana, Religious and Cultural Affairs)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කාලය ලබා දීම පිළිබඳව මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් විධියට රත්නපුර දිස්ත්‍රික්කයේ කොලොන්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයිති - පැරණි වදනක් සිහිපත් වෙනවා, කොලොන්න කෝරළය කියලා - ඓතිහාසික වටිනාකමක් තිබෙන මඩුවන්වෙල මහ දිසාවට අයත්ව තිබුණු මඩුවන්වෙල වලව්ව පිළිබඳව; එහි ආරක්ෂාව, සංරක්ෂණය සහ මතු පැවැත්ම පිළිබඳව යෝජනාවක් ගෙන ආ රත්නපුර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු උපුල් කිත්සිරි මැතිතුමාට මම ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම ඒ පිළිබඳව අදහස් පළ කළ ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා, අපේ නියෝජ්‍ය ඇමති ගමගෙදර දිසානායක මැතිතුමාට මේ විෂය හසුරුවන අමාත්‍යවරයා විධියට මා ස්තුතිවන්ත වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මඩුවන්වෙල වලව්ව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සතු ගැසට් කරන ලද ආරක්ෂිත ස්මාරකයක්. පුරාවිද්‍යා ස්මාරක පිළිබඳව පොදුවේ අපේ රටේ ජනතාවට තිබෙන්නේ තියුණු දැනුමක් නොවෙයි. මේ දැනුම ජනගත කරන්නට ඕනෑ, විස්තර කරන්නට ඕනෑ. මේ වලව්ව ගැසට් කරන ලද ආරක්ෂිත ස්මාරකයක් හැටියට තමයි තිබෙන්නේ. මේ ප්‍රවර්ග වැදගත් වෙන්නේ, ඒ යටතේ තමයි අපට සංරක්ෂණ කටයුතුවලට අවශ්‍ය ප්‍රතිපාදන සහ නීති රීතිවලින් නිදහස ලැබෙන්නේ. Gazetted and protected monument කියලා

තමයි අපි මේක හඳුන්වන්නේ. දැනටමත් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මේ සම්බන්ධයෙන් සැලසුම් කර තිබෙනවා, ඒ වාගේම දැනටත් මඩුවන්වෙල වලව්ව පිළිබඳ සංරක්ෂණ කටයුතුවල අඛණ්ඩව නිරත වෙලා ඉන්නවා. පුරාවිද්‍යා දෙසතිය තුළ ඉතාම ඓතිහාසික විධියට පාර්ලිමේන්තුවේ මේ කාරණය සඳහන් කරන එකේ වැදගත්කම ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා පැහැදිලි කළා. "උරුමයට ජීවයක්" කියන, පුරාවිද්‍යා ස්ථාන දහසක් සංරක්ෂණය කිරීමේ වැඩසටහන ගැන එතුමා සඳහන් කළා.

රත්නපුර දිස්ත්‍රික්කය විතරක් ගත්තොත්, නිතර මතු වී පෙනෙන ඓතිහාසික වැදගත්කමක් තිබෙන ස්ථාන රාශියක් මේ දිස්ත්‍රික්කයේ තිබෙනවා. ඒවායින් එකක් තමයි, මඩුවන්වෙල වලව්ව. ඊට අමතරව ඇඹිලිපිටිය උඩරංවමඩම, දාපනේ ටැම්පිට විහාරය, වලල්ගොඩ ටැම්පිට විහාරය, පනාමුරේ ඇත්ගාල, ඒ වාගේම ඕමල්පේ ටැම්පිට විහාරය ඇතුළු එක හා සමාන වැදගත්කමක් තිබෙන ස්ථාන රාශියක් ඒ අවට ප්‍රදේශයෙන්ම අපට පෙන්වා දෙන්න පුළුවන්. මේ සියල්ල සංවර්ධනය කරන්න, ඒ වාගේම රත්නපුර දිස්ත්‍රික්කය සතුව තිබෙන සංචාරක සැලසුම් එක්ක සමපාත කරලා මෙය තවත් දියුණු තියුණු කරන්න අපි වැඩසටහනක් දියත් කරලා තිබෙනවා. මොකද, ඒ යටතේ සනීපාරක්ෂක පහසුකම්, පිවිසුම් මාර්ග, අලංකරණ කටයුතු ඇතුළු වැඩ රාශියක් කළ යුතුව තිබෙනවා. සංරක්ෂණය කිරීම කියන කාරණය ඇතුළේ ලොකු සැලසුමක් තිබෙන්නට ඕනෑ. මඩුවන්වෙල වලව්ව සම්බන්ධයෙන් ගත්තොත්, ඒ සැලසුම තිබෙනවා.

ඒ වාගේම නූතන තාක්ෂණයේ මහිමය භාවිත කරලා දැනට මේවා සංරක්ෂණය කරන වැඩ පිළිවෙළ ඉදිරියට අරගෙන යෑමේ ඕනෑකමත් අපට තිබෙනවා. උදාහරණයක් හැටියට, AI තාක්ෂණය වෙන්න පුළුවන්, AR, VR වාගේ පහසුකම් සහිතව මඩුවන්වෙල වලව්වට එකතු විය යුතු අර්ථ කථන මධ්‍යස්ථාන, තොරතුරු මධ්‍යස්ථාන සහ කෞතුකාගාර රාශියක් දියුණු කරන බව එම සැලසුමේ තිබෙනවා.

මඩුවන්වෙල වලව්ව සංරක්ෂණයට අප ගන්නා ක්‍රියාමාර්ග අතරමඟ ඇන හිටින්නට හේතු වන, ප්‍රශ්න කිරීම්වලට හේතු වන එම ඉඩම සම්බන්ධ ගැටලුව මේ විධියට පාර්ලිමේන්තුව තුළ නිරවුල්ව මතු කිරීම පිළිබඳව මම ගරු මන්ත්‍රීතුමාට විශේෂයෙන් ස්තුතිවන්ත වනවා. 1964 දී රජයට පවරා ගත් බව, 1978 දී එය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට පැවරුණු බව, ඒ වාගේම 1983.07.08වැනි දා සහ 2006.07.21වැනි දා නිකුත් කළ ගැසට් පත්‍ර දෙකක් ගැනත් ගරු මන්ත්‍රීතුමා මතක් කළා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අර්ථ කථන පිළිබඳ ගැටලුවක් සහ එය භාවිත කරලා ඉන් පසු ගත් ක්‍රියාමාර්ගවල ව්‍යාකූල තත්ත්වයක් පිළිබඳව මෙම ගැසට් පත්‍ර දෙකේම තිබෙනවා. ඒ නිසාම තමයි මෙතැන ප්‍රශ්න රාශියක් ඇතිවෙලා තිබෙන්නේ. පසු කාලීනව එම ඉඩම් විකුණුම්කර මඟින් තව තවත් පිරිස් අතට මාරු වී ගිහිල්ලා ටිකක් සංකීර්ණ තත්ත්වයක් ඇතිවෙලා තිබෙනවා. ඒ නිසා තමයි ගරු මන්ත්‍රීතුමා යෝජනා කරන්නේ, නව මැනුමක් සහිතව ඉතාම ඉක්මනින් එය නිරවුල් කරන්නට ඕනෑ කියලා.

මා කලිනුත් යෝජනා කළ පරිදි මඩුවන්වෙල මහ දිසාවට අයත් වෙලා තිබුණු මඩුවන්වෙල වලව්ව සහ තදනුබද්ධ ඓතිහාසික භූමි දර්ශනය, දේපළ හා සම්පත් කියන මේ සියල්ල එක හා සමානව වැදගත් වනවා. මේ භූමි දර්ශනය අද වනකොට යම් දුරකට පලුදු වෙලා තිබෙනවා, විකුණුම්කර මඟින් එම ඉඩම් වෙනත් අය මතට මාරුවෙලා ගිහිල්ලා, ඒ අය සංවර්ධන කටයුතු කරපු නිසා. මඩුවන්වෙල වලව්ව කියන ඒ වටිනා දේපළට පිවිසෙන්නට තිබෙන්නේ ඉතා පටු මාර්ගයක්. ඒ වාගේම එම මාර්ගය දෙපස යම් යම් ඉදිකිරීම් සහ සංවර්ධන කටයුතු කර ඇති ආකාරය දැනටත් දැකගන්න පුළුවන්. ගරු ජනාධිපතිතුමා රත්නපුර දිස්ත්‍රික් සංවර්ධන කමිටුවට ගිහිල්ලා මේ පිළිබඳව විශේෂ විමසීමක් කළා. එතුමා ඒ වෙලාවේම මා විෂය භාර අමාත්‍යවරයා වන නිසාත්, රත්නපුර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වන නිසාත් මගෙන් ඉල්ලා සිටියා, මා පෙන්වා මතක් කළා, මේ ස්මාරකවලට මාගේ විශේෂ අවධානය යොමු කරන බව. එම නිසා සංචාරක ආකර්ෂණය සහිත විකල්ප ගමනාන්තයක් විධියට මඩුවන්වෙල සහ තදනුබද්ධ ප්‍රදේශය හඳුනා ගැනීම පළමු කාරණය හැටියටත්, දැනට එතැන තිබෙන අනාරක්ෂිත බව, වේගයෙන් විනාශ මුඛයට යෑම නතර කරලා සංරක්ෂණ කටයුතු වේගවත් කළ යුතු බව දෙවන කාරණය හැටියටත්, තුන්වනුව එම ස්ථානය හා බැඳුණු ඉඩම් මැන නිරවුල් කිරීමත් කළ යුතුව තිබෙනවා. මේ කරුණු ටික තමයි අපි සාකච්ඡාවට ගත යුතු වන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අතිරේක කරුණක් හැටියට, මඩුවන්වෙල මහ දිසාවට අයත් දේපළ හා සම්බන්ධ වැදගත් නිරීක්ෂණයක් මම සිහිපත් කරන්නට කැමැතියි. මඩුවන්වෙල මහ දිසාව කියන චරිතය ගත්තොත්, එතුමාගේ චරිත කථාව සහ එම තොරතුරු ගැන සඳහන් වන්නේ, අපේ රටේ ජීවත් වුණු අදීන පුරුෂයෙකු හැටියට වාගේම බ්‍රිතාන්‍ය ආණ්ඩු කාලයේ හිටපු, ගනුදෙනු කිරීමේදී හොඳ පෞරුෂයක් තිබුණු ප්‍රාදේශීය සහ වැදගත් පුද්ගල පෞරුෂයක් හැටියටයි. ඇත්තටම "සබරගමුවේ කළු කුමාරයා" හැටියට තමයි එතුමාව හඳුන්වන්නේ. දැනට ජීවමානව වැඩ සිටින පූජ්‍ය කැලිගම විජිතනන්ද මහා නායක හාමුදුරුවන් වහන්සේ රචනා කරලා තිබෙනවා, මඩුවන්වෙල දිසාව ගැන විශේෂිත ග්‍රන්ථයක්. ඒ වාගේම අපේ පෙළ පොත්වල දැනටමත් මඩුවන්වෙල මහ දිසාව ගැන සඳහන් වනවා.

අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ ඉදිරි කාලයේදී සුහුරු පන්ති කාමරවල මේ අතීත පුරුෂයින් ගැන, මේ වටිනා ඓතිහාසික දේපළ ගැන සාකච්ඡා කරමින් දරුවන් අත්දැකීම් හුවමාරු කර ගන්න කොට අපි මේවා නිරවුල්ව සංරක්ෂණය කර තිබීම අත්‍යවශ්‍ය වනවා. ඒ වාගේම නව තාක්ෂණය සම්බන්ධ කර ගැනීමත් මෙහිදී අත්‍යවශ්‍ය වනවා. ගරු උපුල් කිත්සිරි මන්ත්‍රීතුමනි, ඔබතුමා සිහිපත් කළ ග්‍රන්ථයේත් විජිතනන්ද මහා නායක හාමුදුරුවන් වහන්සේ සඳහන් කරලා තිබෙනවා, හික්කඩුවේ ශ්‍රී සුමංගල නායක හාමුදුරුවෝ අටකලන් කෝරළයට වැඩම කිරීම පිළිබඳව. ඒකේ කියැවෙන්නේ, "අද ලංකාවට බුදුන් වැනි වූ හික්කඩුවේ ශ්‍රී සුමංගල නායක හාමුදුරුවෝ සබරගමුවට වඩිනවා. උන්වහන්සේ වෙනුවෙන් ඇප කැප වෙලා, පේ වෙලා මත්ස්‍ය, මාංශයෙන් වැළකී ඉන්න ඕනෑ" කියලා මඩුවන්වෙල මහා දිසාව නියෝගයක් නිකුත් කරලා තිබෙනවා කියන එකයි. අපට මේ තොරතුරු ඉතා වැදගත් වනවා. පසු කාලීනව මේ තොරතුරු ගැන රත්නපුරයෙන්ම බිහි වෙච්ච මහින්ද ප්‍රසාද් මස්ඉඹුල වාගේ ලේඛකයින් තමන්ගේ නව කථාවලට අරගෙන තිබෙනවා. මේ සියල්ල වැදගත් වන්නේ නූතන තාක්ෂණයත් එක්ක වර්තමානය දක්වාම මේ උරුමය යාවත්කාලීන කරගෙන සංරක්ෂණය කරන්න ඕනෑ නිසායි.

අවසාන වශයෙන් මා නැවත වතාවක් උපුල් කිත්සිරි මන්ත්‍රී සොයුරාට ස්තුතිවන්ත වනවා, මෙවැනි යෝජනාවක් ඉදිරිපත් කිරීම පිළිබඳව. විශේෂයෙන්ම කොලොන්න ප්‍රාදේශීය සභාව සහ කොලොන්න ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, රත්නපුර අපේ පුරාවිද්‍යා කලාප කාර්යාලය මේ පිළිබඳව උනන්දුව පළ කරනවා. මා කැමැතියි, ඉතාම කෙටි කාලයක් ඇතුළත අපේ දෙපාර්තමේන්තුවට මේ ඉල්ලීම නැවත වතාවක් ඉදිරිපත් කරන්න. ගරු මන්ත්‍රීතුමා අද පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරපු පෞද්ගලික

[ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා]

මන්ත්‍රී යෝජනාව ඉතා වැදගත් මංසලක් හැටියට පාවිච්චි කරලා, දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීමක් කිරීම වාගේම ඒ අයට අදාළ නිශ්චිත උපදෙස් දෙන්න මේ ඉඩම වහාම කෙටි කාලයක් තුළ මැනලා, නිරවුල් කරලා පෞද්ගලික හිමිකාරිත්වය සහ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ උරුමය නිරවුල් කරලා, විශේෂයෙන්ම මේ ගැසට් පත්‍ර දෙක සම්බන්ධව තිබෙන අවුල නිරවුල් කරලා මේ ඓතිහාසික ස්ථානය නිසි සේ සංරක්ෂණය කරන්නට අවශ්‍ය කරන ක්‍රියාමාර්ග ගන්නා බව මා පාර්ලිමේන්තුවට දැනුම් දෙන්න කැමැතියි. ඒ අනුව නැවත වතාවක් මම මන්ත්‍රී සොයුරාට ස්තුතිවන්ත වනවා, තමන්ගේ ප්‍රදේශයේ තිබෙන ඓතිහාසික ස්ථානයක් පිළිබඳව මේ විධියට පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් ගෙනැල්ලා ගැටලුවක් නිරාකරණය කර ගන්න මහපෙන්වීම පිළිබඳව.

බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Upul Kithsiri, you have five minutes to make the wind-up speech as the Mover of the Motion.

[අ.භා. 12.12]

**ගරු උපුල් කිත්සිරි මහතා**
(மாண்புமிகு உபுல் கித்சிறி)
(The Hon. Upul Kithsiri)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම මා විසින් ගෙන එන ලද පෞද්ගලික මන්ත්‍රී යෝජනාව සම්බන්ධයෙන් අදහස් පළ කරපු ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමාට මා ස්තුතිවන්ත වනවා. එතුමා විශේෂයෙන්ම රයිගම් මාළිගාව පිළිබඳව ඉතා වැදගත් අදහස් කිහිපයක් ඉදිරිපත් කළා. මා මෙම යෝජනාව ගෙන ඒමේ අරමුණ වන්නේ එවැනි ස්ථාන පිළිබඳව සංවාදයක්, කතිකාවක් හැදීමයි. අපේ අනාගත පරපුර වෙනුවෙන් මේවා රැක ගැනීම තමයි අපේ ප්‍රධානම අරමුණ විය යුත්තේ. ඒ වාගේම ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා සංස්කෘතික දෙසතිය පිළිබඳව කථා කරමින්, පූජා උරුමය පිළිබඳව කථා කරලා, ස්ථාන දහසක් සංවර්ධනය කිරීමේ වැඩසටහන පිළිබඳව කථා කළා. අපට එවැනි ස්ථාන දහසක් කඩිනමින් සංවර්ධනය කරන්න පුළුවන් නම්, ඒක අනාගත පරපුරට වාගේම අපේ සංචාරක කර්මාන්තයටත් හොඳ තෝතැන්නක් බවට පත් වනවා.

විශේෂයෙන් මා ස්තුතිවන්ත වන්න ඕනෑ, අපේ සුනිල් සෙනෙවි ඇමතිතුමාට. එතුමා ඒ අමාත්‍යාංශය දරමින් මඩුවන්වෙල වලව්ව පමණක් නොවෙයි, රටේම තිබෙන සංස්කෘතික කටයුතු පිළිබඳව එතුමාගේ අවධානය යොමුකොට තිබෙනවා. හොඳ අවබෝධයකින් යුතුව එතුමා ඒ කටයුතු කරන බවට අපට විශ්වාසයක් තිබෙනවා වාගේම එය පෙනෙන්නත් තිබෙනවා. ඒ අනුව රට පුරා තිබෙන මෙවැනි සංස්කෘතික වැදගත්කමකින් යුතු ස්ථාන අනාගත පරපුර වෙනුවෙන් දායාද කිරීමට එතුමාගේ අමාත්‍යාංශය දායකත්වය ලබා දෙයි කියලා අපට විශ්වාසයක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ඓතිහාසික ස්ථාන පිළිබඳව කථා කරද්දී මේ හා බැඳිච්ච සුවිශේෂී දේවල් ප්‍රමාණයක් තිබෙනවා. මඩුවන්වෙල වලව්ව පිළිබඳව කථා කරනවා නම්, විනාඩි 5ක්, 10ක් නොවෙයි, එහි පුරාවෘත්තය සහ ඓතිහාසික කතන්දර, එහි වැදගත්කම පිළිබඳව අපට පැය ගණනක් කථා කරන්න පුළුවන්. ඒ වාගේම මේ ඕනෑම සංස්කෘතික ස්ථානයක් ගත්තොත්, අපිට ඒවා ගැන පොත්වල පිටු ගණන් ලියන්න පුළුවන්. නමුත් අපේ ප්‍රධාන අරමුණ වෙන්න ඕනෑ, අනාගත පරපුර වෙනුවෙන් මේවා ආරක්ෂා කර තැබීමයි. මීට අවුරුදු 32,000කට කලින් ලංකාවේ ජීවත් වුණු බලංගොඩ මානවයා පිළිබඳව, ඒ ශිෂ්ටාචාරය පිළිබඳව තොරතුරු ලියැවිලා තිබීමේ ගෞරවයත් අපේ රත්නපුර දිස්ත්‍රික්කයට හිමි වෙලා තිබෙනවා.

විශේෂයෙන්ම අපේ හිනිදුම සුනිල් සෙනෙවි ඇමතිතුමා කිව්වා වාගේ උඩරංචමඩම කියන්නේ ලංකාවෙන් හම්බ වුණු පැරණිම සොහොන් බිම් තිබෙන භූමියක්. එතුමා ඒ ස්ථානය නිරීක්ෂණය කළා. ඒ ස්ථානය තව සංරක්ෂණය කරන්න ඕනෑ. ඒ වාගේම, "උඩරංචාමඩම" කියලා ඓතිහාසික ගම්මානයක් තිබුණු බවටත් සාක්ෂි හමු වී තිබෙනවා. මීට අවුරුදු 3,000කට, 3,500කට කලින් අලංකාර කොණ්ඩ කටු පවා ඔවුන් භාවිත කළ බවට සාධක හමු වෙලා තිබෙනවා. මේ සංස්කෘතික ස්ථාන රැක ගැනීම හරහා අපේ රට සංස්කෘතික උරුමයක් බවට පත් කරන්න වාගේම සංචාරක තෝතැන්නක් බවටත් පත් කරන්න පුළුවන් කියන එක අපට දැන් ඒත්තු ගැන්විලා තිබෙනවා. ලෝකය පුරා ඉන්න විවිධ සංචාරකයන් අතරේ මේ වාගේ සංස්කෘතික අංගවලට කැමති, ඒවාට ගරු කරන සංචාරකයන් බොහෝ සේ අපිට දකින්න පුළුවන්.

ගරු ඇමතිතුමනි, ඔබතුමා කිව්වා වාගේ රත්නපුර දිස්ත්‍රික්කයේ, කොලොන්න ආසනයේ තිබෙන තවත් මෙවැනි ඓතිහාසික ස්ථාන පිළිබඳව වාගේම රට පුරාම තිබෙන ඓතිහාසික ස්ථාන පිළිබඳවත් අවධානය යොමු කරලා, සිංහල, දෙමළ, මුස්ලිම් භේදයකින් තොරව, ජාති, කුල-මල, ආගම් භේදයකින් තොරව ඒවා සුරක්ෂිතව රැක ගත්තොත් දේශීය වාගේම විදේශීය සංචාරකයන්ටත් මෙහි වටිනාකම පිළිබඳ තොරතුරු අපට ලබා දෙන්න පුළුවන් වනවා. ඒ හරහා අපේ ප්‍රෞඪ ඉතිහාසය පිළිබඳව, ඒ ගාම්භීරත්වය පිළිබඳව ලෝකයට අපට කියලා දෙන්න පුළුවන් වනවා. ඒවායේ තිබෙන තාක්ෂණය පාවිච්චි කරලා, ඒ අවස්ථා ඔවුන්ට ලබා දෙන්න පුළුවන්. ඒ හරහා විදේශීය සංචාරකයන්ට එහි ආකර්ෂණය විඳින්න අවස්ථාව ලැබෙනවා වාගේම අපේ රටේ සංචාරක කර්මාන්තයටත් ඒ තුළින් විශාල ගාම්භීරත්වයක් ලැබෙනවා.

මම මේ පෞද්ගලික මන්ත්‍රී යෝජනාව ගෙන එන්නේම මඩුවන්වෙල වලව්ව පාදක කරගෙන සමස්ත ශ්‍රී ලංකාවේම තිබෙන සියලු පුරාවිද්‍යාත්මක ස්ථාන සංරක්ෂණය කරලා, ඒ ඉඩම් මැනලා, අපේ අනාගත පරපුරට ඒවා ආරක්ෂා කර දෙමින් ඒවා දේශීය සහ විදේශීය සංචාරකයන්ගේ ආකර්ෂණය දිනා ගත හැකි ස්ථාන බවට පත් කිරීම සඳහායි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ යෝජනාව ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාටත්, ඒ පිළිබඳව අදහස් දක්වපු සියලුදෙනාටත් මේ අවස්ථාවේදී මගේ ගෞරවනීය ස්තුතිය පිරිනමමින් මම නිහඬ වනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Private Members' Motion No. 3 in today's Order Paper - P. 58/2025 - to be moved by the Hon. (Mrs.) Hiruni Wijesinghe, Attorney at Law. You have five minutes.

## පාසල් සිසුන්ගේ අධ්‍යාපන සංවර්ධනය, වෘත්තීය සංවර්ධනය සහ පුද්ගල සමාජ සංවර්ධනය සඳහා සෑම පාසලකටම පුහුණුව ලත් මනෝ උපදේශකවරයෙකු - Student Counsellor - පත් කිරීම

பாடசாலை மாணவர்களின் கல்வி அபிவிருத்தி, தொழில் அபிவிருத்தி மற்றும் தனிநபர் சமூக அபிவிருத்தியின் பொருட்டு ஒவ்வொரு பாடசாலைக்கும் பயிற்றப்பட்ட உளவள ஆலோசகர் - Student Counsellor - ஒருவரை நியமித்தல்

APPOINTMENT OF A TRAINED STUDENT COUNSELLOR TO EVERY SCHOOL FOR EDUCATIONAL DEVELOPMENT, VOCATIONAL DEVELOPMENT AND PERSONAL SOCIAL DEVELOPMENT OF SCHOOL CHILDREN

[අ.භා. 12.18]

**ගරු නීතිඥ හිරුනි විජේසිංහ මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) ஹிருணி விஜேசிங்ஹ)
(The Hon. (Mrs.) Hiruni Wijesinghe, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "වර්තමානයේ බොහෝ පාසල් සිසුන් අතර විවිධ මානසික පසුබෑම් දක්නට ලැබෙන හෙයින් ද, මෙම තත්ත්වයන් ඔවුන්ගේ ශාරීරික හා සමාජීය පැවැත්ම සඳහා වක්‍රාකාරව බලපාන හෙයින් ද, ඇතැම් අවස්ථාවලදී පාසල් සඳහා පාසල් මනෝ උපදේශකවරයන් පත් කර තිබුණ ද එම තනතුර සඳහා පාසල් ගුරුවරුන්ගේ භූමිකාව ද ඇතුළත් වීම හරහා ඉන් බලාපොරොත්තු වන සේවය ඵලදායීව සිදු වී නොමැති හෙයින්ද, සෑම පාසලකටම මනෝ උපදේශකවරයෙකුගේ අවශ්‍යතාව මතු වී ඇති හෙයින් ද, පාසල් සිසුන්ගේ අධ්‍යාපන සංවර්ධනය, වෘත්තීය සංවර්ධනය හා පුද්ගල සමාජ සංවර්ධනය සඳහා සෑම පාසලකටම පුහුණුව ලත් මනෝ උපදේශකවරයෙකු පත් කිරීමට අවශ්‍ය පියවර රජය විසින් ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පවුල් පරිසරයේ තිබෙන අස්ථාවරත්වය, ආර්ථික අපහසුතා, දෙමව්පියන් විදේශගත වීම නිසා දරුවන් හුදෙකලාව අනාරක්ෂිත වීම, පාසල් පද්ධතිය තුළට ඇදී එමින් තිබෙන මත්ද්‍රව්‍ය උවදුර නිසා දරුවන් ගැටලුකාරී තත්ත්වයන්ට ගොදුරු වීම, දෙමව්පියන්ගේ දැඩි කාර්යබහුලත්වය නිසා දරුවන්ට ස්මාර්ට් ජංගම දුරකථන පාවිච්චි කරන්න දීම තුළින් ඔවුන්ට දෙමව්පියන්ගෙන් පරිබාහිරව කාලය ගත කිරීමට අවස්ථාව සලසා දීම වැනි තත්ත්වයන් නිසාත්, තරගකාරී විභාග රටාව, විභාග කේන්ද්‍රීය අධ්‍යාපන රටාව නිසාත් ආතතියට පත් වන, විවිධ මානසික පීඩනයන්ට පත් වන දරුවන් අපිට හඳුනා ගන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙවැනි දරුවන්ට පාසල් පද්ධතිය තුළ තිබෙන ආරක්ෂාව කෙබඳුද? තමන්ට තිබෙන ගැටලු, තමන්ට තිබෙන බිය සහ ලජ්ජාව කියන කාරණා සියල්ල දරුවන් පාසලේදී කාටද කියන්නේ? මොකද, දෙමව්පියෝ කාර්යබහුලයි. දරුවන්ට තමන්ගේ ජීවිතය කාලය තුළ අවුරුදු 13ක් වැනි විශාල කාල පරිච්ඡේදයක් අධ්‍යාපනය ලබන්න පාසල තුළ ගත කරන්න සිද්ධ වෙනවා. ඒ තරගකාරී අධ්‍යාපන ක්‍රමය තුළ පාසලට යොමු වන දරුවාට, මත්ද්‍රව්‍ය උවදුරින් බැට කන ප්‍රදේශවල තිබෙන පාසල්වල ඉන්න එම උවදුරට ගොදුරු වුණු දරුවන්ට, සමාජීය ප්‍රශ්නවලින් සහ පවුල් ප්‍රශ්නවලින් පීඩාවට පත් වන දරුවන්ට තමන්ගේ ප්‍රශ්නය කියන්න පාසලේ විශේෂ ගුරුවරයෙක් ඉන්න ඕනෑ. ඒ හින්දා 06/2021 චක්‍රලේඛය ප්‍රකාරව දරුවන් 300ට වැඩි පාසල්වලට ශිෂ්‍ය උපදේශකවරු - student counsellorsලා - පත් කිරීමට කටයුතු කරලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 10,047ක් පමණ වන ලංකාවේ තිබෙන සමස්ත පාසල් පද්ධතියේම ඉන්න දරුවන්ට තමන්ට තිබෙන ගැටලු ප්‍රකාශයට පත් කරන්න, තමන්ට දෙවැනි මවක් ලෙස සිටින්න විශේෂ පුහුණුව ලත් ගුරුවරයෙක් තම පාසලේ සිටින්න ඕනෑ කියලා ප්‍රායෝගිකව මා විශ්වාස කරනවා.

හැබැයි, අපි ප්‍රායෝගිකව දැකලා තිබෙනවා, අපේ අධ්‍යාපන පද්ධතිය තුළ මේ ආකාරයට ශිෂ්‍ය උපදේශකවරයන් විධියට පත් කරලා තිබෙන ගුරුවරුන්ව ඒ පාසලේ ඉන්න දරුවෝ පවා අඳුරන්නේ නැහැ කියන එක. අප පාසලේ ඉන්න ශිෂ්‍ය උපදේශක ගුරුවරයා කවුද කියලා පාසලේ ඉන්න දරුවෝ දන්නේ නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇතැම් පාසල්වල ශිෂ්‍ය උපදේශකවරයා පත් කරලා තිබුණාට ඒ ආචාර්යවරුන්ට කාල පරිච්ඡේද ගොඩක් දී තිබෙන නිසා ඒ අතරතුර තමයි මනෝ උපදේශන සේවය - ශිෂ්‍ය උපදේශන සේවය - කරන්න කාල වේලාව වෙන් කර ගන්න සිද්ධ වෙලා තිබෙන්නේ. එවැනි තත්ත්වයක් තුළ ගුරුවරුන්ට තමන්ගේ කාර්යභාරය ඉටු කිරීමට කාලය ප්‍රශ්නයක් වෙලා තිබෙනවා.

ඒ වාගේම දරුවෙකුගේ ප්‍රශ්නයක් තමන්ට හිතවත් ශිෂ්‍ය උපදේශක ගුරුවරයාට ඉදිරිපත් කිරීමට පාසලේ සුදුසු ස්ථානයක් නැහැ. බොහෝ වෙලාවට එක්කෝ පන්ති කාමරය, නැත්නම් ගුරු විවේකාගාරය වැනි ස්ථානයක තමයි දරුවන්ගේ ප්‍රශ්න ගැන කථා කරන්න වෙන්නේ. තමන්ගේ රහසක් ගුරුවරයාට පෞද්ගලිකව ආරක්ෂාවකින් යුතුව ප්‍රකාශ කිරීමට සුදුසු වේදිකාවක් පාසල් තුළ නිර්මාණය වෙලා නැහැ. ඉතින්, මෙවැනි තත්ත්වයන් තුළ දරුවෝ ගිහිල්ලා ශිෂ්‍ය උපදේශකවරයාට කියනවා, මෙන්න මෙහෙම ගැටලුවක් තිබෙනවා කියලා. නමුත්, සමහර වෙලාවට පෞද්ගලිකත්වයට ඇති අයිතිය බිඳ හෙළමින් පාසලේ අනෙක් ගුරුවරුන්ද, ශිෂ්‍යයන්ද අතර ඒ ගැටලුව ප්‍රචලිත වෙලා තිබෙන අවස්ථා පිළිබඳව අපට දැන ගන්නට, දැක ගන්නට ලැබිලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ කාරණා නිසා අපට අවශ්‍ය වෙනවා, මනා ලෙස දරුවන් කෙරෙහි විශේෂ අවධානය යොමු කරපු සහ මින් ඉදිරියටත් දරුවන්ව counselling කටයුතුවලට යොමු කිරීමේ path එක දන්න පුහුණුව ලත් ගුරුවරුන් පිරිසක් ශිෂ්‍ය මනෝ උපදේශකවරුන් ලෙස අපේ අධ්‍යාපන පද්ධතිය තුළට ඇතුළත් කර ගැනීම.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම 2024, 2025 සහ 2026 වර්ෂවලදී යොවුන් වියේ පසුවන දරුවන් කීපදෙනෙක්ම සිය දිවි නසා ගෙන තිබුණා. ඒ දරුවන්ගේ අකල් වියෝව සම්බන්ධයෙන් සමාජ මාධ්‍ය ඔස්සේ පළ වුණු සමහර ප්‍රචාරණ කටයුතු ආදිය නිසා මේ සමාජයේ සිටින ජනතාව දැඩි මානසික පීඩනයකට ලක් වෙලා තිබුණා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පර්යේෂණ වාර්තාවලට අනුව පෙනී යනවා, වර්තමානයේ පාසල් වියේ ඉන්න යොවුන් දරුවන් ඒ අයට කවදා හරි මැරෙන්න ඕනෑ වුණොත් තමන් ඒ සඳහා තෝරා ගන්න පහසුම මාර්ගය මොකක්ද කියලා හඳුනා ගන්න ස්වයංව උත්සාහ දරන බව. ඒ කියන්නේ, කුමන හෝ අවස්ථාවකදී මැරෙන්න හිතුණොත් මම මැරෙන්නේ කොහොමද කියලා ළමයි කල්පනා කරනවා. එවැනි තත්ත්වයට ඔවුන්ගේ මානසික මට්ටම නිර්මාණය වෙලා තිබෙනවා. තවත් සමහර දරුවෝ තමන්ට පීඩාවක් ඇති කර ගන්න, හානියක් කර ගන්න තරමට තමන්ගේ මානසික මට්ටම දුර්වල වන ආකාරයට විවිධ සමාජ ක්‍රියාකාරකම්වල නිරත වන බවටද පර්යේෂණ වාර්තාවලින් දක්වා තිබෙනවා.

මම විශේෂයෙන්ම කියන්න කැමැතියි, දරුවන්ගේ ශාරීරික ආරක්ෂණ කටයුතු සඳහා එන්නත්කරණය සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වෙන බව. ඒ වාගේම දරුවන්ගේ මානසික සෞඛ්‍ය සම්බන්ධයෙනුත් අවධානය යොමු කිරීම වැදගත් වන බව මම මේ අවස්ථාවේදී සභාවට ප්‍රකාශ කරන්න කැමැතියි.

[ගරු නීතිඥ හිරුනි විජේසිංහ මහත්මිය]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ පෞද්ගලික මන්ත්‍රී යෝජනාව තුළින් ගරු සභාවට යෝජනා කරනවා, පාසල් ක්ෂේත්‍රයට පුහුණුව ලත් ශිෂ්‍ය උපදේශකවරු - student counsellorsලා - නැවත වතාවක් බඳවා ගැනීමේ කටයුතු සිද්ධ කරන්න කියලා. මා දන්නා පරිදි සංඛ්‍යා දත්ත අනුව 3,500කට ආසන්න ප්‍රමාණයක් තමයි එවැනි අය ඉන්නේ. ඒ තනතුරට බඳවා ගැනීමේ කටයුතු සිදු කරනවාත් සමඟ ඒ සඳහා අවශ්‍ය පහසුකම් පාසල් තුළ නිර්මාණය කර දෙන්න. මොකද, අපට ශාරීරික ශක්තියෙන් වාගේම මානසික ශක්තියෙන් ශක්තිමත් දරුවන් පිරිසක්, අනාගත පරපුරක් නිර්මාණය කර ගැනීමේ අවශ්‍යතාව පවතිනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The Hon. (Mrs.) Deepthi Wasalage. You have five minutes to second the Private Members' Motion moved by the Hon. (Mrs.) Hiruni Wijesinghe.

[අ.භා. 12.24]

**ගරු දීප්ති වාසලගේ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தீப்தி வாசலகே)
(The Hon. (Mrs.) Deepthi Wasalage)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දින මේ උත්තරීතර සභාවට ඉතා කාලෝචිත යෝජනාවක් පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් විධියට ගරු හිරුණි විජේසිංහ මන්ත්‍රීතුමිය ඉදිරිපත් කර තිබෙන මේ අවස්ථාවේ, අවුරුදු 30කට ආසන්න කාලයක් ගුරුවරියක් ලෙස සේවය කළ මට ඒ සම්බන්ධව අදහස් දක්වන්න කාලය ලැබීම පිළිබඳව ඉතාම සතුටු වෙනවා. අවුරුදු 30ක් වන මගේ ගුරු සේවය ඇතුළත දරුවන්ගේ මානසික තත්ත්වයන් පිළිබඳව මා විවිධ අවස්ථාවල විවිධ අත්දැකීම් ලබා තිබෙනවා. ඒවා අතරින් මම ලැබූ එක් අත්දැකීමක් මා මේ සභාවට කියන්නම්.

උසස් පෙළට විද්‍යා අංශයෙන් ඉගෙනුම ලැබූ ඉතාම දක්ෂ දැරියක් මට හමු වුණා. විභාගයට මාස හයක් විතර තිබියදී මට පෙනී ගියා එම දැරිය පන්ති කාමරය තුළ නිතරම නිදා වැටුණු බවක්. ඇත්තටම මම දවස් කිහිපයක් එම දියණිය දෙස බලාගෙන හිටියා. නමුත් මම එකවරම එම දියණියගෙන් අහන්න ගියේ නැහැ. ඇයගේ මිතුරියකගෙන් මම ඇහුවා, "ඔබේ යෙහෙළියට වෙලා තිබෙන්නේ මොකක්ද?" කියලා. මට එම දියණියගේ යෙහෙළිය කිව්වා, "මැඩම්, එයා depress වෙලා ඉන්නේ. මැඩම්ට පුළුවන් නම් එයා එක්ක කථා කරන්න" කියලා. විවේක කාලයේදී මම එම දියණියගෙන් ඇහුවා, "පුතේ, ඔයාට මොකද වෙලා තිබෙන්නේ?" කියලා. එම දියණිය කඳුළු පෙරමින්, හඬමින් මට කිව්වා, "මැඩම් මට බයයි" කියලා. මම ඇහුවා, "ඇයි, පුතේ ඔයා බය?" කියලා. මොකද, ඇය ඉතාම දක්ෂ සිසුවියක්. නමුත් ඒ දියණිය හඬමින් මට කිව්වා, "ඉස්කෝලේ අය, දෙමව්පියන් සහ නෑදෑයින් බලාගෙන ඉන්නවා, මම දිස්ත්‍රික්කයේ පළමුවෙනියා වෙයි කියලා. මට ඒක කරන්න බැහැ, මැඩම්. මට බය හිතෙනවා" කියලා. ඒ වාගේම ඇය මට කිව්වා, "තුන් සැරයක් දිවි නසා ගන්න සූදානම් වුණා. මැඩම්, මම අන්තිම වතාවේ බෙහෙත් පෙති ටික අරගෙන කටේ දමා ගන්න හදනකොට, අප්පච්චි ආවා. ඒ හින්දා මට ඒ අවස්ථාවේ දිවි නසා ගන්න බැරි වුණා" කියලා. මම වහාම ක්‍රියාත්මක වුණා, මට කරන්න පුළුවන් සීමාවෙන්. මම ඇයගේ මවට කථා කරලා කිව්වා, "ඔබේ දියණිය ලොකු මානසික පීඩනයකින් පෙළෙනවා. වහාම ඇය ප්‍රතිකාර සඳහා යොමු කරන්න" කියලා. ඇත්තටම ඒ අම්මා හැඬුවා. මොකද, මම ඒ ගැන කියනකම් ඒ අම්මා දැනගෙන සිටියේ නැහැ, ඇයගේ දියණිය ඒ වාගේ පීඩනයකින් පෙළුණා කියන එක. ඊට පසුව ඇයගේ දෙමව්පියන් ඇයව ප්‍රතිකාරවලට යොමු කළා. අද වෙනකොට ඇය විශ්වවිද්‍යාල අධ්‍යාපනයත් නිම කරලා විද්‍යා උපාධිධාරිනියක් විධියට මේ සමාජය තුළ ජීවත් වෙනවා. මගේ ගුරු ජීවිතය තුළ මේ වාගේ දරුවන්ගේ මානසික පීඩා පිළිබඳ බොහොමයක් අත්දැකීම් මට තිබෙනවා.

දරුවා කියන්නේ අනාගත ආයෝජනයක්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සදාචාරාත්මක සමාජයක් ගොඩ නැඟීමට දරුවා ප්‍රබල සාධකයක්. දරුවාගේ ලෝකය සුවපත් කළොත් තමයි අප බලාපොරොත්තු වන හොඳ සමාජය ගොඩනඟා ගැනීමට අපට හැකි වෙන්නේ. අද දරුවා හෙට ලෝකය තනන්නෙක්. නමුත් යම් දරුවෙකුගේ කුඩා කාලයේදී ඔහු හෝ ඇය පත් වන මානසික තත්ත්වය මත එම දරුවාගේ අනාගත සමාජ භාවිතාව තීරණය වෙනවා. ලෝක ඉතිහාසය තුළ ඒ සඳහා බොහෝ උදාහරණ තිබෙනවා.

1956 වර්ෂයේදී ඇමෙරිකාවේ මිචිගන් ප්‍රාන්තයේ උපත ලැබූ අයිලින් වුර්නොස් කියන දැරිය කුඩා කාලයේදීම දෙමව්පියන් විසින් අත හැරීම හේතුවෙන් සීයා අතින් කායිකව; ලිංගිකව බලවත් අපයෝජනයකට ලක්වීම නිසා ඇය වැඩිහිටි වියට පැමිණි පසුව මිනීමැරුම් හතක් කර තිබෙනවා. ඇය සමාජ විරෝධී මනසකින් සමාජය දෙස බැලුවා. කුඩා කළ ඇයගේ මානසික ආබාධය හඳුනා නොගැනීමේ ප්‍රතිඵලයක් විධියට තමයි එලෙස සිදු වුණේ. අවුරුදු 46කට පසු ඇය මරණ දණ්ඩනයට ලක් වෙනවා. මම ඒ වාගේම තවත් උදාහරණයක් දක්වන්නම්. 1953 වර්ෂයේදී ඇමෙරිකාවේ නිව්යෝර්ක් ප්‍රාන්තයේ උපත ලැබූ ඩේවිඩ් බර්කොවිට්ස් යන අයට කුඩා කළ තමන්ගේ මව අහිමි වෙනවා. ඒ නිසා මානසික තත්ත්වය අයහපත් අතට පත්වීම හේතුවෙන් ඔහු මිනීමැරුම් හයක් සිදු කර තිබෙනවා. ඔහු කියා තිබෙන්නේ ඔහුට මිනී මරන්න කියන්නේ ඔහුගේ අසල්වැසියාගේ නිවසේ ඉන්නා බල්ලා තුළ සිටින යක්ෂයා කියලායි. මෙයින් පිළිබිඹු වන්නේ කුඩා කාලයේ දරුවන් මානසික ආබාධවලට ලක්වීම නිසා ඔවුන් වැඩිහිටියන් වීමෙන් පසුව සමාජ විරෝධී ක්‍රියාවලට පෙලඹෙන බවයි. අපේ ලංකාවේ සමාජය දිහා බැලුවත්, කුඩා කල යහපත් මානසිකත්වයක් නැති වීම නිසා සමාජය තුළ අපරාධකරුවන් බිහි වෙන බව පෙනෙනවා. අපේ රටේ වුණත් අපරාධකරුවන් වන පුද්ගලයන්ගේ ඉතිහාසය දෙස බැලුවොත්, අපට මෙවැනි උදාහරණ බොහොමයක් හඳුනා ගන්න පුළුවන් වෙයි. දරුවෙකුට කුඩා කළ ඉතා හොඳ මානසික තත්ත්වයකින් ජීවත් වීමට අවස්ථාව සැලසීම සමාජයක් වශයෙන් අපි සියලු දෙනාම කළ යුතු දෙයක්. නමුත් අපි අපේ දරුවන්ට අද මොකක්ද කරලා තිබෙන්නේ කියලා මේ යෝජනාව ගෙන එන අවස්ථාවේ විමසා බැලුවොත්, අප වැඩිහිටියන් වශයෙන් අපේ දරුවන් මානසික පීඩාවෙන් පෙළන ක්‍රියාකාරකම් ඒ අය වෙත පටවා තිබෙන බව පෙනෙනවා.

අපි දරුවන් අධ්‍යාපනයේ හිණිපෙත්තටම ගෙන යන්න ඕනෑය කියලා හිතලා දරුවන්ගේ උර මත ලොකු පොත් බෑග් එකක් එල්ලා තිබෙනවා. මේ බර පොත් බෑග් එක එල්ලාගෙන බිම බලාගෙන යන පුංචි දරුවා පරිසරයේ සුන්දරත්වය දකින්නේ නැහැ, අහසේ පායා තිබෙන ලස්සන දේදුන්නක් දකින්නේ නැහැ, අවට පරිසරයේ පියාඹන සමනලුන් දකින්නේ නැහැ, සියොතුන්ගේ හඬ ඇහෙන්නේ නැහැ, ඇළක, දොළක, වෙලක සිරියාව දකින්නේ නැහැ. ඒ නිසා ඔවුන්ගේ මානසික තත්ත්වය යහපත් වෙන්නේ නැහැ. අපේ රටේ ඉන්න දරුවන් මේ තත්ත්වයෙන් මුදා ගැනීමට අපි කුමක්ද කළ යුත්තේ කියලා කල්පනා කළ යුතුයි. කොටින්ම පරිසරයේ සුන්දරත්වය විඳින්නේ නැති, බාහිර ක්‍රියාකාරකම්වල යෙදෙන්නේ නැති, විනෝදාස්වාදයක් විඳින්නේ නැති දරුවෙකු කවදාවත් යහපත්

මානසික තත්ත්වයකින් සිටින්නේ නැහැ. ඒ නිසා මං හිතනවා, අධ්‍යාපනයේ හිණිපෙත්තට ගෙන යන්න හදන දරුවාගේ මානසිකත්වය ගැන අපි මීට වඩා සැලකිලිමත් විය යුතුයි කියලා.

අපේ රටේ පාසල් දරුවන්ගෙන් සියයට 18ක් පීඩාකාරී මානසික අවපීඩනයෙන්, කාංසාවෙන් පෙළෙන බව පවුල් සෞඛ්‍ය කාර්යාංශයේ දත්තවල වාර්තා වෙනවා. ඒ වාගේම පාසල් දරුවන් අතරට සිය දිවි නසා ගැනීමේ සිතුවිලි පැමිණීම සියයට 15.4කින් ඉහළ ගොස් තිබෙනවා. දරුවන් අතරින් සියයට 22.7ක් නිරන්තරයෙන් දැඩි පාළුවකින් පෙළෙන බව සෞඛ්‍ය අමාත්‍යාංශයේ දත්තවලින් වාර්තා වෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! The ongoing Proceedings of this House shall stay suspended till 1.00 p.m. for lunch.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට නැවත පවත්වන ලදී.***

*அதன்படி அமர்வு இடைநிறுத்தப்பட்டு, பி.ப. 1.00 மணிக்கு மீண்டுந் தொடங்கிற்று.*

*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Mrs.) Deepthi Wasalage, do you want a couple of minutes more?

**ගරු දීප්ති වාසලගේ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தீப்தி வாசலகே)
(The Hon. (Mrs.) Deepthi Wasalage)
Yes, Sir.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay, I will give you two more minutes. The Floor is yours and you can proceed.

**ගරු දීප්ති වාසලගේ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தீப்தி வாசலகே)
(The Hon. (Mrs.) Deepthi Wasalage)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ දරුවන්ගේ යහපත් මානසික තත්ත්වය සහ යහ පැවැත්ම වෙනුවෙන් පාසල්වල මනෝ උපදේශනය සඳහා මනෝ චිකිත්සක ක්‍රම විධි පිළිබඳ උපාධියක් හැදෑරූ, ආචාර ධර්ම පද්ධතියකට යටත් වූ, විශ්වසනීයභාවය සුරකින, කාලච්ඡේද 8ම මනෝ උපදේශන සේවාව වෙනුවෙන් වෙන් වූ ගුරුවරයකු, එහෙම නැත්නම් නිලධාරියකු පත් කිරීම සඳහා ගරු හිරුනි විජේසිංහ මන්ත්‍රීතුමිය විසින් ගෙනෙන ලද යෝජනාව ස්ථිර කරමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Sivagnanam Shritharan. You have five minutes to speak on this Private Members' Motion.

[பி.ப. 1.01]

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இன்றைய தினம் வழக்கறிஞர் கௌரவ (திருமதி) ஹிருனி விஜேசிங்ஹ அவர்களால் கொண்டுவரப்பட்ட, பாடசாலை மாணவர்களின் கல்வி அபிவிருத்தி, தொழில் அபிவிருத்தி மற்றும் தனிநபர் சமூக அபிவிருத்தியின் பொருட்டு ஒவ்வொரு பாடசாலைக்கும் பயிற்றப்பட்ட உளவள ஆலோசகர் - student counsellor - ஒருவரை நியமித்தல் தொடர்பான பிரேரணையை காலத்தின் தேவையாக நான் கருதுகின்றேன். மிக முக்கியமாக வடக்கு, கிழக்கிலே 2009ஆம் ஆண்டுக்கு முன்னர் இலங்கை அரசாங்கத்தினால் மேற்கொள்ளப்பட்ட மிகப் பெரிய யுத்தம் என்பது மாணவர்களுடைய உளவளத்தைப் பாதித்திருந்தது உங்களுக்குத் தெரியும். அக்காலகட்டத்தில் அவர்களுக்கான உளவள ஆலோசனைகளை வழங்கக்கூடிய சூழல் அரசாங் கத்தினால் ஏற்படுத்தப்படவில்லை. இருப்பினும், தமிழர் புனர்வாழ்வுக் கழகம் போன்ற அமைப்புகள் மூலமாக மாணவர்களுக்கான உளவள ஆலோசனைகள் வழங்கப் பட்டது.

இன்று உலகத்தின் போக்குகள் மாறியிருக்கின்றன. குறிப்பாக, முகநூல், YouTube, WhatsApp போன்ற சமூக வலைத்தளங்களின் தாக்கம் இன்றைய மாணவர்களைக் கவர்ந்து இழுத்திருக்கிறது. அதைவிட, நாட்டில் ஏற்பட்ட 'கொரோனா' போன்ற நோய்த் தாக்கம் காரணமாகக் கல்வியில் ஏற்பட்ட தடைகளினால், Zoom தொழினுட்பத்தின் வழியாகக் கற்கலாம் என்ற புதிய முறையும் அரசாங்கத்தினால் அறிமுகப்படுத்தப்பட்டது. இன்று உலகத்தில் கற்பித்தல் முறைகள்கூட இலத்திரனியல் ஊடகங்கள் ஊடாக Zoom வழியில் நடைபெறுகின்றபோது, மாணவர்கள் Zoom வழியில் கற்பது மட்டுமன்றி, வகுப்புகள் முடிந்த பிற்பாடு தாங்கள் பயன்படுத்தும் கையடக்கத் தொலைபேசிகள் அல்லது இலத்திரனியல் சாதனங்கள் ஊடாகச் சமூக வலைத் தளங்களுக்குள் நுழையும் சூழல் உருவாக்கப்பட்டுள்ளது. இதனால், இச்சமூக வலைத்தளங்கள் மாணவர்களின் கவனக் கலைப்பான்களாக மாறி, மாணவர்களிடையே மிகப் பாரியளவில் கவனச் சிதைவு ஏற்பட்டு, கல்வியில் அவர்கள் கொண்டிருக்கின்ற ஆர்வமும் அக்கறையும் வீழ்ச்சியை நோக்கிப் போய்க்கொண்டிருக்கின்றது என்பதைப் பல்வேறு பட்ட ஆய்வுகளின் அடைவுமட்டங்கள் காட்டுகின்றன.

பாடசாலைகளில் ஏன் ஓர் உளவள ஆலோசகருடைய உதவி தேவைப்படுகின்றது என்று சொன்னால், இது இன்று கல்வித் துறையில் இருக்கின்ற மிகப் பெரிய வழிகாட்டல் முறையொன்றாக இருப்பதனாலாகும். உங்களுக்குத் தெரியும், மின்குமிழைக் கண்டுபிடித்த தோமஸ் அல்வா எடிசனை, 'படிக்க இயலாதவர்' என்று கூறி பாடசாலையிலிருந்து ஆசிரியர்கள் வெளியேற்றியபோது, "நீ ஒரு சிறந்த மாணவன், உனக்கேற்ற பாடசாலை இங்கு இல்லை" என்று கூறி அவரது மனதைத் தேற்றி, அவருக்கு ஓர் உளவள ஆலோசகராகவும் ஆசிரியராகவும் இருந்து வழிநடத்திய அவரது தாயார் இந்த உலகத்தினுடைய தலைசிறந்த விஞ்ஞானியாக அவரை மாற்றினார். ஆகவே, உளவள ஆலோசனை என்பது ஒரு சமூகத்தில் வாழுகின்ற மாணவர்களுடைய மனங்களில் மிகப் பெரிய மாற்றத்தைக் கொடுக்கக்கூடியது; ஒரு தைரியத்தைக் கொடுக்கக்கூடியது. ஆகவே, அந்த உளவள ஆலோசனை மிக மிக முக்கியத்துவம் வாய்ந்தது.

[ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා]

யாழ்ப்பாணப் பல்கலைக்கழகத்தினுடைய மூத்த பேராசிரியராக இருந்த சபா ஜெயராசா அவர்கள் இதற்கு ஒரு புதிய வடிவம் கொடுத்தார். அதாவது, உளவியல் என்பது ஒரு சீர்மிய நடவடிக்கை என்ற அடிப்படையில், மாணவர்களுக்கு அந்தச் சீர்மிய நடவடிக்கைகளை, உளவியல் சிகிச்சையை எவ்வாறு ஆசிரியர்கள் மேற்கொள்ள வேண்டும் என்பது பற்றி அவர் கையாண்ட பல யுக்திகள் உண்டு. குறிப்பாக, கல்வியினுடைய பின்-நவீனத்துவம் மற்றும் ஒருங்கிணைந்த கல்விச் செயற்றிட்டங்களை அறிமுகம்செய்து, அதனூடாகக் கல்விச் சீர்மியத்தைக் கொண்டுவருவதற்குப் பங்களிப்புச் செய்த யாழ்ப்பாணப் பல்கலைக்கழகத்தின் முன்னாள் மூத்த பேராசிரியர் சபா ஜெயராசா அவர்கள்இங்கு நினைவுகூரப்பட வேண்டியவர். இன்று அவர் ஓய்வுநிலையில் இருக்கின்றார். உளவியல் துறையில், உள வள ஆலோசனைத் துறையில் அவர் மிகப்பெரிய பங்கை ஆற்றியிருந்தார்.

இன்றைய காலகட்டத்தில் பிள்ளைகள் ஆன்மீக ரீதியாகக்கூட சற்றுத் தள்ளிப் போய்க்கொண்டிருக்கின்ற ஒரு நிலை காணப்படுகிறது. ஆகவே, ஆன்மீக ரீதியாகவும் பிள்ளைகள் வசீகரிக்கப்பட வேண்டும். அதை மதத் தலங்கள், மத நிறுவனங்கள் சரியான முறையில் பின்பற்ற வேண்டும். இன்று எத்தனையோ சிறுவர் சிறுமிகளை மதத்தலங்கள் மற்றும் மத நிறுவனங்களை நடத்துகின்றவர்கள் துஷ்பிரயோகம் செய்த சம்பவங்கள் பற்றி உங்களுக்குத் தெரியும். அண்மைக் காலங்களில் அனுராதபுரத்திலே, கொழும்பிலே எனப் பல இடங்களில் பாடசாலைச் சிறுமிகளை அல்லது ஆலயத்தை நம்பிச் செல்லுகின்ற சிறுமிகளை மதத் தலைவர்களே துஷ்பிரயோகம் செய்த சம்பவங்களை நாங்கள் அறிந்திருக்கின்றோம். ஆனால், இந்த நாட்டிலே அப்படிப் பாதிக்கப்பட்டவர்களுக்குச் சரியான முறையில் நீதி கிடைக்கவில்லை. ஜனாதிபதி அவர்கள்கூட ஒரு தடவை சொன்னார், "பிக்குமார் அவ்வாறு பிழைவிட்டால், அதை விசாரிக்க அவர்களுக்குத் தனியான நீதிமன்றத்தை நாங்கள் அமைப்போம்" என்று. இது, "சட்டத்தின் முன் எல்லோரும் சமம்" என்ற விடயத்தைக்கூட தள்ளி வைத்திருக்கிறது.

குறிப்பாக, மாணவர்களுக்கான இந்த உள வள ஆலோசனை என்பது, அதிலும் பருவ வயதில் இருக்கின்ற பெண் பிள்ளைகள், ஆண் பிள்ளைகளுக்குப் பல்வேறு வகைப்பட்ட உள வள ஆலோசனைகள் வழங்கல் என்பது இன்று மிக முக்கியத்துவம் பெற்றிருக்கின்றது. அந்த வகையில், கௌரவ உறுப்பினர் அவர்கள் இன்று இந்தச் சபைக்குக் கொண்டுவந்திருக்கின்ற பிரேரணையை நிறைவேற்ற வேண்டியது காலத்தினுடைய கடமை; இது மிகமிக முக்கியத்துவம் வாய்ந்தது. இந்த விடயத்தை வெறுமனே ஒரு counsellor நியமனத்துடன் மட்டும் நிறுத்திவிடக் கூடாது. ஒரு பாடசாலைக்கான counsellor ஒருவர் சட்டரீதியாக நியமிக்கப்படும்போது, ஒரு வலயத்துக்கான உளவள உதவிக் கல்விப் பணிப்பாளர் ஒருவரும் நியமிக்கப்பட வேண்டும்; அதற்கெனத் தனியான ஓர் அலகு உருவாக்கப்பட்டு, உரிய வசதிகள் செய்து கொடுக்கப்பட வேண்டும். அதற்காக ஆசிரியர் ஆலோசகர்களும் வளவாளர்களும் உருவாக்கப்படுகின்ற போதுதான் இந்த உளவள ஆலோசனை கனதியாகப் பிள்ளைகளைச் சென்றடையும்; அதன்மூலம் பிள்ளைகளை வழிநடத்தக்கூடியதாக இருக்கும்; அந்தச் சேவை வெற்றி கரமானதாக, மிகவும் நேர்த்தியானதாக பிள்ளைகளைச் சென்றடையக்கூடியதாக இருக்கும்.

இன்றைய தினம் கொண்டுவரப்பட்ட உளவள ஆலோசனைத் திட்ட ஆலோசனை மிக மிக முக்கியத்துவம் வாய்ந்தது; இது காலத்துக்கு மிகத் தேவையானது. இன்றைய உலக ஒழுங்குப் போக்கிலே மாணவர்களுடைய மன நிலைகளை இனங்கண்டு, அவர்களை இந்தப் போட்டிகர வேலைவாய்ப்பு உலகுக்குள் ஈர்த்துக்கொள்வதற்கும், வெற்றிகரமான மனிதர்களாக மாற்றுவதற்கும் உளவள ஆலோசனை என்பது மிக மிக முக்கியத்துவம் வாய்ந்தது. ஒரு கணித மேதையாக இராமானுஜனை இந்த உலகத்துக்குத் தந்ததற்கு, ஒரு மிகப் பெரிய வீரனாக புரூஸ் லீயை இந்த உலகத்துக்குத் தந்ததற்கு, தோமஸ் அல்வா எடிசன் என்ற விஞ்ஞானியை உலகத்துக்குத் தந்ததற்கு அவர்களுடைய குடும்பத்திலிருந்து கிடைத்த உளவள ஆலோசனைகளும் ஆசிரியர்களுடைய ஆலோசனைகளும் அவர்களுக்குக் கொடுக்கப்பட்ட தன்னம்பிக்கையும்தான் காரணம். அதுதான் அவர்களை உலகத்தில் 'வெற்றி மனிதர்களாக' மாற்றின. அதைத்தான், "நீ எதை நினைக்கிறாயோ அதுவாக ஆகிறாய்" என்று சுவாமி விவேகானந்தரும், "கனவு காணுங்கள்! கனவுகளில் இருந்து சிந்தனைகள் பிறக்கும், சிந்தனைகள் செயல்களாக மாறும்" என்று அப்துல் கலாமும் அன்று சொன்னார்கள். அந்தக் கனவுகள் பிள்ளைகளிடம் உருவாவதற்குச் சரியான நம்பிக்கை வழங்கப்பட வேண்டும். அந்த நம்பிக்கையை வளர்க்கக்கூடிய உளவள ஆலோசனைகளை வழங்குதல் பாடசாலைகளில் மிக நேர்த்தியாக ஆரம்பிக்க வேண்டும் என்பதை வலியுறுத்தி, மிக மிக முக்கியத்துவம் வாய்ந்த இந்தப் பிரேரணையை நானும் வழிமொழிந்து ஆதரிக்கின்றேன். குறிப்பாக, இன்றைய இலத்திரனியல் உலகத்தில் சமூக வலைத்தளங்களின் தாக்கத்திலிருந்து பிள்ளைகளைக் காப்பாற்றவும், கல்வித் துறையிலே அவர்கள் முன்னேறவும், உலகத்தை வெற்றி கொள்ளவும் அவர்களுக்கு அதிகமான உளவள ஆலோசனை அவசியம் என்பதை வலியுறுத்தி, விடைபெறுகின்றேன்.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Ajith P. Perera. The Floor is yours. You have five minutes to speak on this Private Members' Motion.

[අ.භා. 1.08]

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු හිරුනි විජේසිංහ මන්ත්‍රීතුමිය විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ඉතාම කාලෝචිත, වැදගත් යෝජනාවක්. සෑම පාසලකටම පුහුණුව ලත් මනෝ උපදේශකවරුන් පත් කිරීම ඉතාම සුදුසුයි. පාසල් 10,000ක් පමණ අපේ රටේ තිබෙනවා. ඒ පාසල් 10,000ටම එකවර එවැනි උපදේශකයන් 10,000ක් පත් කිරීම සමහර විට ප්‍රායෝගික නොවන්නට පුළුවන්. ඒ නිසා සිසුන් වැඩි පිරිසක් සිටින පාසල්වලට එක් උපදේශකයකුත්, ඉතා කුඩා සිසුන් සංඛ්‍යාවක් සිටින පාසල් කිහිපයකට එක් උපදේශකයකුත් වශයෙන් පත් කිරීම ඉතාම සුදුසුයි. මීට කලින් උගත් මන්ත්‍රීතුමියලා විසින් ප්‍රකාශ කරන ලද එවැනි අදහස් ද මම අනුමත කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අනාගතයේදී අපේ රටේ අධ්‍යාපන ක්ෂේත්‍රයටත්, ආර්ථිකයටත්, පොදුවේ මේ රටටත් බලපාන ඉතා වැදගත් කාරණයක් තිබෙනවා. ඒ තමයි, අද වන විට පාසල්වල පළමු ශ්‍රේණියට ළමුන් ප්‍රමාණවත් ලෙස නොමැති වීම. කුඩා පාසල්වල සමහර පන්ති වසා දමා තිබෙනවා. සමහර

පාසල්වල ඉන්නේ එක් ළමයෙකු හෝ දෙදෙනෙකු පමණයි. ජනප්‍රිය පාසල්වලට විතරයි ළමුන් ඒක රාශි වීම සිදු වන්නේ. ඇයි මෙහෙම වෙලා තිබෙන්නේ? 2015 අවුරුද්දේ මේ රටේ දරු උපත් 336,097ක් සිදු වුණා. 2016දී දරු උපත් 331,000යි; 2017දී දරු උපත් 326,000යි; 2018දී දරු උපත් 328,000යි; 2019දී දරු උපත් 319,000යි; 2020දී දරු උපත් 301,000යි; 2021දී දරු උපත් 284,000යි; 2022දී දරු උපත් 275,000යි; 2023දී දරු උපත් 247,000යි; 2024දී දරු උපත් 220,000යි; 2025දී දරු උපත් 214,570යි. වසර 10ක් තුළ වාර්ෂික උපත් සංඛ්‍යාව 120,000කින් අඩු වෙලා තිබෙනවා. කවුරුත් මේක දැනගෙන හිටියා. මම ගරු සෞඛ්‍ය ඇමතිතුමාගෙන් මේ පාර්ලිමේන්තුවේදී ලිඛිත පිළිතුරු අපේක්ෂාවෙන් ඉදිරිපත් කරන ලද ප්‍රශ්නයට පිළිතුරු 2026 ජුලි මාසයේ 24වැනි දා හැන්සාඩගත කරලා තිබෙනවා. ඒ අනුවයි මම මේ කරුණු කියන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වෛද්‍යවරයෙකු වශයෙන් ඔබතුමා දන්නවා මේකේ තිබෙන වැදගත්කම. එක් එක් වසරට සාපේක්ෂව හැම වසරකම උපත් සංඛ්‍යාව අඩු වෙලා තිබෙනවා. 2019 සිට මේ ප්‍රවණතාව වර්ධනය වෙලා තිබෙනවා. කොරෝනා නිසා මෙහෙම වුණාය කිව්වාට, මේක කොරෝනා නිසා ඇතිවුණු ප්‍රශ්නයක් නොවෙයි. කොරෝනා නිසා දරුවන් උපත ලැබීමේ යම් අඩුවක් තිබෙනවා. හැබැයි, දිගටම මේ අඩුව පවතිනවා. ඒ නිසා මේ ප්‍රශ්නය කුමක්ද කියලා හඳුනා ගැනීම අවශ්‍යයි. මෙහිදී විවාහ වන වයස ඉහළ යෑම, විවාහ අනුපාතය පහළ යෑම, විවාහ වෙන්වීම් සහ දික්කසාද ප්‍රමාණය ඉහළ යෑම, ජීවන වියදම වැඩි වීම, නිවාස, අධ්‍යාපනය සහ ළමා රැකවරණය අධික වියදම් සහිත වීම, ආර්ථිකය පිළිබඳ අවිනිශ්චිතතාව, දරුවන් ඇති කිරීම පිළිබඳ වියදම් අධික වී ඇති බවට සමාජය තුළ පවතින මතය, කොවිඩ් වසංගතයෙන් ඇතිවුණු කම්පනය යන කාරණා හේතු වෙලා තිබෙනවා. ඒ වාගේම දරුවන් ලැබීමට හැකි වයසේ තරුණ තරුණියන් රට අතහැර යෑම, සංක්‍රමණය වීම යන කාරණාත් මීට බලපා තිබෙනවා. මේ තත්ත්වය තුළ වෙන්නේ මේකයි. දැනටමත් පවතින මේ ප්‍රවණතාව නිසා ඉදිරියේදී මේ රටේ සාමාන්‍ය එදිනෙදා කටයුතු පවත්වා ගෙන යෑම සඳහා අවශ්‍ය තරුණ ජනගහනය නොමැති වෙනවා. රජයේ සහ පෞද්ගලික අංශයේ රැකියා සඳහා ප්‍රමාණවත් තරම් පුරවැසියන් නොමැති වීමේ ප්‍රශ්නයක් නියත ලෙස මතු වෙනවා. සෞඛ්‍ය ඇමතිතුමා කියන විධියට 330,000ක්-360,000ක් අතර ප්‍රමාණයක් ප්‍රශස්ත වාර්ෂික දරු උපත් සංඛ්‍යාව වශයෙන් සලකන්න පුළුවන්. නමුත්, අද ඒක 200,000 දක්වා අඩුවෙලා තිබෙනවා. මේක අප කම්පනය කරන සංඛ්‍යාවක්. මේක ලොකු ප්‍රශ්නයක්. මේ රටේ ආර්ථික සංවර්ධනය සැලසුම් කිරීම, අධ්‍යාපනය සැලසුම් සකස් කිරීම, මේ රටේ උසස් අධ්‍යාපනය සැලසුම් සකස් කිරීම, රැකියා අවස්ථා සැලසුම් කිරීම කියන හැම කාරණයකදීම අසාමාන්‍ය ලෙස දරු උපත් සංඛ්‍යාව අඩු වීම - සිංහල, දෙමළ, මුස්ලිම් කියන ජනවර්ග තුනේම - බලපානවා. ඒකත් මම කියන්න ඕනෑ. මේ ඇතිවෙලා තිබෙන ජනගහනයේ අඩුවීම, වාර්ෂික උපත් සංඛ්‍යාවේ අඩුවීම රටේ ආර්ථිකයට දැවැන්ත ලෙස බලපානවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේක, මේ රටේ මේ මොහොතේ තිබෙන ප්‍රමුඛතම ප්‍රශ්නයක්.

අපි අධිකරණවල තිබෙන ගැටලු ගැන කථා කරනවා. ජීවන වියදම වැඩිවීම ගැන කථා කරනවා. ප්‍රවාහනයේ තිබෙන ප්‍රශ්න ගැන කථා කරනවා. නිවාස ඉදිකිරීමට යන වියදම ගැන කථා කරනවා. අපි වෙන වෙනම ඒවා ගැන කථා කරනවා. මේ රටේ අනාගතය තමයි අපේ දරුවෝ. මේ රටේ දරුවෝ උපදින්නේ නැත්නම්, ප්‍රමාණවත් තරම් දරු උපත් සංඛ්‍යාවක් නැත්නම්, මේ රටේ දැනටමත් තිබෙන පාසල් දසදහසයට ප්‍රමාණවත් වෙන තරම් දරුවෝ නැත්නම්, අපි දැනටමත් ගොඩනහලා තිබෙන විශ්වවිද්‍යාල පද්ධතියේ ධාරිතාවට ගැළපෙන ප්‍රමාණයට දරුවන් ඉදිරියේදී එන්නේ නැත්නම් ඒක ලොකු ප්‍රශ්නයක්. සාමාන්‍ය විද්‍යාවේදී උපාධියට සහ ශාස්ත්‍රවේදී උපාධිවලට දැන් ප්‍රමාණවත් තරම් ළමයි සංඛ්‍යාවක් විශ්වවිද්‍යාලවලට ඇතුළත් වෙන්නේ නැහැ. මීට කලින් ඇති වුණු බලපෑමේ ප්‍රතිඵල දැන් ක්‍රමානුකූලව ඇවිල්ලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක ඉතාම බැරෑරුම් ප්‍රශ්නයක්. අපට මේකට කරන්න පුළුවන් මොනවාද? මේ සඳහා, යැපෙන දරුවන් සිටින පවුල්වලට බදු සහන දෙන්න ඕනෑ. එහෙම නැත්නම් අය කරන ආදායම් බදු ප්‍රමාණය අඩු කරන්න ඕනෑ. ඒ කියන්නේ, ළමයි ඉන්න පවුල්වලට විශේෂයෙන් සලකන්න ඕනෑ. ඒ අය අපි ආරක්ෂා කරන්න ඕනෑ. අපි ඒ පවුල් රකින්න ඕනෑ. ඒ වාගේම සුදුසුකම්ලත් පවුල් සඳහා මූල්‍ය ආධාර සහ දරු උපත්වලදී යම් යම් ප්‍රදාන ලබා දෙන්න ඕනෑ. මේක, මෙවැනි ප්‍රශ්නවලට මුහුණ දුන් ලෝකයේ අනෙක් රටවල් කරපු ක්‍රමයක්. ඊළඟට. දෙමාපියන්ට ලබාදෙන නිවාඩු - මාතෘ සහ පීතෘ නිවාඩු - ප්‍රතිලාභ ඉහළ දමන්න ඕනෑ. අම්මටයි, තාත්තටයි දෙන්නටම නිවාඩු දෙන්න ඕනෑ. ඒ වාගේම ළමයින් හදන්නට දිරිමත් කරන්න ඕනෑ. දරුවෙක් ඉපදුණාම ඇතිවෙන අභියෝගවලට මුහුණ දීම සඳහා රජයෙන් ශක්තිය ලබා දෙන්න ඕනෑ. ළමා සුරැකුම් මධ්‍යස්ථානවලට සහ මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානවලට යන වියදම අඩු කරන්න රජය විශේෂිත වැඩ පිළිවෙළක් සකස් කරන්න ඕනෑ. ඒ වාගේම තරුණ පවුල් සඳහා නිවාස ආධාර ක්‍රම හෝ සහනාදායී නිවාස ණය පහසුකම් දෙන්න ඕනෑ. දරුවෝ වැඩියෙන් ඉන්න අයට ණය පොලිය අඩු කරන්න ඕනෑ. දරුවෝ වැඩියෙන් ඉන්නකොට සහන ලබා දෙන්න ඕනෑ. ඒ වාගේම මාතෘ හා ළමා සෞඛ්‍ය සේවා සඳහාත්, සුරැකුම් සඳහාත් යන වියදම්වලට සහනාධාර ලබා දෙන්න අවශ්‍යයි.

ඒ වාගේම නම්‍යශීලී විධිවිධාන සැලසීම කරන්නත් ඕනෑ, පවුල් හිතකාමී සේවා ස්ථාන පිහිටුවන්න. ඒ කියන්නේ, දරුවත් එක්ක වැඩට යන්න පුළුවන් වෙන විධියට. එතකොට වැඩ කරන තැනට එක්කගෙන ගිහිල්ලා වැඩ කරන අතරතුර දරුවා බලාගන්න අම්මාට පුළුවන්. අම්මාට වැඩ ඉවරවෙලා දරුවාත් ගෙදර එක්කගෙන එන්න පුළුවන් වාතාවරණයක් ඇති කරන්න ඕනෑ. ඒ වාගේම තරුණ යුවළවලට, විශේෂයෙන්ම දරුවන් ලබන සහ දරුවන් සිටින පවුල්වලට ආරක්ෂාව ලබා දෙන්න ඕනෑ. ඒ වාගේම වැඩි වැඩියෙන් දරුවන් හැදීම, අගය කළ යුතු, ප්‍රවර්ධනය කළ යුතු, සම්මාන දිය යුතු දෙයක් බවට පත් කරන්න ඕනෑ. මම මේ කාරණය සඳහන් කරන්නේ, ඊළඟ අය වැය සකස් කිරීමේදී මේ රජය මේ රටේ දරු උපත් සංඛ්‍යාව ඉහළ දැමීම සඳහා අවශ්‍ය වන ආයෝජනය කළ යුතු නිසායි. රජයට ප්‍රමාණවත් තරම් රුපියල්වලින් මුදල් තිබෙන බව, ගරු සභානායකතුමා කියන ආකාරයට ආණ්ඩුවට ටොන් ගණන් මුදල් තිබෙන බව, අය වැයේදී ට්‍රිලියන ගණනක් අතිරික්ත මුදල් තිබෙන බව සඳහන් කළා. බදු ආදායම් වැඩිවෙලා තිබෙනවා. රජයේ මුදල් ආදායම වැඩිවෙලා තිබෙන අවස්ථාවක අනාගතය වෙනුවෙන් දරු උපත් සංඛ්‍යාව ප්‍රවර්ධනය කිරීම සඳහා, ඉපදී සිටින දරුවන්ගේ ආරක්ෂාව සහ රැකවරණය සඳහා අවශ්‍ය වැඩිපුර ආයෝජනය ඊළඟ අය වැය යෝජනාවලට ඇතුළත් කිරීම පිළිබඳව රජය සලකා බලයි කියා මම බලාපොරොත්තු වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Roshan Akmeemana. You have five minutes to speak on this Private Members' Motion.

[අ.භා. 1.16]

**ගරු රොෂාන් අක්මීමන මහතා**
(மாண்புமிகு ரொஷான் அக்மீமன)
(The Hon. Roshan Akmeemana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු හිරුණි විජේසිංහ පාර්ලිමේන්තු මන්ත්‍රීතුමිය විසින් ඉදිරිපත් කළ පාසල් දරුවන්ගේ මානසික සෞඛ්‍ය තත්ත්වය ඉහළ නැංවීම සඳහා වූ යෝජනාව අනුමත කරන ගමන්, පාසල් ගුරුවරයෙකු ලෙස සේවය කර ලබපු අත්දැකීම් එක්ක මම කැමැතියි, මේ විවාදයට මගේ අදහසත් එකතු කරන්න.

පාසල් අධ්‍යාපන ක්‍රමය, එහෙම නැත්නම් අපේ අධ්‍යාපන ක්‍රමය ගැන සාකච්ඡා කරනකොට දරුවන්ගේ මානසික සෞඛ්‍ය පිළිබඳ සාකච්ඡාව මග නොහැරිය හැකි කාරණාවක් බවට වර්තමානයේදී පත් වෙලා තිබෙනවා. ඒකට හේතුව ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය - මීට කලින් හිටපු - පරම්පරා මුහුණ දුන්නාට වඩා වැඩි අභියෝග ගණනාවකට, වැඩි මානසික පීඩාවලට වර්තමාන දරු පරම්පරාව මුහුණ දීමයි. ඒකට විශේෂ හේතුවක් තිබෙනවා. ඒ තමයි, පසුගිය කාලයේ අපේ රට මුහුණ දීපු ආර්ථික අර්බුද, ආර්ථිකමය අපහසුකම්. ඒ නිසා දෙමව්පියන් වඩා හොඳ ආර්ථික තත්ත්ව හඹා යනවා. ඒ සඳහා සමහර විට රැකියා දෙකක් කරන්න සිද්ධ වෙනවා. තමන්ගේ නිවසට අදාළ ප්‍රදේශයෙන් දුර බැහැරට හෝ වෙනත් රටවල රැකියාවලට යන්න සිද්ධ වෙනවා. මේ නිසා දෙමව්පියන්ට දරුවන් සමඟ, දරුවන් වෙනුවෙන් ගත කරන්න තිබෙන කාලයේ අඩුකමක් දක්නට ලැබෙනවා. මෙන්න මේ වාගේ විශේෂ කාරණා නිසා අද වෙනකොටත් කලින් පරම්පරා මුහුණ දුන්නාට වඩා වැඩි පීඩනවලට, වැඩි බලපෑම්වලට වර්තමාන දරු පරම්පරාව පත් වෙලා තිබෙනවා. ඒ නිසා තමයි දරුවන් වෙනුවෙන් මෙහෙම විවාදයක් සඳහා අවස්ථාව අපි ලබා ගන්නේ.

වර්තමානයේ අපේ රටේ යම් යම් පාසල්වල ශිෂ්‍ය උපදේශන සේවා සඳහා ගුරුවරු ඉන්නවා. ඒ වෙනුවෙන් පත්වීම් ලබපු අය ඉන්නවා. නමුත්, කාලයක් තිස්සේ අපේ රටේ සිද්ධ වෙච්ච බඳවා ගැනීම්වල අඩුපාඩුකම් නිසා, ගුරු හිඟය නිසා ඒ ශිෂ්‍ය උපදේශන සේවා වෙනුවෙන් ඉන්න ගුරුවරුන්ටත් පාසලේදී වෙනත් විෂයයන් ආවරණ කරන්න සිද්ධ වෙලා තිබෙනවා. ඇත්තටම, ශිෂ්‍ය උපදේශනයට පත්වීම් ලබපු ගුරුවරු පවා වර්තමානය වෙද්දී පාසලේදී වෙනත් විෂයක් උගන්වනවා. ඒ නිසා ඔවුන්ගෙන් බලාපොරොත්තු වන කාර්යභාරය පවා කරගන්න හැකියාවක් ලැබෙන්නේ නැහැ. මේ වර්ෂය තුළ 30,000කට ආසන්න ගුරුවරු ප්‍රමාණයක් බඳවා ගන්න අපි ලැහැස්ති වෙලා ඉන්නවා. ඒ කටයුතු සිද්ධ වෙමින් පවතිනවා. ගරු අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන නියෝජ්‍ය ඇමතිතුමාත් මේ විවාදයට සම්බන්ධ වෙන නිසා අපි යෝජනා කරනවා, ඒ ගුරුවරු 30,000 බඳවා ගත්තාට පසුව, ශිෂ්‍යයන් වැඩි ප්‍රමාණයක් ඉන්න පාසල්වලට ශිෂ්‍ය උපදේශන සේවා සඳහා ගුරුවරයෙක් ස්ථිර වශයෙන් පත් කරන ලෙසත්, ශිෂ්‍යයන් අඩු ප්‍රමාණයක් ඉන්න පාසල් කිහිපයක් වෙනුවෙන්ම එක් ගුරුවරයෙක් හෝ පත් කරන ලෙසත්. මොකද, ලංකාවේ පාසල් 10,000කට ආසන්න ප්‍රමාණයක් තිබෙන නිසා ඒ පාසල් 10,000ටම එක් ගුරුවරයෙක් බැගින් පත්කිරීම ප්‍රායෝගිකව අපහසු වෙන්න පුළුවන්. නමුත් මා කියන විධියට කළොත් අපට මේ ක්‍රියාවලිය කරගන්න පුළුවන්. සමාජ මාධ්‍යයේ බලපෑම, මත්ද්‍රව්‍ය භාවිතය, ප්‍රචණ්ඩත්වය, සමාජ මාධ්‍ය තුළින් එල්ල වෙන ප්‍රචණ්ඩත්වය යන මේ සියලු කාරණා නිසා වර්තමානයේ ශිෂ්‍ය පරම්පරාව තුළ දැඩි ආතතික ස්වභාවයක් නිර්මාණය වෙලා තිබෙනවා.

මේ ශිෂ්‍යයන්ගේ මානසික සෞඛ්‍ය සඳහා අපට සලකා බලන්න සිදු වෙන තවත් පැත්තක් තමයි ශාරීරික අධ්‍යාපනය සහ ක්‍රීඩාව. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධ්‍යාපනය ගත්තොත්, විෂය මූලික අධ්‍යාපනය, මානසික සෞඛ්‍ය, ක්‍රීඩාව සහ සෞන්දර්යය වාගේ විෂයයන් එකිනෙකට විකල්ප නොවෙයි. ඒවා එකිනෙකට පෝෂණය කරන දේවල් මිස, එකක් වෙනුවට එකක් නොවෙයි. ක්‍රීඩාව අතින් ගත්තත් වර්තමානයේදී පාසල්වල ක්‍රීඩා පුහුණුකරුවන් නැහැ. ක්‍රීඩාව සඳහාම පත්වීම් ලබපු පුහුණුකරුවන් නැහැ. සමහර පාසල්වල ක්‍රීඩා විෂය භාර ගුරුවරු ඉන්නවා. නමුත්, යම් යම් සුවිශේෂී ක්‍රීඩා සඳහා විශේෂඥ හැකියා තිබෙන, දක්ෂ ක්‍රීඩා පුහුණුකරුවන්ගේ දරුණු හිඟයක් තිබෙනවා. ඒ නිසා දරුවන් ක්‍රීඩාවට යොමු වීමේ අඩුපාඩුකම් තිබෙනවා. අපි යෝජනා කරනවා, පාසල්වල ක්‍රීඩා පුහුණුකරුවන් වශයෙන් ක්‍රීඩාවටම විශේෂඥ හැකියාව තිබෙන පුහුණුකරුවන් බඳවා ගැනීම කළ යුතුයි කියලා. මොකද, දරුවන්ගේ මානසික සෞඛ්‍යයට සහ ශාරීරික සෞඛ්‍යයට ක්‍රීඩාව ඉතාම වැදගත්. ක්‍රීඩාව තුළින් ලැබෙන කණ්ඩායම් හැඟීම, දරාගැනීමේ ශක්තිය, නායකත්වය යන මේ සියල්ල දරුවන්ගේ මානසික සෞඛ්‍යයටත් බලපානවා. කණ්ඩායමක ක්‍රීඩා කිරීම තුළින් හඳුනාගන්න එක් සගයෙක් දරුවෙකුගේ හොඳම යාලුවා බවට දීර්ඝ කාලීනව පත්වෙන්න පුළුවන්. එහෙම අවස්ථා තිබෙනවා.

ඒ වාගේම තමයි සෞන්දර්යය විෂයය. සෞන්දර්යය විෂයයන් ගත්තත්, ගුරු පුරප්පාඩු විශාල ප්‍රමාණයක් ලංකාවේ පාසල්වල තිබෙනවා. සෞන්දර්යය තුළින් තමයි පරිකල්පනය සහිත සංවේදී මනුස්සයෙක් බිහි වෙන්නේ. ක්‍රීඩාව, සෞන්දර්යය සහ ශිෂ්‍ය උපදේශන සේවා තුළ තිබෙන ගුරු පුරප්පාඩු ටික අපට පුරවා ගන්න පුළුවන් නම් ඒවාට වෘත්තීමය හැකියාවක් තිබෙන පුහුණු අය - නිකම්ම නිකම් ඔළුගෙඩි ටිකක් දමනවාට වඩා ඒ ක්ෂේත්‍රවලටම පුහුණුවක් ලබපු අය - වෙනත් රාජකාරි පවරන්නේ නැතුව ඒ වෙනුවෙන්ම අනුයුක්ත කරන්න පුළුවන් නම් අපේ දරුවන්ගේ මානසික සෞඛ්‍යය මීට වඩා ඉහළ මට්ටමකට ගේන්න පුළුවන්. එහි ප්‍රතිලාභය ලැබෙන්නේ ඒ දරුවන්ට පමණක් නොවෙයි. ඒ හරහා නිර්මාණශීලී, අභියෝගවලට මුහුණ දෙන්න පුළුවන්, ජව සම්පන්න දරුවන් අපේ සමාජයට, අපේ ආර්ථිකයට දායක කිරීම තුළින් මුළු රටටම සේවයක් ලැබෙන බව මා කියන්න කැමැතියි.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. (Mrs.) Rohini Kumari Wijerathna. You have five minutes to speak on this Private Members' Motion.

[අ.භා. 1.22]

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම මම බොහොම සතුටට පත් වෙනවා, අපේ තරුණ මන්ත්‍රීතුමිය, ගරු හිරුනි විජේසිංහ මැතිනිය බොහොම කාලීන, වැදගත් මාතෘකාවක් යටතේ යෝජනාවක් ඉදිරිපත් කර තිබෙන එක ගැන. ඇත්තටම අද සමාජයේ දරුවන් මුහුණ දෙන ගැටලු දිහා බලනකොට, අධ්‍යාපනය කියන්නේ පොත් පත් කටපාඩම් කරලා විභාගයකට මුහුණ දෙන්න ළමයින් ලෑස්ති කිරීම පමණක් නොවෙයි කියන එක අද අපි හැමෝම දන්නා කාරණාවක්. විශේෂයෙන්ම අධ්‍යාපනයේදී තිබෙන තරගය නිසා, වර්තමාන ආර්ථික හා සමාජයීය වටපිටාව නිසා, තාක්ෂණික දියුණුව නිසා දරුවන් පෙර නොවූ විරූ ලෙස විවිධාකාරයේ මානසික පීඩනයට, ආතතියට, ව්‍යාකූලත්වයට පත් වෙලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඇත්තටම අද පාසල ඇතුළේ අපට දකින්නට තිබෙන්නේ මොනවාද කියලා බැලුවොත්, ළමා අපචාර සහ අපයෝජන තිබෙනවා. ඒ නිසා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ළමා අපචාර සහ අපයෝජන කියන එක අපි පැහැදිලිව හඳුනා ගන්න ඕනෑ. ඊළඟට මත්ද්‍රව්‍ය උවදුර තිබෙනවා. ඊළඟට, පවුල් ආරාවුල් වාගේම ආර්ථික ප්‍රශ්න හේතුවෙන් අද අපේ දරුවෝ විෂාදයට, කාංසාවට හා ආතතියට පමණක් නොවෙයි, අවධානය අඩුවීම, අධි ක්‍රියාශීලීත්වය - ADHD - වාගේ තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඒ වාගේම චර්යාත්මක ආබාධ සහිත දරුවන් මෙන්ම bipolar තත්ත්වයේ සිටින දරුවනුත් අපට පාසල් පද්ධතිය තුළ හඳුනා ගන්නට හැකියාව ලැබිලා තිබෙනවා. ඉතින්, එහෙම දරුවන්ට අවධානය යොමු කරනකොට, ඒ දරුවන් තේරුම් ගන්නට බැරි අය හිතුවක්කාර, එහෙම නැත්නම් දඩබ්බර, අකීකරු දරුවන් විධියට තමයි ඒ දරුවෝ දිහා බලන්නේ. එසේ වීම තුළම ඒ දරුවන්ගේ අධ්‍යාපනය එතැනින් හමාර වෙන්න බොහෝ වෙලාවට ඉඩ තිබෙනවා. නමුත් ඇත්තටම ගත්තොත්, ඇත්ත තත්ත්වය ඒක නොවෙයි. ඒ දරුවාගේ චර්යාවෙන් එළියට එන්නේ ඒ දරුවාගේ හිතේ තිබෙන මානසික පීඩනය හෝ මනසේ ඇති වන තත්ත්වයයි. ඔවුන් නිහඬව, හඬමින් හෝ කෑ ගසමින් ඉල්ලන්නේ ඒ අයට පිහිට වෙන්න, ඒ අය වෙනුවෙන් මැදිහත් වෙන්න වෙන්න කියලායි. ඒ නිසා මෙවැනි පසුබිමක පාසලකට මනෝ උපදේශකවරයෙකු පත් කිරීම හුදු අලංකාරයක්, ෂෝ එකක් නොවෙයි. ඇත්තටම ඒක අතිරේක සේවාවකුත් නොවෙයි. අද එය විය යුතු වැදගත්ම කාර්යයක් හැටියට, අත්‍යවශ්‍යම කාරණයක් හැටියට මා දකිනවා. අපි ගරු සේවයට එනකොට අපට කියනවා, "ජෝන්ට ලතින් උගන්වන්න කලින් ජෝන් හඳුනා ගන්න" කියලා. "ජෝන්" හඳුනා ගන්න නම් ජෝන්ගේ මනසේ ක්‍රියාකාරිත්වයෙත් අපි සැලකිල්ලට ලක් කරන්න ඕනෑ කියලා මම හිතනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

2016-2020 කාලයේත් පාසල්වලට මනෝ උපදේශකවරු බඳවා ගන්න කියලා ගැසට් පත්‍රයක් නිකුත් කළා, මට මතකයි. ආණ්ඩුව වෙනස් වෙනවාත් එක්කම ඒක නතර වුණා. ළමයින් 500ක් හෝ ඊට වැඩිය සිටින සෑම පාසලකටම, ළමයින් 500කට එක මනෝ උපදේශකවරයකු බැගින් පත් කරන්න කියන යෝජනාව ආවා. ඒ නිසා ගරු මන්ත්‍රීතුමියගේ යෝජනාවටම මම අද තවත් යෝජනාවක් එක් කරනවා. ඒ තමයි, මේ පත් කරන මනෝ උපදේශකවරයා විධිමත්, වෘත්තීය සුදුසුකම් තිබෙන කෙනෙක් විය යුතුයි කියන එක. ඒ කියන්නේ විශ්වවිද්‍යාලයක උපාධියක්වත් තිබෙන්න ඕනෑ. මොකද, මේක මනස ගැන සොයන වැඩක්. මම හිතන විධියට දොස්තර මහත්මයෙක් කරන වැඩක්. මේක Scan machine එකකට දාලා කරන්න පුළුවන් වැඩක් නොවෙයි. දරුවාගේ මනසත් එක්ක හඳුනා ගන්න ඕනෑ, ඒ දරුවා මොන තත්ත්වයකද ඉන්නේ කියලා. ඒ වාගේම සායනික පුහුණුවක් තිබෙන මනෝ උපදේශක සේවාවක් අද යුගයට අවශ්‍යයි, පාසල් පද්ධතියට අවශ්‍යයි කියන එක මම මේ වෙලාවේදී මතක් කරනවා. ඒ නිසා, විශ්වවිද්‍යාල පද්ධතිය තුළින් ලබා ගත් විධිමත් උපාධියක් සහිත, සායනික පුහුණුවක් සහිත පුද්ගලයකු මේ මනෝ උපදේශක තනතුර සඳහා පත් කරන්න කටයුතු කරන්නය කියන යෝජනාව මම නැවත වතාවක් ඉදිරිපත් කරනවා.

ඒ වාගේම මේකේ තිබෙන වැදගත්කම තමයි, ඒ මනෝ උපදේශකවරයාට දරුවා නිවැරැදිව හඳුනා ගන්නටත්, ඒ වෙනුවෙන් මැදිහත් වෙන්නත් හැකියාව තිබෙන්න ඕනෑකම. ඒ වාගේම රහස්‍යභාවය රකින්න පුළුවන් වෙන්න ඕනෑ. ගරු මන්ත්‍රීතුමිය ඒක පැහැදිලිව කිව්වා. පාසල්වල ඇතැම් අය අතින් - හැමෝම නොවෙයි - ඔබතුමිය කියපු කාරණාව සිද්ධ වෙනවා. ඒ වාගේම ඒ දරුවාගේ පූර්ණ පෞරුෂය වර්ධනයට මඟ පෙන්වීම ඒ පත් කරන මනෝ උපදේශකවරයා තුළින් සිදු විය යුතුයි කියන එක මම කියනවා. මොකද, එහෙම නොවුණොත් දරුවා තවත් නරක පැත්තකට යන්න පුළුවන්. ඒ නිසා මම තවත් යෝජනාවක් කරන්න ලෑස්තියි. ගුරු පුහුණුවේදී ගුරුවරුන්ට මනෝ උපදේශනය හා මනෝ විද්‍යාව කියන විෂයයන් දෙක තවත් ගැඹුරින් අධ්‍යයනය කරන්නට ඒ පාඨමාලාවලට කරුණු ඇතුළු කරන්නය කියලා මම යෝජනා කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Mrs.) Rohini Kumari Wijerathna, you have one more minute to wind up.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
මම අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ලෝකයේ බොහෝ රටවල ගුරුවරයා විසින් දරුවාගේ මනෝභාවය, මානසික තත්ත්වය පිළිබඳව සොයා බලා දෙපාර්තමේන්තුවට වාර්තා කරන්න ඕනෑ. එහෙම වාර්තා කරන්නේ නැතුව කොයි තැනකදී හෝ දරුවාට මානසික ආබාධයක් තිබෙනවාය කියලා හඳුනා ගත්තොත්, ඒ ගුරුවරයා ඒකට උත්තර බඳින්න ඕනෑ. අපි හැමදේම කරන්නේ දරුවන් වෙනුවෙන් නම්, මේ කියන ආකාරයේ සුදුසුකම් තිබෙන වෘත්තිකයෙක් ඒ සඳහා පත් කරන්න කියලා නැවත වතාවක් යෝජනා කරමින්, ගරු හිරුණි විජේසිංහ මන්ත්‍රීතුමිය විසින් ඉදිරිපත් කරන ලද මෙම යෝජනාව මා බොහොම අගය කරන බව ප්‍රකාශ කරනවා.

මට මේ අවස්ථාව ලබා දීම වෙනුවෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. (Dr.) Madhura Senevirathna. You have ten minutes to provide the Reply.

[අ.භා. 1.28]

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා (අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன - கல்வி, உயர் கல்விப் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Madhura Senevirathna - Deputy Minister of Education and Higher Education)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි නිතර කථා කරන ඉතාම කාලෝචිත මාතෘකාවක් සාකච්ඡාව සඳහා මේ සභාවට ගෙන ඒම වෙනුවෙන් මුලින්ම මම ගරු නීතිඥ හිරුනි විජේසිංහ මන්ත්‍රීතුමියට ස්තුතිය පළ කරන්න කැමැතියි. මේ යෝජනාවට අදාළව සාධනීය අදහස් ගොඩක් පළ වුණා. ඉතින් ඒ අදහස් ප්‍රකාශ කිරීම වෙනුවෙන් සහ මෙම පෞද්ගලික මන්ත්‍රී යෝජනාව සාධනීය යෝජනාවක් ලෙස පිළිගැනීම වෙනුවෙන් දීප්ති වාසලගේ මන්ත්‍රීතුමිය, රොෂාන් අක්මීමන මන්ත්‍රීතුමා, ශ්‍රීතරන් මන්ත්‍රීතුමා, අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා, රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය යන සියලුදෙනාටම මා ස්තුතිවන්ත වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුලින්ම මෙම යෝජනාවෙන් මතු කර ගත යුතු කාරණා කිහිපයක් තිබෙනවා. එකක්, මනෝ උපදේශකවරයෙකුගේ සේවය ලබා ගැනීම සහ පාසල් ගුරුවරුන් මනෝ උපදේශකවරුන් ලෙස කටයුතු කිරීම

[ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා]

කියන කාරණය. ඒ වාගේම අධ්‍යාපන සංවර්ධනය, වෘත්තිය සංවර්ධනය, පුද්ගල සමාජ සංවර්ධනය යන කාරණාත් කිහිපයක් තිබෙනවා. මුලින්ම මෙහි අවශ්‍යතාව ගැන කථා කළොත්, මනෝ සමාජ සංවර්ධනය සඳහා වෘත්තිය මාර්ගෝපදේශනයත්, මනෝ විද්‍යාත්මක මාර්ගෝපදේශනයත් යන දෙකම අත්‍යවශ්‍ය වෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ගරු මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රීතුමියලා සඳහන් කළා වාගේම මේ මොහොත වෙනකොට අධ්‍යාපන පද්ධතියට මාර්ගෝපදේශන ක්‍රියාවලිය එකතු කර ගැනීම අතිශය අවශ්‍ය වෙලා තිබෙනවා. විශේෂයෙන්ම මේ මොහොත වෙනකොට දරුවන් සමාජ අභියෝග රැසකට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙනවා. ශිෂ්‍ය ශිෂ්‍යාවන් බස් රථයක නැඟලා ගෙදරින් පාසලට එනකොට සහ යනකොට ඔවුන් ඉන්නේ එළියේ, සමාජයේ. ඒ අවස්ථාවල ඇති වන සමාජ ගැටලු රැසක් තිබෙනවා.

අතීතය ගත්තොත්, කොවිඩ් අර්බුදය තිබුණා, ආර්ථික අර්බුදය තිබුණා. දැන් මත්ද්‍රව්‍ය අර්බුදය තිබෙනවා. ඒ වාගේම නවීන ලෝකයත් එක්ක මතු වුණු ගැටලු ගොඩක් තිබෙනවා. විශේෂයෙන්ම ඩිජිටල් තාක්ෂණයත් එක්ක මතු වුණු ගැටලු, ඩිජිටල් තාක්ෂණයට ඇබ්බැහිවීම් වැනි ගැටලු තිබෙනවා. ඉතින් මේ වාගේ කාරණා ගොඩක එකතුවක් තිබෙනවා. ඒ නිසා මේ යෝජනාවේ අවශ්‍යතාව ගැන සඳහන් කරපු කාරණා සියල්ල නිවැරදියි. විශේෂයෙන්ම පාසල් පද්ධතිය සඳහා වෘත්තිය මාර්ගෝපදේශන කටයුතු ඉතාම අවශ්‍යයි. වෘත්තිය මාර්ගෝපදේශනය සහ පාසල් ගුරුවරයාගේ භූමිකාව ගත්තොත්, මේ දෙක එකතු කළ හැකිද? ඒවාට අනන්‍යතා තිබෙනවාද? ඔව්, අනන්‍යතා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වෘත්තිය මාර්ගෝපදේශනය කියන්නේ අතිශය සියුම්, අතිශය ගැඹුරු, අතිශය විද්‍යාත්මක ක්ෂේත්‍රයක්. මේ සම්බන්ධයෙන් ලංකාවේදීත් අපි ප්‍රාමාණික වියතුන් එක්ක නිරන්තරයෙන් සාකච්ඡා කළා. විදේශ සාකච්ඡා කිහිපයකුත් කළා. එතැනදී නිතර ඉස්මතු වුණු කාරණාව තමයි වෘත්තිය මාර්ගෝපදේශකයන්ගේ - counsellorsලාගේ - වෘත්තියමයභාවය අනිවාර්යයෙන් සැලකිය යුතුයි කියන කාරණාව. ඒ කාරණාව ගැන වෙනත් කිසිම තර්කයක් නැහැ. එහෙම වෙන්න ඕනෑ.

හේතුව මේකයි. බැරි වෙලාවත් ළමා කාලයේදී - අපි හිතමු, ප්‍රාථමික අංශයේදී කියලා - පාසල ඇතුළතදී යම්කිසි රෝගාබාධයක් නිසා, එහෙම නැත්නම් සමාජ ප්‍රශ්නයක් නිසා යම් ශිෂ්‍යයෙක් හෝ ශිෂ්‍යාවක් මඟ හැරුණොත්, ඔහු හෝ ඇය වැඩිහිටියකු බවට පත් වෙද්දී මුහුණ දෙන්න සිදු වන තත්ත්වය බලන්න.

මම ගරු රෝහිණී කවිරත්න මන්ත්‍රීතුමිය ගත්ත උදාහරණයම ගන්නම්. ඔය ඔටිසම් කියන රෝගී තත්ත්වයටත්, ඒ වාගේම ADHD කියන තත්ත්වයටත් එන්නේ එක හා සමාන තත්ත්වයක්. එවැනි රෝගී තත්ත්වයක් තිබෙන පොඩි ළමයෙක් හඳුනා ගත්තොත්, ඔහු හෝ ඇය වැඩිවියට පැමිණෙනකොට තිබෙන ඒ අවශ්‍යතා සියල්ල සම්පූර්ණ කළොත්, අපේ ශ්‍රම වෙළෙඳ පොළට හොඳ පුරවැසියෙක්, සමාජයට හොඳ සම්බන්ධකම් තිබෙන පුරවැසියෙක් හදාගන්න පුළුවන්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බැරි වෙලාවත් ඒ ළමා කාලය miss කර ගත්තොත් මොකක්ද වෙන්නේ? බොහෝ විට ඔහු හෝ ඇය antisocial behaviours තිබෙන, සමාජයට ප්‍රතිවිරුද්ධතා තිබෙන පුද්ගලයෙක් වනවා. ඒ නිසා මෙම මාර්ගෝපදේශන ක්‍රියාවලිය සඳහා යෙදවෙන පුද්ගලයාගේ ඒ ක්ෂේත්‍රය අතිශය ගැඹුරුයි. ඒ නිසා ඒ මන්ත්‍රීතුමියගේ යෝජනාව අතිශය වැදගත් එකක්.

දැන් මේ සඳහා අපට ඇති තරම් පිරිසක් ඉන්නවාද? මේක තමයි ගැටලුව. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පද්ධතිය ඇතුළත මේ මොහොතේදී සිද්ධ වන්නේ මොකක්ද? අපට මේ අවශ්‍යතාව තිබෙනවා. ඒක ඇත්ත. දැන් අපට මේ සඳහා පුහුණුව ලද බඳවා ගත් ගුරුවරුන් 3,500ක් විතර ඉන්නවා. ඊට අමතරව මේ කටයුතු කරන්න නිශ්චිත ගුරුවරු නැති පාසල්වල විදුහල්පතිවරයාට පුළුවන්, යම් බඳවා ගැනීමක් කරන්න. හැබැයි, ඊට පසුව ඔවුන් ඒ අදාළ පුහුණු කටයුතුවලට යොමු කළ යුතුයි. විශේෂයෙන්ම ජාතික අධ්‍යාපන ආයතනයේත්, විශ්වවිද්‍යාලවලත්, වෙනත් ආයතනවලත් එවැනි පුහුණුවීම් කරනවා.

ඊළඟට, මෙතැනදී මතු වෙච්ච තවත් කාරණාවක් තිබෙනවා. අලුත් විෂය නිර්දේශවල, විශේෂයෙන් ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල මෙම වෘත්තීය මාර්ගෝපදේශන හා මාර්ගෝපදේශන කියන ක්‍රියාවලි දෙක සඳහාම විශේෂ මොඩියුල කිහිපයක් තිබෙන බව මා සඳහන් කරන්න කැමැතියි. ඒ වාගේම වෘත්තිය මාර්ගෝපදේශනයේ යෙදෙන ගුරුවරුන් සඳහා අලුත් ඉගෙනුම් මොඩියුල කිහිපයකුත් මේ වෙද්දි නිර්දේශ කරලා තිබෙනවා. අපි මේ කරන්නේ මොකක්ද? ගුරුවරයා හෝ ගුරුවරිය පළමුවෙනි ස්පර්ශය - first touch - වනවා, ශිෂ්‍යන්ට හෝ ශිෂ්‍යාවන්ට. මේ කරුණුවලට අදාළව ඔවුන් යාවත්කාලීන කිරීමක් සහ ඔවුන්ට දැනුම ලබා දීමක් තමයි මේ තුළින් කරන්නේ. අපි කියනවා, මේ සේවය අනන්‍යයි කියලා. ඒක ඇත්ත. මාර්ගෝපදේශන සේවය අනන්‍යයි. නමුත් ගුරුවරුන් ද මේ සඳහා පුහුණු කිරීම වැදගත් වනවා. මොකද, දෙමව්පියන්ට පසුව වැඩිපුරම කාලයක් දරුවා ගෙවන්නේ පාසල තුළ ගුරුවරුන් සමඟ. ඒ නිසා දරුවන් තුළ ඇතිවන වෙනස්කම් අවබෝධ කර ගන්න ගුරුවරුන්ට පුළුවන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙහිදී රෝගී තත්ත්ව විතරක් නොවෙයි, ශිෂ්‍යයා හෝ ශිෂ්‍යාව එන්නේ බඩගින්නේද, සමාජ ප්‍රශ්නයකින් පෙළෙනවාද, ගෙදර අඬ දබර තිබෙනවාද කියන මේ සියල්ලම අවබෝධ කර ගන්න වෙන්නේ පාසලේ ඉන්න මේ ගුරුවරුන්ට. ඒ නිසා මේ කාර්යභාරය අතිශය පුළුල් වනවා. ඒ නිසා මේ ගුරුවරුන් වෘත්තීය මාර්ගෝපදේශනයට යොමු කිරීම සඳහා මේ මොහොතේදීත් අපි විශේෂ වැඩ පිළිවෙළක් යෝජනා කරමින් පවතිනවා. ඒ තමයි බහුවිධ සැලැස්මක් සකස් කිරීම. මෙහිදී පාර්ශ්වකරුවන් කිහිපයක් ඉන්නවා. මේ සම්බන්ධව පසුගිය කාලයේ අපි ලැබූ අත්දැකීම් බොහොම නිරසයි. සමහර වෙලාවලදී අපි දැක්කා, මේ දරුවන් හිංසනයට ලක් වනවා. ඒක ලිංගික හිංසනයක් වෙන්නත් පුළුවන්, මානසික හිංසනයක් වෙන්නත් පුළුවන්. හැබැයි, මෙය හිංසනයක් කියන එක ගැන දෙමව්පියන්ට අවබෝධයක් තිබුණේ නැහැ. එතකොට මේ සම්බන්ධව පාසලට වගකීමක් පැවරෙනවා. මොකද, පාසල තමයි අවබෝධ කර ගන්නේ මේ දරුවා හිංසනයට ලක් වනවා කියලා. හැබැයි, දරුවාගේ චර්යාව තුළින් ඒවා නොපෙන්වනවා වෙන්නත් පුළුවන්. ඒ නිසා මේ දේවල් සියුම්ව අවබෝධ කර ගන්නට හැකියාව සහිත පිරිසක් දැනට අපි ගුරු ක්ෂේත්‍රය තුළ හදන අතරතුර, අවශ්‍ය නම් බාහිර පාර්ශ්වයක් වශයෙන් ඔබතුමන්ලා සහ ඔබතුමියලා සඳහන් කරපු අර සායනික මනෝ වෛද්‍යවරුන් හෝ මනෝ විද්‍යාඥයන් වෙත මේ දරුවන් යොමු කිරීම සඳහාත් වූ ක්‍රියාවලියක් අපි සකස් කරලා තිබෙනවා. එවැනි දරුවන් නිසි ලෙස හඳුනා ගත්තොත් ඒ අවශ්‍ය තැන්වලට යොමු කරන්න පුළුවන්. එක්කෝ මනෝ වෛද්‍යවරයෙකු වෙත, එහෙම නැත්නම් නීතිමය ක්‍රියාවලියකට, එහෙමත් නැත්නම් කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශයට එම දරුවන් යොමු කරන්න පුළුවන්.

මෙම ක්‍රියාවලිය සිද්ධ වන අතරතුර විශේෂයෙන්ම මෙම වෘත්තීය මාර්ගෝපදේශනය ගැන වෙනම කථා කළොත්, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විධියට අපි මේ දවස්වල අවධානය යොමු කරන තවත් කාරණයක් තිබෙනවා - counselling. මනෝ විද්‍යාව

කියලා විශේෂ පුහුණු පාඨමාලා, නැත්නම් ඩිප්ලෝමා පාඨමාලා බොහොමයක් අපි දැන් එළියේ දකිනවා. අපි ඒවා යම් නියාමනයකට ලක් කිරීමකුත් කරනවා. බැරි වෙලාවත් මේ දරුවන්ට යොමු වන කෙනා වෘත්තීය මාර්ගෝපදේශනයට සුදුසු කෙනෙක් නොවෙයි නම් - අර අපි කථා කරපු සහකම්පනය තිබෙන, යමක් හඳුනාගත හැකි, ආචාර ධර්ම පිළිපදින, යමක් අවබෝධ කරගත හැකි වෘත්තීමය කෙනෙක් නොවෙයි නම් - එතැන ගැටලුවක් තිබෙනවා. ඒ නිසා වෘත්තීය මාර්ගෝපදේශනය කරන පිරිස නියාමනය කරන වැඩ පිළිවෙළකුත් අපි දැන් කරගෙන යනවා. ඒ දෙක කොටස් දෙකක්. ඉදිරියේදී අපි බලාපොරොත්තු වනවා, ඔබතුමන්ලාගේ යෝජනාව පරිදි කටයුතු කරන්න. අපේ පද්ධතිය තුළ මේ සඳහා සිටින පිරිස අතිශය අඩුයි. මේ පද්ධතියට තවත් පිරිසක් එකතු කරගැනීමේ හැකියාව තිබෙනවා නම්, අපි ඒ වැඩේ කරනවා. ඒ සඳහා මේ දවස්වල අපි පිඹුරුපත් සකස් කරමින් සිටිනවා. ඒ අනුව කොයි තරම් වෘත්තීය මාර්ගෝපදේශකයන් ප්‍රමාණයක් අවශ්‍ය ද කියා අපි සොයා බලනවා. විශේෂයෙන්ම මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය ඇතුළත අපට අවශ්‍ය වෙලා තිබෙනවා, ඔවුන්ගේ වෘත්තීය අධ්‍යාපනය සම්බන්ධයෙන් සහ ඉදිරියේදී මොකක්ද කරන්නේ කියන එක සම්බන්ධයෙන් විශේෂ උපදෙස් ලබා දෙන්න. මෙම සමස්ත ක්‍රියාවලිය දැන් සිද්ධ වෙමින් පවතිනවා. එතැනදි වෘත්තීය මාර්ගෝපදේශකයින්ගේ ඇතුළත් වීම, එකඟතාව සහ පද්ධතියට එකතු වීම අතිශය වැදගත් වනවා. මේ අතරතුර කාලයේදී අපි ගුරුවරුන් හා ගැටෙන සියලු පිරිස් වෘත්තීය මාර්ගෝපදේශන හරහා දැනුවත් කිරීම, යාවත්කාලීන කිරීම සිදු කරනවා.

ඒ වාගේම තවත් විශේෂ සඳහන් කිරීමක් මෙතැනදි කළ යුතුව තිබෙනවා. මෙහිදී ගුරුවරුන්ගේ භූමිකාවට ඵලදායීව නිදහසක් ලබා දෙන්නත් අවශ්‍යයි. මේ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ නිරත වෙලා ඉන්න ගුරුවරු වෘත්තීය මාර්ගෝපදේශනයේ නිරත වනකොට සමහර වෙලාවලදී තදබල පීඩනයකට ලක් වන්නත් පුළුවන්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Dr.) Madhura Senevirathna, would you please wind up?

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)
මම ඉක්මනින් කථාව අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඒ නිසා ඉදිරියේදී අපි බලාපොරොත්තු වනවා, එක් අයෙකුට පැවරෙන වැඩ කොටස පුළුවන් තරම් අඩු කරලා, වැඩිපුර ප්‍රමාණයක් වෘත්තීය මාර්ගෝපදේශකයන් පද්ධතිය තුළ නිර්මාණය කරගන්න. මෙම කටයුතු එක තැනකට එකතු කරගන්න අවශ්‍ය ක්‍රියාවලිය අපි කරන බව කියමින්, ගරු හිරුනි විජේසිංහ මන්ත්‍රීතුමිය මෙවැනි යෝජනාවක් ගෙන ඒම ගැන නැවත වාරයක් එතුමියට ස්තුතිවන්ත වෙමින්, මේ විවාදයට සහභාගි වෙච්ච සියලුදෙනාගේ අදහස්වලට ගරු කරමින්, මෙම යෝජනාව මා විසින් ද ස්ථිර කරන බව කියමින් නිහඬ වනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Mrs.) Hiruni Wijesinghe, you have five minutes to make the Mover's wind-up speech.

[අ.භා. 1.40]

**ගරු නීතිඥ හිරුනි විජේසිංහ මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) ஹிருனி விஜேசிங்ஹ)
(The Hon. (Mrs.) Hiruni Wijesinghe, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සෑම පාසලකටම පුහුණුව ලත් මනෝ උපදේශකවරයන් පත් කිරීමේ අවශ්‍යතාව සම්බන්ධයෙන් අද මා ඉදිරිපත් කළ යෝජනාව වෙනුවෙන් අදහස් පළ කළ ගරු දීප්ති වාසලගේ මන්ත්‍රීතුමිය, ගරු රෝහිණී කවිරත්න මන්ත්‍රීතුමිය, ගරු රොෂාන් අක්මීමන මන්ත්‍රීතුමා, ගරු ශ්‍රීතරන් මන්ත්‍රීතුමා, ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා සහ අපේ අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමාට මා ස්තුතිවන්ත වනවා. මේ යෝජනාවට පක්ෂව අද අදහස් දැක්වූ කථිකයන් අතර මේ පාර්ලිමේන්තුව නියෝජනය කිරීමට පෙර, ආචාර්යවරුන් හැටියට, පාසල් ගුරුවරුන් හැටියට කටයුතු කරපු කිහිපදෙනෙක් සිටියා. එතුමන්ලාට පෞද්ගලික අත්දැකීම් රාශියක් තිබුණා මේ සම්බන්ධයෙන් ගරු සභාවට කරුණු ඉදිරිපත් කරන්න. කාල වේලාව මැදිහත් වුණත් ඒ සියලු කාරණා කෙටියෙන් හෝ ඉදිරිපත් කිරීම වෙනුවෙන් ඒ සියලුදෙනාට මා ස්තුතිවන්ත වනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මෙහිදී විශේෂයෙන්ම තවත් කාරණයක් කියන්න කැමැතියි. විශ්වවිද්‍යාලවල අනිවාර්යයෙන්ම තිබෙනවා, student counselling office එකක්. එහි student counsellorsලා ඉන්නවා. එහි වෙනම යන්ත්‍රණයක් තිබෙනවා. ඒ යන්ත්‍රණය අපට හමුවන්නේ අවුරුදු 20න්, 21න් විශ්වවිද්‍යාලයකට ගියාම. හැබැයි, අවුරුදු 20ක්, 21ක් තිස්සේ පාසල් පද්ධතියේ ඉන්න දරුවන්ට තිබෙන මානසික ප්‍රශ්න, රහස් කියන්න වේදිකාවක් අපි නිසි ලෙස පාසල් පද්ධතිය තුළ සැකසිය යුතුමයි. මොකද, දැනට ඒ අවස්ථාව හිමි වන්නේ විශ්වවිද්‍යාලයකට යොමු වුණාම පමණක් නිසා. වසර ගණනාවක් තිස්සේ ඒ මානසික ගැටලු ටික, ව්‍යාධි ටික වර්ධනය වෙලා අවුරුදු 20ක්, 21ක් වනවිට විවිධ මානසික ව්‍යාකූලතාවලින් ඒ දරුවා පෙළෙන්න පුළුවන්. 1 වසරේ සිට 13 වසර දක්වා වයස අවුරුදු 18 වෙනකම් මූලික අවධියේදී මනෝ උපදේශනයට අදාළ අඩිතාලමක් වැටී නැත්නම් ඇත්තටම වැඩ ලෝකයට පිවිසෙන විශ්වවිද්‍යාල ශිෂ්‍යයෙකුගෙන් වුණත් බලාපොරොත්තු වන මල්ඵල ගැන්වීමක් අවුරුදු 20, 21දී විශ්වවිද්‍යාලයේදී ලබා දෙන උපදේශනය තුළින් ලබා ගැනීමට හැකියාවක් තිබෙනවාද කියන එක ප්‍රශ්න සහගතයි.

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා කිව්වා, නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ඔස්සේ මනෝ උපදේශනයට අදාළ සාධනීය පියවර රාශියක් ගනිමින් සිටිනවා වාගේම, ගුරුවරුන්ගේ දැනුවත්භාවය සඳහා modules කිහිපයක් සැකසෙමින් පවතිනවා කියලා. මම බොහොම සතුටු වෙනවා, මේ යෝජනාව ඉදිරිපත් කරන අතරවාරයේදීම ඒ සඳහා අවශ්‍ය කෙටුම්පත් ටික අමාත්‍යාංශයේ මැදිහත් වීමෙන් සකස් කෙරෙමින් පවතින බව දැනගන්නට ලැබීම ගැන.

ගරු අධ්‍යාපන නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා සහ අනෙකුත් මන්ත්‍රීතුමන්ලා ප්‍රකාශ කළ ආකාරයට දරුවන් 300ට වැඩියෙන් ඉන්න පාසල්වලට තමයි මේ මනෝ උපදේශක තනතුර සඳහා නිලධාරින් පත් කිරීමට අවස්ථාවක් නිර්මාණය කරලා තිබුණේ. මා නියෝජනය කරන්නේ පුත්තලම දිස්ත්‍රික්කය. එය ජන වර්ගයේ විවිධත්වය, ආගමික විවිධත්වය, භූ විෂමතාව වාගේම රැකියා විවිධත්වය මත පදනම් වුණු දිස්ත්‍රික්කයක්. මම පාසල්වලට ගියාම දැක තිබෙනවා වාගේම පාසල්වල ගුරුවරු අපට කථා කරලා කියනවා, ඒ පාසල්වල ඉන්න දරුවන්ගේ තත්ත්වය. විශේෂයෙන්

[ගරු නීතිඥ හිරුනි විජේසිංහ මහත්මිය]

ඒවායේ ඉන්නේ විවිධ ජන කොට්ඨාස නියෝජනය කරන දරුවන්. ඒ කියන්නේ, ධීවර පවුල්වල දරුවන්, විදේශගත ශ්‍රමිකයන්ගේ දරුවන්, දූපත් ප්‍රදේශවල ජීවත් වන දරුවන්, වතු ආශ්‍රිතව ජීවත් වන දරුවන් වාගේ විවිධ සමාජ තල නියෝජනය කරන දරුවන් යන කුඩා පාසල් තිබෙනවා. බොහෝ විට ඒ පාසල්වල ළමුන් 100ක්, 150ක් තමයි ඉන්නේ. ඒ දරුවන්ගේ අම්මා, තාත්තා වෙන්නේ එම පාසලේ ඉන්න ගුරුවරු, විදුහල්පතිතුමා හෝ විදුහල්පතිතුමිය. ඒ දරුවන්ට කන්න බොන්න දෙන්නේ පාසලේ ගුරුවරු, විදුහල්පතිතුමා හෝ විදුහල්පතිතුමිය ඇතුළු පිරිස. ඒ දරුවන්ට අඳින්න පළඳින්න දෙන්නෙත් පාසලෙන්, ආරක්ෂාව දෙන්නෙත් පාසලෙන්. ඒ සියල්ලම පාසල්වලින් කරන බව මම පෞද්ගලිකව දැක තිබෙනවා. මනෝ උපදේශක තනතුරක් නැති වුණත් දෙමව්පියන් විධියට මැදිහත් වෙලා පවුල් පරිසරයෙන් දෙන්න බැරි ඒ පහසුකම් ඒ පාසල්වලින් ලබා දෙන, දරුවන්ගේ ආරක්ෂණය වෙනුවෙන් කටයුතු කරන ඒ ගුරු භවතුන්ට මම බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නීතිඥවරු හැටියට පෞද්ගලිකව අපට ඒ සම්බන්ධ අත්දැකීම් තිබෙනවා. පාසල්වලින් තමයි ගොඩක් අපරාධ අනාවරණ වෙන්නේ. මනෝ උපදේශනයට යොමු වෙලා සිටින ගුරුවරුන්ට අමතරව දරුවන්ට ගොඩක් හිතවත්ව ආදරය කරන ගුරුභවතුන් ඉන්නවා. දෙමව්පියන්ට කියන්න බැරි රහස් ටික ඔවුන්ට තමයි ළමයි කියන්නේ. දරුවන් දෙමව්පියන්ට සඟවන ලිංගික හිංසනයන්, බලහත්කාරකම් වැනි අපචාර රාශියක් පාසල් මට්ටමින් අනාවරණ වෙනවා. ඒ පාසලේ ඉන්න ගුරුවරයාට, "මිස්, මට මෙහෙම සිද්ධියක් වෙනවා" කියලා කීම හරහා තමයි ඒක මේ සමාජයට අනාවරණ වෙන්නේ. එතෙක් ඒ සියල්ල දෙමව්පියන්ට සහ ඒ පවුල්වල ඥාතීන්ට සඟවාගෙන සිටිනවා. ඒ අනුව දරුවන්ට සිදු වන අපයෝජන ටික අනාවරණ කර ගන්න, දරුවන්ගේ මානසික ව්‍යාධි ටික අනාවරණ කර ගන්න, මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවීම් වැනි අපචාර ටික දැනගන්න, ඒ අයට තිබෙන ප්‍රශ්න ටික කියා ගන්න පාසල් මට්ටමින් හොඳ වේදිකාවක් සැකසිය යුතුයි. ඒ නිසා තමයි මේ තනතුර අපි අනිවාර්යයෙන් පාසල තුළ ස්ථාපිත කළ යුත්තේ. පාසල්වල සිටින උපදේශකවරු guide කරන්න එක් ප්‍රධාන උපදේශකවරයෙකු හෝ උපදේශකවරියක විශේෂයෙන් කලාපය තුළ රඳවා ගත යුතුයි. ඒ වාගේම කුඩා පාසල්වලට උපදේශකවරයෙකු පත් කිරීමේ අපහසුතාවක් තිබෙනවා නම් ඒ කලාපයට සිටින උපදේශකවරයා දින වකවානු අනුව අදාළ පාසල්වලට ගොස් උපදේශන කටයුතු කරන්න ඕනෑ. ඒ වාගේම එන්නත්කරණයෙන් පරිබාහිරව සෞඛ්‍ය ක්ෂේත්‍රයත් දරුවන්ගේ මානසික සෞඛ්‍ය ගොඩනැඟීම වෙනුවෙන් අධ්‍යාපන ක්ෂේත්‍රයට මැදිහත් විය යුතුයි, ඒ සම්බන්ධීකරණ කටයුතු කළ යුතුයි කියලා මා වැඩිදුරටත් යෝජනා කර සිටිනවා.

සිවඥානම් ශ්‍රීතරන් මන්ත්‍රීතුමා කිව්වා, 2009 වර්ෂයේ යුද්ධය අවසන් වුණාට පස්සේ දරුවන්ට මනෝ උපදේශන ලබා ගැනීමට අවශ්‍ය වුණා කියලා. ඒ සඳහා විවිධ පාර්ශ්වවලින් මැදිහත්වීම් ලැබුණා. නමුත් ඒවා ප්‍රමාණවත් නොවුණු අවස්ථා තිබුණු බව අපට දකින්නට ලැබුණා. පශ්චාත් යුද කාල පරිච්ඡේදයේදී, ඒ කියන්නේ 2009දී 1වන ශ්‍රේණියට දරුවෙක් භාර ගත්තා නම් අනිවාර්යයෙන් අවුරුදු 16ට වැඩි දරුවෙක් තමයි මේ වනකොට ඉන්නේ. එවැනි දරුවන්ට පශ්චාත් යුද තත්ත්වයෙන් පසුව විශේෂයෙන් ළමා උපදේශනය සිද්ධ වෙන්න ඕනෑ කියලා මා විශ්වාස කරනවා. මොකද, ඒ දරුවන් සහ ඔවුන්ගේ දෙමව්පියන් අවුරුදු ගණනක් කඳවුරුවල ඉඳලා යුද්ධයේ අමිහිරි අත්දැකීම්වලට මුහුණ දීලා විවිධ මානසික මට්ටම්වල ඉන්නේ. ඒ නිසා දරුවන්ට පමණක් නොවෙයි, මුළු පවුලටම උපදේශනය ලබා දීමට වැඩ පිළිවෙළක් වර්තමානයේදී හෝ ආණ්ඩුව මැදිහත් වෙලා සකස් කරනවා නම් බොහොම වැදගත් වනවා කියලා මා විශ්වාස කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම අවසාන වශයෙන් මේ කාරණයත් කියන්න කැමැතියි. ආණ්ඩුවක් වශයෙන් සමාජ මාධ්‍ය සම්බන්ධයෙන් තීරණයක් ගැනීමට අධ්‍යාපන අමාත්‍යාංශයේ සාකච්ඡාවක් පවතිනවා. මොකද, පශ්චාත් කොවිඩ් සමයෙන් පසුව විශේෂයෙන් දරුවෝ සමාජ මාධ්‍යයට, screensවලට දැඩි ලෙස ඇබ්බැහි වෙලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය තීන්දු තීරණ ගනීවි.

පසුගිය දවසකදී day care centresවල සිටින දරුවන්ගේ ආරක්ෂාව තහවුරු කිරීමට ගරු ජනාධිපතිතුමාගේ මැදිහත් වීමෙන් ජාතික මට්ටමේ යන්ත්‍රණයක් ඇති කිරීමට කටයුතු කරන බව ප්‍රකාශ කරලා තිබෙනවා. ඒ සියල්ල දරුවන්ගේ ආරක්ෂාව වෙනුවෙන් කරන්නේ. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ඔස්සේද මා මේ කියන මාතෘකාවට අදාළ කෙටුම්පත් කටයුතු සිද්ධ වනවා. ඒ වාගේම "ඉවත් වෙනු", සහ "රටම එකට" ජාතික මෙහෙයුම යටතේ මත්ද්‍රව්‍යයට එරෙහිව නැඟී සිටිනවා. පාසල් පද්ධතිය වෙළාගෙන තිබෙන මත්ද්‍රව්‍ය උවදුරෙන් දරුවන් බේරා ගන්න අපි රජය විධියට, ආණ්ඩුව විධියට මැදිහත් වෙලා තිබෙනවා. ඒ වෙනුවෙන් කටයුතු කිරීම ගැන ඊට අදාළ ඇමතිවරු ඇතුළු අමාත්‍යාංශවල නිලධාරීන්ට මා ස්තුතිවන්ත වනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි රුපියල් මිලියන ගණන්, බිලියන ගණන් වියදම් කරලා පාරවල් හදනවා. රුපියල් මිලියන ගණන්, බිලියන ගණන් වියදම් කරලා ගොඩනැඟිලි හදනවා. ඉතින්, ඒ හැම දෙයටම වඩා අපට වටින්නේ අපේ දරුවන්ගේ මානසික සෞඛ්‍යය. අපි අධ්‍යාපනයට කොතරම් මුදලක් වියදම් කරලා ලොකු ලොක්කෝ හැදුවාට, වැඩිහිටියන් වෙලා ඉහළ තනතුරුවලට එන ඒ අයගේ මනස ළමා වයසේදීම විකෘති වෙලා තිබෙනවා නම් අපි බලාපොරොත්තු වන ඒ යෝධ සංවර්ධනය ඒ ආකාරයටම මල්ඵල ගැන්වෙයි කියලා අපට විශ්වාස කරන්න බැහැ. මොකද, එවැනි තත්ත්වයක් යටතේ නිර්මාණය වෙන්නේ විකෘති මානසික තත්ත්වයෙන් යුත් අනාගත පරපුරක්. ඒ නිසා මේ යෝජනාව පිළිබඳව නැවත වාරයක් සලකා බලා ඒ කෙටුම්පත් කිරීමේ කටයුතු කඩිනමින් සිදු කරන මෙන් ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඒ වාගේම මේ කාරණයට අවධානය යොමු කරන ලෙස සෞඛ්‍ය ඇමතිතුමාගෙනුත් ඉල්ලා සිටිනවා. මෙම යෝජනාව වෙනුවෙන් කථා කළ කථිකයන් සියලුදෙනාටම ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

At the request of the Mover of Private Members' Motion No. 4 - P. 57/2025 - in today's Order Paper, the Debate on the Motion will be rescheduled to a later date.

Next, Private Members' Motion No. 5 - P. 59/2025 - in today's Order Paper to be moved by Hon. (Mrs.) Rohini Kumari Wijerathna. Hon. Member, the Floor is yours for five minutes.

## විදේශගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් වන "රට විරුවන්" වෙනුවෙන් විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් සකස් කිරීම

“ரட்டவிருவன்” - புலம்பெயர் வீரர்கள் - என்றழைக்கப்படும் இலங்கையின் புலம்பெயர் தொழிலாளர்களுக்கான ஓய்வூதியத் திட்டமொன்றை வகுத்தல்

FORMULATION OF A PENSION SCHEME FOR THE SRI LANKANS WORKING ABROAD, WHO ARE STYLED AS “*RATA VIRUWAN*” (MIGRANT HEROES)

[අ.භා. 1.50]

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "ශ්‍රී ලංකාවේ ජාතික ආර්ථිකය පණ ගැන්වීම සඳහා විදෙස්ගත ශ්‍රමික ප්‍රජාවගෙන් ලැබෙන දායකත්වය ඉතා සුවිශේෂ වන හෙයින්ද, ආර්ථික අර්බුදය හමුවේ විදෙස් රටවල වසර ගණනාවක් රැකියා කිරීමෙන් අනතුරුව නැවත ශ්‍රී ලංකාවට පැමිණ තම දූ දරුවන්ද සමඟින් ජීවිකාව ගෙන යන ඔවුන්ට ඇතැම් අවස්ථාවලදී නැවත රැකියාවක් කිරීමට තරම් හැකියාවක් නොමැති වීම හේතුවෙන් විවිධ ගැටලුවලට මුහුණපෑමට සිදු වන හෙයින්ද, ඔවුන්ගෙන් විදේශ විනිමය වශයෙන් ලැබෙන මුදලින් යම් ප්‍රතිශතයක් යොදා ගෙන විශ්‍රාම අරමුදලක් පිහිටුවා විශ්‍රාම යෝජනා ක්‍රමයක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි."

මම අද දින මෙම උත්තරීතර පාර්ලිමේන්තුව හමුවේ මෙරට සමස්ත ආර්ථිකයේ ජීවනාලිය වූ මිලියන 1.5කට අධික කොන්දේසි විරහිත විදේශගත ශ්‍රමිකයන්, එහෙම නැත්නම් රට විරුවන් උදෙසා ඉතාම තීරණාත්මක හා සාධාරණ පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් ඉදිරිපත් කළා. ඒ අය අපේ රටේ ලේ නහර ටික කිව්වොත් නිවැරදියි. එලෙස විදේශගත වූ ශ්‍රමිකයන් සඳහා රාජ්‍ය අනුග්‍රහය ලත් විධිමත් දායකත්ව විශ්‍රාම වැටුප් ක්‍රමයක් ස්ථාපිත කළ යුතුයි කියලා මා යෝජනා කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ යෝජනාව මීට වසර තුනකට ඉහතදී ඉදිරිපත් කළා. නමුත්, පාර්ලිමේන්තු න්‍යාය පත්‍රයට මේ යෝජනා එන ක්‍රමයක් සහ අනුපිළිවෙළක් තිබෙනවා. ඒ අනුව යෝජනාව ඉදිරිපත් වෙන්න මේ තරම් කාලයක් ගත වෙලා තිබෙනවා. මෙම යෝජනාව පසුගිය අය වැය යෝජනාවලත් තිබීම ගැන මම ඉතාම සතුටු වුණා, කවුරු කළා වුණත් එය සිදු විය යුතු දෙයක් නිසා. කලින් ආවේ කිකිළිද, බිත්තරයද කියන එක අදාළ වෙන්නේ නැහැ. ඒ නිසා අපි මේ වැඩේ කොහොම හරි කරමු කියන තැන ඉඳගෙන මම මේ යෝජනාව කරනවා. ඇත්තටම මෙය කළ නොහැක්කක් නොවෙයි.

මම මේ වෙලාවේදී මතක් කරන්න ඕනෑ, මගේ පියා වූ ජේ.පී. විජේරත්න බණ්ඩා මැතිතුමා ඒ කාලයේ පෞද්ගලික මන්ත්‍රීන්ගේ යෝජනාවක් ඉදිරිපත් කරමින් ගොවීන් උදෙසා වූ විශ්‍රාම වැටුපක් මේ පාර්ලිමේන්තුවේදීම යෝජනා කළ බව. එය ආදර්ශයට අරගෙන විවිධ ක්ෂේත්‍රවල විශ්‍රාම වැටුප් ක්‍රම සකස් වුණා. ඒ නිසා මම හිතනවා, මෙම යෝජනා ක්‍රමයත් කළ නොහැක්කක් නොවෙයි, කළ හැකි දෙයක් බව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දරුණු ආර්ථික අර්බුද අවස්ථාවල විදේශ විනිමය නැතිව රටක් හැටියට අපි හිර වෙනකොට මේ රට බේරා ගත්ත වීරයන් වුණේ ඒ අය. ඒ වාගේම මව් බිමෙන් සැතපුම් දස දහස්ගණනක් ඈත ඉඳිමින්, කාන්තාරවල රස්නයට, දරුණු සීතලට වාගේම විවිධාකාර වූ පීඩාවලට මුහුණ දෙමින්, ලේ, දහඩිය, කඳුළු ජීවිත පුද කරමින් තමයි ඒ අය ඩොලර් මේ රටට එව්වේ. මේ රටේ නිල විදේශ ප්‍රේෂණ - foreign remittances - මඟින් තමයි අපේ රටේ ජාතික ආර්ථිකය පණ ගැන්වෙන්නේ. ඒකයි ඒ අය විරුවන් හැටියට අපි සලකන්න ඕනෑ. කුරිරු යුද්ධයෙන් රණ විරුවන් මේ රට බේරා ගත්තේ කෙසේද, ඒ වාගේම ආර්ථික වශයෙන් පවතින යුද්ධයේදී මේ රට බේරා ගන්නට මේ අය දෙන දායකත්වයත් අපට සුළුකොට තකන්න බැහැ කියලා මා විශ්වාස කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සංඛ්‍යාලේඛන අරගෙන බැලුවොත් අපට ඒ ගැන වැටහීමක් ගන්න පුළුවන්. කාලය පිළිබඳ ගැටලුවක් තිබෙන නිසා ඒ ගැන මම කෙටියෙන් කියන්නම්. 2024දී පමණක් 314,786ක් පුහුණු හා අර්ධ පුහුණු කියන කාණ්ඩ යටතේ විදේශ රැකියා සඳහා ලියාපදිංචි වෙලා ගිහිල්ලා තිබෙනවා. 2025 වසරේ පළමු මාස 06ට පිටත් වීම 144,000කට ආසන්න ප්‍රමාණයක් තිබෙනවා. 2026 වසරේ මැයි මාසය වන විට 100,690ක් ලියාපදිංචි වෙලා විදේශ රැකියා සඳහා ගිහිල්ලා තිබෙනවා. මේවා මහ බැංකු දත්ත අනුව තමයි අපට හොයා ගන්න පුළුවන් වුණේ. මේ මාස 06ට ලක්ෂයකට ආසන්න ප්‍රමාණයක් විදේශ රැකියාවලට ගිහිල්ලා තිබෙනවා නම්, මේ දශක හතරක කාලය තුළ කොයි තරම් ප්‍රමාණයක් මේ රටට විදේශ ප්‍රේෂණ ගෙනෙන්න ඇත්ද? අපි දන්නවා මේ හරහා 2025 වසරේ ඩොලර් බිලියන 8.076ක්, 2026 වසරේ - මේ අවුරුද්දේ - මේ වෙනකොට ඩොලර් බිලියන 3.9027ක් ගෙනැල්ලා තිබෙන බව. මේ අයගෙන් බහුතරයක් මැද පෙරදිග සේවය කරන අය. මට ලැබී තිබෙන කාලය ප්‍රමාණවත් නොවන නිසා මේ දත්ත මම **සභාගත*** කරනවා.

මම මේ සමාජයෙන්, මේ පාර්ලිමේන්තුවෙන් ආපිට අහන්න කැමතියි, රට විරුවන් ලෙස අපි හඳුන්වන මේ විදේශගත ශ්‍රමිකයන්ට ආපසු ලැබුණේ මොනවාද කියලා. ඇත්ත. ඒ අයට තිබෙනවා, රක්ෂණ ක්‍රමයක්. ඒ අය විදේශගතව සිටින කාලය ඇතුළත ඒ අයට ජීවිත රක්ෂණයක් තිබෙනවා. එහිදී ඒ අයට ජීවිත හානියක් වුණොත්, රෝහල්ගත වුණොත් ගෙවනවා. ඒ අයගේ දරුවන්ට ජීවිත හානියක් වුණොත්, රෝහල්ගත වුණොත් ගෙවනවා. දරුවන්ට ශිෂ්‍යාධාර, ශිෂ්‍යත්ව දෙනවා. ඒ වාගේම ණය යෝජනා ක්‍රමයක් තිබෙනවා. ලංකාවට ඇවිල්ලා මාස හයක් ඇතුළත රෝහල්ගත වුණොත් ගෙවනවා. නමුත්, ඒක ප්‍රමාණවත්ද කියන තර්කය, කාරණාව මෙතැනදී මතු වෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ නිසා දැන් ප්‍රශ්නය තිබෙන්නේ ලංකාවට ආවාට පස්සේ ඒ අයට මොකද වෙන්නේ කියලායි. අන්න එතැනදී තමයි ප්‍රශ්නය එන්නේ. එතැනදී තමයි මේ අය සමාජ ආරක්ෂණ ක්‍රමයකට දායක කර ගන්න අවශ්‍ය වෙන්නේ. ඒ මොකද, ජීවිතයේ සැඳෑ සමයේදී ඒ අය අසරණ වෙලා ඉන්නවා අපි අනන්ත දකිනවා. සමහර වෙලාවට ඒගොල්ලන් ලංකාවට එනකොටම මුදල් ඉවරයි. මොකද, ඒ අය රට යන්නේ එක්කෝ තිබුණු ණය ගොඩකින් බේරෙන්න, එහෙම නැත්නම් ගෙදර හදා ගන්න, දරුවන්ට උගන්වා ගන්න, දරුවන්ට කරන්න තිබෙන යුතුකම් ටික කරන්න යනාදී කාරණාවලටයි. ඒ නිසා ආර්ථික අර්බුදයේදී රට රැක ගත්ත ඔවුන් රැක ගැනීම රටක, රජයක වගකීම වෙනවා. එහෙම නොවේ නම් රාජ්‍ය මට්ටමින් ඔවුන්ට තිබෙන රැකවරණය, සමාජ ආරක්ෂණය මොකක්ද කියන එක අපි කථා කරන්න ඕනෑ. මොකද, ඒ අයට gratuity එකක් නැහැ, ETF, EPF නැහැ. එවැනි කිසිම දෙයක් නැහැ. ඒ නිසා වයස්ගත වුණාම,

---

* ***පුස්තකාලයේ තබා ඇත.***
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය]

හරිහම්බ කරපු මුදල නැති වුණාම බොහෝ විට ඒ අයට ණය බරින් මිරිකිලා නැවත වතාවක් දරුවන්ට, ඥාතීන්ට අත පාලා ජීවත් වෙන්න සිද්ධ වෙනවා අපි දැකලා තිබෙනවා.

ඒ වාගේම ඒ අයට ආර්ථික යුක්තිය ඉටු කරන්න ඕනෑ. එය දෙවැනි කාරණාව හැටියට මම දකිනවා. රාජ්‍ය සේවකයාට නම් විශ්‍රාම වැටුපක් තිබෙනවා. පෞද්ගලික අංශයේ අයට නම් අර්ථ සාධක අරමුදලක් තිබෙනවා. නමුත්, රටට වැඩිම විදේශ විනිමය ගෙනෙන ශ්‍රමිකයන් වන රට විරුවාට ලැබෙන්නේ මොකක්ද කියන එක ගැන මේ වෙලාවේ දී සමාජ කතිකාවක් ඇති වෙන්න ඕනෑ. ඇත්තටම මේක සුබසාධන කාර්යයක් නොවෙයි. රජය විසින් ඉටු කළ යුතු වගකීමක්, නැත්නම් සමාජ යුක්තියක් බව තමයි මම මේ වෙලාවේ මතක් කරන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තුන්වැනි කාරණාව හැටියට මම මේක කියන්න කැමැතියි. ඒ අය විශ්‍රාම වැටුප් ක්‍රමයකට දායක කර ගැනීම තුළ දේශීය ආර්ථිකයේ ස්ථාවරත්වය සඳහා නීත්‍යානුකූල මුදල් ගලා ඒමක් සිද්ධ වෙනවා. විධිමත් සහ ආකර්ෂණීය විශ්‍රාම වැටුපක් සකස් කරලා ඒ අයට ලබා දුන්නොත්, ඒ ශ්‍රමිකයන් උණ්ඩියල් සහ හවාලා වැනි අවිධිමත් ක්‍රමවලින් බැහැර වෙලා මේ රටේ තිබෙන සියයට සියයක් නීත්‍යානුකූල බැංකු පද්ධති හරහා ලංකාවට මුදල් එවන්නට පෙලඹෙනවා. මොකද, ඒ අය මුදල් එවන්නේ ඔවුන්ගේම ආයෝජනයක් හැටියටයි. එම නිසා ඒ ස්වයං ආයෝජන ක්‍රියාවලියට දායක වීම තුළින්, ඔවුන් සක්‍රිය සේවයේ යෙදී සිටින කාලයේදීම රටේ නිල විදේශ සංචිත ස්වංක්‍රීයව ශක්තිමත් වෙන්නට ඉඩ හසර ලැබෙන බවත් මම මේ වෙලාවේ මතක් කරන්නට ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවසාන වශයෙන් මම තවත් කාරණයත් මතක් කරන්න කැමැතියි. එම ශ්‍රමිකයන් දරුවන් ඇතුළු පවුල, තමන්ගේ මවුබිම දාලා පිට රට යන්නේ ඩොලර් එවන්න පමණක්ම නොවෙයි. ඒ අය පිට රට යන්නේ පවුල ජීවත් කරවන්නයි. නමුත් බහුතරයකට සිද්ධ වෙන්නේ මොකක්ද? මම ඉස්සෙල්ලා කිව්වා වාගේ, සමහර වෙලාවට හිස් අතින්ම නැවත මේ රටට එන්න සිද්ධ වෙනවා. ඒ වාගේම රෝගාතුර වී අන්ත අසරණ වෙලා මිය යන තෙක්ම කාගේ හෝ යටතේ ඉඳලා, කාගෙන් හෝ යැපිලා ජීවත් වෙන්න සිදු වන සමාජමය ඛේදවාචකය අපි අත්විඳිනවා, දකිනවා. එම නිසා මේ කාරණයට තිරසර විසඳුමක් ලබා දීම ප්‍රතිපත්ති සම්පාදකයන් හැටියට මේ පාර්ලිමේන්තුවේ අප කාගේත් පරම යුතුකමක් සහ වගකීමක් හැටියට මා දකිනවා. එම නිසා විදේශගත ශ්‍රමිකයන් සඳහා රාජ්‍ය අනුග්‍රහය හා දායකත්වය සහිත ක්‍රමවත්, ස්ථාවර විශ්‍රාම වැටුප් ක්‍රමයක් ව්‍යවස්ථාපිතව පිහිටුවීමට මා ඉදිරිපත් කරන මේ යෝජනාව දේශපාලන පක්ෂ භේදයකින් තොරව රට වෙනුවෙන් කරන යුතුකමක් හා වගකීමක් හැටියට සලකා අනුමත කරනු ඇතැයි කියා විශ්වාස කරමින් මා නිහඬ වෙනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. J.C. Alawathuwala, please. The Floor is yours to second that Motion.

Order, please! The Hon. Deputy Chairperson of Committees will now take the Chair.

***අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය [ගරු හේමාලි වීරසේකර මහත්මිය] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] took the Chair.*

[අ.භා. 2.00]

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය විසින් ගෙනෙන ලද යෝජනාව මම ස්ථිර කරනවා.

විදේශගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් - රට විරුවන් - වෙනුවෙන් විශ්‍රාම වැටුප් වැඩ පිළිවෙළක් සකස් කරන්නය කියන මේ යෝජනාව ඉතාම වැදගත් යෝජනාවක් හැටියට මා සලකනවා. මොකද, අද අපේ රටේ රාජ්‍ය සේවයේ ඉන්න පිරිසටත් වඩා වැඩි පිරිසක් විදේශ රැකියා සඳහා ගිහිල්ලා ඉන්නවා. රාජ්‍ය සේවය ගත්තොත් අද ලක්ෂ 15කට අඩු ප්‍රමාණයක් ඉන්නේ. නමුත්, විදේශගත රැකියාවල යෙදී සිටිනවා ඊට වැඩි පිරිසක්. අපේ රටේ අය ලක්ෂ 20කට ආසන්න හෝ ඊට වැඩි පිරිසක් මැද පෙරදිග විතරක් නොවෙයි, යුරෝපීය රටවල සහ තවත් රටවල් ගණනාවක රැකියාවල යෙදී ඉන්නවා. එම නිසා මේ යෝජනාව ඉතාම වැදගත් යෝජනාවක්. මොකද, අද අපේ රටට විදේශ විනිමය ලැබෙන ප්‍රධානම මාර්ගය තමයි, විදේශගත රැකියාවල යෙදී සිටින අපේම සහෝදර සහෝදරියන් ලංකාවට එවන remittances, එහෙම නැත්නම් ඔවුන්ගේ වැටුප්. ඒක තමයි අද අපේ රටට විදේශ විනිමය ලැබෙන ප්‍රධානම මාර්ගය.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි 5ක කාලයක් වැඩිපුර ලබා ගන්න පුළුවන්.

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
බොහොම ස්තුතියි. කාලය ලැබී තිබෙන නිසා මට තව කථා කරන්න පුළුවන්.

එම නිසා මම පැහැදිලිවම කියන්න ඕනෑ, ගරු රෝහිණී කුමාරි මන්ත්‍රීතුමිය ඉතාම වැදගත්, කාලෝචිත ඒ වාගේම අත්‍යවශ්‍ය කාරණාවකට අදාළව තමයි මෙම පෞද්ගලික මන්ත්‍රී යෝජනාව ඉදිරිපත් කරලා තිබෙන්නේ කියලා.

අපි මෙතැනදී බලන්න ඕනෑ විශේෂ කාරණයක් තිබෙනවා. එතුමිය කිව්වා වාගේම මේ වසරේත්, ගිය වසරේත් ඇමෙරිකානු ඩොලර් බිලියන 8කට වැඩි විදේශ විනිමය ප්‍රමාණයක් මේ අය හරහා අපේ රටට ලැබුණා.

කොරෝනා වසංගතයෙන් පසුව 2022දී අපේ රට බංකොලොත්භාවයට පත් වුණාම අපට අත්‍යවශ්‍ය තෙල් ටික ගෙන්වා ගන්න අවශ්‍ය ඩොලර් ප්‍රමාණය අපට තිබුණේ නැහැ. විදේශ රැකියා ක්ෂේත්‍රයෙන් වසර ගණනාවක් දිගින් දිගටම ආපු

ඩොලර් ප්‍රමාණයත් ඒ වනකොට අඩු වුණා. මොකද, ඒ කොරෝනා වසංගතයත් එක්ක විදේශ රැකියා විශාල ප්‍රමාණයක් අහිමි වුණා. නමුත් අද වනකොට ශ්‍රී ලාංකිකයන් විශාල පිරිසක් විදේශ රැකියා ක්ෂේත්‍රයේ යෙදී සිටිනවා. ඒ වාගේම, අවුරුදු ගණනක් එහා පැත්තට ගිහිල්ලා බැලුවත්, අවුරුද්දකට ලක්ෂ තුනකට ආසන්න ප්‍රමාණයක් විදේශ රැකියා ක්ෂේත්‍රයට අලුතින් ඇතුළු වෙනවා. විදේශවලට ගිහින් සේවයේ යෙදී ඉඳලා ආපු අයත් ඒ අතර ඉන්න පුළුවන්. මොකද, ගොඩක් අය ඒ ගිවිසුම අත්සන් කරන්නේ අවුරුදු දෙකකට, තුනකට, පහකට වාගෙයි. ඒ කොහොම වුණත්, එය අපට ඉතාම වැදගත් ක්ෂේත්‍රයක්. ඒ ක්ෂේත්‍රය තමයි අපට තිබෙන ආර්ථික ප්‍රශ්න ගණනාවකට විසඳුම් සපයන්න අවශ්‍ය විදේශ විනිමය ලබා දෙන ප්‍රධානම ක්ෂේත්‍රය. එහෙම නම් අපට යුතුකමක් තිබෙනවා, විදේශගත ශ්‍රමිකයන් වෙනුවෙන් යමක් කරන්න. ඒ අයට තිබෙන ආර්ථික ප්‍රශ්න නිසා, මේ රටේ රැකියාවක් කළොත් ඒ රැකියාවෙන් ලැබෙන මුදල් ප්‍රමාණය මදි නිසා, එහෙමත් නැත්නම් ඊට වඩා හොඳ රැකියාවක් විදේශ රටක කිරීමේ හැකියාව තිබෙන නිසා ඒ අය විදේශගත වෙලා ඉන්නවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ලෝකයේ කොහේ හරි රැකියාවක් කරන්න පුළුවන් තත්ත්වයක් අද වන විට ඇති වෙලා තිබෙනවා. නියමිත සුදුසුකම් තිබෙනවා නම්, වුවමනාව තිබෙනවා නම් ඒ අයට ලෝකයේ ඕනෑම තැනක රැකියාවක් කිරීමේ අවස්ථාව තිබෙනවා. අපේ යුතුකමක් තමයි, විශේෂයෙන්ම මෙවැනි සේවාවක් ඉටු කරන, එහෙම නැත්නම් අපේ රටට ලොකු ආදායමක් - ලොකු ඩොලර් ප්‍රමාණයක් - ලබා දෙන ඒ පිරිස වෙනුවෙන් විශ්‍රාමික වැඩ පිළිවෙළක් සකස් කරන එක. අපි කියන්නේ නැහැ, රජයේ විශ්‍රාම වැටුප් වාගේ ක්‍රමයකට යන්න කියලා. නමුත් දායකත්ව විශ්‍රාම වැඩ පිළිවෙළකට හෝ යන්න අපට පුළුවන්.

විදේශ රැකියාවලට යන අය බොහෝ දෙනෙක් විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි වෙනවා. විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි වුණාම විදේශ සේවා නියුක්ති කාර්යාංශය ඒ සඳහා යම් මුදලක් අය කර ගන්නවා. මේ කියන විශ්‍රාම වැටුප් ක්‍රමය කොහොමද හදන්නේ කියන එක මම විග්‍රහ කරන්න යන්නේ නැහැ. එහි අවශ්‍යතාව ගැන විතරයි මම කථා කරන්නේ. තමුන්නාන්සේලා වෙනමම සාකච්ඡා කරලා, පක්ෂ, විපක්ෂ හැම කෙනාගේම අදහස් අරගෙන, විශේෂඥයන්ගේ අදහස් අරගෙන ඒ සඳහා වැඩ පිළිවෙළක් හැදිය යුතුයි කියන තැන තමයි අපි ඉන්නේ. මේ යෝජනාව කරපු ගරු මන්ත්‍රීතුමිය ඉන්නේත් එතැනයි කියා එතුමිය කරපු කථාවෙන් අපට පැහැදිලි වුණා. කෙසේ වෙතත්, මේක විය යුතු වැඩක්.

මා මුලදීත් කිව්වා වාගේ අපේ රටේ රාජ්‍ය සේවයේ යෙදී සිටින අයට වඩා වැඩි පිරිසක් අද වනකොට විදේශ  රැකියා ක්ෂේත්‍රයේ යෙදිලා ඉන්නවා. ඒ අයගෙන් සමහර අයට - විශේෂයෙන් කම්කරු ක්ෂේත්‍රයේ, ගෘහ සේවක ක්ෂේත්‍රයේ යෙදී සිටි අයට - රැකියාව කරලා ලංකාවට ආවාට පසුව  ඒ රැකියාව කරපු කාලයේ ලබා ගත් ආදායම ගොඩක් වෙලාවට අහිමි වෙනවා. මොකද, ඒ ගොඩක් දෙනෙක්  ඒ එවපු වැටුප ණය ගෙවන්න, නිවාස හදන්න හෝ වෙනත් යම් යම් අවශ්‍යතා වෙනුවෙන් යොදවා තිබෙනවා. ඒ නිසා මෙවැනි වැඩ පිළිවෙළක් සකස් කළොත් එය ඒ අයගේ ජීවිතයේ ඉතිරි කාලය ඉස්සරහට ගෙන යන්න අනිවාර්යයෙන් ඉතාම වැදගත් වෙනවා.

විදේශගත අපේ ශ්‍රමිකයන්ගෙන් ගොඩක් දෙනෙක් මුදල් එවීමේදී විශේෂයෙන්ම නීත්‍යානුකූල ක්‍රම හරහා තමයි මුදල් එවන්නේ. නමුත් යම් යම් කණ්ඩායම් නීත්‍යානුකූල නොවන ක්‍රමවලටත් මුදල් එවනවා. අපට ලැබෙන්න නියමිත ඩොලර් ප්‍රමාණය ඒ හේතුවෙන් මේ රටට ලැබෙන්නේ නැතිව යනවා. එහෙම වෙන්නේ නැහැ  කියන්න අපට බැහැ. මොකද, සමහර රැකියා ක්ෂේත්‍රවල ඉන්න අය උණ්ඩියල්, හවාලා ක්‍රම මඟිනුත් මුදල් එවනවා. ලේසියට, පහසුවට වාගේම ඩොලරයට බැංකුවෙන් ගෙවන ගණන අඩු වුණාම, වැඩියෙන් ගෙවන තැනට ඒ අය ඒ මුදල් ලබා දෙනවා.

විදෙස්ගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් මෙරටට වැටුප එවන ක්‍රමය උපයෝගි කරගෙන හෝ යම් ප්‍රතිශතයකට අනුව හෝ ඒ අය වෙනුවෙන් විශ්‍රාම වැටුප් ක්‍රමයක් සකස් කරන්න පුළුවන් නම්, එය එක පැත්තකින් රටට ඉතාම වාසිදායක වෙනවා. අනෙක් පැත්තෙන්, විදේශගත ශ්‍රමික පිරිසටද එය බෙහෙවින් වැදගත් වෙනවා. ඒ නිසා අපි විශේෂයෙන් ඉල්ලා සිටිනවා, ඒ සඳහා වැඩ පිළිවෙළක් සකස් කරන්න කියලා.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ "කුවේට් වන්දි අංශය" කියලා එකක් තිබෙනවා. ගරු විදේශ කටයුතු සහ විදේශ රැකියා නියෝජ්‍ය ඇමතිතුමා ඒ බව දන්නවා. "කුවේට් වන්දි" කියන්නේ මොකක්ද? 1990 ගණන්වල කුවේට්හි ඇති වුණු යුද තත්ත්වය නිසා අපහසුතාවට පත් වුණු, ඒ වාගේම කරදරයට පත් වුණු විදේශ ශ්‍රමිකයන්ට වන්දි ලබා දුන්නා. ඒ වන්දි ලබා දීමේදී යම් කොටසකට වන්දි ලැබුණා. නමුත් මම දන්නවා, ඒ කාලයේ ගොඩක් දෙනෙක් පාස්පෝට් එක තමන්ගේ නමට හදන්නේ නැතුව හෝ වෙනත් මාර්ගවලින් හෝ විදෙස්ගත වුණු බව. දැන් නම් ඒක කරන්න බොහොම අමාරුයි. නමුත් ඒ යුගයේ තිබුණේ එවැනි තත්ත්වයක්. ඒ නිසා ඒ අයගේ ඇත්ත නම එකක්, පාස්පෝට් එකේ තිබෙන නම වෙනත් එකක්. එහෙම විදේශගත වුණු බොහෝ දෙනෙකුට ඒ වන්දි ප්‍රමාණය  - ඒ හැම වන්දියක්ම - ලබා දෙන්න බැරි වුණා. එම නිසා එම මුදලින් යම් ප්‍රමාණයක් ඉතිරි වුණා. ඒක ආපහු යවන්න කියලාත් ඒ කාලයේ සාකච්ඡාවක් තිබුණු නමුත්, අපේ රටට ලැබුණු ඒ මුදල් දැන් තැන්පතු හැටියට තිබෙනවා කියලායි මා හිතන්නේ. මා හිතන විධියට, ඒ මුදල් දැන් විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ආරක්ෂක තැන්පතු හැටියට තිබෙනවා. යම් යම් අවස්ථාවල ඒවා භාණ්ඩාගාරයටත් දීලා තිබෙනවා. ඇත්තටම ඒවායේ අයිතිය තිබෙන්නේ කාටද? ඒවායේ අයිතිය තිබෙන්නේ විදේශගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන්ට. මොකද, එය ඒ අය වෙනුවෙන් වන්දි ගෙවන්න ලබා දීපු මුදලක්. විශාල මුදලක් එතැන තිබෙනවා කියලා මා විශ්වාස කරනවා. මම දන්නේ නැහැ ඒ තිබෙන ගණන. ගරු නියෝජ්‍ය ඇමතිතුමා ඒක දන්නවා ඇති. අන්න ඒවා උපයෝගි කරගෙන, අඩුම ගණනේ ඒවායේ පොලියවත් උපයෝගි කරගෙන මේ කියන විශ්‍රාම වැටුප් ක්‍රමය ආරම්භ කරමු. මොකද, එවැන්නක් ආරම්භ කිරීම ඉතාම වැදගත් වනවා.

මා හිතන විධියට, ඒ මුදල් රජයටවත්, වෙනත් කෙනෙකුටවත් පාවිච්චි කරන්න අයිතියක් නැහැ. මොකද, එය එදා විදේශ රැකියාවල යෙදී සිටි අයට වෙච්ච අසාධාරණයක් වෙනුවෙන්, එහෙම නැත්නම් ඒ අයට වෙච්ච පාඩුවක් වෙනුවෙන් ගෙවපු වන්දියක්. ඒ මුදල් උපයෝගි කරගෙන මේ කටයුත්ත ආරම්භ කරන්න පුළුවන්. ඉදිරියේදී විදේශගත වන, එහෙම නැත්නම් ලියාපදිංචි වෙලා විදේශගත වන අයගෙන් යම් ප්‍රමාණයක් වැඩි කරලා අරගෙන ඒ මුදලුත් මේකට එකතු කරගෙන හෝ මෙවැනි විශ්‍රාම වැටුප් ක්‍රමයක් සකස් කරන්න පුළුවන් බව පැහැදිලියි. එම කටයුත්ත අත්‍යවශ්‍ය දෙයක් වාගේම වැදගත් දෙයක් බව මම විශේෂයෙන් සඳහන් කරනවා. මොකද, අපි විදේශ රැකියා ක්ෂේත්‍රයේ ඉන්න පිරිස ආරක්ෂා කර ගන්න ඕනෑ. ඔවුන් රට වෙනුවෙන් ලොකු සේවාවක් කරන්නේ. ඒ නිසා ඒ රට විරුවන් වෙනුවෙන් විශ්‍රාම වැටුප් ක්‍රමයක් සකස් කිරීමේ වැඩ පිළිවෙළට විපක්ෂය හැටියට අපට දෙන්න පුළුවන් උපරිම සහයෝගය

[ගරු ජේ.සී. අලවතුවල මහතා]

දෙන්න අප සූදානම්. රජය හැටියට ඔබතුමන්ලා ඒ කටයුත්ත ආරම්භ කරන්න. ඒ වෙනුවෙන් වැඩ පිළිවෙළක් සකස් කරන්න. මේක කළ යුතු දෙයක් බව යළි යළිත් සඳහන් කරමින්, මට කතා කරන්න වෙලාව ලබා දීම පිළිබඳව ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියට ස්තුතිවන්ත වෙමින්, ඉතාම කාලෝචිත යෝජනාවක් ගෙන ඒම පිළිබඳව අපේ ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමියටත් ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු අජිත් ගිහාන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.10]

**ගරු අජිත් ගිහාන් මහතා**
(மாண்புமிகு அஜித் கிஹான்)
(The Hon. Ajith Gihan)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය විසින් ඉදිරිපත් කරන ලද පෞද්ගලික මන්ත්‍රී යෝජනාවේ සඳහන් වන්නේ, විදේශගත ශ්‍රමිකයන්ට විශ්‍රාම වැටුපක් ලබා දීම සම්බන්ධවයි. එහෙම නැත්නම් දායකත්ව විශ්‍රාම වැටුපක් ලබා දීම සම්බන්ධවයි. එම යෝජනාව ගැන කථා කිරීමට පෙර, එම යෝජනාව ගෙන ඒම පිළිබඳව අපි එතුමියට ස්තුතිවන්ත වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, එතුමියගේ කථාව තුළ එතුමිය පැහැදිලි කළා, අපේ ශ්‍රමිකයන් විදේශගත වෙන්නේ ඇයි, කුමක් නිසාද කියන එක. එතුමිය කිව්වා, එක පැත්තකින් ඔවුන්ගේ ආර්ථිකය හීන වීම, ණය ගෙවා ගන්න බැරි වීම ආදි ආර්ථික අපහසුතා මත විදේශගත වෙනවා, එසේ විදේශගත වෙලා ආවාට පස්සේ බොහෝ විට ඔවුන්ගේ අතේ ශත පහක්වත් නැහැ, ලබාගත් ණය ගෙවලා ගෙවලා හෙම්බත් වෙලා තමයි ඒ අය මේ රටට එන්නේ කියලා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒකට හේතුව ඉතා පැහැදිලියි. අපේ රටේ දූප්පත්කම පවත්වාගෙන ආපු තත්ත්වයක් තිබුණා. අපේ රටේ දූප්පත්කම දේශපාලන ක්‍රියාවලියට සම්බන්ධ කරගෙන තිබුණා. දූප්පත්කම තුළින් දේශපාලනය කරපු ක්‍රමයක් ඒ කාලයේ තිබුණා. ඒ නිසා ඒ ජීවිත හැමදාමත් අසරණ තත්ත්වයට පත් වුණා. විදේශගත වීම හැරුණාම වෙනත් විකල්පයක් ඒ අසරණ පවුල්වලට තිබුණේ නැහැ. ගෙයක් දොරක් හදා ගන්න එක ඒ අයට සිහිනයක් වෙලා තිබුණා. ඒ නිසා දරුවන් මෙහේ දමලා විදේශගත වෙන්න ඒ අයට සිදු වුණා. ගරු මන්ත්‍රීතුමියනි, එදා ග්‍රාමීය ජනතාවගේ ජීවිත අසරණ වෙලා තිබුණේ පසුගිය කාලයේම ඔබතුමියලාගේ පක්ෂය ඇතුළු අනෙකුත් පක්ෂවල පක්ෂ දේශපාලනය තුළ අපේ රටේ ජනතාව අසරණ තත්ත්වයට පත් කිරීමේ ක්‍රියාවලිය නිසායි.

ඒ නිසා මේ වර්තමාන ආණ්ඩුව එක පැත්තකින් ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් කරන්න, ජන ජීවිත ගොඩ නඟන්න ප්‍රජා සංවර්ධන සහ හරහා "ප්‍රජා ශක්ති" වැඩසටහන යටතේ ගමට ප්‍රතිපාදන වෙන් කරමින් වැඩ පිළිවෙළක් යනවා. එක පැත්තකින් දූප්පත්කම තුරන් කිරීමට මේ තුළින් විසඳුම් ලබා දෙන්න පුළුවන් වෙනවා. මොකද, අපේ අම්මලා, අක්කලා, නංගිලා තමයි විදේශගත වෙලා මැද පෙරදිග රටවල බැලමෙහෙවරකම් කරන්න ගිහිල්ලා තිබෙන්නේ. ඒ නිසා ඔවුන් අසරණ වෙලා. අවුරුද්දකට ගත්තොත්, Gulf countriesවල ඉන්න අයගෙන් පැමිණිලි රාශියක් එනවා. ඒ නිසා අපි එක පැත්තකින් හිතන්න ඕනෑ, ඒ පැත්ත අඩු කරන්න. ඒ සඳහා මේ අවුරුදු දෙක තුළ අපි කාන්තාවන් විදේශගත වෙන එක අඩු කරලා තිබෙනවා. පිරිමින් යවන එක වැඩි කරලා තිබෙනවා. අපි මෙවැනි ක්‍රමයක් අනුගමනය කරලා තිබෙනවා. අපි හැම පැත්තකින්ම මේවාට විසඳුම් ලබා දෙන්න ඕනෑ. ඒ නිසා අපි ඒ තැනට ගිහිල්ලා තිබෙනවා.

ඇත්තටම මේ අයට විශ්‍රාම වැටුපක් ඕනෑ. මේ අය විශ්‍රාම වැටුපක් ගැන කථා කරනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපට ඒ සඳහා ක්‍රමයක් හදන්න ටිකක් අමාරුයි. එතුමියත් ඒකට උත්සාහ කළා කිව්වා. එතුමිය විශ්වාසයෙන් යුතුව මේ යෝජනාව ඉදිරිපත් කරනවා, වර්තමාන අපේ ආණ්ඩුවට. ඒක හොඳයි. එතුමියට පසුගිය කාලයේ කර ගන්න බැරි වෙලා තිබෙනවා මේ විශ්‍රාම වැටුප සම්බන්ධ කටයුත්ත. එතුමියටත් විශ්වාසයක් තිබෙනවා, වර්තමාන ආණ්ඩුව මේ සම්බන්ධ වැඩ පිළිවෙළක් හදයි, ක්‍රම යක් හදයි කියලා. සියලුදෙනා එකතු වෙලා මේ සඳහා වැඩ පිළිවෙළක් හදමු කියලාත් එතුමිය කිව්වා. ඔව්, අපි දන්නවා, මේ වෙද්දිත් ඊට අදාළ මැදිහත් වීම් කරගෙන යන බව. එහෙම කළ යුතුයි. නමුත්, ගැටලු රාශියක් තිබෙනවා. අපි දන්නවා, මිලියන 1.5කට එහා, ලක්ෂ 17කට එහා පිරිසක් විදේශ ශ්‍රමිකයන් විධියට විදේශගත වෙලා තිබෙන බව. ඔවුන්ගෙන් සුළු ප්‍රමාණයක් තමයි විශ්‍රාම වැටුප ක් ගැන ඉල්ලීම් කරලා තිබෙන්නේ. දැනටමත් ඔවුන් තිබෙන ක්‍රමයට, සමාජ ආරක්ෂණ ක්‍රමයට අනුගත වෙලා තිබෙන්නේ. නමුත්, මේ ක්‍රමය සකස් කළ යුතුයි. එය කිරීමේදී ගැටලු තිබෙනවා. මොකද, සමහර අය රට ගිහිල්ලා අවුරුදු දෙකෙන් එනවා. සමහර අය අවුරුදු 5, 10, 20, 30 වාගේ එක එක විධියට තමයි විදේශගත වෙලා සිටින්නේ. ඒ නිසා ඒ හැමෝම වෙනුවෙන් හොඳ ක්‍රමයක් සකස් කරලා හොඳ දායක විශ්‍රාම වැටුපක් හදලා දෙන්න ඕනෑ කියලා අපි විශ්වාස කරනවා. ඒ ගැටලු හොඳට අධ්‍යයනය කරලා හොඳ සාකච්ඡාවකින් පසුව තමයි එවැනි ක්‍රමයක් හදන්න ඕනෑ.

ඒ වාගේම අපි දන්නවා දැන් මේ රට ශක්තිමත් කරලා තිබෙන්නේ කියලා. මේ වසරේත් ප්‍රමාණවත් විදේශ ප්‍රේෂණ ඇවිල්ලා තිබෙනවා. ගරු මන්ත්‍රීතුමියත් ඒ ගැන කිව්වා. මේ මාස කිහිපය තුළ ඩොලර් බිලියන 4කට ආසන්න විදේශ ප්‍රේෂණ ඇවිල්ලා තිබෙනවා. පසුගිය වසරේ ඩොලර් බිලියන 8කට එහා විදේශ ප්‍රේෂණ අපට ගෙනැල්ලා තිබෙනවා. මේ රට වැටෙන ඕනෑම මොහොතක විදේශ ශ්‍රමිකයන් අපේ රට ආරක්ෂා කරලා තිබෙනවා. ඒ නිසා අපි මේ අය කෙරෙහි විශේෂ අවධානය යොමු කරන්නත් ඕනෑ, ඒ සඳහා වැඩ පිළිවෙළක් අපි හදන බව කියන්නත් ඕනෑ.

ඔබතුමන්ලා දන්නවා, විශේෂයෙන්ම පුත්තලම දිස්ත්‍රික්කයේ විශාල ප්‍රමාණයක් ඉතාලි රාජ්‍යයේ සේවය කරනවා, අපේ රටට ඩොලර් විශාල ප්‍රමාණයක් ගේනවා කියලා. වෙන්නප්පුව, නාත්තන්ඩිය, මහවැව, තොඩුවාව, හලාවත වාගේ ප්‍රදේශවල විශාල පිරිසක් යුරෝපයේ රටවල ඉන්නවා කියලා. හැබැයි, පසුගිය කාලයේ ඔවුන්ට ප්‍රශ්න තිබුණා. ඔවුන්ට රියදුරු බලපත්‍රය සම්බන්ධ ප්‍රශ්න තිබුණා. නමුත්, පසුගිය කාලයේ ඒවාට විසඳුම් ලබා දුන්නේ නැහැ. ඒවා renew කරන්න, ඒවා අලුත් කර ගන්න අවශ්‍ය වුණත් ඒවා කරලා දීලා තිබුණේ නැහැ. ඒකට ක්‍රමයක් තිබුණා. නමුත්, ඒ ක්‍රමයට අනුගත වෙලා තිබුණේ නැහැ. ඒකේ design එකේ ප්‍රශ්න තිබුණා. ඒ රියදුරු බලපත්‍රය design කරන්න ඕනෑ. ඒ Design කරනකොට එක එක ක්‍රම එහෙන් ඉල්ලද්දී අපි ඒකට adjust වෙච් ඒක හදලා දෙන්න ඕනෑ. හැබැයි, පසුගිය ආණ්ඩුව - ඔබතුමන්ලාගේ ආණ්ඩුව - ඒවාට අවශ්‍ය මැදිහත් වීම්

කරලා තිබුණේ නැහැ. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවත් එක්ක විදේශ කටයුතු අමාත්‍යාංශයේ අපේ ගරු විජිත හේරත් අමාත්‍යතුමාත්, අපේ ගරු අරුන් හේමචන්ද්‍ර නියෝජ්‍ය අමාත්‍යතුමාත්, අපිත් මැදිහත් වෙලා ඒ ගැන සාකච්ඡා කළා. මම මේ පාර්ලිමේන්තුවේ කිව්වා, ඒ සඳහා මැදිහත් වෙන්න කියලා. ඒ අවස්ථාව හදලා දෙන්න අපිත්, ප්‍රවාහන අමාත්‍යාංශයේ ගරු බිමල් රත්නායක ඇමතිතුමාත්, අපේ ගරු ප්‍රසන්න ගුණසේන නියෝජ්‍ය අමාත්‍යතුමාත් team එකක් විධියට එකතු වෙලා වැඩ කළා. හැබැයි, පසුගිය කාලයේ මොකක්ද වුණේ? ඒ සඳහා වෙන් වෙන්ව, එක එක්කෙනාගේ සම්බන්ධතාවක් නැතිව වැඩ කරපු නිසා ඉතාලියේ වෙසෙන අපේ ශ්‍රී ලාංකීය ජනතාවට රියදුරු බලපත්‍රය හදලා දෙන්න බැරිව ගියා. හැබැයි, අපි මොකක්ද කළේ? මේ ආයතනවල, අමාත්‍යාංශවල ඉන්න අපේ ගරු අමාත්‍යතුමන්ලා ඒකාබද්ධ වෙලා ඒ වෙනුවෙන් මැදිහත් වෙලා ඒකට ක්‍රමයක් හැදුවා. අපට පුළුවන් වුණා, ඊට අවශ්‍ය මැදිහත් වීම කරලා ඒ රියදුරු බලපත්‍රය හදලා දෙන්න. අපි හොඳ ක්‍රමයකට වැඩ කරනවා. මේ ආණ්ඩුව වැඩ කරන ක්‍රමය ඒකයි. ඒ ක්‍රමයට වැඩ කළොත් ජනතාවගේ ප්‍රශ්න විසඳන්න පුළුවන්. අපි අනිවාර්යයෙන්ම එකමුතු වෙලා රට විරුවන්ට විශ්‍රාම වැටුප හදලා දීලා ඔවුන්ගේ ජීවිත සුරක්ෂිත කරන්න සූදානම් කියන පණිවුඩය මම මේ මොහොතේ ලබා දෙන්න කැමැතියි.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු පද්මසිරි බණ්ඩාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.16]

**ගරු පද්මසිරි බණ්ඩාර මහතා**
(மாண்புமிகு பத்மசிறி பண்டார)
(The Hon. Padmasiri Bandara)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද ඉදිරිපත් කළ මෙම යෝජනාවේ අන්තර්ගත කරුණු පිළිබඳව හිතනකොට මේක ඉතාම හොඳ යෝජනාවක් බව පෙනෙනවා.

විදේශ රැකියා ක්ෂේත්‍රය යනු විශේෂයෙන්ම අපේ රටේ ආර්ථිකයේ ශක්තිමත් කුලුනු අතරින් ප්‍රධානතම එකක්. අද දින මෙම යෝජනාව ඉදිරිපත් කරපු ගරු මන්ත්‍රීතුමියගේ පැත්තෙන් කියැවුණා, පසුගිය වසරේත් ඩොලර් බිලියන 8ක් වාගේ ලොකු මුදලක් විදේශ ශ්‍රමිකයන්ගෙන් අපේ රටට ලැබුණු බව. ඇත්තටම අපේ රටේ පසුගිය කාලය පුරාවට තිබුණු ආර්ථික අර්බුදය විසඳා ගැනීම සඳහා එවැනි මුදලක් එවීම තුළින් එම ශ්‍රමිකයන් විශාල මෙහෙවරක් කළාය කියන කාරණාව මම දකිනවා. විශේෂයෙන්ම ඒ අය එදා ඉතාම අමාරු වෙලාවේ වාගේම අදත් මේ රට වෙනුවෙන් කරන කාර්යභාරය අපට කිසිසේත්ම අමතක කරන්න බැහැ.

ශ්‍රමිකයන් හැටියට අපේ රටින් පිට මං වෙලා යන්නේ, විදේශගත වෙන්නේ අවුරුදු 20ත්, 30ත් අතර අය. මේ රටේ තිබෙන හොඳම ශ්‍රමය, රටට අවශ්‍ය කරන තරුණ ශ්‍රමය තමයි ඒ විධියට අපේ රටින් විදේශවලට යන්නේ. ඔවුන්ගේ තරුණ කාලය, ඔවුන්ට තිබෙන හොඳම ශ්‍රම ශක්තිය විදේශ රටවලට වැය කරලා, ඒ කර්මාන්තශාලාවල, නැත්නම් ගෘහ සේවය වාගේ විවිධ කාර්යයන්වල නිරත වෙනවා. ඇත්තටම ඒ තරුණ වයස අවසන් වුණාට පසුව තමයි සමහරු ලංකාවට එන්නේ. එහෙම අය අපේ ගම්වල ඉන්නවා. වයස අවුරුදු 20න් පමණ විදෙස්ගත වෙන ඇතැම් අය ආපසු මේ රටට එන්නේ අවුරුදු 10කින්, 15කින්, 20කින් පමණ. සමහර අය පූර්ණ කාලීනව අවුරුදු 30ක් වාගේ දීර්ඝ කාලයක් විදේශ රැකියා කරනවා. හැබැයි, කලින් කථා කළ අපේ ගරු මන්ත්‍රී සහෝදරයාගෙනුත් කියැවුණා වාගේ, යම් කෙනෙක් විදේශ සේවයේ යෙදෙමින් ගෙවල් හදලා, ළමයින්ට උගන්වලා, ළමයින්ගේ වෙනත් වෙනත් වුවමනාත් ඉටු කරලා අවසානයේ වයස අවුරුදු 50 ඉක්මවපු කෙනෙක් ලෙස ලංකාවට ආවාට පස්සේ ඔහුට හෝ ඇයට කිසිදු දෙයක්, කිසිදු වරප්‍රසාදයක් ලැබුණු බවක් අපට දකින්න නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ගරු මන්ත්‍රීතුමිය විසින් අද යෝජනා කර තිබෙන කාරණාවලට කිසිදු විරෝධයකින් තොරව අපේ එකඟතාව පළ කරනවා. හැබැයි, මගේ යෝජනාවක් තිබෙනවා. ඒක අපේ කථිකයන්ගෙනුත් කියැවුණා. විදේශ රැකියාවක් සඳහා පිටත්වන ශ්‍රමිකයෙකුගේ ශ්‍රමය අගය කිරීම සඳහා මෙවැනි ක්‍රමයක් යෝජනා කරනකොට ඒකට අදාළව ආණ්ඩුව පැත්තෙන්, රජය පැත්තෙන් දායකත්වයක් දැරිය යුතුයි වාගේම, ඒ ශ්‍රමිකයාගේ පැත්තෙනුත් යම් දායකත්වයක් ලබා දිය යුතුයි කියන යෝජනාව මගේ පැත්තෙන් තිබෙනවා. රජය යම් ප්‍රතිපාදනයක් ලබා දුන්නාට පස්සේ ඒ ප්‍රතිපාදනය ඇතුළේ විශ්‍රාම වැටුප් ක්‍රමයක් රට තුළ නිර්මාණය වෙනවා. ඒ වාගේම ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය, මහා භාණ්ඩාගාරය, සමාජ ආරක්ෂණ මණ්ඩලය එකට එකතු වෙලා -ඒකාබද්ධව- මෙම කාර්යය ආරම්භ කළොත්, මෙවැනි අරමුදලක් ආරම්භ කළොත්, එය මනා ලෙස විනිවිදභාවයකින් යුතුව කළමනාකරණය කළොත් අපි අද කථා බහ කරන යෝජනාව මහ පොළොවේ පැළ කරන්න පුළුවන් වෙයි කියන විශ්වාසය අපට තිබෙනවා.

අද වනවිට ලෝකයේ රටවල් රැසක සමාජ ආරක්ෂණය පිළිබඳ නව ආකෘති හඳුන්වා දීලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මගේ පැත්තෙන් තිබෙන යෝජනාව වන්නේ අපි ඒ නව ආකෘතිත් අපේ අවධානයට ගන්න ඕනෑය කියන එකයි. ඒවාත් අපේ අවධානයට ගෙන අපේ රටේ තිබෙන ආර්ථික මට්ටමට ගැළපෙන ආකාරයට සහ විදේශගත වන ප්‍රමාණය සැලකිල්ලට ලක් කරලා එවැනි දෙයක් සකස් කිරීම පිළිබඳව සලකා බැලිය යුතුයි. මොකද, අද වනවිට විදෙස්ගත ශ්‍රමිකයන්ට අවශ්‍ය වන්නේ විශ්‍රාම වැටුපක් පමණක්ම නොවෙයි. ඒ අයගේ වෙනත් සුබසාධක කටයුතුත් තිබෙනවා. ඒ අයට සෞඛ්‍ය රක්ෂණ ආවරණයක් ලබා දෙන්න ඕනෑ. ඔවුන්ට හදිසි අනතුරු රක්ෂණ ක්‍රමයක් හඳුන්වා දෙන්න ඕනෑ. දැනටත් තිබෙන එක විධිමත් කරන්න ඕනෑ. ආබාධිත වූ අයට ආදායම් ආරක්ෂාවක් හදලා දෙන්න ඕනෑ. ඒ වාගේම යම් ශ්‍රමිකයෙක් මිය ගිය අවස්ථාවක ඔහුගේ හෝ ඇයගේ පවුලේ සාමාජිකයන්ට අවශ්‍ය .ආධාරයක් ලබා දෙන්න ඕනෑ. ඒ වාගේම. මෙරටට පැමිණීමෙන් පසු ඔවුන්ට ස්වයං රැකියාවක් කිරීම සඳහා අඩු පොලියක් සහිත සහන ණයක් ලබා දීම වාගේ විවිධ වැඩසටහන් අපට යෝජනා කරන්න පුළුවන්. ඒ වාගේම ඒ අය ලංකාවට එනකොට දීර්ඝ කාලයක් ඒ රැකියාව කිරීම තුළින් යම් ප්‍රගුණතාවක් ලබාගෙන තිබෙන්නේ. ඒ ප්‍රගුණතාව අපේ රටේ ආර්ථිකයට කොයි විධියටද පාවිච්චි කර ගන්න පුළුවන් කියන එක අපි සලකා බැලිය යුතුයි. ඔවුන් හරහා වෘත්තීය පුහුණු වැඩසටහන් එක්ක අපේ රටේ ඉන්න තවත් අයටත් ඒ පිළිබඳ යම් අවබෝධයක් ලබා දෙන්න අපට පුළුවන්. විශේෂයෙන්ම විදෙස්ගත වන අයට අපි මූල්‍ය කළමනාකරණය උගන්වන්න ඕනෑ. ඔවුන්ට ඒ පිළිබඳ යම් අදහසක් ලබා දීලා පිට රටවලට යවන්න ඕනෑ. ඊට පසුව ඒ අය එවන මුදල් මේ රටේදී ඒ අයගේ පවුලේ අය භාවිත කිරීම පිළිබඳවත් කළමනාකරණයක් ඇති කරන්න ඕනෑ. මොකද, මම ගුරුවරයකු හැටියට වැඩ කළ කාලය තුළ ලබා තිබෙන අත්දැකීම් තුළින්ම මට ඒ ගැන අවබෝධයක් තිබෙනවා. මීට කලින් සාකච්ඡා වුණු යෝජනාවකත් සඳහන් වුණු පරිදි මව්වරුන්

[ගරු පද්මසිරි බණ්ඩාර මහතා]

විදෙස්ගත වුණාට පසුව දරුවන් තනි වෙනවා; හුදෙකලා වෙනවා. ඒ අයට සල්ලි එවනවා තමයි. හැබැයි, ඒ දරුවන්ට අවශ්‍ය ආදරය, ගෞරවය, ආරක්ෂාව වාගේ දේවල් නොලැබීම නිසා අපේ රටේ විශාල සමාජ අර්බුදයක් නිර්මාණය වෙලා තිබෙනවා. මෙන්න මේ කරුණු ගැනත් අපේ අවධානය යොමු කරන්න ඕනෑ. රජයක් හැටියට අපි මේ සඳහා ක්‍රියාමාර්ග ගෙන තිබෙනවා. ඒ වාගේම ඉදිරියේදීත් ක්‍රියාමාර්ග ගන්නා බව මේ අවස්ථාවේදී සඳහන් කරන්න කැමැතියි.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු අරුන් හේමචන්ද්‍ර නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.23]

**ගරු අරුන් හේමචන්ද්‍ර මහතා (විදේශ කටයුතු සහ විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அருண் ஹேமசந்திரா - வெளிநாட்டலுவல்கள் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Arun Hemachandra - Deputy Minister of Foreign Affairs and Foreign Employment)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මෙම යෝජනාව ඉදිරිපත් කිරීම පිළිබඳව ප්‍රථමයෙන්ම ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමියට ස්තුතිය පුද කරන ගමන්, මෙම යෝජනාවේ සාරය ඒ විධියටම පිළිගන්නා බවත් මා සඳහන් කරන්න කැමැතියි. මීට කලින් කථා කළ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ගණනාවක් මේ සම්බන්ධව විස්තරාත්මකව සඳහන් කළා. ඒ ගැන ඉතාම සතුටුයි. විශේෂයෙන්ම මේ මොහොත වනවිටත් අපි විදෙස්ගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන්ට අදාළව විශ්‍රාම වැටුප් ක්‍රියාවලියක් පටන් ගෙන තිබෙනවා. අද පැවැත්වෙන මේ සාකච්ඡාවත්, මේ සංවාදයත් එම ක්‍රියාවලියට ඉතා ශක්තිමත් ආකාරයෙන් හොඳ දායකත්වයක් ලබා දෙයි කියා අපි හිතනවා. ඒ විශ්වාසය අප තුළ තිබෙනවා.

අපේ රට පසුගිය කාල වකවානුව තුළ ආර්ථික අර්බුදය ඇතුළු විවිධ අර්බුදවලට මුහුණ දෙමින්, දූෂණය, වංචාව, නාස්තිය ඇතුළු විවිධ දේවල්වලට මුහුණ දෙමින් බංකොලොත්භාවයට පත් වුණා. නමුත් අපි රටක් විධියට කොන්ද කෙළින් තබාගෙන යළි නැඟී සිටිමින් අද වනවිට ඉතා ශක්තිමත් ආර්ථිකයක් ගොඩනඟන මේ ගමනට යම් ආකාරයකින් සම්බන්ධ වෙලා තිබෙනවා. එහෙම නම් මම නිසැකවම කියනවා, ඒකට ප්‍රධානම හේතුව විදේශ ප්‍රේෂණ බව. හේතුව, විදේශ ප්‍රේෂණ කියන්නේ අපට නිශ්චිත ලෙස ලැබෙන මුදලක්. ඒ නිසා ලංකාවෙන් පිටට ගිහිල්ලා, විවිධ රටවල්වල ඉතා මහන්සි වී වැඩ කරලා අපේ රටට විදේශ ප්‍රේෂණ එවන අපේ ශ්‍රමිකයන්ට ස්තුතිය පුද කරන්නට සහ අපේ උත්තමාචාරය පුද කරන්නට මේ මොහොත මම උපයෝගි කර ගන්නවා.

නිල වශයෙන් ගත්තාම ලක්ෂ 17ක් පමණ වන ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් ප්‍රමාණයක් විවිධ රටවල සේවය කරන බව අපි දන්නවා. ඒ වාගේම නිල නොවන විශාල සංඛ්‍යාවකුත් ඉන්නවා. 2025 අවුරුද්ද තමයි විදේශ ප්‍රේෂණ වැඩිම ප්‍රමාණයක් ලංකාවට ලැබුණු අවුරුද්ද. එවැනි මුදලක් අපේ රටට ලබා දීමේදී අපේ ආණ්ඩුව කෙරෙහි ජනතාවට තිබෙන විශ්වාසයත් හේතුවක් වුණා. ඒ වාගේම වෙනත් මාර්ග හරහාත් ලංකාවට මුදල් ලැබෙන බව අපි දන්නවා. අපි ඒ මාර්ග ටිකත් පුළුවන් තරම් අවම කරගෙන නිල විධියටම සංවිධානාත්මකව, නිල මාවත් හරහා ඒ මුදල් ලංකාවට ගෙන්වා ගැනීමට අදාළ වැඩ කටයුතු කරගෙන යනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, දැනටමත් විදෙස්ගත ශ්‍රමිකයන්ට අදාළ විශ්‍රාම වැටුප් - pension - සම්බන්ධ ක්‍රමයක් තිබෙනවා. සමාජ ආරක්ෂණ මණ්ඩලය - Social Security Board - හරහා තමයි ඒ කටයුතු සිද්ධ වන්නේ. හැබැයි, කනගාටුදායක කාරණය වන්නේ ලක්ෂ 17කට වැඩි සංඛ්‍යාවක් නිල වශයෙන් පිට රටවල සේවය කළාට, අද වනවිට ලියාපදිංචි වී සිටින සංඛ්‍යාව 307ක් වීමයි. ඒ නිසා මේවාට ආකර්ෂණය සම්බන්ධ ප්‍රශ්නයක් තිබෙනවා. *[බාධා කිරීමක්]* 307යි. ඒ කියන්නේ ආකර්ෂණය සම්බන්ධව ප්‍රශ්නයක් තිබෙනවා. අපට යම් කිසි product එකක්, යම්කිසි දෙයක් අලෙවි කරන්න ඕනෑ නම්, නැත්නම් ඒකට යම් කිසි පිරිසක් ආකර්ෂණය කරගන්න ඕනෑ නම් ඒක market කරන්න පුළුවන් විධියේ product එකක් වන්නට ඕනෑ. අපි දන්නවා, මෙතැන අඩුපාඩුවක් තිබිලා තිබෙනවා. ඒ නිසා අපි බලයට ආපු ගමන්ම මේ ගැන සාකච්ඡා කරන්න පටන් ගත්තා. ඒ වාගේම මෙතැන තව විවිධ කාරණා තිබෙනවා. ඒ කියන්නේ සමහර අය අවුරුදු දෙකකට පිට රට යනවා. සමහර අය අවුරුදු හතරකට යනවා. සමහර අයට ඒ රටවලවලට ගියාට පසුව හොඳ සමාගම් හම්බ වෙනවා. මගේ යාළුවෙක් ඉන්නවා, එයාගේ තාත්තා ඩුබායිවල අවුරුදු 30ක් විතර සේවය කළා. දැන් මගේ යාළුවත් ඩුබායිවලට ගිහිල්ලා අවුරුදු පහක් විතර සේවය කරනවා. එහෙම පිරිසකුත් ඉන්නවා. තාත්තා සේවය කළ සමාගමෙන් පුතාටත් රක්ෂාව ලැබුණු, එහෙම ප්‍රජාවකුත් ඉන්නවා. ඒ කියන්නේ මේක විවිධත්වයෙන් පිරුණු ක්ෂේත්‍රයක්.

ඒ වාගේම මේ ප්‍රශ්න ගැටලු දිහා බැලුවාම, ඒ එක එක ප්‍රශ්න ගැටලුවලට එක එක අනන්‍යතාවක් තිබෙනවා. ඒ නිසා අපට මෙතැනදී one-size-fits-all package එකක් දෙන්න බැහැ. මෙතැනදී එයාලාට විවිධ තේරීම් ලබා දෙන්නට අපට සිද්ධ වෙයි. අපි බලන්න ඕනෑ මෙතැන සමාජ ආරක්ෂණ පැත්ත. ඒ කියන්නේ විශ්‍රාම වැටුප ද, නැත්නම් යම්කිසි maturity එකක් එයාලාට ගන්න පුළුවන් තත්ත්වයක් තිබෙනවා ද කියලා බලන්න ඕනෑ. අපි මේ ගැන විවිධ දේවල් සාකච්ඡා කරගෙන යනවා. මම හිතන විධියට දැනට අපි සැලකිය යුතු සාර්ථකත්වයක් අත්පත් කරගෙන තිබෙනවා.

විශේෂයෙන්ම මම එක කාරණාවක් මෙතැනදී කියන්න කැමැතියි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. ඒකට අපි කියනවා seed fund කියලා. ඒ කියන්නේ, දෙයක් පටන් ගන්නට අපි බීජයක් හැටියට ඉදිරිපත් කරන මුදල. ඒ seed fund එකක් විධියට රුපියල් බිලියන 2.1ක මුදලක් පසුගිය අය වැයෙන් අපගේ ජනාධිපතිතුමා වෙන් කර තිබෙනවා. ඒකට අදාළ කටයුතු අපි කරගෙන යනවා. විශේෂයෙන්ම එළැඹෙන දෙසැම්බර් 31ට කලින් අපි එහි ප්‍රගතිය පෙන්වන්නත් ඕනෑ. ඒ ප්‍රගතිය පෙන්වන්න ඕනෑ කියන අවශ්‍යතාවක් තිබෙන නිසා අපි ඉතාම කාර්යක්ෂම විධියට මේ කටයුතු කරගෙන යනවා. ඒ අනුව දැනට අපි රුපියල් බිලියන 2.1ක - Rs. 2.1 billion - seed fund එකත් එක්ක ඒ කටයුතු පටන්ගෙන තිබෙනවා. Kuwait Fund එක හරහා තමයි අපට මේක ලැබෙන්නේ. ගරු ජේ.සී. අලවතුවල මන්ත්‍රීතුමාත් ඒ යෝජනාව ඉදිරිපත් කර තිබුණා. ඇත්තටම අපි ඒක දැනටමත් පිළිගෙන තිබෙනවා. ඒ වාගේම එතැන තවත් මුදල් කොටසක් තිබෙනවා. අපට මුදල් අමාත්‍යාංශයෙන් අනුමැතිය ලැබෙනවා නම් ඒ ඉතිරි මුදලත් මේ විශ්‍රාම වැටුප් ක්‍රමයට පාවිච්චි කරන්න අපි ලෑස්තියි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. ඒ නිසා මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශයක් විධියට අපි ඉම හොඳ විධියට

මැදිහත් වෙනවා. අපි අවශ්‍ය විධියට මැදිහත් වෙනවා. විවිධ පාර්ශ්ව එක්ක විවිධ සාකච්ඡා කරමින් ඉතාම ඵලදායී system එකක් හඳුන්වා දෙන්නට අපි සූදානම් වෙලා ඉන්නවා.

ඒ වාගේම විදේශ සේවා නියුක්ති කාර්යාංශය වෙනම කමිටුවක් පත් කරගෙන මේකට අදාළ ඒ කටයුත්තත් කරගෙන යනවා. එතැනදී අපි දකින්නේ මේ තුළින් අපගේ ශ්‍රමිකයාට ඵලදායී output එකක් ලැබෙන්නට ඕනෑ කියලායි. ඒකට අදාළ කටයුතු අපි කරගෙන යනවා.

ඒ වාගේම අපි විශ්වාස කරන තවත් කාරණාවක් තිබෙනවා. මේ remittance එකට - ලැබෙන ප්‍රේෂණයට - සරිලන විශ්‍රාම වැටුපක් ලබා දෙන්න පුළුවන් ද කියලා සංවාදයක් මතුවෙලා තිබෙනවා. අපේ ගරු මන්ත්‍රීතුමියගේ යෝජනාව අරගෙන බැලුවොත්, ඒකත් එවැනි යෝජනාවක්. අපි මේ ගැන කලින්ම මහ බැංකුවත් එක්ක සාකච්ඡා කළා. සමහර නීති-රීති සම්බන්ධ ප්‍රශ්න එතැන තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපේ ඩිජිටල් ආර්ථික නියෝජ්‍ය ඇමතිතුමාත් මේ අවස්ථාවේ සභාවේ සිටින නිසා මම මේ කාරණයත් කියන්න ඕනෑ. ඒ තමයි, අපේ රටේ පසුගිය කාලවකවානු තුළ තිබිච්ච දැවැන්තම ප්‍රශ්නය තමයි, අපේ සංඛ්‍යාලේඛන දත්ත සම්බන්ධ ප්‍රශ්නය. ඒ සම්බන්ධයෙන් අපි ඩිජිටල් අමාත්‍යාංශය එක්කත් කථා කරමින් අවශ්‍ය කටයුතු කරනවා. එතුමන්ලාගේ LankaPay හරහා LankaRemit කියලා වෙනම application එකක් තිබෙනවා. ඒ LankaRemit application එක හරහා අපට හොඳ සහයෝගයක් අමාත්‍යාංශයෙන් ලැබුණා. ඒ සම්බන්ධයෙන් ගරු නියෝජ්‍ය ඇමතිතුමාට අපේ ස්තුතිය පුද කරනවා. LankaRemit app එක හරහා ලියාපදිංචි වෙච්ච සියලු විදේශ ශ්‍රමිකයන්ගේ තොරතුරු අපට ගන්න පුළුවන් නම්, එයාලා ලංකාවට එවපු ප්‍රේෂණ පිළිබඳ පුද්ගලයන් වශයෙන් අපට අනන්‍ය වාර්තාවක් ගන්න පුළුවන්. ඒකට අපි උත්සාහ කරනවා. නමුත්, තවම එවැනි එකක් නැහැ. තවම අපට තිබෙන්නේ total එක. පසුගිය මාස 6ක කාලය ගත්තොත් දළ වශයෙන් ඩොලර් බිලියන 4.7ක ප්‍රේෂණ අපට ලැබිලා තිබෙනවා කියලා අපි කියනවා. ඒක total එක; එතැන country-specific වාර්තාවකුත් නැහැ. සමහර අවස්ථාවලදී මෙන්න මේ රටවලින්, මෙච්චර මෙච්චර මුදල් ප්‍රමාණ ආවා කියලා අපට තොරතුරු ගන්නත් අමාරුයි. ඒ කියන්නේ, එක රටකින් තව රටකට ඒ සල්ලි ගිහිල්ලා මේ රටට එන වෙන system එකක් තිබෙනවා. ඒ නිසා country-specific වාර්තාවකුත් නැහැ. ඒ නිසා දැන් අපි විශේෂයෙන්ම LankaKonect කියන application එකක් launch කළා. ඒකට plug-in එකක් විධියට LankaRemit එකත් set කර ගන්න පුළුවන් නම්, කෙනෙක් විදේශගත වෙච්ච කාලවකවානු තුළ අපේ රටට එවන ලද ඒ මුදල සම්බන්ධ වාර්තාවක් අපට ගන්න පුළුවන්. මේ වාර්තාව තමයි අත්‍යවශ්‍ය වෙන්නේ. එතකොට කෙනෙකුට සදාචාරාත්මක අයිතියක් තිබෙනවා ඒ ඉල්ලීම කරන්න. එතකොට ඒ සම්බන්ධ අනන්‍ය වාර්තාවක් තිබෙනවා. ඒ වාගේම ආණ්ඩුව විධියට ඒ ඉල්ලීමට සරිලන ප්‍රතිලාභය ලබා දෙන්න අපිත් බැඳිලා ඉන්නවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. මේ මොහොත වන විටත් අපි මේ ටික කරගෙන යනවා. මේක ඉතාම කාලීන සංවාදයක්.

ඉතාම කෙටි කාලයක් තුළ, මම මුලින්ම කිව්වා වාගේ දෙසැම්බර් 31ට කලින් අපට මේ පිළිබඳ යම් ප්‍රගතියක් පෙන්වන්න තිබෙනවා. එතකොට අපට එතැනත් checkpoint එකක් තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේත් ඉතාම පැහැදිලි ලෙස සඳහන් කර තිබෙනවා, විදේශගත ශ්‍රී ලාංකිකයන්ට විශ්‍රාම වැටුප් ක්‍රමයක් සකස් කරනවා කියලා.

විදේශගත ශ්‍රී ලාංකිකයන් එවන remittancesවලින් යම්කිසි ගණනක් කපන්න ගත්තාම ඒ මිනිස්සු සල්ලි එවන්න විවිධ ක්‍රම පාවිච්චි කරන්න උත්සාහ දරන්න පුළුවන්. ඒ නිසා විදේශගත ශ්‍රී ලාංකිකයන් දැනගන්නත් ඕනෑ, ලංකාවට යවන සල්ලිවලට අපි අත තියන්නේ නැහැ කියලා. නමුත් සමහරුන්ට rebate කරන්න පුළුවන්. නිල වශයෙන්, හරි මාර්ගයෙන් සල්ලි එවනවා නම් ඒ ඩොලර්වලට සරිලන රුපියල් අපට ගෙවන්න පුළුවන්. එහෙම අවස්ථාත් තිබෙනවා. ඒ මොනවා කරන්නත් කලින් එවපු මුදල පිළිබඳ අනන්‍ය වාර්තාවක් අපි ලබා ගන්න ඕනෑ. ඒ සඳහා අපි ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශයත් එක්ක සම්බන්ධ වෙලා මේ වනකොටත් ඒ කටයුතු කරගෙන යනවා.

ඒ වාගේම අපි ඉදිරියේදී බලාපොරොත්තු වනවා, මේ කාරණයට ඉතා කඩිනම් මැදිහත්වීමක් කරලා තිරසාර විශ්‍රාම වැටුප් ක්‍රමයක් හදන්න. ඒ විශ්‍රාම වැටුප් අවශ්‍ය නැති අයට යම්කිසි maturity එකක් ලබා ගන්න පුළුවන් ක්‍රමයක් සකස් කරන්නත් අපි බැඳිලා ඉන්නවා. ඒ සඳහා සියලුදෙනාටම ශක්තිය සහ ධෛර්යය ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින් මගේ කථාව අවසන් කරනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 5ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.33]

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම මුලින්ම ස්තුතිවන්ත වන්න ඕනෑ ගරු ජේ.සී. අලවතුවල මන්ත්‍රීතුමාට, මගේ පෞද්ගලික මන්ත්‍රී යෝජනාව ස්ථිර කිරීම වෙනුවෙන්. ඒ වාගේම ගරු අජිත් ගිහාන් මන්ත්‍රීතුමාටත්, ගරු පද්මසිරි බණ්ඩාර මන්ත්‍රීතුමාටත්, නියෝජ්‍ය අමාත්‍ය අරුන් හේමචන්ද්‍ර මැතිතුමාටත් මගේ ස්තුතිය පුද කරනවා. ඒ එක්කම මම නිවැරදි කිරීමකුත් කරන්න ඕනෑ. ගරු අජිත් ගිහාන් මන්ත්‍රීතුමනි, අපි ඉදිරිපත් කරන පෞද්ගලික මන්ත්‍රී යෝජනා පමණක් නොවෙයි, වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්නත් න්‍යාය පත්‍රයට සහ Order Book එකට එන ක්‍රමයක් තිබෙනවා. පාර්ලිමේන්තුවේ සිටින වසර 4ක හෝ 5ක කාලය ඇතුළතදී අපි ඉදිරිපත් කළ යෝජනා ඒ පොතට ආවේ නැත්නම්, ඊළඟ පාර්ලිමේන්තුවට ඒ මන්ත්‍රීතුමා හෝ මන්ත්‍රීතුමිය තේරී පත් වුණොත් ඒවා නැවත වතාවක් ඉදිරිපත් කරන්න ඕනෑ. ඒ නිසා මගේ යෝජනාව ගත්තේ නැහැ කියන කාරණය නොවෙයි එතැන තිබෙන්නේ. ඒවා භාර දෙන අනුපිළිවෙළට තමයි පොතට එන්නේ. ඒ අනුව තමයි කටයුතු සිද්ධ වන්නේ. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් ඉදිරිපත් කරලා බලන්න. එතකොට ඒක සිද්ධ වන්නේ කොහොමද කියලා අවබෝධයක් ලැබෙයි. කෙසේ වෙතත්, ඔබතුමාගේ නොදැනුවත්භාවය පිළිබඳව මම කනගාටු වනවා.

මම ගරු පද්මසිරි බණ්ඩාර මන්ත්‍රීතුමාටත් ස්තුතිවන්ත වන්න ඕනෑ, කොරහේ කිඹුල්ලු දකින්නේ නැතිව බොහොම ප්‍රශස්ත විධියට මේ කාරණය දිහා බලා, මෙහි තිබෙන වැදගත්කම ගැන කථා කිරීම ගැන. ගරු මන්ත්‍රීතුමනි, මමත් යෝජනා කරන්නේ රාජ්‍ය දායකත්වය සහ ශ්‍රමිකයාගේ දායකත්වය සහිතව එය කළ යුතුයි කියන එකයි. ඒ වාගේම ඔබතුමා කිව්වා, මේ සම්බන්ධ නව ආකෘති ගණනාවක් ලෝකය පුරා තිබෙනවා කියලා. ගරු

[ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය]

නියෝජ්‍ය ඇමතිතුමනි, මේ කාරණයේදී සෑම පැත්තක් ගැනම විශේෂ සැලකිල්ලක් යොමු කරලා, මේ පිළිබඳව research කරලා හොඳම ක්‍රමය මොකක්ද කියන එක තෝරාගෙන මේ විශ්‍රාම වැටුප් ක්‍රමය, සමාජ ආරක්ෂණ ක්‍රමයක් සහිතව ඉදිරිපත් කරන්න අපට හැකියාවක් ලැබෙයි කියා මා හිතනවා. මම විශේෂයෙන්ම පද්මසිරි බණ්ඩාර මන්ත්‍රීතුමාට මගේ ස්තුතිය ප්‍රකාශ කරන්න ඕනෑ, විදෙස්ගත ශ්‍රමිකයන්ට විශ්‍රාම වැටුපක් ලබා දීම සඳහා එතුමා තුළ තිබෙන අදහස සහ එකඟත්වයට.

ගරු නියෝජ්‍ය ඇමතිතුමාත් බොහොම හරවත් විධියට පැහැදිලි කළා, මෙම විශ්‍රාම වැටුප් ක්‍රියාවලිය ආරම්භ කර තිබෙනවා කියලා. මම ඒ ගැන සතුටු වනවා. මොකද, ඒක මම කාලයක් තිස්සේ බලාපොරොත්තු වෙච්ච දෙයක්. කොතැනින් හරි ඒක සිද්ධවනවා නම්, මට සතුටුයි. මොකද, අපි කුහක වන්න ඕනෑ නැහැ. කිකිළිද බිත්තරයද ඉස්සෙල්ලා ආවේ කියන එක මෙතැනට අදාළ නැහැ. අපේ හදවතේ තිබුණේ මේ දේ සිද්ධ විය යුතු බව නම්, කාටහරි යහපතක් වෙන එක නම්, ඒක කවුරු කළත් අපට සතුටු වන්න පුළුවන්. ඒ නිසා මගේ එහෙම කුහකත්වයක් නැහැ. ඔබතුමන්ලා මේ පිළිබඳ යම් වැඩ පිළිවෙළක් සකස් කරගෙන යනවා නම් මම බොහොම සතුටුයි. ඒ නිසා ඒ කටයුතු සාර්ථක කර ගන්නට ශක්තිය සහ ධෛර්යය ලැබේවා කියලාත් මම ප්‍රාර්ථනා කරනවා.

ඇත්තටම කිව්වොත්, මම මේ යෝජනාව ගෙන එන්න තීරණය කළේ මෙන්න මේ නිසායි. විදේශගත වන ශ්‍රමිකයන්ගෙන් ලියාපදිංචි වෙලා යන පිරිසකුත් ඉන්නවා, ලියාපදිංචි නොවී යන පිරිසකුත් ඉන්නවා. ඔබතුමන්ලා කිව්වා වාගේ තාත්තාගෙන් පස්සේ එතැනට පුතෙකුට යන්නත් පුළුවන්. ඒ විධියට නොයෙකුත් ආකාරයෙන් ගිය අපේ ශ්‍රමිකයන් මැද පෙරදිග පමණක් නොවෙයි ලෝකය පුරාම ඉන්නවා. හැබැයි අපි දකිනවා, ඒ බොහෝදෙනා ගුවන් යානයට නඟින වෙලේ ඉඳන් අනාරක්ෂිතයි කියලා. පවුලෙන් වෙන්වී යෑම තුළින් ඔවුන්ට මානසික අනාරක්ෂිතභාවයක් තිබෙනවා. ඒ වාගේම එතැන මොන විධියේ රැකියාවක් ලැබේවිද කියන කාරණයේදීත් අනාරක්ෂිතභාවයක් තිබෙනවා. අපේ ශ්‍රමිකයන් බොහෝ අනතුරුදායක රැකියාවලත් යෙදෙනවා. සමහරු නොකර බැරිකමට එවැනි රැකියාවලට යනවා. ඒ අවදානමත් රැගෙන තමයි කාන්තාවන් ඇතුළු අපේ තරුණ ප්‍රජාව විදේශ ශ්‍රමිකයන් හැටියට ඒ රටවලට යන්නේ. ඒ නිසා මම හිතනවා, ඔවුන් ලංකාවට පැමිණි පසුවත් නැවත අනාරක්ෂිත නොවිය යුතුයි කියලා. අපේ සද්භාවය තිබෙන්න ඕනෑ එතැනයි. අන්න ඒ නිසා විදේශගත ශ්‍රමිකයන් වෙනුවෙන් රජයේ දායකත්වය සහ ශ්‍රමිකයාගේ දායකත්වයත් සහිතව තිරසාර, විධිමත් විශ්‍රාම වැටුප් ක්‍රමයක් හා සමාජ ආරක්ෂණ ක්‍රමයක් ලබා දෙන ලෙස මම නැවත වතාවක් යෝජනා කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, විශේෂයෙන්ම අපි දකිනවා පුහුණු ශ්‍රමිකයන්ට වඩා නුපුහුණු ශ්‍රමිකයන් විදේශවලට ගියාම අනාරක්ෂිතභාවය වැඩියි කියලා. සමහර රටවල් ඒවාට brand වෙලා ඉන්නේ. උදාහරණයක් වශයෙන් පිලිපීනය ගත්තොත්, nursesලාට. ඒ කියන්නේ, ඒ රටවලට හොඳ පුහුණු ශ්‍රමිකයෙක් තමයි යන්නේ. කටාර් රාජ්‍යය ගත්තොත්, අපේ රටේ quantity surveyorsලාට පුදුම ඉල්ලුමක් තිබෙනවා. ඒ, පුහුණු අය. අපි පුළුවන් තරම් උනන්දු කරන්න ඕනෑ, පුහුණු ශ්‍රමිකයන් විදේශගත කරවන්නට. එතකොට ඒ අයට වැඩි වැටුපකුත් ලැබෙනවා. නුපුහුණු ශ්‍රමිකයෙකුට ලැබෙන වැටුපට වඩා පුහුණු ශ්‍රමිකයෙකුට ලැබෙන වැටුප වැඩියි. අපේ නුපුහුණු ගෘහස්ථ සේවිකාවක හැටියට යන කෙනෙකුට වඩා පුහුණු සේවිකාවක හැටියට යන කෙනෙකුගේ වැටුප වැඩියි. ඒ වැටුප වැඩිවීමේ වාසිය ඒ පුද්ගලයා ලබනවා වාගේම, රටක් හැටියට වක්‍රව අපිත් ලබනවාය කියන එක මේ වෙලාවේ මතක් කරන්න ඕනෑ. ඒ නිසා මේ රට වෙනුවෙන් දායක වන එවැනි අය රැකීම රටේ පුරවැසියන් හැටියට අපේ යුතුකමක්. ඇත්තටම අපට පෙනුණේ නැතත් විදේශගත ශ්‍රමිකයන් නිසා අපි රැකෙනවා. ඒ නිසා මම හිතනවා, අප රකින, අපේ ආර්ථිකය රකින ඒ විදේශගත ශ්‍රමිකයන් රැක ගැනීම රටේ සියලු පුරවැසියන්ගේත්, රජයේ සියලුදෙනාගේත් වගකීමක් කියලා. ඒ නිසා මා ගෙනා යෝජනාව යථාර්ථයක් බවට පත් කර ස්ථිරසාර විශ්‍රාම වැටුප් ක්‍රමයක් සහ සමාජ ආරක්ෂණ ක්‍රමයක් විදේශගත ශ්‍රමිකයා වෙනුවෙන් ලබා දෙන්නට, සකස් කරන්නට මේ පාර්ලිමේන්තුවට, මේ අමාත්‍යාංශයට හැකියාව ලැබේවා - එය එසේම වේවා - කියලා මම ප්‍රාර්ථනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

යෝජනා අංක පා. 61/2025 ඉදිරිපත් කිරීම, ගරු රුවන්තිලක ජයකොඩි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි පහක කාලයක් ලැබෙනවා.

## ශ්‍රී ලංකාවේ පාසල් පද්ධතිය තුළ පිහිටි ආපනශාලාවල ළමුන්ට අහිතකර ආහාර අළෙවි කිරීම නතර කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම
### இலங்கையின் பாடசாலைக் கட்டமைப்பிலுள்ள உணவகங்களில் மாணவர்களுக்குப் பாதகமான உணவு வகைகளை விற்பனை செய்வதை நிறுத்துவதற்கான வழிமுறையொன்றை உருவாக்குதல்
### FORMULATION OF A SYSTEM TO PREVENT THE SALE OF UNHEALTHY FOOD TO CHILDREN IN SCHOOL CANTEENS WITHIN THE SCHOOL SYSTEM OF SRI LANKA

[අ.භා. 2.41]

**ගරු රුවන්තිලක ජයකොඩි මහතා**
(மாண்புமிகு ருவன்திலக்க ஜயக்கொடி)
(The Hon. Ruwanthilaka Jayakody)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම අද ඉදිරිපත් කරන්නේ සමස්ත පාසල් පද්ධතිය තුළ සිටින ශිෂ්‍ය ප්‍රජාවට ඉතා වැදගත් වන යෝජනාවක්. ඒ අනුව මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "ශ්‍රී ලංකාවේ පාසල් දරුවන් අතර දියවැඩියාව රෝගය බහුල වශයෙන් හඳුනාගෙන ඇති බව විශේෂඥ වෛද්‍යවරුන් පෙන්වා දී තිබෙන හෙයින් ද, දියවැඩියාව රෝගය සඳහා ආහාර වර්ග මෙන්ම ආහාර පුරුදු සහ ආහාර රටාව හේතු වන හෙයින් ද, ශ්‍රී ලංකාවේ පාසල් පද්ධතිය තුළ පිහිටි පාසල් ආපනශාලාවන්හි දියවැඩියාව සඳහා හේතු වන්නා වූ සීනි සහ පිටි සහිත ආහාර මෙන්ම ෆ්‍රයිඩ් රයිස්, කොත්තු, ක්ෂණික නූඩ්ල්ස් වැනි ආහාර වර්ග ඉතා විශාල වශයෙන් පාසල් ළමුන්ට අළෙවි කරන හෙයින්ද, අප රටේ පාසල් දරුවන් අතර දියවැඩියා රෝගී තත්ත්වය පාලනය කිරීම සඳහා පාසල් ආපනශාලාවල අළෙවි කළ යුතු ආහාරපාන වර්ග පිළිබඳව රජය විසින් යම් සීමාවන් පැනවිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි."

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අනාගත ලෝකය ජය ගැනීම සඳහාත්, එහිදී මුහුණපෑමට සිදු වන අභියෝග ජය ගැනීම සඳහාත් සෞඛ්‍ය සම්පන්න සමාජයක් ඇති කිරීම අත්‍යවශ්‍ය කාරණයක්. අධ්‍යාපනය හා සෞඛ්‍ය එකට බැඳී පවතිනවා. හොඳ අධ්‍යාපනයක් ලැබීමට නම් සෞඛ්‍ය තත්ත්වය

යහපත්ව තිබිය යුතුයි. සෞඛ්‍යසම්පන්න බවේ මූලික පදනම තමයි, පෝෂණය. යහපත් සෞඛ්‍යයක් පවත්වා ගැනීමට නම් නිවැරදි පෝෂණයක් ලබා ගැනීම අත්‍යවශ්‍ය වනවා සේම, එය සාක්ෂාත් කර ගැනීම සඳහා පාසල් දරුවන්ට සමබර ආහාර වේලක් ලබා දීමට මේ රටේ දෙමාපියන්ට හැකි පමණින් උත්සාහ කළ යුතු බව මම විශ්වාස කරනවා. සිසුන්ගේ අධ්‍යාපනික සාධන මට්ටම ඉහළ නංවා ගැනීමටත්, කායික හා මානසික සමබරතාව අඛණ්ඩව පවත්වා ගෙන යෑමටත් පෝෂණීය ආහාර ලබා දීම අත්‍යවශ්‍ය නිසාම තමයි රජය විසින් ප්‍රාථමික සිසුන් සඳහා ආහාර වේලක් ලබා දීමේ වැඩසටහන ක්‍රියාත්මක කළේ. ඒක තමයි අපේ අරමුණ.

ඒ වාගේම අපි දන්නවා, වර්තමානයේදී දෙමව්පියන්ගේ ආර්ථික අපහසුතා එක්ක මව සහ පියා කියන දෙදෙනාම මුදල් ඉපැයීමේ නියැළෙන නිසා ඒ කාර්ය බහුලත්වයත් එක්ක ඔවුන්ගේ පහසුව සඳහා උදෑසනම යම් මුදලක් දීලා ආපනශාලාවකින් ආහාර ගන්න කියයා තමයි ගොඩක් වෙලාවට දරුවන්ට කියන්නේ. ඒ නිසා දරුවන් කෘත්‍රිම ආහාරවලට පුරුදු වෙලා තිබෙනවා. ඇතැම් දෙමව්පියන්ට ඒකට මැදිහත්වීමේ අවශ්‍යතාව තිබුණත් පවතින ක්‍රමය තුළ ඒගොල්ලන්ට දරුවන්ගේ පෝෂණය ගැන සෙවීමේ හැකියාව නැති වෙලා තිබෙනවා.

අපි දන්නවා, නිසි පෝෂණීය සංඝටක ඇතුළත්ව නොතිබෙන ආහාර ගැනීම නිසා දරුවන්ගේ සෞඛ්‍ය තත්ත්වය අර්බුදයකට පත් වෙලා තිබෙන බව. සමහර ආපනශාලාවල තිබෙන්නේ පිටි අධික ආහාර. ඒ නිසා වර්තමානය වනවිට දරුවන්ගේ සෞඛ්‍ය තත්ත්වය දරුණු ලෙස අර්බුදයකට ලක් වෙලා තිබෙනවා. ඔබ දන්නවා, සමහර දරුවෝ TV programmesවල තිබෙන දේවල් දැකලා වෙනස් වූ ආහාර රටාවලට පුරුදු වෙලා තිබෙන බව. වෙළෙඳ පොළ උපක්‍රමවලට රැවටිලා තමයි ඒ ආහාර රටාවලට ඔවුන් පුරුදු වෙලා තිබෙන්නේ.

ඇත්තටම පාසල් තුළ ආපනශාලා ස්ථාපනය කරලා තිබෙන්නේ කාටද? ගුරුවරුන්ට සහ දරුවන්ට තමයි ඒ ආපනශාලා විවෘත කරලා තිබෙන්නේ. ඒ ආපනශාලා නිවැරදිව කරන අයට නිසි ගෞරවය ලබා දෙමින් මම කියන්න ඕනෑ, ගොඩක් ආපනශාලා හිමිකරුවන්ගේ අරමුණ ලාභයයි කියන එක. ඒ නිසා ඔවුන් හානිදායක දේවල් ගැන, දරුවන් ගැන වෙනම හිතන්නේ නැහැ. ඔවුන්ට වැඩි ආදායමක් ලබා ගැනීමේ උපක්‍රම තමයි එතැනදී භාවිත කරන්නේ. ඒ නිසා එම ආපනශාලාවල තිබෙන ආහාර සම්බන්ධව යම්කිසි නිවැරදි ක්‍රමයක් හැදෙන්න ඕනෑ. ඒ ආපනශාලා හිමිකරුවන් දරුවන් ගැන හිතලා, නිවැරදිව ආහාර වෙළෙඳාම් කිරීමේ අවශ්‍යතාව තිබෙනවා. ඒ නිසා තමයි, අපට මේ ආපනශාලා පිළිබඳ යම්කිසි නියාමනයක් කිරීම අවශ්‍ය වෙන්නේ. ඒ සඳහා අවශ්‍ය වැඩසටහන් දැනටත් හදලා තිබෙනවා. ඒවා ඉදිරියේදී ක්‍රියාත්මක වෙයි කියලා මම බලාපොරොත්තු වෙනවා.

ශ්‍රී ලංකා පාසල් පද්ධතිය තුළ පිහිටි ආපනශාලාවල ළමයින්ට අහිතකර ආහාර අළෙවි කිරීම නතර කිරීමට ක්‍රමයක් සකස් කළ යුතු බවට මම නැවතත් යෝජනා කරනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

යෝජනාව ස්ථිර කිරීම, ගරු (වෛද්‍ය) ජගත් ගුණවර්ධන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.46]

**ගරු (වෛද්‍ය) ජගත් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) ஜகத் குணவர்தன)
(The Hon. (Dr.) Jagath Gunawardana)

මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. මුලින්ම, මෙම යෝජනාව මම ස්ථිර කරනවා.

පාසල් තුළ සෞඛ්‍ය ආරක්ෂිත ආපනශාලා පවත්වාගෙන යෑම සඳහා අවුරුදු ගණනාවක් චක්‍රලේඛ නිකුත් කර තිබෙනවා.

35/2015 චක්‍රලේඛය අභිභවා යමින් මේ රජය යටතේ 2026 වර්ෂයේ 3වැනි මාසයේදී අපට පුළුවන් වුණා, පාසල් දරුවන් ගැන හිතලා ඒකට තවත් වැඩි යමක් එකතු කරන්න. ඒ අනුව, ආපනශාලා තුළින් පෝෂණීය හා පිරිසිදු ආහාර ලබා දීම, නිවැරදි ආහාර පුරුදු හා චර්යා පාසල් සිසුන් තුළ ප්‍රවර්ධනය කිරීම, නිසි පෝෂණ තත්ත්ව සහිත පාසල් සිසුන්ගේ ප්‍රතිශතය ඉහළ නැංවීම, බෝ නොවන රෝගවලට ගොදුරු වීමේ ප්‍රවණතාව අඩු කිරීම, නිවැරදි ආහාර පුරුදු හා රටා සමාජගත කිරීම කියන කාරණා ඒ චක්‍රලේඛය අනුව නියම කරලා තිබෙනවා. ගරු රුවන්තිලක ජයකොඩි මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ යෝජනාව ඉතාම වැදගත්, කාලීන යෝජනාවක් බව මා ප්‍රකාශ කරනවා.

ඇත්තටම නීරෝගී, බුද්ධිමත්, උගත් මානව සම්පතක් කියන්නේ රටේ සංවර්ධනයට ඉතාම වැදගත් පිරිසක්. එවැනි උගත්, බුද්ධිමත්, නීරෝගී ජනතාවක් බිහි කිරීමේදී ඒ සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ පාසලේදී දෙන්න පුළුවන්. පාසලේදී ලැබෙන මාර්ගෝපදේශ අනුව තමයි ඔවුන් නීරෝගී, උගත් සහ බුද්ධිමත් පුරවැසියන් වශයෙන් සංවර්ධන ක්‍රියාවලියට සම්බන්ධ වෙන්නේ. එහිදී ඉතා වැදගත් වෙනවා පාසලේදී ඔවුන් ලබන පෝෂණය.

අපි දකිනවා, පාසල් ආපනශාලා තුළ දරුවන්ට අහිතකර නොයෙක් ආහාර ද්‍රව්‍ය අළෙවි කරන බව. ඒ පිළිබඳ චක්‍රලේඛ ප්‍රකාශයට පත් කරලා තිබුණත් ඒවා හරියට ක්‍රියාත්මක වෙන්නේ නැති ස්වභාවයක් පවතිනවා. ඒ අනුව සමහර අහිතකර ආහාර ද්‍රව්‍ය, ආහාර පුරුදු වාගේම අහිතකර ආහාර රටා ගැන අවධානය යොමු කරලා තමයි අපි මේ චක්‍රලේඛය නිකුත් කරලා තිබෙන්නේ. අපි දකිනවා, පාසල් තුළ වාගේම සමාජයේත් බෝ නොවන රෝගවල විශාල ව්‍යාප්තියක් තිබෙන බව. දියවැඩියාව, අධික රුධිර පීඩනය, පිළිකා, වකුගඩු රෝග, ඇදුම වාගේ රෝග විශාල වශයෙන් මේ සමාජයේ ව්‍යාප්ත වෙලා තිබෙනවා. ඒක සෞඛ්‍යයට තර්ජනයක් ලෙස අප දකිනවා. ඒවා මර්දනය කිරීම සඳහා අපට පාසල් තුළින් යම්කිසි මූලාරම්භයක් ලබා ගන්න පුළුවන්. එහෙම මූලාරම්භයක් ලබාගෙන ඒක සමාජගත කිරීම තුළින් ඒ දරුවන් අවුරුදු 10ක්-15ක් ඇතුළත සමාජගත වෙනකොට නීරෝගී වැඩිහිටියන් ලෙස සමාජගත කරන්න අපට හැකියාව ලැබෙනවා. ඒ සඳහා අපි ක්‍රියාමාර්ග විශාල ප්‍රමාණයක් අරගෙන තිබෙනවා. බෝ නොවන රෝග සම්බන්ධයෙන් රජය විධියට අපි විශාල වශයෙන් වැඩ කරලා තිබෙනවා. ආරෝග්‍යා සුවතා මධ්‍යස්ථාන ඇති කිරීම මඟින් ප්‍රාථමික සෞඛ්‍ය සංරක්ෂණය දියුණු කිරීමට අපට පුළුවන් වෙලා තිබෙනවා. ග්‍රාම නිලධාරි මට්ටමට මේ ප්‍රශ්න ගෙනිහිල්ලා, ඊට විසඳුම් හොයන්න පවුලේ වෛද්‍යවරයෙක් ඇති කරලා ඒ ප්‍රදේශයේ - ඒ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ - සෞඛ්‍ය ප්‍රශ්න ගැන වග වන, වග කියන වෛද්‍යවරයෙක් ඇති කිරීම තුළින් බෝ නොවන රෝග සම්බන්ධයෙන් ක්‍රියාත්මක වෙන්න අපට හැකියාව ලැබී තිබෙනවා.

ගරු රුවන්තිලක ජයකොඩි මන්ත්‍රීතුමා විසින් ගෙනෙන ලද මේ යෝජනාව ඉතාම කාලෝචිත සහ ඉතාම වැදගත් යෝජනාවක් බව නැවත වරක් සඳහන් කරමින් මා නිහඬ වනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

ස්තුතියි.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා. ඔබතුමාට අදහස් දැක්වීමට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.52]

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ගරු රුවන්තිලක ජයකොඩි මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද මේ යෝජනාව ඉතාම වැදගත් වාගේම කාලෝචිත යෝජනාවක්.

ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිය සකස් කිරීමට රජයට ශක්තිය ලැබේවායි කියා මා ප්‍රාර්ථනා කරනවා. ඒ පිළිබඳ යෝජනාවක් ඉදිරිපත් කිරීම ගැන එතුමාට ස්තුතිවන්ත වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපේ රටේ නීතියේ ආධිපත්‍යය පිළිබඳ ඉතාම ගැඹුරු අර්බුදයක් මතු වෙලා තිබෙනවා. එක පැත්තකින් අපරාධ යුක්තිය පසිඳලීම පිළිබඳ අධිකරණ ක්‍රියාදාමයට විධායකයේ මැදිහත්වීම දිගින් දිගට සිදු වෙමින් තිබෙනවා. මේ මැදිහත්වීම වෙනත් තලයකට ගිහිල්ලා අද මේ රටේ අධිකරණයේ පුරප්පාඩු,-

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමා අදාළ යෝජනාව ගැන නොවෙයි නේද කථා කරන්නේ?

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
යෝජනාවට සම්බන්ධයි.

නිසි ලෙස මනස සකස් වුණු, නීතියේ ආධිපත්‍යය පිළිබඳ මනා හැඟීමක් තිබෙන පුරවැසියන් බිහි කිරීම තමයි වැදගත් වෙන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේදී, මේ රටේ අධිකරණයේ මතු වෙලා තිබෙන අර්බුදය පිළිබඳව සභාව කල් තැබීමේ යෝජනාවක් ඉදිරිපත් කිරීමට විපක්ෂය විසින් කරන ලද යෝජනාව ප්‍රතික්ෂේප වෙලා තිබෙනවා. ඒක ඉතාම කනගාටුදායකයි. මේ උත්තරීතර සභාව තුළ මේ රටේ ව්‍යවස්ථාදායකය, අධිකරණය, විධායකය කියන ආයතන ගැන සාකච්ඡා කරන්න පුළුවන්. ඒවා එකිනෙක සම්බන්ධයි. ඒවා සංවරණ හා තුලන මඟින් සම්බන්ධ වෙලා තිබෙනවා. ඒ වාගේම අධිකරණ බලය පාර්ලිමේන්තුව සතුයි. පාර්ලිමේන්තුව සතු බලය අධිකරණ හරහා තමයි ක්‍රියාත්මක කරන්නේ. එතකොට ජනතාවගේ අධිකරණ බලය ව්‍යවස්ථාව මඟින් පවරා දීලා තිබෙන්නේ අධිකරණයට. ඒ නිසා ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අනිවාර්යයෙන්ම මේ සභාවට මේ බලය තිබෙනවා. ඒ නිසා අද පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේදී විපක්ෂය විසින් ඉදිරිපත් කරපු ඒ යෝජනාව ප්‍රතික්ෂේප කිරීම පිළිබඳව අපි ඉතාම කනගාටු වෙනවා. අපට තිබෙන,-

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කථාව මාතෘකාවට සම්බන්ධ නැහැ නේද?

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
සම්බන්ධයි.

ඒ විතරක් නොවෙයි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ රටේ පාසල් අධ්‍යාපනය නිසි ලෙස නොලැබී තිබීම නිසා,-

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමා යෝජනාව හඳුනාගෙන නැද්ද මන්දා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
හඳුනාගෙන තිබෙනවා.

පාසල් අධ්‍යාපනය නිසි ලෙස නොලැබුණු අය, විධිමත් අධ්‍යාපනයක් නොලැබුණු අය, සමාජ අසාධාරණකම්වලට ලක්වුණු අය අද විශාල වශයෙන් බන්ධනාගාරගත වෙලා ඉන්නවා. ඒ වාගේම මේ රටේ පසුගිය දවස්වල ඇති වුණු බන්ධනාගාරයේ ප්‍රශ්නයේදී වග වීම සඳහා ඇමතිතුමා ක්‍රියාකරපු නැති නිසා අපි විපක්ෂය වශයෙන් අධිකරණ ඇමතිතුමාට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් අත්සන් කළා. අපි ඒ විශ්වාස භංග යෝජනාව ඉදිරිපත් කරලා ඉක්මනින් විවාදයට ගැනීමට බලාපොරොත්තු වෙනවා.

මා බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා, මේ යෝජනාව ඉදිරිපත් කරපු රුවන්තිලක ජයකොඩි මන්ත්‍රීතුමාට. එතුමා ඉතා කාලීන යෝජනාවක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ යෝජනා මඟින් යහපත් දරුවන් හැදෙනවා නම්, ඒ ආකාරයට ඔවුන්ගේ පෝෂණය පිළිබඳව නිසි ලෙස සොයා බලනවා නම්, ඔවුන්ගේ අධ්‍යාපනය පිළිබඳ නිසි ලෙස සොයා බලනවා නම්, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපට අදට වඩා හොඳ රටක් ගොඩ නැඟෙනවා කියන එක ඉතාම පැහැදිලිව කියන්න පුළුවන්.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු නන්දන පත්මකුමාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.55]

**ගරු නන්දන පත්මකුමාර මහතා**
(மாண்புமிகு நந்தன பத்மகுமார)
(The Hon. Nandana Pathmakumara)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ශ්‍රී ලංකාවේ පාසල්වල ඇති ආපන ශාලාවල ළමුන්ට අහිතකර ආහාර අලෙවි කිරීම නතර කිරීම සඳහා ක්‍රමයක් සකස් කිරීම සඳහා වන කාලෝචිත යෝජනාව ගරු රුවන්තිලක ජයකොඩි මන්ත්‍රීතුමා ඉදිරිපත් කර තිබෙනවා. ඒ යෝජනාව වෙනුවෙන් පොඩි වේලාවක් හෝ කථා කරන්න අවස්ථාව ලැබීම පිළිබඳව මම මුලින්ම සතුටු වෙනවා. මට පෙර කථා කරපු විපක්ෂයේ මන්ත්‍රීතුමා මේ යෝජනාවට අදාළව වචන කීයක් කථා කළාද කියලා බැලුවොත්, මම හිතන හැටියට වචන 10ක්වත් නැහැ. "යන්නෙ කොහෙද, මල්ලෙ පොල්" වාගේ තමයි එතුමා කථා

කළේ. අධිකරණය එහෙම නැත්නම් බන්ධනාගාර සිද්ධියක් ගැන තමයි මේ දරුවන්ගේ ප්‍රශ්නයේදීත් එතුමාගේ පැත්තෙන් කරුණු මතු වුණේ.

විශේෂයෙන්ම අපි අහලා තිබෙනවා, හොඳම දේ දරුවන්ට දෙන්න ඕනෑය කියලා. නමුත් අපේ රටේ හොඳම දේ දරුවන්ට කෙසේ වෙතත්, නරකම දේ තමයි ලැබුණේ. ඒ නිසා තමයි රටට ඕනෑ කරන පුරවැසියා, රට ඉල්ලා සිටින පුරවැසියා පසුගිය කාලයේ අපේ රටේ නිර්මාණය කර ගන්න බැරි වුණේ. ඒ නිසා දැන් අපට විශේෂ වගකීමක්, යුතුකමක් තිබෙනවා, රටට ඕනෑ කරන පුරවැසියා නිර්මාණය කර ගැනීමට. අපි බලයට එනකොටත් රටට පොරොන්දු වුණා, පොහොසත් රටක් - ලස්සන ජීවිතයක් හදලා දෙනවා කියලා. අන්න ඒ ලස්සන ජීවිතය හිමිකර ගන්නා පුරවැසියා නිර්මාණය කිරීමේදී, ගොඩනැගීමේදී පුරවැසියාගේ මුල් අවධිය, ළමා කාලය අපට ඉතාම වැදගත් වෙනවා.

අපේ රට තරම් දරුවන්ට ආදරය කරන රටක්, දරුවන්ගේ අනාගතය ගැන හිතන දෙමාපියන් ඉන්න රටක් ලෝකයේ තවත් නැතිව ඇති. විශේෂයෙන්ම දෙමාපියන් විශ්වාස කරනවා දරුවාට හොඳට උගන්වන එක තමයි ජීවිතයේ ලොකුම කාර්යය කියලා. හැබැයි, දරුවාට හොඳට උගන්වන්න පාසලට එව්වාට පස්සේ, ඒ දරුවා පාසලේ තිබෙන කැන්ටිමට ගියාම ඒ කැන්ටිමේ තිබෙන්නේ දරුවාගේ දෛනික ආහාරයට එකතු කරගන්න සුදුසුම කෑම ද කියන එක පිළිබඳ අපට ගැටලුවක් තිබෙනවා. බොහෝ විට අපට දකින්න ලැබෙන්නේ මොනවාද? ඒ කැන්ටිමේ තිබෙන්නේ මොනවාද? පාන් පිටිවලින් සෑදූ ආහාර, රසායනික දේවල්, කෘත්‍රිම දේවල් එකතු කරපු ආහාර, ක්ෂණික නූඩ්ල්ස්, චිප්ස් වැනි දරුවන්ට අවශ්‍ය නොවන, අහිතකර ආහාර තමයි බොහෝ විට පාසලේ කැන්ටිමේ තිබෙන්නේ. ඒ වාගේම, ඒ කැන්ටිමට එන දරුවාගේ ඔළුවේත් යම් දෙයක් නිර්මාණය වෙලා තිබෙනවා, ඔවුන් දැකපු දේවල්වලින්.

පසුගිය කාලයේ අපේ රටේ තිබුණු දේශපාලන ක්‍රමය ඇතුළේ නිර්මාණය වෙච්ච දරුවා කොයි වාගේ කෙනෙක්ද කියලා අපි බැලුවොත්, බල්ලෝ මරලා හරි සල්ලි හම්බ කරන්න පුළුවන් මිනිසෙක් තමයි පසුගිය කාලයේ තිබුණු දේශපාලනය තුළ ගොඩනඟන්න උත්සාහ කළේ. ඒ තුළ දරුවාට සුදුසු දේ වෙනුවට, ආදායම, ලාභය ඉලක්ක කරගත් සුදුසු නැති බොහෝ දේවල් දරුවන්ට ලබා දෙන්න විවිධ සමාගම් සහ ආයතන උත්සාහ කළා. අපි වෙළෙඳ දැන්වීම් තුළ දැක්කේ මොනවාද? "ලකුණු 100ක් ගහන්න පුළුවන් වෙන්නේ මෙන්න මේ බීම බිව්වාට පස්සේ, හයියෙන් දුවන්න පුළුවන් වෙන්නේ මෙන්න මේ කෑම කෑවාට පස්සේ, හොඳට පීනන්න පුළුවන් වෙන්නේ, හොඳට ඉගෙන ගන්න පුළුවන් වෙන්නේ, මතක ශක්තිය වැඩි කරගන්න පුළුවන් වෙන්නේ මෙන්න මේ කෑම බීම ගත්තාට පස්සේ" යනාදී කථා නිරන්තරයෙන් මාධ්‍ය තුළින්, සමාජ මාධ්‍ය තුළින් දරුවාගේ ඔළුවේ තැන්පත් කෙරෙව්වා. ඊට පස්සේ දරුවා පාසලේ කැන්ටිමට ගිහිල්ලා දකින්නෙත් අන්න අර ඔළුවේ තිබෙන දේ. එළියේ දැකපු දේ ඔළුවේ තිබෙනවා. ඒ නිසා දරුවා කැන්ටිමෙන් මිලදී ගන්නේ ඔහුට ඕනෑ කරන සුදුසු ආහාරය නොවෙයි.

විද්‍යා පන්තියේදී අපි ඉගෙන ගන්නවා, නීරෝගීකම තමයි ධනය කියලා. හැබැයි, එහෙම ඉගෙන ගන්න ගමන් කැන්ටිමේ රෝග විකුණනවා. ඒක තේරුම් ගත්ත නිසා තමයි, මේ කාලෝචිත යෝජනාව අපේ ගරු රුවන්තිලක ජයකොඩි මන්ත්‍රීතුමා ඉදිරිපත් කළේ. ඒ ගැන අපි එතුමාට ස්තුතිවන්ත වෙනවා. අපි නිර්මාණය කරන්න යන මේ යහපත් සමාජයට යහපත් පුරවැසියකු නිර්මාණය කිරීමේදී, ඒ පුරවැසියාගේ මුල් කාලයේ - ළමා වියේ - ලෙඩ රෝගවලින් තොර ශක්තිමත් දරුවෙක් නිර්මාණය කර ගැනීමට නම් පාසල තුළ තිබෙන කැන්ටීම වගකීම් සහගත තත්ත්වයට පත් කිරීම පිළිබඳව අපි විශේෂයෙන් හිතන්න ඕනෑ. ඒක පාසල් සංවර්ධන සමිති, කලාප අධ්‍යාපන කාර්යාල සියල්ල එකතු වී කරන්න ඕනෑ දෙයක්. අපේ ආණ්ඩුවේ විශේෂ අවධානය ඒ සඳහා යොමුවෙලා තිබෙනවා.

කවදාවත් නොවුණු බොහෝ දේවල් දැන් මේ රට තුළ සිද්ධ වෙමින් තිබෙනවා. දරුවන්ට හොඳ අනාගතයක්, දරුවන්ට හොඳ සෞඛ්‍යාරක්ෂිත ජීවිතයක්, ලෙඩ රෝගවලින් තොර ජීවිතයක් ලබාදෙන එක අපේ වගකීමක් හැටියට අපි සලකනවා. ඊට අදාළ සියලු දේවල් අපි ඉෂ්ට කරමින් තිබෙනවා. මේ දරුවන්ගේ ජීවිත ලස්සන කරන එක අපි විශේෂයෙන්ම කරනවාය කියන එක සඳහන් කරමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.01]

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා (අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன - கல்வி, உயர் கல்விப் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Madhura Senevirathna - Deputy Minister of Education and Higher Education)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මා මුලින්ම ස්තුතිවන්ත වෙනවා ගරු රුවන්තිලක ජයකොඩි මන්ත්‍රීතුමන්ට. එතැමා ගෙනා මෙම අතිශය කාලෝචිත යෝජනාව තුළ සඳහන් වෙන්නේ ආපනශාලා සම්බන්ධයෙන් පමණක් නොවෙයි. මෙතැන සඳහන් වෙනවා විශේෂයෙන්ම දියවැඩියාව වැනි විශේෂිත රෝගවලට හේතු වන ආහාර පාන වර්ග සඳහා රජය විසින් යම්කිසි සීමා පැනවිය යුතුයි කියලා. ඒ නිසා මෙම යෝජනාව අතිශය කාලෝචිත සහ ලෝක තත්ත්වයටත් රටේ තත්ත්වයටත් ගැළපෙන යෝජනාවක්.

මේ යෝජනාව පිළිබඳ අදහස් පළ කළ ගරු ජගත් ගුණවර්ධන මන්ත්‍රීතුමාටත්, නන්දන පත්මකුමාර මන්ත්‍රීතුමාටත්, අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමාටත් මා ස්තුතිවන්ත වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ලංකාවේ ළමයින්ගේ පෝෂණය තිබෙන්නේ ද්විත්ව පෝෂණ අර්බුදයක. ද්විත්ව පෝෂණ අර්බුදයක් කියන්නේ, එක පැත්තකින් මන්දපෝෂණය, අනෙක් පැත්තෙන් ස්ථූලභාවය, දියවැඩියාව සහ දීර්ඝ කාලීනව පවතින ලෙඩ. පවතින ලෝක තත්ත්වය සහ ලංකාව තුළ ඇති වෙච්ච ආර්ථික අර්බුදය වැනි කාරණා එක්ත තමයි මේ කියන පෝෂණ අර්බුදය එන්නේ. 2024 වනකොට ලංකාවේ මන්දපෝෂණය ඉතාම ඉහළ තත්ත්වයක තිබුණා. ඒ වාගේම, කෘෂභාවය සහ මිටිභාවය විශේෂයෙන් අවුරුදු 5ට අඩු දරුවන් වැඩි කොටසකට තිබුණා. අවුරුදු 5ට අඩු දරුවන් තමයි ඊළඟට පාසලට එන පිරිස. දෙවනුව, ඒකේ අනෙක් පැත්ත තමයි ස්ථූලභාවය, අධිබර සහ අනෙකුත් ලෙඩ රෝග. විශේෂයෙන් ළමා කාලයේ එන දියවැඩියා රෝගී තත්ත්වයේ වැඩි වීමක් දකින්නට තිබුණා. මේ ද්විත්ව තත්ත්වයම තිබුණා. මේ තත්ත්වය එක පැත්තකින් ආර්ථික, සමාජ ක්‍රියාවලියට ගැටගැහිලා තිබෙනවා. සම්පත් බෙදී යෑමේ විෂමතා ද මෙයට බලපානවා. මේ කාරණා ඔක්කෝමත් එක්ක, මේ කියන පෝෂණ අර්බුදයට අප මුහුණ දෙන්නේ කොහොමද කියන ගැටලුවට විසඳුම් සොයන්න අපට සිද්ධ වුණා. එහිදී, අප මුලින් කථා කළ පරිදි -අපේ ගරු මන්ත්‍රීතුමන්ලා සඳහන් කළ පරිදි- "පාසල් තුළ සෞඛ්‍යාරක්ෂිත

[ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා]

ලෙස ආපනශාලා පවත්වාගෙන යෑම" යන මැයෙන් අංක 03/2026 චක්‍රලේඛය නිකුත් කරනවා. සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය එකතුව තමයි එය නිකුත් කරන්නේ. අප හිතන්නේ මෙය ඉතිහාසයේ විශේෂිත අවස්ථාවක් කියලායි. එය එසේ වන්නේ, පෝෂණය සම්බන්ධයෙන් පුළුල්ව සලකා බලා, පරිපූර්ණ චක්‍රලේඛයක් විධියට නිර්දේශ නිකුත් වන්නේ මේ චක්‍රලේඛයෙන් වීම නිසායි. මම ඒකට උදාහරණ දක්වන්නම්.

මේ ක්‍රියාදාමය තුළ අවධානය යොමු කර තිබෙනවා, පාසල් තුළ සෞඛ්‍යාරක්ෂිත ආපනශාලා පවත්වාගෙන යෑමේදී අනුගමනය කළ යුතු නිර්ණායකවලට සහ ආපනශාලාවල ආරක්ෂිතව ආහාර පිළියෙල කිරීම, ඒවායෙහි පිළියෙල කළ හැකි සහ අළෙවි කළ හැකි ආහාර මොනවාද කියන කරුණුවලට. ඒ වාගේම, දියවැඩියාව, පිළිකා ආදි රෝගවලට ළමයින් ගොදුරු වෙන්න හේතු වන ආහාර මේවායි කියා මේ වනකොට සොයාගෙන තිබෙනවා. මෙහිදී ඒ ආහාර වර්ග නිශ්චිතව නම් කර තිබෙනවා වාගේම විශේෂයෙන් ඒවා පිළිබඳ ප්‍රචාරණයද නවත්වා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මෙහි තව කොටසක් තිබෙනවා. අප අධ්‍යාපනය කියලා සලකන්නේ පොතින් පතින් ගන්නා අධ්‍යාපනය විතරක් නොවෙයි. දරුවා මේ ආහාර රටාවට පුරුදු වනකොට ගෙදර ගිහිල්ලාත් මේ ආහාර රටා ගැන දෙමාපියන්ට කියා දෙනවා. නොවිධිමත් ලෙස කරන මේ ගනුදෙනුවත් එක්ක, මේ අධ්‍යාපනයත් එක්ක අපි හිතනවා, ගෙදර තුළදීත් මේ සෞඛ්‍යවත් සහ පෝෂණීය ආහාර රටාව අනුගමනය කරවන්න පුළුවන් වෙයි කියලා.

ඊළඟ කාරණාව තමයි, මේ කටයුත්ත නියාමනය වෙන්නේ කොහොමද කියන එක. ඉස්සර නියාමනය සම්බන්ධයෙන් විශේෂිත වැඩ පිළිවෙළක් තිබුණේ නැහැ. හැබැයි, සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිවාරණ කොටසට අදාළව, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්ට ආහාර පනතින් විශේෂ බලතල පවරා තිබෙනවා, ආහාර සම්බන්ධයෙන්. නමුත් පෝෂණය සම්බන්ධයෙන් නියාමන වැඩසටහනක් නිශ්චිතව තිබුණේ නැහැ. හැබැයි, දැන් තිබෙනවා. මම ඒ ගැන කියන්නම්.

ඉදිරියේදී විදුහල්පති ප්‍රධාන පාසල් ආහාර කමිටුවක් පිහිටුවනවා. ඒ කමිටුවට අධීක්ෂණය කරන්න පුළුවන්, පාසලේ ආපනශාලා පවත්වාගෙන යන්නේ කොහොමද, අවශ්‍ය නිර්ණායක ක්‍රියාත්මක කරනවාද යනාදිය පිළිබඳව. මේ ආකාරයට අධීක්ෂණයක් කෙරෙනවා, වගකීමක් ද තිබෙනවා. ඒ වාගේම, දැන් PHI මහත්වරුන්ටත් සෘජුව ගිහිල්ලා ඒවා පරීක්ෂා කර බලන්න පුළුවන්, කලාප නිලධාරින්ටත් ගිහිල්ලා ඒවා පරීක්ෂා කර බලන්න පුළුවන්.

ඊළඟ කාරණය තමයි, මෙම ආපනශාලා නිශ්චිතව ක්‍රියාත්මක වෙන්නේ නැත්නම් මොකක්ද කරන්නේ කියන එක.

මේ කියපු චක්‍රලේඛය මත දැන් පුළුවන් ඒ ටෙන්ඩරය අවලංගු කරන්න. ඒ නිශ්චිත ක්‍රියාදාමය අනුගමනය කරන්නේ නැත්නම් ටෙන්ඩරය අවලංගු කරන්න පුළුවන්.

මෙම යෝජනාව අනුව ගත්තොත්, හොඳ ආහාර පුරුදු ඇති කිරීම, ආහාර නිශ්චිත කිරීම සහ නොගැළපෙන ආහාර පිළිබඳ ප්‍රචාරණය නැවැත්වීම හා ඒ සම්බන්ධයෙන් වගවීම, නිසි ක්‍රියාදාමය සහ පාසල තුළ පෝෂණය සම්බන්ධයෙන් කමිටුවක් ඇති කරලා කතා බහකුත් ඇති කරන්න පුළුවන්. ඒ අනුව විශේෂයෙන් ළමයාට පුළුවන් වෙනවා, මේ කාරණා ගැන ගෙදර ගිහින් දෙමව්පියන්ටත් කියා දෙන්න. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, එම නිසා මම හිතනවා එතුමා කළ යෝජනාවේ සඳහන් කාරණාවලට අදාළ සුවිශේෂී කාර්යභාරයක් එම චක්‍රලේඛය ක්‍රියාත්මක කිරීම තුළ පාසල් පද්ධතිය තුළ ඉටු කරන්නට හැකි වෙයි කියා. අපි එය ක්‍රියාත්මක කරනවා.

මේ කටයුත්තට අදාළව ඉදිරිය කොහොම එකක් වේවිද? මෙහි ටිකක් අභියෝග සහිත කොටසක් තිබෙනවා. විශේෂයෙන් ගත්තොත්, ආහාර පුරුදු ඇති කිරීම තමයි වැදගත් කාරණාව වෙන්නේ. මොකද, පාසලෙන් එළියට යනකොට ළමයින් නැවත වාරයක් අධිපෝෂණයට හෙවත් තරබාරුකමට, එහෙමත් නැත්නම් දීර්ඝ කාලීන රෝගවලට ලක් කරවන ආහාර පිළිබඳ තිබෙන ප්‍රචාරණ කටයුතු නැවතිලා නැහැ. ඊට අමතරව, ශිෂ්‍ය ශිෂ්‍යාවන් රෝගවලට ගොදුරු වෙලා තිබෙනවා, ආහාර නිසි ලෙස නියාමනය නොකිරීම නිසා. මේ කාරණා දෙකම සැලකිල්ලට ගෙන සෞඛ්‍ය අංශත්, අධ්‍යාපන අමාත්‍යාංශයත් එකතුව කෙරෙන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වෙනවා. ඒක තමයි වැදගත්ම කාරණය. මොකද, අපට සෞඛ්‍ය වෙන් කරන්න බැහැ අධ්‍යාපනයෙන්. මෙහිදී නිරීක්ෂණයට සෞඛ්‍ය අංශත් සම්බන්ධ වෙනවා. ඒ වාගේම, අධ්‍යාපනයෙන් එහා ගිය ප්‍රතිලාභයක් ද මෙහි තිබෙනවා. මොකද, ළමයා පාසලෙන් පිටව ගිහින් පුරවැසියෙකු වන කොටත් මේ හුරු පුරුදු ටික අරගෙන යයි කියා අපි බලාපොරොත්තු වෙනවා. අපි හිතනවා, කාලයක් යනකොට මෙමඟින් අපේ සෞඛ්‍ය පද්ධතියටත් ටිකක් සැහැල්ලුවක් ලැබෙයි කියලා. මොකද, ශිෂ්‍ය ශිෂ්‍යාවන් පුරවැසියන් වනකොට ඒ අයටම පුළුවන් තමන් ගත යුතු ආහාර, තමන් නොගත යුතු ආහාර ප්‍රචාරණවලට නොරැවටී සිටිමින් තීරණය කිරීමට. ඉතින් අපි හිතනවා මෙන්න මේ කියපු කාරණා අතිශයින් වැදගත් කියලා.

ඊළඟට, පෝෂණය ගැනත් කිව යුතුයි. මෙහිදී අපි අධිපෝෂණය සහ මන්දපෝෂණය ගැන කථා කළා. මෙය විෂම චක්‍රයක් විධියට ක්‍රියාත්මක වෙමින් යනවා. විශේෂයෙන්ම ගම්බද සහ වතු ආශ්‍රිතව ගත්තොත් දකින්න තිබෙන්නේ, අධිපෝෂණ තත්ත්ව නොව එහි අනෙක් පැත්තයි. ඒ කියන්නේ, මන්දපෝෂණය සහ කෘශ බවයි. මන්දපෝෂණය සහ කෘශ බවත් එක්ක දුප්පත්කම ගැට ගැහිලා තිබෙනවා. මිටි බව සහ කෘශ බව නිසා ඔවුන්ට හරියාකාරව ශ්‍රම දායකත්වයක් දෙන්න බැරි වෙනවා, ජාතික ආර්ථිකයට. හරියාකාර ශ්‍රම දායකත්වයක් දෙන්න බැරි වනකොට දුප්පත්කම ආපහු එනවා. දුප්පත්කම ආපහු එනකොට නැවත වාරයක් දරුවන් කෘශ බවට පත් වෙනවා. චක්‍රයක් විධියට තමයි මෙය ක්‍රියාත්මක වෙමින් තිබෙන්නේ. මෙය විෂම චක්‍රයක් විධියට අපි දකිනවා. අපි හිතනවා මේ කියන පෝෂණ ක්‍රියාවලිය හරියට කළොත් ඒ විෂම චක්‍රය කඩන්න පුළුවන් කියලා. මොකද, අපි ආහාර වේල් දෙනවා. එහිත් නිශ්චිත කළමනාකරණයක් තිබෙනවා. මේ විෂම චක්‍රය කැඩුවාට පසුව කෘශ බව, මිටි බව හෝ තරබාරුකම නැති දරුවෙකු සමාජයට එනකොට අර ගැට ගැහිලා තිබුණු දුප්පත්කම, අනෙකුත් ප්‍රශ්න සහ සමාජමය ගැටලුත් නැති වනවා. ඒ නිසා මෙය ආහාර රටාව වෙනස් කිරීමක් විතරක් නොව සමාජය වෙනස් කිරීමක්ද වනවා.

මෙම කාලෝචිත මාතෘකාව පෞද්ගලික මන්ත්‍රීන්ගේ යෝජනාවක් විධියට රැගෙන ඒම ගැන විශේෂයෙන්ම ගරු රුවන්තිලක ජයකොඩි මන්ත්‍රීතුමාට මම නැවත වාරයක් ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම, මේ යෝජනාව ගැන අදහස් දැක්වූ ගරු මන්ත්‍රීතුමන්ලාටත් බෙහෙවින් ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු රුවන්තිලක ජයකොඩි මන්ත්‍රීතුමනි, ඔබතුමාට විනාඩි 5ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.11]

**ගරු රුවන්තිලක ජයකොඩි මහතා**
(மாண்புமிகு ருவன்திலக்க ஜயக்கொடி)
(The Hon. Ruwanthilaka Jayakody)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මගේ යෝජනාව ස්ථිර කරමින් කථා කළ ගරු (වෛද්‍ය) ජගත් ගුණවර්ධන මන්ත්‍රීතුමාට සහ අදහස් දැක්වූ ගරු නන්දන පත්මකුමාර මන්ත්‍රීතුමාටත්, ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමාටත් ස්තුතිවන්ත වෙනවා. ඒ ගමන්ම මට කියන්න දෙයක් තිබෙනවා. ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා කාලයක් තිස්සේ පාර්ලිමේන්තුවේ වැඩ කටයුතු කරන, පාර්ලිමේන්තු ක්‍රමය ගැන දන්නා මන්ත්‍රීවරයෙක්. හැබැයි, එතුමා මේ රටේ ශිෂ්‍ය පරම්පරාවේ පෝෂණයට අදාළව කෙරුණු මේ ඉතා කාලෝචිත සාකච්ඡාවේදී එම මාතෘකාව ගැන කථා කරනවා වෙනුවට වෙනත් චුවමනාවක් මත, එතුමාගේ දේශපාලන වුවමනාවක් මත කථා කිරීම ගැන මම කනගාටු වෙනවා.

ඒ වාගේම මේ මාතෘකාව ගැන කථා කරනකොට ගරු මධුර සෙනෙවිරත්න මැතිතුමා ඉතා වැදගත් කාරණා ටිකක් මතු කළා. මම යෝජනා කරපු කාරණයට අදාළව 3/2026 කියන චක්‍රලේඛය නිකුත් කරලා තිබෙනවා. ඒ චක්‍රලේඛය තුළින් පැහැදිලිවම පාසල් තුළ සෞඛ්‍යාරක්ෂිතව ආපණශාලා පවත්වාගෙන යෑම සම්බන්ධ කාරණා රාශියක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ සඳහා මැදිහත් වූ අධ්‍යාපන නියෝජ්‍ය ඇමතිතුමා ඇතුළු ඒ සියලුදෙනාට අපි ස්තුතිවන්ත වෙනවා. එතැනදී ඉතා වැදගත් වූ කාර්යභාරය තමයි, මේ චක්‍රලේඛය ක්‍රියාත්මක කිරීම. එහිදී පාසල්වල ඉන්න විදුහල්පතිතුමන්ලාට, ආචාර්ය මණ්ඩලයට, මේ ආපණශාලා පවත්වාගෙන යන අයට විශාල වගකීමක් තිබෙනවා. සාමාන්‍යයෙන් අපි කාලයක් පුරුදු වෙච්ච දේවල් තමයි මේ ආපණශාලාවල තිබෙන්නේ. කාලයක් තිස්සේ දරුවන් පුරුදු වෙච්ච ආහාර රටාවක් තිබෙනවා. මේක වෙනස් කිරීම ඉතා අමාරුයි. නමුත්, ඒ සඳහා නිසි බලධාරින් මැදිහත් වෙලා දරුවන් දැනුවත් කරලා ඒ සම්බන්ධ ක්‍රියාමාර්ග ගැනීමෙන් අපි හිතනවා, යම් නිශ්චිත කාල සීමාවක දී අපේ අවශ්‍යතාව මේ රටේ දරුවන් වෙනුවෙන් අපට ඉෂ්ට කර ගන්න පුළුවන් වෙයි කියලා. ඒ මෙතැන තිබෙන ප්‍රධාන කාරණයක් තමයි, පාසල් ආපණ ශාලා නියාමනයේදී ඒවා සෞඛ්‍ය නිලධාරි කාර්යාලයේ ලියාපදිංචි කළ යුතුයි කියලා සඳහන් කරලා තිබෙන එක. ඒවා නිවැරදිව තිබෙනවාදැයි සොයා බැලිය යුතුයි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ සම්බන්ධ තවත් කාරණයක් තිබෙනවා. දිනපතා ප්‍රවර්ධනය කළ යුතු ආහාර පාසල තුළ බැනර් එකකින් ප්‍රදර්ශනය කළ යුතුයි. ඒ වාගේම පාසල තුළ අළෙවි කිරීම තහනම් කළ ආහාරත් බැනර් එකකින් ප්‍රදර්ශනය කළ යුතුයි. එවිට මම හිතන හැටියට සියලුදෙනා දැනුවත් වෙනවා. ඒ දැනුවත්වීම තුළ අපි බලාපොපොරාත්තු වන මෙම කාරණය ඉෂ්ට කරගන්න පුළුවන්.

ඊට අමතරව තවත් විශාල කාර්යභාරයක් අපේ දෙමව්පියන්ටත්, අපි සියලුදෙනාටත් තිබෙනවා. මේ විධියට පාසල් තුළ ආපණ ශාලා නියාමනය කළත් දරුවන් එළියෙන් ආහාර ගැනීමේ කාර්යයේ නිරත වෙනවා. ඒ ගැන දරුවන් දැනුවත් කිරීම තුළින්ම තමයි ඒකෙන් අයින් වෙලා නිවැරදි පෝෂණ රටාවට ඔවුන්ට යන්න පුළුවන් වෙන්නේ. ඒ සඳහා ඉතා විශාල වගකීමක් මේ රටේ දෙමව්පියන්ටත් තිබෙනවා. අපි බලාපොරොත්තු වෙනවා, පාසල් තුළ සෞඛ්‍ය ආරක්ෂිතව ආපණශාලා පවත්වාගෙන යෑම සම්බන්ධ නීතිමය තත්ත්වයක් ගෙන ඒමට වර්තමාන රජයට හැකියාව ලැබෙයි කියලා. මේ පිළිබඳව අදහස් දැක් වූ සියලුදෙනාටම නැවත වතාවක් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

යෝජනා අංක පා. 70/2025 ඉදිරිපත් කිරීම, ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් ලැබෙනවා.

## යාපනයේ සංචාරක සේවා ප්‍රවර්ධනය කිරීම සහ ආර්ථිකය සංවර්ධනය කිරීම
## யாழ்ப்பாணத்தில் சுற்றுலாத்துறைச் சேவைகளை மேம்படுத்தல் மற்றும் பொருளாதாரத்தை அபிவிருத்தி செய்தல்
## PROMOTING TOURISM SERVICES AND ECONOMIC DEVELOPMENT IN JAFFNA

[பி.ப. 3.15]

**ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා**
(மாண்புமிகு றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி)
(The Hon. Rajeevan Jeyachandramoorthy)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, யாழ்ப்பாணத்தில் சுற்றுலா மற்றும் பொருளாதார அபிவிருத்தி தொடர்பாக நான் பின்வரும் பிரேரணையை முன்மொழி கின்றேன்:

"இலங்கையில் யாழ்ப்பாணப் பிரதேசத்தில் சுற்றுலாத் துறைச் சேவைகளை மேம்படுத்தல் மற்றும் பொருளாதாரத்தை அபிவிருத்தி செய்வதன்மூலம் இந்நாட்டின் சுற்றுலாத்துறைப் பொருளாதாரத்தை வலுப்படுத்துவதற்கும், தொழில் வாய்ப்புகளை உருவாக் குவதற்கும், யாழ்ப்பாணத்தை ஓர் உயிர்ப்பான கலாசாரப் பயண முடிவிடமாக மாற்ற முடியுமென்பதால், யாழ்ப்பாணத்தையும் இலங்கையின் வட மாகாணத் தையும் பிரதான கேந்திர இடங்களாக அங்கீகரிப் பதற்கும், உள்ளூர் மற்றும் வெளிநாட்டுச் சுற்றுலாப் பயணிகள் பிரதேசத்தின் ஹோட்டல்கள், உணவு விடுதிகள் மற்றும் சேவை வழங்குநர்களுடன் இணைப்பை ஏற்படுத்தல், உண்மையான சுற்றுலா அனுபவங்களை மேம்படுத்தல், இலங்கையின் வட மாகாணத்திற்கான சுற்றுலாப் பயணிகளின் வருகை யினையும் அவர்களின் திருப்தியையும் அதிகரிப் பதற்கான உட்கட்டமைப்பு மற்றும் டிஜிட்டல் இணைப்பு மற்றும் விற்பனையை மேம்படுத்துகின்ற கொள்கைகள் மற்றும் முதலீடுகளுக்காக ஆதரவளிக்கின்ற, பிரதேசத்தில் சுற்றுலாக் கைத்தொழிலில் ஈடுபட்டுள்ள தொழிற்பாட்டாளர்களை வலுவூட்டுகின்ற மற்றும் கலாசார மரபுரிமைகளை மேம்படுத்தும் சுற்றுலாத் துறைச் சேவை வணிகத்தை ஊக்குவித்தல் மற்றும் அவற்றுக்கு வசதியளிப்பதன்மூலமும், யாழ்ப்பாணப் பிராந்தியத்தின் சுற்றுலாக் கைத்தொழிலின் நிலையான அபிவிருத்தி மற்றும் பொருளாதார விருத்தியை மேம்படுத்துகின்ற அரச-தனியார் பங்காண்மையை மேம்படுத்து வதன்மூலமும், 12 முதல் 18 மாதங்களில் நிலைபேறான பொருளாதாரப் பயன்களை அடைந்து கொள்ளும் இலக்கை நோக்காகக்கொண்டு, பிராந்தி யத்தின் தொழில் மற்றும் வணிக வாய்ப்புகள்மீது அவ்வாறான நிகழ்ச்சித்திட்டங்கள் ஏற்படுத்தும் தாக்கங்களைக் கண்காணிப்பதனூடாக யாழ்ப் பாணத்தை மையமாகக்கொண்ட சுற்றுலாத் தள மொன்றை உருவாக்கு வதற்கு ஆதரவளிக்கும் நடவடிக்கைகள் மேற்கொள்ளப்பட வேண்டுமென இப்பாராளுமன்றம் தீர்மானிக்கின்றது."

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இந்தப் பிரேரணையைக் கொண்டுவந்ததன் நோக்கம், வட மாகாணத்திலே காணப்படுகின்ற மாவட்டங்கள் இயற்கை வனப்புகளைக் கொண்டவையாகவும், உல்லாசப் பிரயாணி

[ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා]

களைக் கவருகின்ற இடங்களாகவும் காணப்படுவதனால், அங்கு "visit Jaffna" என்ற செயற்றிட்டத்தை ஆரம்பித்து, உலகெங்கும் வாழ்கின்ற மக்களை யாழ்ப்பாணம் மற்றும் வட மாகாண பிரதேசங்களுக்குக் கவர்ந்திழுப்பதனூடாக, நீண்டகால யுத்தம் காரணமாகப் பாதிக்கப்பட்ட அப் பிரதேசங்களின் பொருளாதாரத்தை வலுப்படுத்த முடியும் என்பதுடன், அங்கே வாழ்கின்ற குடும்பங்கள் பொருளாதார ரீதியாக நன்மை அடையும் என்பதாகும். இதற்கான சில ஆலோசனைகளை நான் இங்கே முன்வைக்கிறேன்:

1. சுற்றுலாச் செயற்பாடுகளை நிர்வகிப்பதை இலகு படுத்தும் வகையில், உடனடியாக மாவட்டச் செயலகங்களில் சிறிய அளவிலான சுற்றுலா அபிவிருத்தி அலகு - tourism development unit - உருவாக்கப்பட்டு, பிரதேச செயலகங்களிலும் முறை சார்ந்த அபிவிருத்தி உத்தியோகத்தர்கள் நியமிக்கப்பட வேண்டுமென்று நான் இங்கே வலியுறுத்த விரும்பு கின்றேன்.

2. பொருளாதார வளர்ச்சியின் அடிப்படையாகச் சுற்றுலாப் பிரயாணிகளின் வருகையை அதிகரிக்கும் நோக்கில், யாழ்ப்பாணம் சர்வதேச விமான நிலையத்தை விருத்திசெய்து, ஏனைய நாடுகளுட னான நேரடி விமானச் சேவையை உடனடியாக விரைவுபடுத்த வேண்டும். அத்துடன், யாழ்ப்பாணத் துக்கும் கட்டுநாயக்கவுக்கும் இடையிலான உள்நாட்டு விமான சேவையை உடனடியாக ஆரம்பிக்க நடவடிக்கை எடுக்க வேண்டும். இதன்மூலம் எட்டு மணித்தியால பயண நேர விரயத்தை மட்டுமன்றி விபத்துகளையும் தவிர்க்க முடிவதுடன், புலம் பெயர்ந்து வாழும் எமது உறவுகள் அடிக்கடி இங்கே வருகை தருவார்கள்.

3 அரசாங்கத்தின் நிதிக் கிடைப்பனவு வரையறுக்கப் பட்டிருப்பதால், சர்வதேச தொண்டு நிறுவனங்கள் மற்றும் வெளிநாட்டு அரச உதவிகளைப் பெற்று வடக்கின் சுற்றுலாத் துறைக்கான உட்கட்டமைப்பு வசதிகளை விருத்தி செய்ய நடவடிக்கை எடுக்க முடியும்.

அடுத்து, யாழ்ப்பாண மாவட்டத்தில் பல அழகிய கடற்கரைகள் காணப்படுகின்றன. அங்கு கடல்சார் சுற்றுலாவை மேம்படுத்தும் வகையிலே, தேசிய நீர் வளங்கள் ஆராய்ச்சி மற்றும் அபிவிருத்தி முகவரகம் - NARA, சமுத்திரப் பல்கலைக்கழகம் மற்றும் இலங்கை கடற்படை ஆகியவற்றின் உதவியுடன் கடலின் ஆழம் மற்றும் ஆபத்தான பகுதிகளை அடையாளம் கண்டு, பாதுகாப்பான நீர்க்குளியல் மற்றும் நீர்சார் விளையாட்டுக்களை மேம்படுத்த முடியும்.

அதேபோன்றுதான், யாழ்ப்பாணம் உள்ளிட்ட வட மாகாணத்தில் பல்வேறு வகையான நீண்ட பாரம்பரிய உற்பத்திகள் காணப்படுகின்றன. சுற்றுலாத் துறையை மேம்படுத்துவதனூடாக எமது பாரம்பரிய உள்ளூர் உற்பத்திப் பொருட்களைச் சந்தைப்படுத்துவதற்கான வாய்ப்பு உருவாக் கப்பட வேண்டும்.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්. දැන් කථාව අවසන් කරන්න.

**ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා**
(மாண்புமிகு றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி)
(The Hon. Rajeevan Jeyachandramoorthy)
Please give me one more minute, Madam.

அதேபோன்று, கடல்சார் சுற்றுலாத் தளங்களாக விளங்குகின்ற நெடுந்தீவு, அனலைதீவு, நயினாதீவு, எழுவைதீவு போன்ற தீவுகளுக்குச் சிறந்த படகுச் சேவையை வழங்குவதனூடாக உல்லாசப் பயணிகளை மேலும் கவர முடியும் என்று கூறி, என்னுடைய பிரேரணையை முன்வைத்து, விடை பெறுகின்றேன். நன்றி!

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
යෝජනාව ස්ථිර කිරීම, ගරු (වෛද්‍ය) එස්. ශ්‍රී බවානන්දරාජා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් ලැබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු චානක මාදුගොඩ මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා (ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே - கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சர்)
(The Hon. (Dr.) Upali Pannilage - Minister of Rural Development, Social Security and Community Empowerment)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, "ගරු චානක මාදුගොඩ මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු චානක මාදුගොඩ මහතා මූලාසනාරූඪ විය.***
*அதன் பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சானக மாதுகொட அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON. CHANAKA MADUGODA took the Chair.*

[பி.ப. 3.21]

**ගරු (වෛද්‍ය) එස්. ශ්‍රී බවානන්දරාජා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) எஸ். ஶ்ரீ பவானந்தராஜா)
(The Hon. (Dr.) S. Sri Bavanandarajah)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் யாழ். மாவட்டத்தில் சுற்றுலாத் துறைச் சேவைகளை மேம்படுத்தல் மற்றும் பொருளாதார அபிவிருத்தி தொடர்பாக எமது சக பாராளுமன்ற உறுப்பினர் கௌரவ றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி அவர்களினால் கொண்டுவரப் பட்ட இந்தப் பிரேரணையை நான் மிகவும் ஆதரித்து, வழிமொழிகின்றேன். எமது பிரதேசங்களில் 30 ஆண்டுகளாக இடம்பெற்ற யுத்தம் காரணமாக யாழ்ப்பாண மாவட்டத்தில் பெருமளவு மனித உயிர்களும் சொத்துகளும் அழிவடைந்தது

மட்டுமல்ல, எமது மக்களின் கலாசாரமும் அழிவடைந்துள்ளது. அந்த வகையிலே, தற்போது எமது அரசாங்கம் அங்கு பல்வேறு அபிவிருத்தித் திட்டங்களை முன்னெடுத்துவருகின்ற வேளையிலே, சுற்றுலாத் துறையையும் மேம்படுத்த வேண்டிய நடவடிக்கைகளை நாம் மேற்கொள்ளவேண்டிய தருணம் இதுவாகும். ஏனென்றால், நாட்டில் ஆண்டொன்றுக்கு 3 மில்லியன் சுற்றுலாப் பயணிகளை ஈர்ப்பதும், 4.5 பில்லியன் டொலர் வருவாயைப் பெற்றுக்கொள்வதும் எமது அரசாங்கத்தின் இலக்காகும். அந்த வகையிலே, எங்களது யாழ்ப்பாண மாவட்டத்தை நாட்டின் ஒரு மூலோபாய சுற்றுலா அமைவிடமாகவும், அதன் இயற்கை வனப்பு, ஆன்மீகப் பாரம்பரியம் மற்றும் இயற்கையான கடற்கரை வளங்கள் என்பவற்றைச் சுற்றுலா மூலதனமாகவும் மாற்ற வேண்டியது எமது தற்போதைய தேவையாகும். இது ஒரு பிராந்தியத் தேவை மட்டுமன்றி, நாட்டின் ஒட்டுமொத்தப் பொருளாதார வளர்ச்சிக்கும் இன்றியமையாததாகும். இன்று யாழ். மாவட்டத்திலே சுற்றுலாத் துறையை அபிவிருத்தி செய்வதன் மூலம் எமது அந்நியச் செலாவணி வருவாயை அதிகரிக்க முடியும் என்பதோடு, பலருக்கு வேலைவாய்ப்பையும் வழங்கக் கூடிய ஒரு சந்தர்ப்பத்தை உருவாக்க முடியும் என்பதில் சந்தேகம் இல்லை.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இலங்கை சுற்றுலா அபிவிருத்தி அதிகாரசபையின் தரவுகளின் படி, இலங்கைக்கு வரும் சுற்றுலாப் பயணிகளில் 17 - 31 சதவீதம் வரையானவர்கள் இந்தியப் பயணிகளாவர். கடந்த ஆண்டில் மட்டும் 531,000 இந்திய சுற்றுலாப் பயணிகள் இங்கு வருகை தந்திருந்தார்கள். அத்துடன், யாழ். மாவட்டத்திலே பிறந்து வளர்ந்து, இன்று உலகின் பல்வேறு பகுதிகளில் நிரந்தரமான வதிவிடங்களைக் கொண்டவர்கள் பலர் tourist visaவில் வந்து இங்கு பல மாதங்களாகத் தங்கியிருப்பதும் தங்களுக்குத் தெரிந்ததே. அந்த வகையில், எமது சுற்றுலாத் துறையை மேம்படுத்த பல்வேறு வசதிகளை விரிவாக்க வேண்டிய தேவை இருக்கின்றது. முக்கியமாக, காங்கேசன் துறைத் துறைமுகத்தை அபிவிருத்தி செய்வதன்மூலம் கப்பல் போக்குவரத்துத் தொடர்பை ஏற்படுத்தி இந்தியச் சுற்றுலாப் பயணிகளை ஈர்ப்பது, பலாலி சர்வதேச விமான நிலைய சேவையை விரிவாக்கி அதன்மூலம் பெரிய விமானங்களை வரவழைத்து, அதை 24 மணிநேரம் இயங்கவைப்பது, அத்துடன் அங்கிருந்து கட்டுநாயக்க விமான நிலையத்திற்கான நேரடி விமான சேவையை உருவாக்குவது போன்ற தேவைகள் இருக்கின்றன. மேலும், எமது வான்வழிச் சேவைகளும் விரிவாக்கப்பட வேண்டும். அதன்மூலம் பல்லாயிரக்கணக்கான சுற்றுலாப் பயணிகளை நாம் ஈர்க்கக்கூடியதாக இருக்கும். அத்துடன், நாட்டின் ஏனைய பகுதிகளுடன் புகையிரத வலையமைப்பைத் தொடர்புபடுத்துவதன்மூலமும், வீதி அபிவிருத்திகள் மூலமாகவும் எமது சுற்றுலாத் துறையை மேம்படுத்த முடியும். நவீன வசதிகளுடன்கூடிய தங்குமிடங்கள், நவீன கடைத் தொகுதிகள் என்பவற்றை நிர்மாணிப்பதுடன், அவற்றுக்குரிய உதவிகளை வழங்குவதன் மூலமும் மேலதிகமாக நாம் சுற்றுலாப் பயணிகளை இங்கு வரவழைக்க முடியும்.

அதைவிட, யாழ். மாவட்டத்துக்கே உரித்தான பல சமய நிகழ்வுகள் இருக்கின்றன. உதாரணமாக, நல்லூர்க் கந்தசுவாமி கோவில் மகோற்சவ காலத்தின்போது ஏராளமான பக்தர்கள் சுற்றுலா 'விசா'வில் வருவது வழக்கம். உண்மையிலே, யாழ்ப்பாணத்தில் இது போன்ற மகோற்சவ காலங்களை அடிப்படையாகக் கொண்டு அங்கு சுற்றுலாத் துறையை மேம்படுத்துவதும் சுற்றுலா அபிவிருத்தியின் ஓர் அம்சமாகும். எமது அரசு பெருமளவு நிதியை, அதாவது 1,300 மில்லியன் ரூபாய் பணத்தை யாழ். மாவட்டத்தின் சுற்றுலா உட்கட்ட மைப்பு வசதிகளை மேம்படுத்துவதற்காக ஒதுக்கியிருக்கின்றது. அதன்மூலம் காரைநகர் கசூரினா கடற்கரை, காங்கேசன் துறைக் கடற்கரை, சாட்டி மற்றும் சேந்தான்குளம், ஊர்காவற்றுறை போன்ற இடங்களில் உள்ள அழகிய, ஆழமற்ற, ஆபத்தில்லாத கடற்கரைகளை அழகுபடுத்தி, அங்கு பல சுற்றுலாத் தளங்களை அமைப்பதன்மூலமும் பெருமளவான சுற்றுலாப் பயணிகளைக் கவர முடியும். அத்துடன், யாழ். மாவட்டத்திலே இருக்கின்ற நெடுந்தீவு, நயினாதீவு, அனலைதீவு, எழுவைதீவு போன்ற தீவுப்பகுதிகளும் மிகவும் சிறப்பான முறையிலே சுற்றுலாத் துறையை அபிவிருத்தி செய்வதற்கு ஏற்ற இடங்களாகும். இந்த சுற்றுலாத் துறையில் முதலிடுவதற்குப் பல புலம்பெயர்ந்த ஆர்வலர்கள் விருப்பமாக உள்ளபடியால், அவர்களுக்குத் தேவையான அனைத்து வசதிகளையும் வழங்கி, எமது சுற்றுலாத் துறையை மேம்படுத்த வேண்டும் எனவும், அதற்கு உதவிசெய்ய நாங்களும் ஆயத்தமாக இருக்கின்றோம் எனவும் கூறி, வாய்ப்பளித் தமைக்கு நன்றி தெரிவித்து, விடை பெறுகின்றேன். வணக்கம்.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් තිබෙනවා.

[பி.ப. 3.27]

**ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මහතා**
(மாண்புமிகு அமிர்தநாதன் அடைக்கலநாதன்)
(The Hon. Amirthanathan Adaikkalanathan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் கௌரவ றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி அவர்களால் முன்மொழியப்பட்டு இருக்கின்ற, யாழ்ப்பாணத்தில் சுற்றுலாத்துறைச் சேவைகளை மேம்படுத்தல் மற்றும் பொருளாதாரத்தை அபிவிருத்தி செய்தல் தொடர்பான தனிநபர் பிரேரணையில் எனக்கும் பேசுவதற்கு வாய்ப்பளித்தமைக்கு நன்றி கூறுகின்றேன். இந்தப் பிரேரணையில் 'யாழ்ப்பாணத்தில்' என்ற பதத்துக்குப் பதிலாக 'வடக்கில்' என்ற பதத்தைப் பயன்படுத்தினால் நன்றாக இருக்குமென நினைக்கின்றேன். ஏனெனில், வடக்கில் முல்லைத்தீவு, மன்னார், வவுனியா போன்ற பிரதேசங்களில் சுற்றுலாத்துறையை மேம்படுத்துவதற்கு அதிக வளங்கள் இருக்கின்றன.

மன்னாரில் மிக அழகான கடல் வளம் காணப்படுகின்றது. அதேபோல், முல்லைத்தீவு மாவட்டத்திலும் காணப்படுகின்றது. வவுனியாவில் இயற்கை வளம் நிறைந்து காணப்படுகின்றது. முல்லைத்தீவு மற்றும் வவுனியாவிலுள்ள பல இடங்கள் சுற்றுலாத்துறைக்குப் பொருத்தமானவையாக இருக்கின்றன. நான் அரசாங்கத்திடம் ஒரு விடயத்தைச் சொல்லலாமென நினைக்கின்றேன். டுபாயை எடுத்துப்பார்த்தீர்கள் என்றால், அங்குள்ள கடற்பரப்பை வருமானம் மிக்கதொரு சுற்றுலாத் தளமாக மாற்றியிருக்கிறார்கள். எனினும், நாங்கள் எங்களுடைய நாட்டைச் சூழவுள்ள மிக அழகான கடற்பரப்பை சுற்றுலாத் தளமாக மாற்றுவதற்கு எந்த முயற்சியும் மேற்கொள்ளவில்லை. என்னைப் பொறுத்தமட்டில், இது கவலை தருகின்ற ஒரு

[ගරු අමීර්තනාදන් අඩෛක්කලනාදන් මහතා]

விடயமாகும். வெளிநாட்டிலிருந்து இலங்கைக்கு வருகின்ற உல்லாசப் பயணிகள் யானைகளையும், இயற்கையாக அமைந்த கடல் சார்ந்த இடங்களையும், மலை சார்ந்த நுவரெலியா போன்ற இடங்களையும் பார்க்கின்ற நிலைதான் காணப்படுகின்றது. டுபாயில் கடலை எப்படி பயன்படுத்தி இருக்கிறார்கள் என்பது பற்றி சிந்தித்து, அவ்வாறு எங்களுடைய நாட்டிலும் செய்தால், மேலும் அந்நியச் செலாவணியை ஈட்டுவதற்கான வாய்ப்புகளை ஏற்படுத்திக்கொள்ள முடியுமென்பது என்னுடைய ஆலோசனை ஆகும். ஆனால், எந்த Government வந்தாலும் அது பற்றி சிந்திப்பதில்லை. தற்போதைய அரசாங்கமாவது அதனைக் கவனத்திலெடுக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

அடுத்து, இன்றைய விவாதத் தலைப்புடன் சம்பந்தமில்லாத ஒரு விடயத்தை இங்கு சொல்ல விரும்புகின்றேன். தற்பொழுது, முள்ளிக்குளம் மக்கள் போராட்டமொன்றை மேற்கொண்டு வருகின்றார்கள். பள்ளக்கண்டலில் இருக்கின்ற தேவாலயத்தில் இம்மாதம் 8ஆம் திகதி தொடக்கம் 12ஆம் திகதி வரை திருவிழா நடைபெறுகின்றது. ஆனால், Department of Wildlife Conservationஇனர் அந்த தேவாலயத்துக்குச் செல்லும் பாதையைப் பயன்படுத்தக்கூடாதெனச் சொல்லியிருக்கிறார்கள். ஒவ்வொரு வருடமும் திருவிழாவுக்காக அந்தப் பாதை திறக்கப்படும். Department of Wildlife Conservationஆனது, இரண்டு நாட்களுக்காவது அந்தப் பாதையைத் திறந்து, மக்கள் அந்தத் திருவிழாவில் கலந்துகொள்வதற்கான வாய்ப்பை ஏற்படுத்திக் கொடுக்க வேண்டுமென்பது என்னுடைய வேண்டுகோளாகும்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, எமது நாட்டில் சுற்றுலாத்துறை மூலமான வருவாயை அதிகரிக்க வேண்டுமென்றால், கடல் வளத்தை அதிகமாகப் பயன்படுத்த வேண்டும். எங்களுடைய பிரதேசத்தை கூடுதலாகச் சுற்றியிருப்பது கடலாகும். அந்தக் கடற்பரப்பில் மீன் வளம் கூடுதலாகக் காணப்படுகின்றது. எனினும், அதைப் பற்றி அக்கறைகொள்வதாக நான் அறியவில்லை. நவீன மீன்பிடி முறைகளைப் பயன்படுத்தி மீன் உற்பத்தியைப் பெருக்கினால், மீன் வளத்தை ஏற்றுமதி செய்கின்ற வாய்ப்புகளை அதிகரிக்க முடியும். அவ்வாறு செய்தால் நாட்டுக்குக் கிடைக்கின்ற அந்நியச் செலாவணியை மேலும் அதிகரிக்க முடியும். பொருளாதார ரீதியில் தன்னிறைவு அடையக்கூடிய நிலைக்கு நாங்கள் வரலாம். எனினும், இந்த நாட்டில் ஆட்சிக்கு வருகின்ற அரசாங்கங்கள் அதைப் பற்றி சிந்திப்பதில்லை. நாங்கள் எங்களுடைய அறிவைப் பயன்படுத்தி, எங்களுடைய நாட்டிலுள்ள இயற்கை வளங்களைப் பயன்படுத்தினால்கூட பெரியளவில் வருமானத்தை ஈட்ட முடியும். இதன்மூலம் வேறு நாடுகளிடம் கடன்படுகின்ற நிலையைத் தடுக்க முடியும். எங்களுடைய வடக்கு, கிழக்கில் உல்லாசப் பிரயாணத்துறையை மேம்படுத்துவதன் மூலம் நல்ல வருமானத்தை ஈட்ட முடியும். இறுதியாக, இந்தப் பிரேரணையைக் கொண்டுவந்த கௌரவ றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி அவர்களுக்கு நன்றி கூறி, விடை பெறுகின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[பி.ப. 3.33]

**ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා**
(மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன்)
(The Hon. Kaveenthiran Kodeeswaran)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் கௌரவ றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி அவர்களால் கொண்டுவரப்பட்ட, யாழ்ப்பாணத்தில் சுற்றுலாத்துறைச் சேவைகளை மேம்படுத்தல் மற்றும் பொருளாதாரத்தை அபிவிருத்தி செய்தல் சம்பந்தமான தனிநபர் பிரேரணையை நான் வரவேற்கின்றேன்.

இலங்கை என்பது உண்மையிலேயே மிகவும் அழகான நாடு! அதுமாத்திரமல்ல, உலகத்தில் சுற்றுலா செல்வதற்குச் சிறந்த தீவென்று எல்லோராலும் பாராட்டப்படுகின்ற ஒரு தீவும் ஆகும். இயற்கை வளங்கள் நிறைந்த இலங்கை தீவில் உல்லாசப் பிரயாணத்துறையை மேம்படுத்தினாலே மிகப் பெரியளவில் அந்நியச் செலாவணியை ஈட்டிக்கொள்ள முடியும். அதன்மூலம் எமது பொருளாதாரத்தை அபிவிருத்தி செய்துகொள்ள முடியும். இன்று உலகத்தில் வளங்களற்ற, அழகற்ற எத்தனையோ நாடுகள் இருக்கின்றன. அந்த நாடுகள் உல்லாசப் பிரயாணத்துறையை புதிய தொழில்நுட்ப முறைகள்மூலம் -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තිබෙන්නේ විනාඩි 4ක කාලයක් පමණයි. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා කියලා වැරදීමකින් මට කියැවුණා. සමාවෙන්න, ඔබතුමාට විනාඩි 4ක කාලයක් පමණයි තිබෙන්නේ.

**ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා**
(மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன்)
(The Hon. Kaveenthiran Kodeeswaran)

புதிய தொழில்நுட்ப முறைகளைப் பயன்படுத்தி உல்லாசப் பிரயாணத்துறையை மேம்படுத்தவேண்டிய பொறுப்பு இந்த அரசாங்கத்துக்கு இருக்கின்றது. உல்லாசப் பிரயாணத்துறையை மேம்படுத்த வேண்டுமென்றால், அதற்குரிய தொழில்நுட்ப முறைகளை அறிமுகப்படுத்த வேண்டும்.

வட, கிழக்கில் யுத்தத்தால் நலிவுற்ற பிரதேசங்களில் உல்லாசப் பிரயாணத்துறை சார்ந்த விடயங்களை மேற்கொண்டால், அங்குள்ள மக்களுக்கான தொழில்வாய்ப்புகளை உருவாக்க முடியும் என்பதோடு, பொருளாதார ரீதியான ஊக்குவிப்புகளையும் மேற்கொள்ளக்கூடியதாக இருக்கும். இங்கு பேசிய உறுப்பினர்கள் அநேகமான விடயங்களைச் சிறப்பாகச் சொல்லியிருந்தார்கள். நாட்டில் உல்லாசப் பிரயாணத்துறையை ஊக்குவிக்க வேண்டுமென்றால், வெளிநாட்டு சுற்றுலாப் பயணிகளை நாட்டுக்கு வரவழைக்க வேண்டுமென்றால், உள்நாட்டு விமானப் போக்குவரத்துச் சேவையை விஸ்தரிக்க வேண்டும், வீதி அபிவிருத்தி உட்பட ஏனைய அபிவிருத்தி வேலைத்திட்டங்களை மேற்கொள்ள வேண்டுமெனப் பல வழிவகைகளைக் கூறியிருந்தார்கள்.

இந்த வருடம் சுற்றுலாத்துறைமூலம் 4.5 பில்லியன் அமெரிக்க டொலர் வருமானத்தை ஈட்டக்கூடிய வகையிலான வேலைத்திட்டங்களை இந்த அரசு முன்னெடுத்து வருகின்றது. கடந்த காலங்களில் இருந்த அரசாங்கங்களும்

சுற்றுலாத்துறையை மேம்படுத்த வேண்டுமெனச் சொன்னாலும், அது சரியான முறையில் செய்யப்படவில்லை. எனவே, நீங்கள் இந்த விடயங்களைக் கருத்திற்கொண்டு அதற்குரிய வழிவகைகளைச் செய்ய வேண்டும். அதிகளவிலான அபிவிருத்திகளைச் செய்வதற்கான வேலைத்திட்டங்களை மேற்கொள்ள வேண்டும். குறிப்பாக, பொத்துவிலில், கோமாரி எனும் பிரதேசத்தில் lighthouse, surfing spot இருக்கின்ற பகுதிகளில் உல்லாசப் பிரயாணத்துறைக்குரிய அடிப்படை வசதிகளைச் செய்தாலே பாரியளவு அந்நியச் செலாவணியை ஈட்டிக்கொள்ள முடியும். ஏனெனில், அங்கு அடிப்படை வசதிகளற்ற சூழலே காணப்படுகின்றது. எனவேதான் சொல்கின்றேன், அந்தப் பிரதேசங்களில் அடிப்படை வசதிகளைச் செய்து கொடுங்கள் என்று. இப்படியான விடயங்களை அந்தப் பிரதேசத்தில் செய்யும்பொழுது, உல்லாசப் பிரயாணத்துறையை விருத்தி செய்ய முடியும். அதன்மூலம் பொருளாதாரத்தையும் அபிவிருத்தி சார்ந்த விடயங்களையும் முன்கொண்டு செல்லலாமெனக் கூறி, எனது உரையை முடித்துக் கொள்கின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු කේ. ඉලංකුමාරන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 3.37]

**ගරු කේ. ඉලංකුමාරන් මහතා**
(மாண்புமிகு கே. இளங்குமரன்)
(The Hon. K. Ilankumaran)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றையதினம் கௌரவ பாராளுமன்ற உறுப்பினர் றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி அவர்களால், யாழ்ப்பாணத்தில் சுற்றுலாத்துறைச் சேவைகளை மேம்படுத்தல் மற்றும் பொருளாதாரத்தை அபிவிருத்தி செய்தல் தொடர்பாகக் கொண்டு வரப்பட்ட தனிநபர் பிரேரணையின் மீதான விவாதத்தில் உரையாற்றுவதையிட்டு பெரு மகிழ்ச்சி அடைகின்றேன். வட மாகாணத்தைப் பொறுத்தவரையில், நாங்கள் நிலத்தை அடிப்படையாகக் கொண்டே சுற்றுலாத்துறையை முன்னேற்றிக்கொண்டு வருகின்றோம். அதேநேரம், மாலைதீவு நாடானாது எவ்வாறு சுற்றுலாத்துறையை வளர்த்துள்ளது என்பதை அடிப்படையாகக் கொண்டு, வட மாகாணத்தின் கடற்கரையை அண்டிய பிரதேசங்களையும் சிறந்த முறையில் முகாமைத்துவம் செய்வதன்மூலம் அப்பகுதியில் சுற்றுலாத்துறையை நாம் வளர்க்க முடியும் என்பதை இந்த இடத்தில் கூறிக்கொள்கின்றேன். அரசாங்கத்தால் இப்பொழுது சுற்றுலாத்துறை சார்ந்த பல வேலைத்திட்டங்கள் முன்னெடுக்கப்பட்டுக் கொண்டு வருகின்றன. அதன் முதற்கட்டமாக, சமுர்த்திப் பயனாளி குடும்பங்களைச் சேர்ந்த பிள்ளைகளுக்குச் சுற்றுலாத்துறை வழி காட்டல் தொடர்பான பயிற்சி வகுப்புக்கள் நடாத்தப்பட்டு வருகின்றன. இதற்காக ஒவ்வொரு பிள்ளைக்கும் 50,000 ரூபாய் வீதம் அரசாங்கத்தால் பணம் ஒதுக்கீடு செய்யப்பட்டு இருக்கின்றது.

மாலைதீவுக்கு ஒப்பாக வடக்கு, கிழக்குப் பகுதிகளில் சுற்றுலாத்துறையை மேம்படுத்த, அவர்கள் எவ்வாறு முன்னேறினார்கள் என்பதை, அவர்களிடமிருந்து பாடமாகக் கற்றுக்கொள்ள வேண்டிய தேவை எங்களுக்கு இருக்கின்றது. வடக்கு, கிழக்குக் கடற்பரப்பை எடுத்துக்கொண்டால், மன்னாரில் இருந்து காங்கேசன்துறை வரையான கடற்பரப்பில் எந்த வகையிலும் அச்சமின்றிப் பயணிக்கக்கூடியதாக இருக்கின்றது. மாலைதீவின் சுற்றுலாத்துறை முன்னேற்றத்தை அடிப்படையாகக் கொண்டு, எமது கடற்பரப்புக்களில் விஞ்ஞான ரீதியான ஆய்வுகளை மேற்கொள்ள வேண்டும். அதற்கான அனுமதியைத் துரிதப்படுத்தி வழங்க வேண்டும். வடக்கு மாகாணத்தின் கடற்கரையோரங்களில் பாதுகாப்பானதும் மற்றும் அழகானதுமான 'கபானாக்கள்' போன்ற மையங்களை அமைப்பதற்கான சுற்றுச்சூழல் தாக்க மதிப்பீட்டு அறிக்கைகளைப் பெற்று, எதிர்வரும் காலத்தில் முன்னெடுக்கும்பொழுது, துரிதமாக அபிவிருத்தி செய்ய முடியும் எனக் கூறிக் கொள்கிறேன். வடக்கு மாகாணம் 21 தீவுகளை உள்ளடக்கியிருக்கிறது. அவற்றில் நான்கு தீவுகளிலேயே மக்கள் வசிக்கின்றார்கள். ஏனைய தீவுகளையும் நாங்கள் இனம் கண்டு, மாலைதீவைப் போன்ற சுற்றுலாத் தீவுகளாக அபிவிருத்தி செய்ய முடியும்.

மாலைதீவு கடந்த 2025ஆம் ஆண்டு 5.5 பில்லியன் டொலர்களை சுற்றுலாத்துறையின் ஊடாக வருமானமாகப் பெற்றுள்ளது. மாலைதீவில் "One Island, One Resort" என்ற வகையில் அந்தப் பகுதிகளை அபிவிருத்தி செய்து, அங்குள்ள resortகளில் தங்குவதற்காக, ஒரு நாளைக்குக் குறைந்தது 100 - 250 டொலர்களை அறவிடுகிறார்கள். அதேநேரம், அங்குள்ள ஹோட்டல்களின் categoryக்கு ஏற்ப 500 டொலரிலிருந்து 1,000 டொலர்வரை அறவிடுகிறார்கள். அவ்வாறு நாங்கள் எமது தீவுகளை promote பண்ணும்போது, வட பகுதியில் சுற்றுலாத் துறையை முன்னேற்ற முடியும்.

நெடுந்தீவு, நயினாதீவு, எழுவைதீவு, அனலைதீவு போன்ற பிரதேசங்களுக்குப் போக்குவரத்துச் செய்வதில் பாரிய இடையூறுகள் இருந்தன. ஆனால், இன்று எமது அரசாங்கம் நெடுந்தீவுக்கான சுற்றுலாத் துறையை மேம்படுத்துவதற்காக சுற்றுலாப் பயணிகளைக் கவரும்வகையில் "சமூக சக்தி" தேசிய வேலைத்திட்டத்திற்கு ஊடாக, காலநிலைக்கு ஏற்ற வகையில் AC வசதிகளுடன்கூடிய கப்பலொன்றை வழங்குவதற்குத் தீர்மானித்திருக்கின்றது. ஏனென்றால், சுற்றுலாப் பயணிகள் கடலில் பயணம் செய்யும்போது பாதுகாப்பாகவும் சௌகரியமாகவும் பயணம் செய்ய வேண்டும். அதற்கான முன்னாயத்தங்களை அரசாங்கம் எடுத்திருக்கின்றது.

எதிர்வரும் காலத்தில் வடக்கு மாகாணத்தில் கரையோரங்களை இனங்கண்டு, அங்குள்ள தனித்தனித் தீவுகளில் முதலிடுவதற்கு முதலீட்டாளர்களை அரசாங்கம் ஊக்குவிக்க வேண்டும். சில வேலைத்திட்டங்களை மேற்கொள்ளும்போது அதில் சட்டச் சிக்கல்கள் காணப்படும். எமது நாட்டில் கடலுக்குள் ஒரு hotelஐ அல்லது ஒரு cabana setupஐ அமைப்பதற்குத் தடை இருக்கிறது. ஏனென்றால், கரையோர பாதுகாப்பு மற்றும் கரையோர வளங்கள் முகாமைத்துவ திணைக்களம் அதற்கான permissionஐக் கொடுப்பதில்லை. எனவே, அந்தச் சட்டதிட்டங்களை சில பகுதிகளில் தளர்த்த வேண்டும். வட மாகாணத்தை எடுத்துக்கொண்டால், கடலுக்குள் பவளப்பாறைகள் இருக்கின்றன; அழகான மீனினங்கள் இருக்கின்றன. உல்லாசப் பிரயாணிகளுக்கு இவ்வாறான அழகான பிரதேசங்களைக் காட்டும்போது அதிகளவான உல்லாசப் பிரயாணிகள் வடக்கை நோக்கி வருவார்கள். அவ்வாறு வரும்போது இந்த நாட்டுக்கு அந்நியச் செலாவணி வருவாய் அதிகரிக்கும். ஆகவே, இவற்றைக் கருத்திற்கொண்டு, எதிர்வரும் காலங்களில் உரிய சட்டத் திருத்தங்களை மேற்கொண்டு நாம் முன்நோக்கி நகர வேண்டும். அதற்கான முன்மொழிவுகளையும் நாங்கள் மேற்கொள்வோம் என்று கூறி,

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා. අවශ්‍ය නම් ඔබතුමාට ඒ කාලය ගන්න පුළුවන්.

**ගරු කේ. ඉලංකුමාරන් මහතා**
(மாண்புமிகு கே. இளங்குமரன்)
(The Hon. K. Ilankumaran)
நன்றி!

வட மாகாணத்தை எடுத்துக்கொண்டால், குறிப்பாக மன்னார் பிரதேசத்தில் கலாசார ரீதியிலான சுற்றுலாத் துறையை நாம் முன்னேற்றலாம். அங்கே முன்னைய காலத்தில் இருந்த 'இராமர் பாலம்' என்பதன் படிவுகள் காணப்படுகின்றன. அதிகளவான இந்தியப் பிரயாணிகள் அந்த இராமர் பாலத்தைப் பார்ப்பதற்காக வருகிறார்கள். ஆகவே, அதற்கான அணுகு பாதைகளை அழகாகப் புனரமைத்து, அந்தப் பிரதேசத்தை அபிவிருத்தி செய்யும்போது மன்னார் பிரதேசத்திற்கு அதிகளவான சுற்றுலாப் பிரயாணிகள் வருவார்கள் என்று கூறிக்கொள்ள விரும்புகின்றேன். அதுபோல், நெடுந்தீவு பிரதேசத்தில் இப்போது சுற்றுலாத் துறையால் 'அனுமன் பாதம்' அடையாளப்படுத்தப் பட்டிருக்கின்றது. அதற்கான வரைபடம் வைக்கப்பட்டிருக்கின்றது. அவ்வாறான செயற்பாடுகளை முன்னெடுக்கும்போது வட மாகாணத்திற்கு அதிகளவான சுற்றுலாப் பயணிகள் வருவார்கள் என்று கூறிக்கொள்ள விரும்புகின்றேன்.

மேலும், நான் முன்பு கூறியதுபோன்று எமது பிரதேசமானது 21 தீவுகளை உள்ளடக்கியிருக்கின்றது. அதில் 4 தீவில்தான் மக்கள் வசிக்கின்றார்கள். ஏனையவை வெறும் தீவுகளாக இருக்கின்றன. கச்சதீவு போன்ற பிரதேசங்களை இன்றும் மக்கள் பயன்படுத்த முடியாமல் இருக்கின்றார்கள்; சுற்றுலாப் பயணிகள் செல்லமுடியாமல் இருக்கின்றார்கள். அங்கே இருக்கின்ற churchக்கு திருவிழாக் காலத்தில் மாத்திரம் சென்று வருகிறார்கள். அதேபோல், ஊர்காவற்றுறையில் அழகான தனித் தீவொன்று இருக்கிறது. பூநகரிப் பிரதேசத்திலே பூவசரந்தீவு என்று தனியான, அழகான ஒரு தீவு இருக்கின்றது. அதைவிட, அதிகளவான சிறிய சிறிய தீவுகளும் காணப்படுகின்றன. அவை மக்கள் குடியிருப்புகள் இல்லாத தீவுகளாகும். அந்தத் தீவுகளை இனங்கண்டு, விஞ்ஞானரீதியாக ஆய்வு செய்வதற்கான ஒரு பொறிமுறையை உருவாக்கி, அவற்றைச் சுற்றுலாத் துறை சார்ந்து மேம்படுத்தும்போது இலங்கையில் அதிகளவான சுற்றுலாப் பயணிகள் வந்துசெல்லும் இடமாக வட மாகாணம் மாறும். மாலைதீவு எவ்வாறு முன்னேறியது? அவர்கள் தமது சுற்றுலாத் துறை சார்ந்து சிறந்த ஒரு பொறிமுறையை ஏற்படுத்தியன் நிமித்தம்தான் உலகில் சிறந்து விளங்குகிறார்கள். "மாலைதீவு கடலுக்குள் மூழ்கப் போகின்றது" என்று கூறினார்கள். ஆனால், இன்று அவர்கள் சுற்றுலாத் துறைமூலம் பொருளாதாரத்தில் முன்னேறியிருக்கிறார்கள். அதன் அடிப்படையில், மாலைதீவுக்கு ஒத்தவகையில் வட மாகாணத்தை முன்னேற்றுவதற்கு ஓர் ஆய்வைச் செய்ய முன்வரும்போது வட மாகாணமும் முன்னேறும்; இலங்கையும் முன்னேறும் என்பதைக் கூறி, விடை பெறுகின்றேன். நன்றி! வணக்கம்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ජී.ජී. පොන්නම්බලම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් තිබෙනවා.

[பி.ப. 3.44]

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்தத் தனிநபர் பிரேரணையை முன்வைத்தமைக்கு கௌரவ றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி அவர்களுக்கு நான் சக யாழ்ப்பாண மாவட்டப் பாராளுமன்ற உறுப்பினர் என்ற வகையில் என்னுடைய நன்றியை முதலில் தெரிவித்துக் கொள்கின்றேன். இது காலத்திற்குப் பொருத்தமான ஒரு பிரேரணை. உண்மையில் யாழ்ப்பாண மாவட்டத்தைச் சுற்றுலாவை மையமாகக் கொண்ட முக்கியமான ஒரு பிரதேசமாக நாங்கள் மாற்றுவதாக இருந்தால், அதற்குரிய போக்குவரத்து ஸ்தானங்களை நாங்கள் உறுதிப்படுத்த வேண்டும். அந்த வகையிலே, மிக முக்கியமாகத் தேவைப்படுவது பலாலி விமான நிலையம்! ஏற்கெனவே அந்த விமான நிலையத்தை அபிவிருத்தி செய்வதற்கு கணிசமான உதவிகளைச் செய்வதற்கு இந்திய அரசு தயாராக முன்வந்திருந்த நிலையிலே, துரதிருஷ்டவசமாக இதற்கு முதலில் இருந்த அரசாங்கத்தைப்போலவே இன்றைக்கு இருக்கின்ற இந்த NPP அரசாங்கமும் இந்தியாவுடைய அந்த நல்லெண்ணத்தை ஏற்று, அந்த அபிவிருத்தி வேலைத்திட்டத்தைத் தாமதமின்றிச் செய்வதற்குத் தயங்குகிறது.

உங்களுக்குத் தெரியும், பலாலி விமான நிலையத்தை அபிவிருத்தி செய்வதற்கு ஏற்கெனவே feasibility report ஒன்று தயாரிக்கப்பட்டு, 3 கட்டமாக அந்த airportஐ அபிவிருத்தி செய்வதற்கு இணக்கம் தெரிவிக்கப்பட்டதென்பது. ஆனால், அதனுடைய முதலாவது கட்டமாக, விமான நிலைய ஓடுபாதை - airport runwayஇன் உடைய 900 மீற்றர் மட்டுந்தான் அபிவிருத்தி செய்யப்பட்டிருக்கிறது; அதாவது resurface பண்ணப்பட்டிருக்கிறது. 2ஆம் கட்டமாக, அந்த runway 2,300 மீற்றர் நீளம் அபிவிருத்தி செய்யப்படவேண்டி இருக்கின்றது. ஆகவே, அந்தப் பகுதியை முழுமையாக resurface பண்ணி அதனுடைய அபிவிருத்தியைச் செய்தாலே, கணிசமான பிராந்திய நாடுகளின் விமானங்கள் வந்திறங்கக்கூடியதாக இருக்கும். குறிப்பாகச் சொன்னால், Airbus A320 போன்ற விமானங்களை அங்கே இறக்கக்கூடியதாக இருக்கும். அப்படியென்றால், சிங்கப்பூர், மேற்குப் பக்கத்திலுள்ள துபாய், வடக்கிலுள்ள டெல்லி முதலான இடங்களிலிருந்து விமானங்கள் வந்திறங்கக்கூடியதாக இருக்கும். அந்த வகையில், நேரடியாக, அதாவது hubsஆக இருக்கக்கூடிய அந்தந்த நாடுகளின் விமானங்கள் யாழ்ப்பாணத்திற்கு வந்திறங்கக்கூடியதாக இருக்கும். இந்தியா இலவசமாக, grantஆக resurfaceஐச் செய்து தருவதற்குத் தயாரக இருப்பதாகச் சொல்லியும்கூட, இந்த அரசாங்கம் அதை முழுமையாக அனுமதிக்காமல் இருப்பது உண்மையிலே துரதிருஷ்டவசமானது. அந்த வகையிலே, கௌரவ றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி அவர்கள் அக்கறை எடுத்து, இன்று தனியார் உறுப்பினர் பிரேரணை ஒன்றைக் கொண்டுவந்திருக்கிற நிலையில், அவசர அவசரமாக அந்தப் பலாலி விமான நிலையத்தை அபிவிருத்தி செய்வதற்கு, அரசாங்கத்துக்கு அவர் அழுத்தம் கொடுக்க வேண்டும் என்று நாங்கள் கேட்டுக்கொள்ள விரும்புகின்றோம்.

இரண்டாவது விடயம், உண்மையிலே கணிசமான புலம்பெயர்ந்த தமிழ் மக்கள் இங்கு touristsஆக வந்துபோவதற்குத் தயாராக இருக்கிறார்கள்; ஏற்கெனவே வந்துகொண்டும் இருக்கிறார்கள். ஆனால், இப்போது வருவதைவிட எத்தனையோ மடங்கு அதிகமாக வருவார்கள், எப்போதென்றால் அவர்களுக்கு இந்த நாட்டில் பாதுகாப்பு

இருக்கின்ற ஒரு நிலைமை உறுதிப்படுத்தப்பட்டால்! அவ்வகையில் உறுதிப்படுத்தப்படுவதாக இருந்தால், இன்றைக்கு வட மாகாணத்தில் இருக்கக்கூடிய இராணுவத்தினுடைய பிரசன்னத்தைக் குறைத்தே ஆகவேண்டும்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි.

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
මම අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

மாண்புமிகு ஜனாதிபதி அநுர குமார திஸாநாயக்க அவர்கள் தன்னுடைய முதலாவது வரவு செலவுத்திட்ட உரையிலே 2030ஆம் ஆண்டில் நாட்டிலுள்ள இராணுவத்தினுடைய தொகையை 250,000இல் இருந்து 100,000ஆகக் குறைப்பதாகக் குறிப்பிட்டிருந்தார். அவ்வாறு செய்வதாக இருந்தால், அதை அவசரமாகச் செய்வதனூடாக, அதாவது இராணுவத்தின் தொகையில் கணிசமான மாற்றம் வந்திருப்பதாகத் தெரிந்தால், குறிப்பாக இங்கே வாழுவதற்குப் பயந்து, உயிர் அச்சுறுத்தல் என்று நினைத்து, வெளிநாட்டுக்குப் புலம்பெயர்ந்திருக்கின்ற தமிழ் மக்களுக்குத் தாங்கள் பாதுகாப்பாக வந்து செல்லலாம் என்ற அந்த நம்பிக்கை வரும். எங்களுடைய நாட்டின் சொந்த மக்கள், எமது யாழ்ப்பாண மண்ணைச் சார்ந்த மக்களே மிகப்பெரிய அளவிலே யாழ்ப்பாணத்துக்கு விஜயம் செய்வதற்கு மட்டுமல்ல, மேலதிகமாக முதலீடு செய்து, நிரந்தரமாக ஏதோவொரு வகையிலே அவர்களுடைய இருப்பை இங்கு தக்கவைப்பதற்கும்கூட எதிர்பார்க்கின்றார்கள். அந்த வகையிலே, கௌரவ றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி அவர்கள் இந்த விடயத்தில் அக்கறை எடுப்பது மாத்திரமன்றி, அவருடைய அரசாங்கத்தின் உதவியுடன் இரண்டு விடயங்களிலும் மேலதிகமான அக்கறையை எடுத்தாலே, கணிசமான முன்னேற்றத்தை நாங்கள் அடையலாம் என்று நான் சொல்லிவைக்க விரும்புகின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
පිළිතුරු කථාව, ගරු (මහාචාර්ය) රුවන් රණසිංහ නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[3.50 p.m.]

**ගරු (මහාචාර්ය) රුවන් රණසිංහ මහතා (සංචාරක නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) ருவன் ரணசிங்ஹ - சுற்றுலாப் பிரதி அமைச்சர்)
(The Hon. (Prof.) Ruwan Ranasinghe - Deputy Minister of Tourism)
Hon. Presiding Member, first of all, I would like to thank the Hon. (Dr.) Rajeevan Jeyachandramoorthy for bringing this important and timely Adjournment Motion to the attention of this House today and secondly, to all the other Hon. Members who put forward their views, ideas and suggestions as to how we need to work together for tourism development in the entire Northern region, I would say, rather than referring to it just as Jaffna.

At the same time, I would like to inform this House of the plans and some of the activities we have been carrying out for developing tourism. I would also like to say that specifically the Hon. Ramalingam Chandrasekar, the Chairman of the DCC of Jaffna, the Governor of the Northern Province and Dr. J. Vivekanandan, the Chairman of the Tourism Development Bureau of the Northern Province have developed a Strategic Plan for tourism development in the Northern Province, based on which we are actually launching all our development work there.

Sir, the Northern Province, including the Jaffna District, has already been recognized as an area of immense tourism value due to its unique religious, cultural and environmental diversity. We recognize the profound potential of developing the tourism sector in the Jaffna District, capitalizing on the cultural identity of its communities, ecologically significant locations and the rich cultural heritage. This strategic focus would not only uplift the regional economy, but would also contribute vital foreign exchange for the national economy.

In terms of 2025, we have completed more than Rs. 50 million worth of development projects there. Specifically in the area of the Point Pedro Light House, for provision of sanitary facilities, water supply and landscaping, we have spent Rs. 8.85 million. Then, in the area where the Baobab tree is in the Delft Island, for construction of a retail outlet, renovation of toilets, installation of seating facilities and water supply, Rs. 8.99 million had been spent. Then, if we take the Puliyammunai Lagoon, we have spent Rs. 10 million on facilities for tourists. Also, for the purchase of a passenger boat for the Kokkilai Eco Tourism site in the Kokkilai Lagoon, we have spent Rs. 10 million and Rs. 15 million for the development and restoration work of the Mannar Dutch Fort.

Sir, I refute some of the points that the Hon. Members from the Opposition put forward saying that this Government is not working towards the development of tourism in the Northern region, including Jaffna. Actually, we have identified Jaffna as an area which had suffered with less investments, poor infrastructure for development projects and due to lack of entrepreneurial motivation for the local crowd. That happened in the past, but, as I said, immediately after the present Government took office, we asked all the provinces to develop strategic plans for tourism development. The Northern Province has now completed that task and based on that, we keep on investing.

In terms of air transportation, the Jaffna Airport is an international airport and at the moment, the Indigo Airline is operating a number of flights directly from India to Jaffna. Also, our Government is now working with the World Bank to develop domestic aviation. We have called for a report, on which the World Bank is working. In fact, that is a comprehensive report which focuses not only on Jaffna, but on the entire Island, considering the market potential, the economic viability and all such factors that we have. That comprehensive

report will be submitted to the Government very soon and, based on that, we will start our work on domestic aviation. At the moment, there are a few private companies working on air transportation. But, as the Government, our involvement would mainly be based on that report because we are not facilitating just one place, but we need to work on a long-term strategic plan, relating to which we are waiting for the World Bank's report. So, I would like to mention that our Government is continuously working on developing domestic aviation.

For 2026, there are a number of projects planned. For the Jaffna District, Rs. 215 million has been allocated for tourism and related development projects.There are altogether 16 plus projects in this whole package. To mention a few, for the construction of new sanitary facilities at Nakuleswaram Beach, Karainagar, Rs. 10 million has been allocated; for Kankesanthurai Beach development, another Rs. 10 million has been allocated and another Rs. 40 million has been allocated for infrastructure development at Casuarina Beach area, Karainagar. Likewise, there are 16 such projects and as I said, altogether, Rs. 215 million has been allocated for development of tourism-related infrastructure and facilities in those areas. Therefore, as I said, based on that comprehensive long-term development plan, we are working on several projects.

In terms of human capital development, we launched a project with the Department of Samurdhi Development to attract the unemployed youth to the tourism industry. Under that project, the Sri Lanka Institute of Tourism and Hotel Management is actively running the Hotel Operations Multitasker Course relating to the hospitality sector. Actually, six months back, we launched that programme and 82 youth from the Jaffna District and 64 from Kilinochchi have completed this course, and we have directed them for employment. Currently, there are 105 students from the Jaffna District and 80 students from the Kilinochchi District following the course, whom we will direct very soon to the tourism and hospitality sector for employment as well. For the upcoming batch in August, we are planning to recruit 100 from the Jaffna District and another 100 from the Kilinochchi District. So, in terms of human capital development also, we have prioritized the Northern Province, including the Jaffna District. We believe that we would be able to get many youth, who had dealt with weapons for decades, employed in growing sectors like tourism. At the same time, we have secured a land from Jaffna to establish a full-fledged hotel school so that we could run comprehensively all such programmes at that place. And, we would look for investment, particularly from the diaspora in the coming years, once all legal procedures for vesting these lands are over.

Also, I would like to highlight a few more measures that our Government has taken in terms of economic revival, tourism development and socioeconomic well-being of our communities, specifically in the North. As you know, some views have been expressed criticising the Government for not doing that.

Not so long ago, Sri Lanka faced one of the most severe economic crises in its history; our country was declared bankrupt, businesses struggled to survive and families faced immense hardships. We were having the lowest growth rate in the region. But, today, we are witnessing a remarkable turnaround. Through economic reforms, fiscal discipline and renewed confidence, Sri Lanka has begun to recover and is now recognized as one of the fastest-growing economies in the region. So, we have been able to transform that negative trend with that of a positive note.

Jaffna, despite its enormous human potential, strategic location and entrepreneurial spirit, continues to bear the scars of decades of conflict and struggle with underinvestment. For far too long, they have lagged behind in development. Many talented youth continue to leave the country in search of better opportunities elsewhere. Therefore, it is time to change that story. We have an opportunity to transform Jaffna into a vibrant centre of innovation, tourism, agriculture, fisheries, education, technology and so forth. So, to achieve that, we need investments to create jobs, support local businesses and empower our communities.

This is why I extend a heartfelt invitation to our Tamil diaspora across the world: you have always remained connected to your roots; your support has sustained families and communities through difficult times and today, I invite you to become partners in Jaffna's next chapter, not only by contributing financially, but by investing your knowledge, experience, technology and introducing us to global networks. Investing in Jaffna is not simply an economic decision, but an investment in our people, our heritage and our shared future. Together, we all could build an economy that offers opportunities for our youth, encourages innovation and ensures that prosperity reaches every family.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, නියමිත කාලය අවසානයි. කථාව අවසන් කරන්න.

**ගරු (මහාචාර්ය) රුවන් රණසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ருவன் ரணசிங்ஹ)
(The Hon. (Prof.) Ruwan Ranasinghe)
I am winding up, Sir.

The future of Jaffna depends on all of us, including the Government, the private sector, the local entrepreneurs and our global diaspora, and working together with a common vision. So, let us seize this moment and transform recovery into lasting prosperity; let us build a stronger Jaffna that contributes to a stronger Sri Lanka.

Once again, I extend my appreciation for bringing up this important Private Members' Motion before the House. As the Ministry and the Government, we are moving on to fulfil the aspirations of our people in Jaffna.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මන්ත්‍රීතුමා. ඔබතුමාට අදහස් දැක්වීමට විනාඩි පහක කාලයක් තිබෙනවා.

[4.01 p.m.]

**ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා**
(மாண்புமிகு றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி)
(The Hon. Rajeevan Jeyachandramoorthy)
Hon. Presiding Member, I would like to extend my sincere gratitude to the Hon. Deputy Minister (Prof.) Ruwan Ranasinghe. He is very concerned about developing tourism in the Northern Province, especially in Jaffna. He also mentioned several projects that the Government has been carrying out so far in the Northern Province. So, we are really happy.

At the same time, I would like to bring some concerns that we have to his attention. Why I have brought in this Private Members' Motion is because the NPP Government is now in power. Earlier, during the previous Governments, the Northern Province, including Jaffna, had been isolated and rejected without developing the city. For decades, our people suffered a lot due to conflicts and the civil war; they were displaced from place to place and lost their properties and everything they had. Now, we have got an opportunity to develop our area. I am a Representative of Jaffna and the Northern Province.

Hon. Members, including the Hon. (Dr.) S. Sri Bavanandarajah and the Hon. K. Ilankumaran, mentioned about the need to develop Jaffna. From the Opposition, the Hon. Amirthanathan Adaikkalanathan, the Hon. Kaveenthiran Kodeeswaran and the Hon. G.G. Ponnambalam also expressed their concerns regarding development in the Northern and Eastern Provinces. I would also like to say that all the Hon. Members have suggested that we have to promote Sri Lanka as a tourist destination because Sri Lanka is a beautiful country and most of the people in the world like to visit Sri Lanka.

Earlier, the Hon. K. Ilankumaran mentioned about Malai Theevu. Some Hon. Members also mentioned about Pottuvil, Mannar, Kilinochchi and Mullaitivu. Those places also have a high potential to attract tourists. Then, the Hon. Deputy Minister mentioned that the Governor of the Northern Province, the Chairman of the DCC and the Chairman of the Northern Province Tourism Development Bureau have prepared a strategic plan to develop Jaffna and the Northern Province. Some Hon. Members mentioned about the need to develop the Palaly Airport.

நான் இதனைத் தமிழிலும் சொல்ல விரும்புகின்றேன். பலாலி விமான நிலையத்தை விஸ்தரிக்க வேண்டுமென்று கூறியிருந்தார்கள். அதேபோன்று காங்கேசன்துறைத் துறைமுகத்தின் அபிவிருத்தியை மேற்கொள்வதோடு, யாழ்ப்பாணத்துக்கான புகையிரத சேவையையும் வலுப்படுத்தவேண்டிய தேவை இருக்கின்றது. உல்லாசப் பிராயாணிகளுக்குச் சிறந்த பாதுகாப்பை வழங்க வேண்டியிருக்கின்றது. எனவே, பாதுகாப்பு சம்பந்தமாகவும் நாங்கள் நடவடிக்கையெடுக்க வேண்டியிருக்கின்றது. எங்களுடைய தேசிய மக்கள் சக்தி அரசாங்கம் கடந்த காலங்களில் இல்லாத அளவுக்குப் பாரியளவு நிதியை வட மாகாணத்திற்கு ஒதுக்கியிருக்கின்றது. அதை உண்மையிலே தமிழ் மக்களாகிய நாங்கள் உணர்ந்துகொள்ள வேண்டும். அதேபோன்று இனிவரும் காலங்களிலும் இந்த ஒதுக்கீட்டை அதிகரித்து, வட மாகாணத்தையும் உல்லாசப் பிரயாணிகள் வந்து பார்ப்பதற்கான ஒரு வாய்ப்பை ஏற்படுத்த வேண்டும். ஏனென்றால், இலங்கை உல்லாசப் பயணத் துறைக்கான வாய்ப்புகளை அதிகமாகக் கொண்டது. குறிப்பாக, அழகான கடற்கரைப் பிரதேசங்களைக் கொண்டிருக்கின்றது. அண்மையில் நான் பார்படோஸ் என்ற நாட்டுக்குச் சென்றிருந்தேன். அந்த நாட்டில் எதுவுமே இல்லை. ஆனால், அந்த நாட்டில் தனிநபர் வருமானம் அதிகமாக இருக்கின்றது. ஆனால், இலங்கையிலே கடல் வளம் மற்றும் இயற்கை வளங்கள் அதிகமாகக் காணப்படுகின்றது. ஆனால், எங்களுடைய நாட்டிலே தனிநபர் வருமானம் அவ்வாறு இல்லை. எனவே, எமது நாட்டில் உல்லாசப் பயணத் துறையை மேம்படுத்துவதன் ஊடாகத்தான் நாட்டை முன்னேற்ற முடியும் என்பதைக் குறிப்பிட விரும்புகின்றேன்.

இந்த ஆடி மாதத்திலே ஆடிப்பிறப்பு வருகிறது. இந்த மாதத்திலே அதிகளவான உல்லாசப் பிரயாணிகள் யாழ்ப்பாணம் வருகிறார்கள். எனவே, இந்து அமைப்புகள் மற்றும் ஏனைய அமைப்புகள் எல்லாம் சேர்ந்து இந்த ஆடிப்பிறப்புத் தினத்தை ஒரு பொதுவிடுமுறை தினமாக அறிவிக்க வேண்டுமென்று வேண்டுகோள் விடுத்திருக்கிறார்கள். அவ்வாறு செய்வதன் ஊடாக அதிகளவான சுற்றுலாப் பிரயாணிகளை இங்கே வரவழைக்கக்கூடியதாக இருக்கும். ஏனென்றால், கூடுதலான ஆன்மிகப் பயணம் மேற்கொள்ளும் பயணிகள் இந்தியாவிலிருந்தும் வருகிறார்கள். எனவே, அவ்வாறானவர்களைக் கவர்ந்திழுந்து எதிர்காலத்திலே யாழ்ப்பாணம் மாவட்டம் உட்பட வடக்கு, கிழக்கு மாகாணங்களை tourismஇல் நல்ல நிலையை அடையச் செய்வதன்மூலம் இலங்கையை வருமானம் பெறுகின்ற நாடாக நாங்கள் மாற்றுவோம் என்று கூறி, இந்தப் பிரேரணையை முன்வைப்பதற்கு வாய்ப்பு வழங்கியமைக்கு மீண்டும் நன்றி கூறி, விடைபெற்றுக் கொள்கின்றேன்.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා (ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே - கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சர்)
(The Hon. (Dr.) Upali Pannilage - Minister of Rural Development, Social Security and Community Empowerment)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු චන්දිම හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් ලැබෙනවා.

## ශ්‍රී ලංකාව ලොව ප්‍රමුඛ සංචාරක ගමනාන්තයක් බවට පත් කිරීමේ ජාතික වැඩ පිළිවෙළක්
## இலங்கையை உலகின் முன்னணி சுற்றுலாப் பயண முடிவிடமாக ஆக்குவதற்கான தேசிய வேலைத்திட்டம்
NATIONAL PROGRAMME TO TRANSFORM SRI LANKA INTO A LEADING GLOBAL TOURISM DESTINATION

[අ.භා. 4.07]

**ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා**
(மாண்புமிகு சந்திம ஹெட்டிஆரச்சி)
(The Hon. Chandima Hettiaratchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "ශ්‍රී ලංකාවේ දේශීය ආර්ථිකය නැවත ගොඩනැඟීමේ සහ විදේශ විනිමය ඉපැයීමේ ප්‍රධානතම මාර්ගයක් වන්නේ සංචාරක කර්මාන්තයයි. පවතින සාමකාමී වටපිටාව තුළ මෙරටට පැමිණෙන විදේශීය සංචාරකයන්ගේ සංඛ්‍යාව ශීඝ්‍රයෙන් ඉහළ නැංවීම සඳහා සාම්ප්‍රදායික සහ පොදු ප්‍රචාරණ ක්‍රමවේදවලින් බැහැරව, පැමිණෙන සහ ඉලක්කගත සංචාරකයන්ගේ සංස්කෘතික, සමාජයීය සහ ආර්ථික පසුබිම සහ ඒ ඒ සංචාරක කණ්ඩායම්වල පොදු රුචි, අරුචිකම් නිවැරදිව හඳුනාගෙන, ඒ ඒ රටවලට ගැළපෙන පරිදි වෙළෙඳ පොළ ඉලක්ක කරගත් විශේෂිත සංචාරක සැලසුම් -market-specific strategies- සකස් කර ක්‍රියාවට නැංවිය යුතුය.
>
> ඒ අනුව, ලෝකයේ විවිධ කලාපයන්ට ගැළපෙන පරිදි විද්‍යාත්මක උපායමාර්ගික සැලසුම් සකස් කිරීමටත්, ඒ හරහා ශ්‍රී ලංකාව ලොව ප්‍රමුඛතම ගමනාන්තයක් බවට පත් කිරීමේ ජාතික වැඩ පිළිවෙළක් දියත් කළ යුතු බවටත් මම මේ ගරු සභාවට යෝජනා කරමි."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ අවස්ථාවේ කැමැතියි, මේ යෝජනාව ගෙන ඒමේ අරමුණ ඉතාම කෙටියෙන් පැහැදිලි කරන්න.

ඇත්තටම ශ්‍රී ලංකා රාජ්‍යයේ ප්‍රධාන ආදායම් මාර්ගයක් විධියට, ප්‍රධාන කුලුනක් විධියට තිබෙන සංචාරක ව්‍යාපාරය තවදුරටත් සංවර්ධනය කරලා, එමඟින් ආදායම් ඉහළ නැංවීම තමයි මේ යෝජනාව මේ ගරු පාර්ලිමේන්තුවට ගෙන ඒමේ මූලික අරමුණ වුණේ. ඒ සඳහා අවධානය යොමු කරවීම තමයි අපේ අරමුණ. පසුගිය 2025 අවුරුද්ද විතරක් සලකා බැලුවත් 2024 වසරට වඩා 2025 ජනවාරි මාසයේ සියයට 17ක සංචාරකයන් ප්‍රමාණයක් වැඩි වැඩි වෙලා තිබෙනවා. සැප්තැම්බර් මාසයේ සියයට 23කින් වැඩි වෙලා තිබෙනවා. ආදායම ගත්තොත්, ඇමෙරිකානු ඩොලර් මිලියන 3,219.25ක් බවට පත් වෙලා තිබෙනවා. 2025 වසර තමයි සංචාරක ව්‍යාපාරයෙන් වැඩිම බදු ආදායමක් උපයපු වර්ෂය වෙන්නේ. ඒ කියන්නේ Embarkation Levy එක මිලියන 5870.2කුත්, TDL එක රුපියල් මිලියන 2583.6කුත් ලෙස උපයලා තිබෙනවා.

සංචාරක සංවර්ධන අරමුදලට තමයි මේ මුදල් යන්නේ. ඒකෙන් Sri Lanka Tourism Promotion Bureau එකට සියයට 70ක්, SLTDA එකකට සියයට 14ක්, SLITHM එකට සියයට 12ක්, Sri Lanka Convention Bureau එකට සියයට 4ක් යනවා. විදේශීය සංචාරකයන් මේ රටට වැඩිපුර එනවිට ආදායම් තවදුරටත් ඉහළ යනවා.

සංචාරකයන් පැමිණෙන රටවල් ප්‍රමාණය අනුව ගත්තොත්, ඇමෙරිකාවෙන් 2024දී 102,000ක් එද්දී, 2025දී 113,000ක් එනවා. 2024 වර්ෂයේ බටහිර යුරෝපයෙන් 340,000ක් එද්දී, 2025දී 395,000ක් එනවා. 2024 වර්ෂයේ නැඟෙනහිර යුරෝපයෙන් 700,000ක් එද්දී, 2025 වර්ෂයේදී 757,000ක් එනවා. 2024 වර්ෂයේදී ආසියාවේ 759,000ක් එද්දී, 2025 වර්ෂයේදී 916,000ක් එනවා.

ඒ අය අපේ රටට එන හේතු බලමු. 2024 වර්ෂයේදී විවේකය සඳහා 800,000ක් ඇවිල්ලා තිබෙනවා. 2025 වර්ෂයේදී 1,300,000 ඇවිල්ලා තිබෙනවා. 2024 වර්ෂයේදී සම්මේලන, රැස්වීම් සඳහා 86,050ක් එද්දී 2025 වර්ෂයේදී 162,046ක් එනවා. ආගමික කටයුතුවලට 2025දී 12,033ක් ඇවිල්ලා තිබෙනවා.

අපි sites විධියට ගත්තොත්, සීගිරියට 582,000ක් ඇවිල්ලා තිබෙනවා. පොළොන්නරුවට 184,000ක්, බුදුරුවගලට 50,000ක් ඇවිල්ලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ උද්‍යාන ගත්තොත්, පේරාදෙණියට 334,000ක්, හක්ගලට 24,000ක් වාගේ විශාල ප්‍රමාණයක් ඇවිල්ලා තිබෙනවා. මේ, විදේශිකයන් පමණක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ දත්ත ඉදිරිපත් කළේ වෙන මොකක්වත් නිසා නොවෙයි. අපේ රටේ සංචාරක නිෂ්පාදන spread එක - product spread එක - ගත්තොත්, එතරම් විශාල ප්‍රමාණයක් නැති වුණාට එහි ලොකු විභවතාවක් තිබෙනවා. සංචාරක සංවර්ධන අරමුදලින් අපි product promotionsවලට වැඩිපුර මුදල් යොදවනවා වාගේම, product developmentවලටත් මුදල් යොදවන්න ඕනෑකම තිබෙනවා. එහෙම වුණොත් තමයි ලෝකයට හොඳ product එකක් promote කරන්න අපට පුළුවන්කම ලැබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට මේ සියලු දත්ත පද්ධති එකතු කරගත් National Tourism Intelligence Platform එකක් සංවර්ධන කර ගන්න අවශ්‍ය වෙනවා. එහෙම වුණොත් තමයි අපට demand forecasting කරන්න පුළුවන්කම ලැබෙන්නේ; එහෙම වුණොත් තමයි අපට price optimization කරන්න පුළුවන්කම ලැබෙන්නේ; එහෙම වුණොත් තමයි evidence-based investment decisions ගන්න පුළුවන්කම ලැබෙන්නේ. එතකොට තමයි අපට production එක through diversification ගිහිල්ලා අපේ industry එකට හොඳ ආදායමක් උපයන්න පුළුවන් තීන්දු තීරණ ගන්න පුළුවන් තැනකට අරගෙන එන්න පුළුවන් විශාල රුකුලක් දෙන්න පුළුවන්කම ලැබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කළුතර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සභාපති අමාත්‍ය නලින්ද ජයතිස්ස ඇමතිතුමා. එතුමාගේ නායකත්වයෙන් අපි අනුකමිටු පිහිටෙව්වා. සංචාරක අනුකමිටුව විධියට අපට පුළුවන්කම ලැබුණා, දිස්ත්‍රික්කයට strategic plan එකක් හදන්න. ඒක අදාළ අමාත්‍යාංශයට යොමු කරන්න අපට පුළුවන් වුණා. ඒකෙදි ජාතික ජන බලවේගය හඳුනාගත් dimensions පහක් තිබෙනවා. විශේෂයෙන්ම innovative product development and standardization කියන dimension එක යටතේ ඒකට ගැළපෙන පරිදි සකස් කරලා, අමාත්‍යාංශයටත් යවලා, අපි දැන් ඒකට මුදල් වෙන් කර ගන්න බලාපොරොත්තුවෙන් ඉන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ යෝජනාව ගෙන එන්නේම වෙන මොකක්වත් නිසා නොවෙයි, අපට මේ වැඩේ කරන්න පුළුවන්කම තිබෙන නිසා. අපේ රටේ ප්‍රධානම ගැටලුවක් විධියට තිබෙන්නේ මේ දේයි. අපි ලෝකයට යමක් කියන්නට

අවශ්‍යයි. ඒ දේ කියද්දී අපේ රටේ නිෂ්පාදනයක් කරලා ඒ product එක develop කරලා තිබෙන්න අවශ්‍යයි. හංගේරියාවේ කථානායකවරයා අපේ රටට ආපු වෙලාවේ wellness tourism promote කරන්න කථා කළා, ඒගොල්ලන් ඉන්දියාව සමඟ direct flights පටන් ගත්ත නිසා. ලංකාවට එන්න කියලා ආරාධනා කරද්දී අපි මෙතැන නිෂ්පාදනය කරලා තිබෙන්න අවශ්‍යයි. ඒක නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි අමාත්‍යතුමාගේ විශේෂ අවධානය මේ කාරණයට යොමු කරවන්න කැමැතියි. මේ යෝජනාව තුළින් අපි ප්‍රධාන ලෙසම කලාප ලෙස ලෝකය වෙන් කරලා, ඒ, ඒ කලාපයට ගැළපෙන market-specific strategies හදලා, ඒකට ගැළපෙන product එකක් අපේ රටේ develop කරලා, අපේ රටේ tourism ඉස්සරහට අරගන්න ඕනෑ. ඒ තුළින් මේ රටේ රාජ්‍ය ආදායම ඉහළ නංවාගන්න පුළුවන්. එවැනි විශේෂ තැනකට මේ කටයුතු අරගෙන එන්න පුළුවන් කියන යෝජනාව කරමින්, කාලය ලබා දුන්නාට ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
යෝජනාව ස්ථිර කිරීම, ගරු ටී.කේ. ජයසුන්දර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 3ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.13]

**ගරු ටී.කේ. ජයසුන්දර මහතා**
(மாண்புமிகு ரீ.கே. ஜயசுந்தர)
(The Hon. T.K. Jayasundara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු චන්දිම හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉතාම වැදගත්, කාලෝචිත යෝජනාව මම ස්ථිර කරනවා. මේ වෙනුවෙන් කරුණු දක්වන්න අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. විශේෂයෙන්ම කළුතර දිස්ත්‍රික්කයට යාබද ගාල්ල දිස්ත්‍රික්කය තමයි මම නියෝජනය කරන්නේ. ගාල්ල දිස්ත්‍රික්කය කියන්නේ, සංචාරක ක්ෂේත්‍රයේ ඉහළ ආදායම් ලබන සහ ඒ සඳහා විවිධ විභවතා තිබෙන දිස්ත්‍රික්කයක්.

කවුරුත් පිළිගන්නවා, මේක අපේ රටේ සංචාරක ව්‍යාපාරය ඉහළම මට්ටමකට යමින් තිබෙන අවස්ථාවක් කියලා. සමහර විට තව වසර 5ක් විතර යනකොට අපේ රටේ ප්‍රධාන ආදායම් මාර්ගය බවට පත් වෙන්න පුළුවන්කම තිබෙනවා, මේ සංචාරක ව්‍යාපාරය. එතුමාගේ මේ යෝජනාවේ හරය තමයි, අපේ රටේ සංචාරක ව්‍යාපාරය සඳහා වෙළෙඳ පොළ ඉලක්ක කරගත්ත උපාය මාර්ගික සැලැස්මක් සකස් කරන්න කියන එක. ඒක තව විධියකට කිව්වොත් මේ ගැන හොඳින්ම අධ්‍යයනය කරලා මේක සංයුක්ත වැඩ පිළිවෙළක් බවට පත් කරන එක. එතුමා කියපු විශේෂ දේ තමයි, අපේ රටේ සංචාරක කලාප ටික අපි හොඳින් හඳුනාගන්න එක ඉතා වැදගත් කියන එක. ඊයේ පෙරේදාත් අපි අපේ ප්‍රදේශයේ එක සංචාරක කලාපයක් හඳුනාගත්තා. විශේෂයෙන්ම රත්නපුර, ගාල්ල, මාතර කියන දිස්ත්‍රික්ක ටික එකතු කරගත්ත Southern Mist Triangle කියන සංචාරක කලාපය දිස්ත්‍රික්ක තුනක් එකතු කරගත්ත අලුත් සංචාරක කලාපයක් විධියට අපි හඳුනාගත්තා. විශේෂයෙන්ම සර්ම කලාපීය සදාහරිත තෙත් වනාන්තරයකින් හෙබි සිංහරාජය, කන්නෙලිය, හිනිදුම් කන්ද කියන ප්‍රදේශ අයත් කලාපය සංචාරක කලාපයක් හැටියට අපි අලුතින් නම් කර තිබෙනවා.

මෙතැනදී අපි ඉලක්ක කරගන්න ඕනෑ, සංචාරකයා එන්නේ කුමකටද කියන කාරණය. ඒගොල්ලෝ බලාපොරොත්තු වෙන්නේ මොකක්ද? සමහර අය එන්න පුළුවන් පුරාවිද්‍යාත්මක දේවල් දකින්න. සමහර අය එන්න පුළුවන් අපේ මුහුදුබඩ ප්‍රදේශවල තිබෙන සුන්දරත්වය දකින්න. සමහර අය එන්න පුළුවන්, කුරුඳු සහ තේ පිළිබඳ තිබෙන ආකර්ෂණය නිසා. සමහර අය මැණික්වලට ආකර්ෂණය වෙලා එන්න පුළුවන්. සමහර අය එන්න පුළුවන්, විනෝදාස්වාදය සඳහා. තව සමහර අය එන්න පුළුවන්, අපේ රටේ ධර්මය ඉගෙන ගන්න. අපේ රටේ බෞද්ධ දර්ශනය සම්බන්ධයෙන් ලෝකයේ රටවල විශේෂ ලෙන්ගතුකමක් තිබෙනවා. එතකොට ඒගොල්ලන් එන්න පුළුවන්, නිර්මල බුද්ධ ධර්මය පිළිබඳ හදාරන්න. සමහර අය යෝගාවලට එන්න පුළුවන්. ඒ විවිධ ආකාරයට එන්න පුළුවන්. මෙන්න මේ එන අය තේරුම් අරගෙන ඒ අය සඳහා වූ සුවිශේෂී වැඩ පිළිවෙළක් අපි සකස් කරන්න ඕනෑ. මේ සංචාරක ව්‍යාපාරය පිළිබඳව අපේ රටේ ජනතාව තුළ ආකල්පමය වෙනසක් වෙලා තිබෙනවාද කියන එක බලන්න ඕනෑ. සංචාරක ව්‍යාපාරය සඳහා අපේ රටේ හැම කෙනෙකුටම මානසිකව සූදානමක් තියෙන්න ඕනෑ. අපි ඒ සඳහා ඉක්මනින් වැඩ පිළිවෙළක් සකස් කරන්න ඕනෑ. මේ සංයුක්ත සැලැස්ම ඇතුළේ ඒක තිබෙන්න ඕනෑ.

දෙවැනි කාරණය මෙයයි. විශේෂයෙන්ම අපේ රටේ ව්‍යවසායකයා මේ සඳහා සූදානම් කරන්න ඕනෑ. මම ඉස්සෙල්ලා කියපු කාරණා දෙකම කියන්නේ මේ නිසායි. අපේ රටේ මුහුදු බඩ ප්‍රදේශයේ සහ හැම තැනම අනවසර ඉදිකිරීම් තිබෙනවා. සංචාරක ව්‍යාපාරය පිළිබඳ ජනතාවට හොඳ ආකල්පයක් තිබෙනවා නම් මේ අනවසර ඉදිකිරීම් කෙරෙන්නේ නැහැ. ව්‍යවසායකයන්ට හොඳ, පාරිශුද්ධ හැඟීමක් තිබෙනවා නම් ඔය අනවසර ඉදිකිරීම් කරන්නේ නැහැ. ඒගොල්ලන් තම තමන්ගේ කලාපවලට ආවේණික සිද්ධාන්ත තේරුම් අරගෙන වැඩ කරනවා නම්,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු ටී.කේ. ජයසුන්දර මහතා**
(மாண்புமிகு ரீ.கே. ஜயசுந்தர)
(The Hon. T.K. Jayasundara)
මම විනාඩියකින් අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ විතරක් නොවෙයි, තවම අපේ අධ්‍යාපන පද්ධතිය මේ සඳහා හරියට සූදානම් කරලා නැහැ. 13 වසරක අධ්‍යාපනය කියන එක ඇතුළේ මේ ගැන චුට්ටක් තිබෙනවා. හැබැයි ඒක ප්‍රමාණවත් නැහැ. ඒ නිසා සංචාරක ව්‍යාපාරය සඳහා වෙච්ච අධ්‍යාපන පද්ධතියක් අවශ්‍යයි. ප්‍රජා සංවර්ධන සභා සෑම ගමකම තිබෙනවා. අන්න ඒ ප්‍රජා සංවර්ධන සභාවල යම් නියෝජිතයෙක් පත් කරලා ඒගොල්ලන්ට සංචාරක ව්‍යාපාරයේ වැදගත්කම පිළිබඳව දැනුම දෙන වැඩ පිළිවෙළක් මේ සංයුක්ත වැඩ පිළිවෙළ ඇතුළේ තිබෙන්න ඕනෑ. අවසාන වශයෙන්, ගරු චන්දිම හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු සංචාරක ව්‍යාපාරය සඳහා දැවැන්ත සංයුක්ත සැලැස්මක් අපට අවශ්‍යයි කියන යෝජනාව නැවතත් ස්ථිර කරමින් මා නිහඬ වෙනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ජගත් මනුවර්ණ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 3ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.17]

**ගරු ජගත් මනුවර්ණ මහතා**
(மாண்புமிகு ஜகத் மனுவர்ண)
(The Hon. Jagath Manuwarna)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු චන්දිම හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු මේ යෝජනාව ඉතා කාලීන වාගේම ඉතා වැදගත් යෝජනාවක්. විශේෂයෙන්ම ලංකාවේ ආර්ථිකය ගොඩනැඟීම අරමුණු කරගෙන සංචාරක ක්ෂේත්‍රය දියුණු කිරීමේදී විශේෂ සැලසුම් සහිතව ඒ ගමන යන්න ඕනෑය කියන එක විවාදයකින් තොරව අපි පිළිගන්න ඕනෑ. මේ යෝජනාව සම්බන්ධයෙන් මේ සභාවේ ඉදිරිපත් වුණු කාරණාවල තිබෙන්නේ ටිකක් පුළුල්ව මේ ක්ෂේත්‍රය දිහා බලන macro එළඹුමක්. නමුත් මෙතැනින් පහළට ඇවිල්ලා බැලුවාම පෙනී යනවා, නව සංචාරක ගමනාන්ත බිහිවෙන්නේ රජයේ මැදිහත්වීම, එහෙම නැත්නම් මේකට අදාළ ආයතනවල මැදිහත්වීමෙන්ම නොවෙයි කියලා. අද ලෝකයේ සමාජ මාධ්‍ය භාවිත කරන, එහෙම නැත්නම් travel කරන තරුණ ප්‍රජාව හොයාගන්න ගමනාන්ත බොහොමයක් තිබෙනවා. ඒවා සැලසුම්සහගතව අපි ගිහිල්ලා හොයාගන්න ඒවා නොවෙයි. ලංකාව වාගේ රටක නම් මේ වාගේ හොයාගත්ත ස්ථාන බොහෝ වෙලාවට ජනමාධ්‍යවල හෝ කොහේ හෝ තැනක ජනප්‍රිය වූ තැන් නොවෙයි. ඒවා ගම් අස්සේ, එහෙම නැත්නම් කැලෑ අස්සේ තිබෙන ගමනාන්ත. ඒවා මුලින්ම ජනප්‍රිය වෙන්නේ හෝ ඒවා හොයා ගන්නේ දේශීය සංචාරකයන් නිසා. අපි විදේශීය සංචාරකයන් ගැන කථා කරනවා වාගේම, දේශීය සංචාරක කර්මාන්තයේත් යම් විභවයක් තිබෙනවා ලෝකයට මේ ස්ථාන විවෘත කිරීමට. එහෙම නැත්නම් ඒවා සම්බන්ධයෙන් පණිවුඩ අරගෙන යෑමට. එවැනි වගකීමක් සහ එයට අදාළව මැදිහත් වීමේ හැකියාවක් දේශීය සංචාරකයන්ට තිබෙනවා.

මා ජීවත් වෙන මහනුවර ප්‍රදේශයේ අපේ ගම් පළාතේ හේවාහැට ආසනය ගත්තොත්, ඉතාම මෑතක බෙල්වුඩ් කියන ප්‍රදේශයේ එක තැනක් බෙහෙවින්ම ජනප්‍රියත්වයට පත් වුණා, social mediaවල දාපු පොඩි post එකක් නිසා. අද වනකොට විශාල පිරිසක් මේ පැතිවලට එනවා. අලුතින් හොයා ගන්නා ගමනාන්ත හෝ ඒ තැන්වලට වග කියන ආයතනය බවට පත් වෙන්නේ අපේ රටේ පළාත් පාලන ආයතන. විශේෂයෙන් ප්‍රාදේශීය සභා. මේ ප්‍රාදේශීය සභාවල මැදිහත් වීම හොඳින් කෙරුණේ නැත්නම් යටිතල පහසුකම් වෙන්න පුළුවන්, අනෙකුත් දේවල් වෙන්න පුළුවන් ඒ කිසි දෙයක් සිද්ධ වෙන්නේ නැහැ. නමුත්, අවාසනාවකට සමහර,-

විශේෂයෙන් පාතහේවාහැට ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා ඊයේ අත්අඩංගුවට පත් වුණා. ඔහුගේ නම ආර්.එම්.කේ.එස්.බී. රාජනායක. ඔහු 2012 වර්ෂයේ මාළු ලැල්ලකින් කප්පම් අරගෙන, අල්ලස් අරගෙන. මාළු ලැල්ලකින් අල්ලස් අරගෙන තිබීම නිසා ඔහුට විරුද්ධව උසාවියේ නඩුවක් තිබුණා. 2022 වර්ෂයේදී ඔහුට වසර 6ක සිර දඬුවමක් නියම වුණා, වසර තුනකින් ගෙවිලා නිම වෙන්න. නමුත්, Appeal Court එකේ නඩුව ගියා. මීට මාසයකට විතර කලින් ඒ case එක නිෂ්ප්‍රභ - dismiss - වුණා. ඊට පස්සේ ඔහු සිරගත වෙන්න නියමිතයි. නමුත්, ඔහු - මේ සභාපතිවරයා - පනිනවා.

අපි ඒ සභාවේ ආසන 18ක් ජයග්‍රහණය කළා. සමගි ජන බලවේගය ආසන හයයි ජයග්‍රහණය කළේ. ඒ අයට bonus seats හයක් හම්බ වුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔවුන්ට ඒ සභාව පිහිටුවීම සඳහා පොහොට්ටුවේ ඡන්ද තුනත් දුන්නා. පොහොට්ටුවේ ඡන්ද තුනත් දීලා තමයි ඔහු සභාපතිවරයා බවට පත් කළේ. ඔහු පොලීසියට බයේ පැනලා ගියා. පොලීසියෙන් ඊයේ තමයි කොළඹ නුවර බස් එකකදී ඔහුව අත් අඩංගුවට ගත්තේ. මම හිතන විදියට ඔහු උසාවියට ඉදිරිපත් කරන්නේ අද. ඉස්සරහටත් තව ඒ වාගේ සභාපතිලා වෙන්න බලාපොරොත්තුවෙන් ඉන්න අයත් මෙහෙම වුණොත් මොකද වෙන්නේ?

මේ රටේ මාළු ලැල්ලෙන් කප්පම් ගන්න මිනිස්සු ප්‍රාදේශීය සභාවල සභාපති බවට පත් කළාට පස්සේ මේ රටේ සංචාරක කර්මාන්තය නොවෙයි, කිසි දෙයක් ගොඩ දමන්න බැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසානයි. කථාව අවසන් කරන්න.

**ගරු ජගත් මනුවර්ණ මහතා**
(மாண்புமிகு ஜகத் மனுவர்ண)
(The Hon. Jagath Manuwarna)

හොඳමයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අපි ඉදිරියේදී මේ සභා නැවත පත් කරනවා. අර වාගේ හොරු, තක්කඩි මේවාට ගෙනාවාම සංචාරක කර්මාන්තය නොවෙයි කිසි දෙයක් අපට ගොඩ දාන්න වෙන්නේ නැහැ. ඒ නිසා ඒ තනතුරුවලට මිනිස්සු පත් කරද්දී, ඒ අයට සහාය දක්වද්දී ඒ සභාවල සිටින මන්ත්‍රීතුමන්ලා ආපහු සැරයක් ඒ ගැන හිතන්න ඕනෑ. තමන්ගේ ප්‍රදේශයේ, පළාතේ සංවර්ධනය උදෙසා මැදිහත් වෙනවා නම් හොරු, තක්කඩි, කප්පම්කාරයෝ පත් කර ගන්නේ නැතිව, ඒවාට සුදුසු මනුස්සයෙක් පත් කර ගන්න ඕනෑ කියන එක තමයි මගේ අදහස, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට පිළිතුරු කථාව, ගරු රුවන් රණසිංහ නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.22]

**ගරු (මහාචාර්ය) රුවන් රණසිංහ මහතා (සංචාරක නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) ருவன் ரணசிங்ஹ - சுற்றுலாப் பிரதி அமைச்சர்)
(The Hon. (Prof.) Ruwan Ranasinghe - Deputy Minister of Tourism)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතාම කාලෝචිත කාරණයක් මේ සභාවේ අවධානයට යොමු කිරීම ගැන ගරු චන්දිම හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමාට, ඒ වාගේම අපේ ගරු ටී.කේ. ජයසුන්දර මන්ත්‍රීතුමාට සහ ගරු ජගත් මනුවර්ණ මන්ත්‍රීතුමාට මා ස්තුතිවන්ත වෙනවා.

අපි දන්නවා, සංචාරක කර්මාන්තය අභියෝග හමුවේ ඉදිරියට ආපු කර්මාන්තයක් බව. විශේෂයෙන් ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයට කිසි අභියෝගයක් නැතිව සාර්ථකව ඉදිරියට ආපු ගමනක් නොවෙයි තිබෙන්නේ. ඊට විවිධ අභියෝග තිබුණා. සුනාමිය, යුද්ධය, බෝම්බ පිපිරීම් ආදී දැවැන්ත අභියෝග හමුවේ තමයි මේ ගමන ඇවිල්ලා තිබෙන්නේ කියලා අපි දන්නවා. නමුත්, ගරු චන්දිම හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා කිව්වා වාගේම අපට 2025, 2026 ජනවාරි, පෙබරවාරි සහ මැයි කියන මාසවලදී ඉතිහාසගත සංචාරක පැමිණීම් වාර්තා කරන්න පුළුවන් වුණා.

ජගත් මනුවර්ණ මන්ත්‍රීතුමාගේ කථාවට මම සම්පූර්ණයෙන් එකඟ වෙනවා. මේ කර්මාන්තය තනියම පවතින්න පුළුවන් එකක් නොවෙයි.

මම සති දෙකකට කලින් සංචාරක ප්‍රවර්ධන වැඩකට මොස්කව් ගිහිල්ලා හිටියා. එක දවසකට ලංකාවට touristsලා flight එකක් ගෙන්වන්න පුළුවන්. මොස්කව්වලින්, St. Petersburg, Ekaterinburg කියන මේ නගරවලින් දවසකට එක flight එක ගාණේ සංචාරකයන් ගෙන්වන්න පුළුවන්. හැබැයි ප්‍රශ්නය තමයි අපට ගුවන් යානා නැති එක. සෘජු ගුවන් ගමන් ආරම්භ කරන්න අපට ශක්තියක් නැහැ. එවැනි ගුවන් ගමන් සඳහා පහසුකම් සපයන්න කටුනායක එයාර්පෝට් එකට ධාරිතාවක් නැහැ. අපේ රටේ සංචාරක කර්මාන්තයට අවශ්‍ය පහසුකම්, විශේෂයෙන්ම යටිතල පහසුකම් වාගේම, SriLankan Airlines වාගේ ගුවන් සමාගම්වල තිබෙන capacity එක වැඩි කර ගන්න බැරි වීම නිසා තමයි අපට මේ අභියෝග ඇවිල්ලා තිබෙන්නේ.

අපි මේ ප්‍රශ්නවලට ක්‍රමානුකූලව විසඳුම් සොයමින්, විසඳමින් ඉන්නවා. එහි ප්‍රතිඵලයක් විධියට අපේ කටුනායක එයාර්පෝට් එකට රුපියල් බිලියන 15ක් වියදම් කරලා ධාරිතාව වැඩි කරන ව්‍යාපෘතිය ආරම්භ කරන්න මේ වෙනකොට සැලසුම් සකස් කරලා තිබෙනවා. මට මේ කාරණය කියන්න අවශ්‍යයි. එදා මට දුකකුත් ඇති වුණා. Russiaවලින් 2019දී සංචාරකයන් 5,000යි ටැන්සානියාවට ගියේ. ඒ forum එකේදී සතියට flights තුනක් launch කළා, ටැන්සානියාව. ඒගොල්ලන් ඒ traffic එක අරගෙන ගියා. නමුත් අපට ඒක කරන්න බැහැ. අපට මෙන්න මේවාගේ අභියෝග තමයි තිබෙන්නේ.

අපේ චන්දිම හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා විශේෂයෙන් සඳහන් කළා, සංචාරක ප්‍රවර්ධනය ගැන. ඒක ඉතාම වැදගත් අංශයක්. අපට සංචාරක ක්ෂේත්‍රයෙන් අර කියන බදු ආදායම් ලැබෙනවා. විශේෂයෙන් ප්‍රවර්ධන කාර්යාංශයට එයින් සියයට 70ක් යනවා. අපි ළඟ විශාල මුදල් ප්‍රමාණයක් දැන් accumulate වෙලා තිබෙනවා. හැබැයි, පසුගිය දශක කිහිපය ගත්තොත්, ශ්‍රී ලංකාව සංචාරක ගමනාන්තයක් ලෙස ලෝකයේ ආකර්ෂණය දිනා ගන්න, ප්‍රවර්ධනයක් ඇති කරන්න consistently හොඳ වැඩසටහනක් ක්‍රියාත්මක කරන්න අපි අසමත් වෙලා තිබෙනවා. අපි බලය ලබා ගන්නකොට සැලසුම් කරපු යම් කිසි වැඩසටහනක් තිබුණා. ඇත්තම කියනවා නම්, ප්‍රවර්ධනය කියන එක businesses, ව්‍යාපෘති - projects - බවට පත් වෙලා තිබුණේ. ඒ කියන්නේ ආණ්ඩුවේ ඇමතිවරයාට, ඒ කණ්ඩායමට මුදල් උපයා ගන්න පුළුවන් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරමින් තමයි තිබුණේ. මේ නිසා අපි දැන් ගෝලීය ප්‍රවර්ධන වැඩසටහනක් ආරම්භ කරලා තිබෙනවා, වසර 4ක්, 5ක් දීර්ඝ කාලීනව කරන්න. විශේෂයෙන් අපේ කීර්තිනාමය සහ අපේ branding ලෝකයට ගෙනියන්න global PR and digital campaign එකක්. අපි 1960, 1970, 1980 කාලයේ සාම්ප්‍රදායික සංචාරක ප්‍රවර්ධන වැඩ තමයි කළේ. අපි සංචාරක වෙළෙඳ පොළකට යනවා, ප්‍රදර්ශනයකට යනවා. සාම්ප්‍රදායික ලෙස කොහේ හරි නගරයකට ගිහින් roadshow එකක් කරනවා. අපි ඒවා තමයි කළේ. ඒවා තමයි අපි තවමත් කරමින් ඉන්නේ. අපි හිතාගෙන ඉන්නවා, 1960, 1970, 1980 කාලයේ කරපු ප්‍රවර්ධනය තවමත් හරි යයි කියලා. චන්දිම හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා කිව්වා වාගේ අපි Rs. 5 billion to Rs. 6 billion invest කරලා, PR and digital campaign එකක් පටන් ගන්නවා. ඒක consistently කරන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒ හරහා ශ්‍රී ලංකාව සංචාරක ගමනාන්තයක් - destination එකක් - විධියට ජාත්‍යන්තර වෙළෙඳ පොළේ brand කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

ඒ වැඩසටහන අපි මේ වෙනකොට ආරම්භ කරලා තිබෙනවා. ඒ වැඩසටහන ආරම්භ කරනතුරු අපි මේ වසරේ රුසියාව, ජර්මනිය, බටහිර යුරෝපය, චීනය, ඉන්දියාව, ඕස්ට්‍රේලියාව වැනි රටවල interim campaign එකක් ආරම්භ කළා. PR campaign එකක්, digital campaign එකක් අපට කරන්න වෙන්නේ market-specific වාගේම product-specific ලෙස. මොකද, චීනයේ තිබෙන platforms නොවෙයි රුසියාවේ තිබෙන්නේ. ඒ platforms අපට ඉන්දියාවේ කරන්න බැහැ, භාෂාව වෙනස්. ඒ, ඒ වෙළෙඳ පොළවල්වල අපට විකුණන්න පුළුවන් products promote කරන PR and digital campaigns ආරම්භ කරලා තිබෙනවා. මේ වෙනකොට ඕස්ට්‍රේලියාවේ සහ පැසිෆික් කලාපයේ ඒ procurements ඉවර කරලා තිබෙනවා. අපි ඒක ආරම්භ කරනවා මේ අගෝස්තු පළමුවැනි දා. දශක ගණනාවක් අපට කරන්න බැරිවුණු ප්‍රවර්ධන වැඩසටහන් අපි දැන් ආරම්භ කරනවා. ඒ හරහා අපි රජයක් විධියට, රටක් විධියට සංචාරක කර්මාන්තය දෙස පුළුල් ලෙස බලලා ආයෝජනය කිරීම, ප්‍රවර්ධනය කිරීම කියන ව්‍යාපෘති මේ වෙනකොට ආරම්භ කර තිබෙනවා, මේ වැදගත් කාරණය මතු කිරීම පිළිබඳව ගරු චන්දිම හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමාට නැවත වරක් ස්තුතිවන්ත වෙමින්, මගේ අදහස් දැක්වීම අවසාන කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ.භා. 4.27ට, 2026 ජූලි 21වන අඟහරුවාදා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***

*அதன்படி பி. ப. 4.27 மணிக்கு பாராளுமன்றம், 2026 யூலை 21, செவ்வாய்க்கிழமை மு.ப. 9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*Parliament adjourned accordingly at 4.27 p.m. until 9.30 a.m. on Tuesday, 21st July, 2026.*

## ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු
## வினாக்களுக்கு எழுத்துமூல விடைகள்
## WRITTEN ANSWERS TO QUESTIONS

ගරු අජිත් පී. පෙරේරා මහතා විසින් අසන ලද, අද දින න්‍යාය පත්‍රයේ සඳහන් අංක 2121/2026 දරන ප්‍රශ්නයට පිළිතුර දීමට මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය ගරු අනුර කුමාර දිසානායක මහතා සති දෙකක කාලයක් ඉල්ලා ඇත.

மாண்புமிகு அஜித் பி. பெரேரா அவர்களால் கேட்கப்பட்ட இன்றைய ஒழுங்குப் பத்திரத்திலுள்ள 2121/2026ஆம் இலக்க வினாவுக்கு விடையளிப்பதற்கு, நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சர் மாண்புமிகு அநுர குமார திஸாநாயக்க அவர்கள் இரண்டு வாரகால அவகாசம் கோரியுள்ளார்.

The Hon. Anura Kumara Dissanayake, Minister of Finance, Planning and Economic Development has requested for two weeks' time to reply to Question No. 2121/2026 raised by the Hon. Ajith P. Perera appearing in today's Order Paper.

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන් බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில் பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.